මහ ගාල්ල
සංවර්ධන සැලැස්ම

2021 - 2031

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික හා නිවාස අමාත්‍යංශය

මහ ගාල්ල
සංවර්ධන සැලැස්ම
2021 - 2031

මධ්‍යකාලීන උරුමය සුරකින නූතන නගරය

මධ්‍යකාලීන ගාල්ල සංවර්ධනයෙහි ආර්ථික අංශයෙහි කලාපීය පහසුකම් සැපයීම
සහ තිරසාර සංවර්ධන ක්‍රියාවලිය පවත්වා ගෙන යාම සහ එය ආරක්ෂා කිරීම

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

මහ ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2021

සියළුම හිමිකම් ඇවිරිණි.

වෙබ් අඩවිය - www.uda.lk
විද්‍යුත් තැපෑල - info@uda.lk
දුරකථන අංක - + 94112 873 637
ප්‍රකාශනය 2021

මහ ගාල්ල සංවර්ධන සැලැස්ම 2021 -2031, I වන කොටස, II වන කොටස සහ III කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයන, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සැලැස්මය. දෙවන කොටස 2021 -2031 කාල පරිච්ඡේදය සඳහා සැලසුම් සීමාවට අදාල සැලසුම් හා ගොඩනැගිලි නියාමතා සහ කලාපීකරණ නියාමතා වලින් සමන්විත වේ. III කොටස කලාප සීමා මායිම් බණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

මහ ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031 සකස් කර ඇත්තේ දකුණු පළාත් කාර්යාලය විසිනි.

අධීක්ෂණය

මේජර් ජනරාල්(විශ්‍රාමික)උදය නානායක්කාර- සභාපති, නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර - අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ., වරලත් වාස්තු විද්‍යාඥ හා නගර නිර්මාණ ශිල්පී මහින්ද විතානාරච්චි - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අ, නගර නිර්මාණ ශිල්පී එම්.පී. රණතුංග- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් I), නගර නිර්මාණ ශිල්පී ලලිත් විජේරත්න - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් II), - නා.සං.අ., අනුර මැදවල අධ්‍යක්ෂ (දකුණු පළාත) නීතිඥ සී . ජයවර්ධන - උපදේශක (නීති) - නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න - අධ්‍යක්ෂ (උපායමාර්ගික සැලසුම්) නා.සං.අ. නගර නිර්මාණ ශිල්පී කේ.එච්.එම්.ඩබ්.කේ.අබේරත්න (අධ්‍යක්ෂ - දේපල කළමන-ාකරණය සහ අයකර ගැනීමේ අංශය) නා.සං.අ.,

සැලසුම් කණ්ඩායම

කේ.ඩී .එස්.එස්.කුකුලවිතාන (නියෝජ්‍ය අධ්‍යක්ෂ -සැලසුම්) තුෂාරි දිසානායක මහත්මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ -සැලසුම්) සී.ඩබ්.එන්.ද .එස්. සෝමනායක මහත්මිය උපායමාර්ගික නගර නිර්මාණ ශිල්පී /සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) කේ.ජී.ආර්.කුෂානි, නගර නිර්මාණ ශිල්පී, කේ.ඩී. මල්ශානි මිය, සහකාර සැලසුම් නිළධාරිනි, විශාකා ප්‍රියදර්ශනීමිය, නගර නිර්මාණ ශිල්පී ආර්. විනෝදිනි ද. සිල්වා මහත්මිය සැලසුම් නිළධාරිනි එච්.ටි.දමයන්ති මහත්මිය සැලසුම් නිළධාරිනි, එස්.ජී.ඩී.පි. හේවාවිදාන මහත්මිය ,සැලසුම් නිළධාරිනි එස්. කේ. ටී. නදීකා ආරියවංස මහත්මිය සැලසුම් නිළධාරිනි

ගාලු කොටුවෙහි මාර්ගෝපදේශ සැලැස්ම සකස් කිරීම
එල්.ආර්. හෙට්ටිආරච්චි මිය - සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), එම්.වී. එස්. රංජනි මිය - සැලසුම් නිලධාරී

සහාය කණ්ඩායම් - නාගරික සංවර්ධන අධිකාරිය

උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ (අධීක්ෂණය, නියාමය, පිටු සැකසීම සහ ගැසට් කිරීම)
පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ (PORS, සංරක්ෂණය, සංස්කෘතික හා උරුම සැලසුම් සකස් කිරීම)
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ.(භූගෝලීය තොරතුරු දත්ත සැපයීම සහ තාක්ෂණික සහාය සැපයීම)
පර්යේෂණ හා සංවර්ධන අංශය - නා.සං.අ.(නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්ම)

කවරයේ ඡායාරූපය උපුටා ගැනීම -Timo Gotz/Shutterstock

ප්‍රණාමය

මහ ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් කාර්යාලයේ මූලික අධීක්ෂණය යටතේ සිදු විය. මධ්‍යතන උරුමය සුරකින නූතන නගරය මෙම සැලැස්මේ අරමුණයි. මහ ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031 අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම "ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සකස් කර ඇත.

මෙහිදී 1982 අංක 04 දරණ පණත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධි විධාන යටතේ මහ ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031 සඳහා අනුමැතිය ලබාදීම සිදු කර ලද නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන විෂයභාර ගරු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ට අපගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමු .

තවද මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය මගපෙන්වීම හා සහාය ලබාදුන් නාගරික සංවර්ධන, අපද්‍රව බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා වෙත අපේ ස්තුතිය පුදකොට සිටිමු .

නගරාධිපති ගාල්ල මහා නගර සභාව, සභාපති බෝපේ පොද්දල , අක්මීමණ සහ හබරාදුව ප්‍රාදේශීය සභාව හා නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් ගාල්ල මහා නගර සභාව, සභාපති බෝපේ පොද්දල , අක්මීමණ සහ හබරාදුව හා එම කාර්යාලයේ සියළුම නිලධාරීන්ටත් මෙහිදී සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමු .

විශේෂයෙන් මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්යය හා මගපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති මේජර් ජනරාල්(විශ්‍රාමික)උදය නානායක්කාර මහතාට, අධ්‍යක්ෂ ජනරාල්, නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර මහතාට , අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, වරලත් වාස්තු විද්‍යාඥ හා නගර නිර්මාණ ශිල්පී මහින්ද විතානාරච්චි මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සැලසුම් I), නගර නිර්මාණ ශිල්පී, එම්.පී.රණතුංග මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් II) නගර නිර්මාණ ශිල්පී ලලිත් විජේරත්න මහතාට, -දකුණු පළාත් කාර්යාලයේ අධ්‍යක්ෂ අනුර මැදවල මහතාට නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක (නීති) නීතිඥ සී. ජයවර්ධන මහත්මියට හා උපාය මාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ, නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න මහත්මියට හා එම අංශයේ සියළුම නිලධාරීන්ටත් අපගේ ස්තුතිය පුදකර සිටිමු .

අවසාන වශයෙන් පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ඊ. කළුපහන මහත්මියට හා එම අංශයේ සියළුම නිලධාරීන්ටත්, පර්යේෂණ හා සංවර්ධන අංශයේ ජනක් රණවීර මහතාට අධ්‍යක්ෂ භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂක, නගර නිර්මාණ ශිල්පී ජේ.පී.එස්.සෝමසේකර මහත්මිය හා එම අංශයේ සියළුම නිලධාරීන්ටත්, උපාය මාර්ගික සැලසුම් අංශයේ නගර නිර්මාණ ශිල්පී හර්ෂනී සිල්වා මහත්මියට හා නගර නිර්මාණ ශිල්පී ප්‍රවීන් කාවින්ද මහතාට පිටු සැකසීම , පිට කවර නිර්මාණය සඳහා සැලසුම් කණ්ඩායම වෙනුවෙන් ස්තුතිය පුද කරමු .

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන

1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටවනු ලැබූ අතර එමගින් ප්‍රකාශිත නාගරික බල ප්‍රදේශ තුල විධිමත් සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා සක්‍රීය දායකත්වයක් මේ මොහොත වන විට ද සපයනු ලබයි. රටේ සංවර්ධන ක්‍රියාවලියට ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම සමාන දායකත්වයක් සැපයෙන ආකාරයට භෞතික අවකාශය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස භාවිතයට ගැනීම මූලික කරගනිමින් පුළුල් සංවර්ධන සැලසුම් සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීමට කටයුතු යොදා ඇත.

ගාල්ල නගරය විශාල ජන සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. ඒ අනුව මහ ගාල්ල සැලසුම් බල ප්‍රදේශය වාණිජ් හා පරිපාලන වශයෙන් තවදුරටත් සේවා සපයන නගරයක් බවට පත් කිරීමට විභවතාවයක් පවතී. ඒ අවට ප්‍රදේශය සතු ස්වාභාවික පරිසර පද්ධතිය හා පුරා විද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන පිහිටා තිබීම මෙම විභවතාවය තවදුරටත් ඉහළ නංවයි. මෙම සංවර්ධන සැලසුම් මඟින් අපේක්ෂා කරන්නේ මහ ගාල්ල ප්‍රදේශය එම විභවතාවය ප්‍රයෝජනයට ගෙන නගරය සංවර්ධනය කිරීමයි.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්තයක් බවට පත් කරනු වස් නව ප්‍රතිනාගරීකරණ වැඩසටහන් සහිතව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවන්ගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් සමඟ විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයක් හා නවෝත්පාදන ප්‍රවේශයක්ද මේ සඳහා ලැබී ඇත.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්යය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය තුලින් මහ ගාල්ල සංවර්ධන සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

මහින්ද රාජපක්ෂ (පා.ම)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පෙරවදන

නූතන තිරසාර සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමේ ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සතුව විශාල වගකීමක් පැවරී ඇත. ඒ අනුව ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන බල ප්‍රදේශ සඳහා අංක 1982 අංක 04 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8අ(1)) අනුව සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත.

මෙලෙස සකස් කරනු ලබන සංවර්ධන සැලසුම් තුලින් සෞභාග්‍යයේ දැක්මෙහි ඇතුලත් මූලික අපේක්ෂාවන් වන ඵලදායි පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් ගොඩනැගීම මූලික වශයෙන් අපේක්ෂා කරයි. තවද නාගරික ජනතාවගේ ආර්ථික ස්ථායිතාව ඇති කරමින් විධිමත් ප්‍රතිනාගරීකරණ සැලැස්මක් ඔස්සේ නාගරික ප්‍රදේශ සංවර්ධනය හා නියාමනය යන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට මෙම සංවර්ධන සැලසුම් මහත් පිටිවහලක් වනු ඇති බවට විශ්වාස කරමි.

එබැවින් මෙම සැලැස්ම පිලියෙල කිරිමේදී ඉතා වගකීමෙන් තම කාර්යභාරය ඉටු කරන ලද සැලසුම් කණ්ඩායමට හා නන් අයුරින් සහයෝගය දැක් වූ සැමට හෘදයාංගම කෘතඥතාවය පිරිනමන අතර සෞභාග්‍යයේ දැක්මේ අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා ඔබ සැමගේ දායකත්වය ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

ආචාර්ය නාලක ගොඩහේවා (පා.ම)
නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනා-කාරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී අධිකාරිය පිහිටුවන ලද්දේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය සහ නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලැසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිවය.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ II අ කොටස 8 අ(1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව, ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන මහ ගාල්ල සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් මෙවලම් හා ක්‍රමෝපායන් උපයෝගීකර ගනිමින් මහ ගාල්ල සංවර්ධන සැලැස්ම 2021-2031 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. මහ ගාල්ල සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු විසඳීමටත්, ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමටත් උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම අනුගමනය කර එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන් ගෙන් සහ මහජනතාව ගෙන් ඉල්ලා සිටිමි.

මෙම සැලැස්ම නියමිත කාලය තුල සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. තවද මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මේජර් ජනරාල් (විශ්‍රාමික) උදය නානායක්කාර
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය.

පළාත් පාලන ආයතන නගරාධිපති/සභාපතිවරුන්ගේ පණිවුඩය



දශක හතරක් පුරාවට ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයේ පුරෝගාමී මෙහෙවර ඉටු කරන නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රාදේශීය පළාත් පාලන ආයතන සමඟ ද ඒකාබද්ධ වෙමින් නිසි භූමි පරිහරණ රටාවකින් යුක්තව සියලු නාගරික අවශ්‍යතා සපුරාලන ජීවත් වීමට හිතකාමී නගර නිර්මාණ උදෙසා පෙළ ගැසී සිටී. ගාල්ල නගරය ඇතුලු වන පරිදි ප්‍රාදේශීය සභා හතරක් ආවරණය වන පරිදි සකස් කරන ලද මහ ගාල්ල සංවර්ධන සැලසුම එම ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික අංශයන්හි ගුණාත්මක හා තුළනාත්මක සංවර්ධනය උදෙසා වඩා වැඩි බරක් දැරීමට එක් වූ අතර, ප්‍රාදේශීය සභාව ද මෙම සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු කරමින් පොදු මහජන සුභ සිද්ධිය උදෙසා නොපිරිහෙලාම වගකීම් සමුදායක් ඉටු කරමින් සිටී.

ඒ අනුව, 2021 - 2031 කාලසීමාව දක්වා බලපැවැත්වෙන මහ ගාල්ල නගර සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය මඟින් සම්පාදනය කර තවදුරටත් නෛතික රාමුවක් යටතේ ප්‍රදේශයේ සංවර්ධන තීව්‍රතාවය යහපත් දිශානතියට පත් කරලීමට කටයුතු කර ඇත. එමඟින් අනාගත නේවාසික ප්‍රජාවට මෙන්ම එදිනෙදා ජීවන අවශ්‍යතා සඳහා ප්‍රදේශයට සංසරණය වන ජනතාව ද ඉලක්ක කර ඇති අතර, පවතින සංවර්ධන විභවතාවයන් හරහා ආර්ථික, සාමාජීය, භෞතික ප්‍රතිලාභ එක් කරලීමටත් කටයුතු යොදා දායාද කර ඇත.

එපමණක් නොව ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය නඟා සිටුවීමටත්, ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු සලසා ඇත. එහිදී මෙම කලාපයේ සංවර්ධනය උදෙසා මා ඇතුළු මහ ගාල්ල නාගරික ප්‍රදේශයට අයත් සියලු මහජන නියෝජිතයින් කැපවී සිටින අතර, එම උදාර අරමුණු වෙනුවෙන් තම වගකීම් සහ යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමට ද බලාපොරොත්තු වේ.

ප්‍රියන්ත සහබන්දු **නගරාධිපති** **ගාල්ල මහ නගර සභාව**	**සමරසේන කළහෙවත්ත** **සභාපති** **අක්මීමණ ප්‍රාදේශීය සභාව**	**දිල්රුක් අබේකෝන්** **සභාපති** **බොපේ-පෝද්දල ප්‍රාදේශීය සභාව**	**ඩිල්ෂාන් විදානගමගේ** **සභාපති** **හබරාදුව ප්‍රාදේශීය සභාව**

පෙරවදන

සංවර්ධනයේ ත්‍රීවිතාවය අනුව කලානුරූපිව නගරයේ විකාශනය වෙනස් වේ. එබැවින්, සංවර්ධනයේ නැගී එන ප්‍රවණතා හොඳින් හඳුනා ගැනීම හා වෙනස් වීම් සඳහා හැඩ ගැසීමට නව විසඳුම් සොයා ගැනිමට අවශ්‍ය වේ. නාගරික සංවර්ධනය නවීකරණයෙන් යුක්තව අනාගත පරම්පරාවන්ට දායාද කරනු ඇත.

කලාපයේ මෙන්ම ශ්‍රී ලංකාවේ වේගයෙන් සංවර්ධනය වන නගර අතුරින් එක් නගරයක් ලෙස ගාලු නගරය සැළකේ. නගරයේ අවකාශීය ව්‍යුහය නගරයෙන් පිටත ප්‍රදේශය කරා ව්‍යාප්ත වීම තුළින් කාලයත් සමඟ වෙනස්කම් වලට භාජනය වෙමින් පවතී. මෙම සිද්ධිය නගර ව්‍යුහය හා සංවර්ධනය සැලකිය යුතු වෙනස්කම් සිදු කරමින් පවතී. එම නිසා මෙම සංසිද්ධිය තුළ මහ ගාල්ල සංවර්ධන සැලැස්ම, අනාගත සංවර්ධනය උදෙසා වර්තමානයේදී ඇති වී ඇති ගැටළුවලට සහ ඉදිරියේදී මතු විය හැකි ගැටළු වලට බුද්ධිමත් විසඳුම් සපයන මෙවලමක් වනු ඇත. 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ දෙවන කොටසේ 8 (එ) වගන්තිය මඟින් සැලසුම් සකස් කිරීම සඳහා නීතිමය විධිවිධාන ලැබී ඇත. මහ ගාල්ල සංවර්ධන සැලැස්ම මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත.

ඒ අනුව වර්ෂ 2021 සිට 2031 දක්වා කාලපරිච්ඡේදය සඳහා එම සැලැස්ම බල පැවැත්වෙනු ඇත. 2005 දෙසැම්බර් මස 01 දින අංක 1421/29 ගැසට් නිවේදනය අනුව නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති මහ ගාල්ල ප්‍රදේශයට අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 03 වන වගන්තිය යටතේ සංවර්ධන සැලැස්මේ ඕනෑම සංශෝධනයක් හෝ වෙනස් කිරීමක් සඳහා ඇමතිවරයාගෙන් පූර්ව අනුමැතියක් ලබා ගත යුතුය.

මෙම සංවර්ධන සැලැස්ම කොටස් දෙකකින් සමන්විත වේ. මහ ගාල්ල ප්‍රදේශයේ පවතින තත්ත්වය සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු, පරමාර්ථ සහ යෝජිත සංවර්ධන සැලැස්මේ උපාය මාර්ගික ව්‍යාපෘති පළමු කොටසේ අඩංගු වන අතර, දෙවන කොටසේ යෝජිත සංවර්ධන සැලැස්මෙහි සංවර්ධන කලාප හා කලාපීය නියාමතා ඇතුළත් කර ඇත.

තවද ප්‍රතිපත්ති සම්පාදකයින්, අනෙකුත් අදාල පරිපාලන නිලධාරීන්, විද්‍යාත්මක හා ව්‍යාපාරික ප්‍රජාව නේවාසිකයින් සහ විශේෂ පාර්ශවකරුවන් අතර පුළුල් සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස මෙම සැලැස්ම සකස් කරන ලදී. සංවර්ධන සැලසුමේ ඉලක්කය වූයේ ජනතාව සඳහා නගරයක් තැනීමට හා ඔවුන් ජීවත් වීමට අවශ්‍ය සුදුසු තැන සකස් කිරීම මිස ඔවුන් ජීවත් වන්නේ කොහේද යන්න නොවේ.

ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය

ගාල්ල මහ නගර සභාව සහ අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන මහ ගාල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මාහට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2020 සැප්තැම්බර් මස 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, ගාල්ල මහ නගර සභාව සහ අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන මහ ගාල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,

17 හා 18 මහල,

"සුහුරුපාය",

සුහුතිපුර පාර,

බත්තරමුල්ල.

2021 ..සැප්තැම්බර්... **මස** ..28... **වන දින.**

පටුන

ප්‍රණාමය	iii
ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය	iv
ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය	v
ගරු සභාපතිතුමාගේ පෙරවදන -නාගරික සංවර්ධන අධිකාරිය	vi
පළාත් පාලන ආයතන නගරාධිපති/සභාපතිවරුන්ගේ පණිවුඩය	vii
පෙරවදන	viii
ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය	ix
ගැසට් නිවේදනය	x
I වන කොටස	
පළමුවන පරිච්ඡේදය - සංවර්ධන සැලසුමෙහි පසුබිම	01
1.1 හැඳින්වීම	02
1.2 සැලසුම් කණ්ඩායම	02
1.2.1 ප්‍රධාන පාර්ශවකරුවන්	02
1..2.2 ප්‍රධාන උපදේශාත්මක ආයතන	03
1.2.3 අනෙකුත් පාර්ශව කණ්ඩායම්	03
1.3 සංවර්ධන සැලසුමෙහි විෂය පථය	04
1.4 සැලසුම් ක්‍රියාවලිය	04
දෙවන පරිච්ඡේදය - පූර්ව සමීක්ෂණය	09
2.1 අධ්‍යයන බල ප්‍රදේශය	10
2.2 සැලසුම් සහ පසුබිම තත්ත්ව	14
2.2.1 ජාතික සහ ප්‍රාදේශීය සම්බන්ධතා	14
2. 2. 2 ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය 2030	15
2. 2. 3 පෙර සැලසුම්කරණ උත්සාහයන්	16
2.2.3.1 ගාලු නගර සීමාවේ උපායමාර්ගික සංවර්ධන සැලසුම 2030	16
2.2.3.2 ADV ගාල්ල සංවර්ධන සැලසුම	17
2.2.3.3 ගාල්ල සංවර්ධන සැලසුම (2008-2025)	17
2.2.4 සීමා මායිම් සැලසුම් කිරීම	21
තුන්වන පරිච්ඡේදය - සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය	23
3.1 සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය	24
හතරවන පරිච්ඡේදය - සැලසුම්කරණ රාමුව	31
4.1දැක්ම	32
4.2 දැක්ම ප්‍රකාශය	32
4.3 අරමුණ	32
4.4 පරමාර්ථ	33
පස්වන පරිච්ඡේදය - ශ.දු.අ.ත විශ්ලේෂණය	35
5.1 ශ.දු.අ.ත විශ්ලේෂණය	37
5.2 නාගරික ව්‍යුහය	67
5.2.1 සලකා බලනු ලබන විකල්ප සිද්ධීන්	72
5.2.2 සංසිද්ධීන් ඇගයීම	75
හයවන පරිච්ඡේදය - සැලසුම	77
6.1සංකල්පිත සැලසුම	77
6.2 යෝජිත ඉඩම් පරිහරණ සැලසුම	79

6.2.1යෝජිත ඉඩම් පරිහරණ සැලසුමෙහි තෝරාගත් ස්ථාන වල හරස්කඩ 2031 81
6.3. සමාජ සහ භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග 81
6.3.1.1 ජනාවාස සංවර්ධන සැලැස්ම 83
6.3.1.2 නාගරික සේවා ප්‍රවර්ධන සැලැස්ම 91
6.3.2 ප්‍රවාහනය - "විධිමත් ගමනාගමන පහසුකම්" 96
6.3.3 ජල සැපයුම 108
6.3.4 විදුලි සහ දත්ත රැහැන් 108
6.3.5 අපවහන සහ මළාපවහන කාණු 109
6.3.5.1 අපවහන ජාලය 109
6.3.5.2 මළාපවාහන පද්ධතිය 109
6.3.6 අපද්‍රව්‍ය කළමනාකරණය 110
6.3.6.1. රත්ගම (මොන්රෝවියාවත්ත) යෝජිත සනීපාරක්ෂක කසළ රදවනය 111
6.3.7. විශේෂ අවධානය 111
6.3.7. 1. වරාය 112
6.3.7.2. අධිවේගී මාර්ගය / අන්තර් හුවමාරු 112
6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ග 113
6.4.1. ඉසුරුමත් නගරය- සංචාරක කළමනාකරණ සැලැස්ම 113
6.4.1.1. උපායමාර්ගික ක්‍රියා (01) - සංචාරක තීරයක් නිර්මාණය 115
6.4. 1.1.1.ව්‍යාපෘති 01-ගිංගඟ ආශ්‍රිතව ජලාශ්‍රිත ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම115
6.4.1.1.2. ව්‍යාපෘති 02-මහමෝදර වැව ආශ්‍රිතව ජලජවිලා ඉදිකිරීම 116
6.4.1.1.3. ව්‍යාපෘති 03 - මහමෝදර රෝහල් භූමිය පුනර්ජනනය 117
6.4.2. ධීවර කටයුතු ප්‍රවර්ධන සැලැස්ම 120
6.4.2.1. භූමිය 01: දෙවට 120
6.4.2.2. භූමිය 02 - රත්ගම් වැල්ල 122
6.4.3. කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධන සැලැස්ම 122
6.4.4. දැනුම කේන්ද්‍ර කරගත් කර්මාන්ත සංවර්ධන සැලැස්ම 124
6.4.5. ඌන උපයෝජිත රාජ්‍ය දේපළ සංවර්ධන සැලස්ම 125
6.5. පාරිසරික තිරසාර උපායමාර්ග 129
6.5.1. ස්වභාවික පරිසර කළමනාකරණ සැලැස්ම 129
6.5.2. ආපදා කළමනාකරණ සැලැස්ම 135
6.5.2.1. සුනාමි 135
6.5.2.2 නාගරික ගංවතුර ගැටළුව 137
6.5.3. පොදු විවෘත අවකාශ 138
6.5.3.1ප්‍රීතිමත් පුරවැසියන් බවට පත් කිරීම 138
6.5.3.1.1. මුහුණත පෙනුම සංවර්ධනය කිරීම 144
6.5.4. කෘෂිකර්මාන්තය 154
6.6 සංස්කෘතික සහ උරුමය කළමනාකරණ උපායමාර්ගය 154
6.6.1. උරුම සහ පුරාවිද්‍යාත්මක සංරක්ෂණ ප්‍රදේශ 154
6.7 සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය 155
6.7.1. උපාය මාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘති 155
6.7.2 ආයතනික සැලැස්ම 175
II කොටස
ඉඩම් සහ ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග සැලැස්ම 180
හත්වන පරිච්ඡේදය -කලාපීකරණ හා කලාපීකරණ නියමතා 181
7.1 හැඳින්වීම 182
7.2 සංවර්ධන කලාප 185
7.2.1 යෝජිත කලපිකරණ සැලැස්ම 2021-2031 186
7.3 කලාප සංගුණකය 187
7.3.1 කලාප සාධකය තීරණය කරන්නේ කෙසේද 188
7.3.2 එක් එක් කලාපයේ කලාප සංගුණකය 2021-2031 191
7.4 සැලසුම් ප්‍රදේශය සඳහා පොදු නියාමනය 192

අට වන පරිච්ඡේදය- යෝජිත කලාපීකරණ සැලැස්ම 193
8.1 අධි වාණිජ කලාපය 194
8.1.1 කලාපීකරණ නියමතා 194
8.1.2 අවසරලත් භාවිතයන් 194
8.2 සෞඛ්‍ය මූලික වාණිජ කලාපය 197
8.2.1 කලාපීකරණ නියමතා 197
8.2.2 අවසරලත් භාවිතයන් 197
8.3 අඩු ඝනත්ව වාණිජ කලාපය 200
8.3.1 කලාපීකරණ නියමතා 200
8.3.2 අවසරලත් භාවිතයන් 200
8.4 නේවාසික ප්‍රවර්ධන කලාපය 203
8.4.1 කලාපීකරණ නියමතා 203
8.4.2 අවසරලත් භාවිතයන් 203
8.5 සාමාන්‍ය නේවාසික කලාපය 205
8.5.1 කලාපීකරණ නියමතා 205
8.5.2 අවසරලත් භාවිතයන් 205
8.6 අඩු ඝනත්ව නේවාසික කලාපය 207
8.6.1 කලාපීකරණ නියමතා 207
8.6.2 අවසරලත් භාවිතයන් 207
8.7 අධිඝනත්ව සංචාරක කලාපය 209
8.7.1 කලාපීකරණ නියමතා 209
8.7.2 අවසරලත් භාවිතයන් 209
8.8 මධ්‍ය ඝනත්ව සංචාරක කලාපය 211
8.8.1 කලාපීකරණ නියමතා 211
8.8.2 අවසරලත් භාවිතයන් 211
8.9 ගෘහාශ්‍රිත සංචාරක කලාපය - 1 (පාරිසරික හිතකාමී) 213
8.9.1 කලාපීකරණ නියමතා 213
8.9.2 අවසරලත් භාවිතයන් 213
8.10 ගෘහාශ්‍රිත සංචාරක කලාපය- 2 (මිශ්‍ර වාණිජ) 215
8.10.1 කලාපීකරණ නියමතා 215
8.10.2 අවසරලත් භාවිතයන් 215
8.11 පාරිසරික කලාපය - කුඹුරු 217
8.11.1 කලාපීකරණ නියමතා 217
8.11.2 අවසරලත් භාවිතයන් 217
8.12 රූමස්සල සංරක්ෂණ කලාපය 218
8.12.1 කලාපීකරණ නියමතා 218
8.13 හරිත ප්‍රවර්ධන කලාපය 219
8.13.1 කලාපීකරණ නියමතා 219
8.13.2 අවසරලත් භාවිතයන් 219
8.14 කෘෂි ආර්ථික කටයුතු කලාපය 221
8.14.1 කලාපීකරණ නියමතා 221
8.14.2 අවසරලත් භාවිතයන් 221
8.15 ප්‍රවාහන කටයුතු කලාපය 223
8.15.1 කලාපීකරණ නියමතා 223
8.15.2 අවසරලත් භාවිතයන් 223
8.16 පරිපාලන කටයුතු කලාපය 225
8.16.1 කලාපීකරණ නියමතා 225
8.16.2 අවසරලත් භාවිතයන් 225
8.17 නාවික කටයුතු කලාපය 227
8.17.1 කලාපීකරණ නියමතා 227
8.17.2 අවසරලත් භාවිතයන් 227

8.18 ගාලු කොටුව සංරක්ෂණ කලාපය 228
8.18.1 කලාපීකරණ නියමතා 228

නව වන පරිච්ඡේදය - සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි 229
9.1 රූමස්සල පාරිසරික ආරක්ෂණ කලාපය 230
9.1.1 හැඳින්වීම 230
9.1.2 අරමුණ 230
9.1.3 නියමතා සැලැස්මෙහි විෂය පථය 231
9.1.4 පොදු නියමතා රෙගුලාසි 231
9.1.5 සංවර්ධන කලාප 233
9.1.5.1 ස්වාභාවික සංරක්ෂණ කලාපය 233
9.1.5.1.1 කලාපීකරණ නියමතා 233
9.1.5.1.2 අවසරලත් භාවිතයන් 233
9.1.5.2 පාලිත සංවර්ධන කලාපය 234
9.1.5.2.1 කලාපීකරණ නියමතා 234
9.1.5.2.2 අවසරලත් භාවිතයන් 234
9.1.5.3 අන්තර් මධ්‍ය සංවර්ධන කලාපය 235
9.1.5.3.1 කලාපීකරණ නියමතා 235
9.1.5.3.2 අවසරලත් භාවිතයන් 235
9.1.5.4 සංවර්ධන ප්‍රවර්ධන කලාපය 236
9.1.5.4.1 කලාපීකරණ නියමතා 236
9.1.5.4.2 අවසරලත් භාවිතයන් 236
9.2 ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශය 237
9.2.1 කලාපීකරණ නියමතා 238
9.2.2 සැලසුම් නියෝග - ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශය 238
9.2.2.1 සංරක්ෂණ කලාපය I 238
9.3 කරාපිටිය උප නගර මාර්ගෝපදේශන සැලසුම 245
9.3.1 පසුබිම 245
9.3.2 අරමුණු 245
9.3.3 කරාපිටිය උපනගරයේ සීමා 245
9.3.4 නියමතා සැලැස්මේ විෂයපථය 245
9.3.5 කරාපිටිය උප නගර සැලැස්මේ පොදු නියමතා 245
9.3.6 කලාපය තුළ අවසර දෙනු ලබන භාවිතයන් 247
9.3.7 අවසර ලබා නොදෙනු ලබන භාවිතය 247
9.3.8 සංවර්ධන ව්‍යාපෘති 247

දස වන පරිච්ඡේදය - යෝජිත මාර්ගයෙහි මාර්ග පළල සීමාව හා ගොඩනැගිලි සීමාව 251

III කොටස 255
සිතියම් ලැයිස්තුව 256
රූප සටහන් ලැයිස්තුව 257
වගු ලැයිස්තුව 260

ඇමුණුම - 01 එක් එක් කලාපයන්හි අවසර දෙනු ලබන භාවිතා 261
ඇමුණුම - 02 වෙනත් රක්ෂිත 266
ඇමුණුම - 03 සංවර්ධනය කළ යුතු අනුමත ගෙබිම් ප්‍රමාණය ගණනය කිරීම 267
ඇමුණුම - 04 අනාගත භාවිතය සඳහා අවශ්‍ය වන ඉඩ ප්‍රමාණය ගණනය කිරීම 267
ඇමුණුම - 05 කලාපීයකරණ භෞතික සීමාවන් 268
ඇමුණුම - 06 කලාපීය භූ ඛණ්ඩාංක 283
ඇමුණුම - 07 මහා වීදිය සංවර්ධන සැලැස්ම - ගාල්ල නගරය 397

I වන කොටස

පළමුවන
පරිච්ඡේදය

සංවර්ධන
සැලසුමෙහි
පසුබිම

පරිච්ඡේදය 01
සංවර්ධන සැලසුමෙහි පසුබිම

1.1 හැඳින්වීම

හැඳින්වීම

සංවර්ධන සැලැස්මක් යනු නීත්‍යානුකූල ලියවිල්ලකි. මෙය නිශ්චිත ප්‍රදේශයක පවතින භෞතිකමය තත්ත්වය, සමාජීය තත්ත්වය, ආර්ථිකමය තත්ත්වය සහ පාරිසරික බලපෑම් සඳහා අනුගතව සකස් කරන ලද, යම් ප්‍රදේශයක් අනාගතයේදී දෘශ්‍යමාන වියයුතු ආකාරය සංවර්ධන ක්‍රමය සහ සංවර්ධනය වියයුතු ප්‍රමාණය දක්වන ලියවිල්ලකි. ව්‍යවස්ථාවෙහි 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ අංක 41 සංශෝධිත 1982 අංක 4 පනතෙහි 8 (අ) වගන්තිය යටතේ ලබාදී ඇති බලතල අනුව සංවර්ධන සැලසුම් සැකසීම සඳහා බලයලත් ආයතනයක් ලෙස ඉහත පනතට අනුව නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කරනු ලැබේ.

1967 ජනවාරි මස පළමුවන දින ගාල්ල, මහනගර සභාවක් ලෙස ස්ථාපිත කරනලදී. 1965 නගර සභා ආඥාපනත යටතේ 1966 නොවැම්බර මස 24 වන දින ආණ්ඩුකාර විසින් නිකුත් කරන ලද අංක 3571 ගැසට් නිවේදනය අනුව මෙය සිදුවිය. ජනගහන වර්ධනය සහ අනෙකුත් නාගරික ගැටළු පදනම්ව සංවර්ධන සැලසුම්හි අවශ්‍යතාවය මතුවිණි. එබැවින් නගරය, නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස 1978 අංක 41 නාගරික සංවර්ධන අධිකාරි පනතෙහි වගන්ති අංක 3 යටතේ 1979.06.01 දිනැති අංක 38/16 අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙහි මූලික අරමුණ වූයේ නගරය තුළ ජනගහන වර්ධනය හේතුවෙන් ඇතිවූ නාගරික විවිධාංගිකරණය විධිමත් කිරීමය. මේ අනුව නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල මහානගර සීමාව සඳහා 2008-2025 යන කාල පරිච්ඡේදයට අදාළව සංවර්ධන සැලසුමක් සකස් කොට එය 2009 වසරේදී ගැසට් කර ප්‍රකාශ කරන ලදී. වර්තමානයේ මෙම සැලසුම භාවිතා වේ.

ගාල්ල යනු දකුණු පළාත තුළ ප්‍රධාන නාගරිකය වුවද මෙහි සංවර්ධනයෙහි පසුබෑමක් ඇත. නගරය තුළ බොහෝ සංවර්ධන කාර්යන් සඳහා විභවයක් පැවතියද ඒවා නිසිපරිදි සැලසුම්ගත ක්‍රමයකට සංවර්ධනය කිරීමට නිසි අයුරින් හඳුනාගෙන නොමැත. එබැවින් සංවර්ධන ප්‍රවණතා සහ සංවර්ධනය සඳහා ඇති විභවය සලකා ගාල්ල මහා නගර සීමාව "මහා ගාල්ල" (Greater Galle) ලෙස ගැසට් කරන ලදී. මෙම සීමාව නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස වසර 2005 දෙසැම්බර් මස 01 වන දින අංක 1421/29 ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශ කර ඇත. මෙය මෑත කාලීන සංවර්ධනය සහ පසුගිය වසර කිහිපය තුළ ක්‍රියාත්මක වූ දිගු කාලීන නාගරික දියුණු කිරීමේ ක්‍රියාවලිය යන කරුණු දෙකම සලකා මෙලෙස ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. මේ අනුව මහා ගාල්ල සඳහා සංවර්ධන සැලැස්ම සැකසීම 2017 වසර මුල් භාගයේදී ආරම්භ වූ අතර මෙය වසර 12ක් සඳහා මහා ගාල්ල සීමාවහි පසුබිම සහ සංදර්භය පුළුල් ලෙස අධ්‍යනයකින් පසු සැලසුම් කර ඇත. එහිදී සෞභාග්‍යය දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 05 වන පරිච්ඡේදය වන ජනතා කේන්ද්‍රීය ආර්ථිකය, 07 වන පරිච්ඡේදයේ භෞතික හා අවකාශ භාවිතයේ නව ප්‍රවේශය, 08 වන පරිච්ඡේදය වන තිරසාර පරිසර ප්‍රතිපත්තියක්, 09 වන පරිච්ඡේදය වන ඉතිහාසය,පුරා විද්‍යාව හා ජාතික උරුමයන් යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරමින් ජාතික නගරයක් ලෙස හඳුනාගත් ගාල්ල නගරයේ මහා ගාල්ල සංවර්ධන සැලසුම සකස් කර ඇත.

සැලසුම් කණ්ඩායම

1.2. සැලසුම් කණ්ඩායම

සැලසුම් ක්‍රියාවලිය පවතින කාල සීමාව තුලදී සැලැස්මට සම්බන්ධ ප්‍රධාන පාර්ශව දැනුවත් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙහි සැලසුම් කණ්ඩායම මගින් උපදේශාත්මක සැසි කිහිපයක් පවත්වා ඇත. මේ සඳහා පහත සඳහන් ආයතන සහ එම ආයතනයන්හි ප්‍රවීණයන් මගින් තේමාත්මක සැලසුම්, හා විශේෂඥ දැනුම සැලසුම්කරණ අවස්ථාවේදී ලබාගෙන ඇත.

1.2.1.1. ප්‍රධාන පාර්ශවකරුවන්

පළාත් පාලන ආයතන - ගාල්ල මහනගර සභාව, බෝපේ පොද්දල, අක්මීමන සහ හබරාදුව ප්‍රාදේශීය සභාව

1.2.2. ප්‍රධාන උපදේශාත්මක ආයතන

1. දිස්ත්‍රික් ලේකම් කාර්යාල (ගාල්ල කඩවත් සතර, අක්මීමණ, බෝපේ, පොද්දල, හබරාදුව)
2. දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය
3. ගාලු උරුම පදනම
4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
5. ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය
6. ලංකා විදුලි බල මණ්ඩලය / ලංකා විදුලි පුද්ගලික සමාගම
7. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
8. මාර්ග සංවර්ධන අධිකාරිය
9. මධ්‍යම පරිසර අධිකාරිය
10. සංචාරක සංවර්ධන අධිකාරිය
11. වාරිමාර්ග දෙපාර්තමෙන්තුව
12. වෙරළ සංරක්ෂණ දෙපාර්තමෙන්තුව
13. කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තුමේන්තුව
14. උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය
15. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
16. පළාත් මගී ප්‍රවාහන අධිකාරිය
17. වන ජීවී සංරක්ෂන දෙපාර්තුමේන්තුව
18. ජාතික භෞතික සැලසුම් දෙපාර්තුමේන්තුව
19. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය
20. ශ්‍රී ලංකා පොලීසිය
21. ශ්‍රී ලංකා ටෙලිකොම්
22. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

1.2.3. අනෙකුත් පාර්ශව කණ්ඩායම්

1. වෙළඳ සංගම් (ධීවර, එළවලු)
2. පරිසර සහ මහජන සංවර්ධන සංගම
3. "උකුසු ඇස " මාධ්‍ය ඒකකය- කරාපිටිය
4. මහජන නියෝජිතයින් (පළාත් පාලන මන්ත්‍රීවරුන් / ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් කරාපිටිය සුභද්‍රාරාම මහා විහාර විහාරාධිපති)

1.3. විෂය පථය

මහා ගාල්ල බල ප්‍රදේශය තුළ ගාල්ල මහනගර සභා බල ප්‍රදේශය මෙන්ම බෝපේ පොද්දල, හබරාදුව සහ අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි කොටසක් ඇතුලත් වන අතර හෙක්ටයාර් 7300 පමණ ආවරණය වන අතර 2012 වසර දත්ත අනුව 190,486 පමණ වන ජනගහනයකින් යුක්ත වේ.
උපායමාර්ගික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදේශයේ ගැටළු සහ උපායමාර්ගික ක්‍රියා හඳුනාගතයුතු අතර මේ සඳහා සම්පූර්ණ නාගරික ප්‍රදේශයෙහි වර්තමානයෙහි පවතින තත්ත්වය විශ්ලේෂණනය කිරීම අවශ්‍ය වේ.

සමාජීය, ආර්ථික, පාරසරික සහ භෞතික සාධකයන්හි සංයුක්ත සැලසුම් දෘෂ්ඨිය, මෙම සැලසුම්ක-රණයේදී ආවරණය කරන අතර සෞභාග්‍ය දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජාතික නගරයක් ලෙස හඳුනාගත් ගාල්ල නගරයේ මහා ගාල්ල සංවර්ධන සැලසුම 2021-2031 සඳහා සකස් කර ඇත.
කෙසේ නමුත් ගාල්ල , දිස්ත්‍රික්කයේ විශාලතම නාගරික කේන්ද්‍රස්ථානය වන අතර මෙය දකුණු පළාතෙහි පිහිටි එක් ප්‍රධාන මධ්‍යස්ථානයකි. මෙහි බොහෝ සංවර්ධන විභව ඇතත් ඒවා නිසි පරිදි සංවර්ධන කටයුතු සඳහා යොදා ගෙන නොමැත. මෙම සැලස්මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රදේශයේ සැගවුණු විභවයන් සහ සංවර්ධන ප්‍රවණතා ඉස්මතු කර සංවර්ධනය කිරීම හා ඉඩම් භාවිතය තාර්කිකරණය කිරීමයි. තවද යුනෙස්කෝව විසින් ගාල්ල නගරය ලෝක උරුම නගරයක් ලෙස ලෝක උරුම සම්මේලනයේදී ප්‍රකාශ කිරීම හේතුවෙන් පළාතේ අනෙකුත් නගරවලට වඩා ගාල්ල නගරය සුවිශේෂ වේ. මෙම වැදගත්කම ඒ තුලින් ඇති වන්නාවූ සංචාරක ආකර්ශනය, නගරය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමටත්, නගරය දේශීය විදේශීය සංචාරක ආකර්ශනය සහිත සංචාරක මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට ඉඩ සැලසේ. මෙමගින් ජීවත්වීමට සුදුසු තත්වයන් ඉහළ නැංවීම සහ ලෝක උරුම ලක්ෂණ සංරක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ. මීට අමතරව ප්‍රසිද්ධ හා ඓතිහාසික රුමස්සල කන්ද ප්‍රදේශය සහ අනෙකුත් සංචාරක ආකර්ශනය ඇති ස්ථානද මහා ගාල්ල සැලසුම් ප්‍රදේශය තුළට ඇතුලත් කිරීම ප්‍රධාන සංවර්ධන උපායමාර්ගයක් වේ .
ගාල්ල නගරය විවිධ ආපදා බහුල ප්‍රදේශයක් ලෙස (සුනාමි,ක්ෂණික ජල ගැලීම් සහ නාය යෑම්) සැලැස්මෙහි සංවේදී ස්වභාවික පරිසරය සංරක්ෂණය වන පරිදි සැලසුම්කරණ සහ ගොඩනැගිලි රෙගුලාසි ඇතුලත් කර ආපදා වලින් තොර ආරක්ෂිත නගරයක් සඳහා අවශ්‍ය අවකාශීය ව්‍යුවහය අන්තර්ගත කර ඇත. ජාත්‍යන්තර ප්‍රධාන නාවික මාර්ග හා ගාල්ල පිහිටීම විශේෂයෙන් යුරෝපය, ඉන්දියාව, දකුණු අප්‍රිකා වැනි රටවල් හරහා යන ජාත්‍යන්තර නැව් මාර්ගවලට ඉතා ආසන්න බැවින් (නාවික සැතපුම් 5ක් පමණ ආසන්නව) අනාගතයේදී වරාය හා වරාය පුළුල් කිරීම සඳහා විභවතාවය-ක් ඇති බවට මෙම සැලසුම මඟින් හඳුනාගෙන ඇත.

කෙසේ වුවද නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත මහා ගාල්ල සැලසුම් සීමා කර ඇති ප්‍රදේශය තුළ පළාත් පාලන ආයතන 4 කට අයත් ග්‍රාම නිලධාරි වසම් 55 පවතින අතර මෙම ග්‍රාම නිලධාරි කොට්ඨාශ 55ට පරිබාහිරව ඉදිරි සංවර්ධන ක්‍රියා සඳහා වඩාත් උචිත සහ වඩාත් විභවයක් ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාශ මෙම සංවර්ධන සැලැස්මට ඇතුලත් වී නොමැත. මීට අමතරව මෙම සැලැස්මෙහි සඳහන් උපාය මාර්ගික ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයෝජන ක්‍රම සහ නිර්මාණ විස්තාරත්මකව ඇතුලත් වී නොමැත.

1.4. සැලසුම් ක්‍රියාවලිය

මහා ගාල්ල සඳහා වූ "සංවර්ධන සැලැස්ම" සැකසීමේදී අනුක්‍රමික අදියර තුනකින් ක්‍රියාත්මක වූ අතර ඒවා නම් ආරම්භය, රාමු කිරීම, සැලසුම්කරණය සහ හතරවන අදියරය වනුයේ සැලසුම් ක්‍රියාත්මක කිරීම වේ. මෙම පියවරයන් වෙන් වෙන්ව ගනු ලබන උපදේශ අනුව වටහා ගතයුතු වේ. සංවර්ධන සැලසුම්කරණ ක්‍රියාවලියෙහි අදියර තුන ඇතුලත පියවර දහයක් වේ.


ආරම්භය
පසුබිම් අධ්‍යනය
2017 මැයි මස මුල් භාගයේදී දත්ත එකතු කිරීම ආරම්භ කර ඇත.(ප්‍රාථමික සහ ද්විතික දත්ත ලබාගැනීම සමීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, අන්තර්ජාල, Google සිතියම් හරහා)
අධීක්ෂණය
2017 මැයි මස අග භාගයේදී පවතින තත්ත්වය විශ්ලේෂණය ආරම්භ කිරීම (MS Excel, Arc GIS සහ Google සිතියම් භාවිතයෙන් මූලික විශ්ලේෂණය)
රාමු ගත කිරීම
ගැටළු සහ විභව හඳුනාගැනීම
2017 ජූනි මැද - ප්‍රදේශයේ ඇති ගැටළු සහ විභවයන් පැහැදිලි දෘෂ්ටි කෝණයකින් හඳුනාගැනීම
දැක්ම, අරමුණු සැකසීම
2017 ජූනි අවසානයේදී -නාගරික සංවර්ධන ක්‍රියාකාරකම් සාර්ථක කරගැනීම සඳහා දැක්ම සහ අරමුණු ගොඩනගා ගැනීම(ආර්ථික, සමාජ, භෞතික, පාරිසරික)ඔස්සේ ගැටළු , විභව සහ සංවර්ධන ප්‍රවනතාවයන් සඳහා ප්‍රවේශය
විස්තරාත්මක විශ්ලේෂණය
2017 අගෝස්තු පෙරභාගය - දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා අරමුණු මත පදනම් වූ විස්තරාත්මක විශ්ලේෂණය (ශ.දු.අ.ත. විශ්ලේෂණය ,සංවේදිතා විශ්ලේෂණ, සම්බන්ධක විශ්ලේෂණ, සංවර්ධන පීඩනය)
සැලසුම් සැකසීම
සැලසුම්, උපායමාර්ග සම්පාදනය
2017 නොවැම්බර් පෙරභාගය -දැක්ම සාක්ෂාත් කිරීම සඳහා වූ නාගරික සංවර්ධන ප්‍රායෝගික ක්‍රියාවලිය සඳහා ආර්ථික,සමාජ,භෞතික සහ පාරිසරික සාධක පරිවර්තනය ගැන විස්තීර්ණ විශ්ලේෂණය
රෙගුලාසි
2018 පෙබරවාරි පෙරභාගය- ඉහත සඳහන් සැලසුම් සඳහා සැලසුම් සංස්ථාපිතය සහ නීති සම්පාදනය
එකහත්වය
කෙටුම්පත් කරන ලද සංවර්ධන සැලැස්ම මහජන අදහස් සඳහා ඉදිරිපත් කිරීම. (උනන්දු පාර්ශව දැනුවත් කිරීමේ වැඩසටහන්) සහ පළාත් පාලන ආයතන කැමැත්ත ලබාගැනීම
ඉදිරිපත් කිරීම
අවසන් සංවර්ධන සැලසුම් කෙටුම්පත ප්‍රධාන සැලසුම් කමිටුවට / සංවර්ධන සැලසුම් අංශයට ඉදිරිපත් කිරීම
ක්‍රියාත්මක කිරීම
අනුමැතිය සහ ප්‍රකාශනය කිරීම,
ගැසට් කර ප්‍රසිද්ධ කිරීම

පරිච්ඡේදය 01

සංවර්ධන සැලසුමෙහි පසුබිම

සැලසුම් ක්‍රියාවලිය

1. පසුබිම් අධ්‍යනය

මෙම අදියරයේදී දත්ත රැස්කරන ක්‍රියාවලිය අවසන් කොට ඇත. ප්‍රාථමික දත්ත එකතු කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, සමීක්ෂණ, ඩ්‍රෝන යන්ත්‍ර සමීක්ෂණ, ගූගල් සිතියම්, ලේඛන සහ ක්ෂේත්‍ර පිරික්සුම් යන ක්‍රම භාවිතා කර ඇත. ඉතිහාසගත වාර්තා සමාලෝචනය මගින් විකාශ අධ්‍යනය සහ මීට පෙර සකස්කරන ලද සංවර්ධන වාර්තා විශ්ලේශණය තුලින් ද්විතීක දත්ත එකතු කරගැනීම සිදුකර ඇත.
මෙම අදියරයේදී මහගාල්ල බල ප්‍රදේශය ප්‍රාදේශීය, ජාතික සහ අන්තර් ජාතික මට්ටමේ වැදගත්කම සහ පෙර සකස් කර ඇති සැලසුම් සමඟ සම්බන්ධතාවය හා පරතරය රාමුව තුළ සොයා බැලීම සිදුවේ.

2. විෂය පථය හඳුනා ගැනීම

මහා ගාල්ලෙහි පවතින ආර්ථික, සමාජ, සහ පාරසරික තත්වයන් සඳහා සිතියම් සැකසීමට පෙර පුළුල් දත්ත ගබඩාවක් ස්ථාපනය කරන ලදී. සකස්කරන ලද සිතියම් වලට අමතරව මූලික විශ්ලේෂණය සඳහා Ms Excel, ගූගල් සිතියම්, SPSS සහ ඩ්‍රෝන යන්ත්‍ර පදනම් මෘදුකාංග වැනි මූලික විශ්ලේෂණ මෘදුකාංග භාවිතා කර ඇත.

3. ගැටළු සහ විභව හඳුනාගැනීම

ප්‍රධාන විභව හඳුනාගැනීම සහ රාමුගත කිරීම සහ සැලසුම්කරණ දෘෂ්ඨි කෝණයෙන් ඇතිවූ බාධක ප්‍රථමයෙන්ම හඳුනාගැනීම එකතු කළ දත්ත මත පදනම් විය. පාර්ශව කරුවන්ගේ අදහස්/ඊළඟ පියවර විය. දෙවනුව, අවස්ථා කිහිපයකදී පාර්ශවකරුවන්ගේ උපදේශන සැසිවාර ගණනාවක් පැවැත්වීම මගින් ගැටළු සහ විභව හඳුනාගත හැකි විය. තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ මහජනතාව හා පළාත් පාලන ආයතන සෘජුව සම්බන්ධ වන විට, ඔවුන්ගේ අදහස් හා යෝජනා සැලසුම් කරන ක්‍රියාවලියේ මුල් අවදියේදී ලබා ගන්නා ලදී. මෙය සැලසුම් ක්‍රියාවලිය පහසු කිරීම සඳහා හේතු වූ අතර, ක්‍රියාවලිය ප්‍රමාද නොවී උපරිම සහ ධනාත්මක ප්‍රතිඵල බලාපොරොත්තු විය හැක. එබැවින් සංවර්ධන සැලස්මහි ආරම්භ අදියර අවස්ථාවේදී සහ ක්‍රියාවලිය පුරාවටම අදාල පාර්ශවයන් සඳහා වූ වැඩසටහන් 4 ක් 2017 වසර ජුනි 06, 13 සහ 22 දිනයන්ද මැයි මස 28 වන දිනද නාගරික සංවර්ධන අධිකාරියෙ කාර්යාල පරිශ්‍රයේදී පැවතිනි. මෙම වැඩසටහන ප්‍රධාන උපදේශාත්මක ආයතන සහ අනෙකුත් පාර්ශව කණ්ඩායම්, අධිකාරියේ සැලසුම් කණ්ඩායම සමග සහභාගිවුහ.

මෙම අදියරයහි අවසන් ප්‍රතිපල වූයේ ගැටළු සහ විභවතාවයන් හඳුනා ගැනීමයි. මෙය පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය මත සහ සැලසුම්කරණ ක්‍රියාවලියේ ප්‍රමුඛත්වය අනුව සකසා අවසන් කරන ලදී.

4. දැක්ම සහ අරමුණු සැකසීම

සංවර්ධන සැලැස්මේ දැක්ම හා අරමුණු සාක්ෂාත් කරගැනීමට ප්‍රධාන ප්‍රවේශ 03 ක් හඳුනා ගන්නා ලදී. පළමු ප්‍රවේශය වන්නේ ගැටළු සහ විභවයන් හඳුනා ගැනීම වේ. මෙය මූලික විශ්ලේෂණයන් තුලින් රජයේ ප්‍රතිපත්ති, මහා පරිමාණ ව්‍යාපෘති, සංවර්ධන ප්‍රවනතා හා අදාල පාර්ශවයන් සමඟ පැවති උපදේශාත්මක වැඩසටහන්හි ප්‍රතිපල විශ්ලේෂණය සලකන ලද අනෙකුත් ප්‍රවේශයන් වේ.

5. විස්තරාත්මක විශ්ලේෂණය

විශ්ලේෂණ අවස්ථාවෙහි දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා අරමුණු මත පදනම්වූ විවිධ විශ්ලේෂණ ක්‍රම අනුගමනය කර ඇත. ප්‍රබල විශ්ලේෂණ ක්‍රමයක් ලෙස ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශේලේෂණය දැක්විය හැක. සංවර්ධනය සිදුකිරීමේදී මුහුණ දෙන ශක්තීන්, දුර්වලතා, අවස්ථා, සහ තර්ජන යන කරුණු විස්තර කෙරෙන අතර ඒවා මෙම අදියරහිදී සලකා බලා ඇත. මීට අමතරව අනෙකුත් විශ්ලේෂණ ක්‍රමවන සංවේදිතා විශ්ලේෂණ, සම්බන්ධක විශ්ලේෂණ, සංවර්ධන පීඩනය, අවකාශ ඒකාබද්ධතාවය සහ යෝග්‍යතා විශ්ලේෂණය වැනි විශ්ලේෂණ ක්‍රම සංවර්ධනය සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීමට භාවිතා කර ඇත. අනාගත මහා ගාල්ල සංවර්ධන සැලැස්ම සඳහා සුදුසු ඉඩම් අවකාශයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම මෙම අදියර යටතේ සිදුවී ඇත. එබැවින් මෙම අදියරයහි ක්‍රියාකාරකම් සක්‍රීය කොට කලාපය තුළ වර්තමානයේ පවතින සංවර්ධන ප්‍රවණතා හඳුනාගැනීම සහ එවන් සංවර්ධන ප්‍රවණතා සැලසුම් කිරීමේදී පවත්නා පරතරයන් සොයාගැනීම සිදුවිය.

6. සැලැස්ම

ආර්ථික, සමාජ, භෞතික සහ පාරිසරික යන අංශයන්හි විස්තරාත්මක විශ්ලේෂණය තුලින් සොයාගත් තොරතුරු සහ සාධක නාගරික සංවර්ධන ප්‍රායෝගික ක්‍රියාවලියට පරිවර්තනය කිරීමෙන් දැක්ම සාක්ෂාත් කරගත හැක. ප්‍රධාන අරමුණු 6ක් ආවරණය කිරීම සඳහා උපාය මාර්ග/ ප්‍රධාන තේමාවන් 6ක් සැලසුම කරන ලදී. ඉන්පසුව සංවර්ධන සැලැස්මෙහි උපාය මාර්ග සැකසීමේ අදියරේදී වඩාත් පුළුල් ව්‍යාපෘති හඳුනාගෙන තිබේ.

7. රෙගුලාසි

ඉහත සඳහන් සැලසුම් සඳහා සැලසුම්කිරීමේ සහ ගොඩනැගිලි රෙගුලාසි ස්ථාපනය මෙම අදියර යටතේ සිදු කර ඇත. මායිම් සහිතව කලාපීය රෙගුලාසි, සැලසුම්කරණ සහ ගොඩනැගිලි රෙගුලාසි, පොදු රෙගුලාසි, ලෝක උරුමයක් වන ගාල්ල කොටුව සඳහා විශේෂ රෙගුලාසි සහ දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහා වූ විශේෂ රෙගුලාසි, රූමස්සල කලාපය සංරක්ෂනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සැලස්ම සහ ගාලු කොටුව සංරක්ෂණය කිරීම සඳහා වූ රෙගුලාසි මහා ගාල්ල සීමාව තුළ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු විශේෂ ස්ථාන සඳහා රෙගුලාසි සැකසීම කරන ලදී.

8. එකඟත්වය ලබාගැනීම

පළාත් පාලන ආයතන එකගත්වය සහ මහජන අදහස් (පාර්ශව දැනුවත් කිරීමේ වැඩසටහන්) ලබාගැනීම සඳහා සකස් කරන ලද සංවර්ධන සැලසුම් කෙටුම්පත ඉදිරිපත් කළ යුතුවේ. නාගරික සංවර්ධන අධිකාරියහි වෘත්තිකයන් විසින් සැලැස්ම සම්බන්ධ අදහස් හා යෝජනා ප්‍රකාශ කිරීම සිදුවේ.

9. ඉදිරිපත් කිරීම

අවසන් සංවර්ධන සැලසුම් කෙටුම්පත ප්‍රධාන සැලසුම් කමිටුව/ සංවර්ධන සැලසුම් ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුවේ. සංවර්ධන සැලසුම් අවසන් කෙටුම්පතෙහි දෘඩ පිටපත් සහ මෘදු පිටපත් සහ භූ දත්ත සමූහය ප්‍රධාන සැලසුම් කමිටුවෙහි අනුමැතිය ලබාගැනීමේ ඉදිරි ක්‍රියවලිය වෙනුවෙන් ලබාදිය යුතුවේ.

දෙවන
පරිච්ඡේදය

පූර්ව සමීක්ෂණය

පරිච්ඡේදය 02

2.1. අධ්‍යයන බල ප්‍රදේශය

පූර්ව සමීක්ෂණය

අධ්‍යයන බල ප්‍රදේශය

ගාල්ල යනු කොළඹ සිට කි.මී 116 එපිටින් ශ්‍රී ලංකාවේ දකුණු පළාත් වෙරළ තීරයේ පිහිටි වෙරළ බඩ නගරයකි. මෙම නගරය තෙත් කලාපයට අයත් අතර මි.මී.2377.9 ක වාර්ෂික වර්ෂාපතනයක් නිරිත දිග මෝසමින් ලැබේ. සෙල්සියස් අංශක 26.7 ක උෂ්ණත්වයක් හා 80 - 88% ක ආර්ද්‍රතාවක් වාර්ෂිකව පවතී. නගරය තුළ අඩි 60 -160 උන්නතාංශය යුත් හුදකලා වූ කඳු හිහිපයක් පිහිටා ඇත. බොහෝ පෙදෙස් වල වගුරු බිම් හා ජලාශ පිහිටා ඇති අතර සමහර ප්‍රදේශ වල පහත් බිම් දක්නට ලැබේ.

මෙම සංවර්ධන සැලැස්මේ වැදගත්ම යෝජනා වලින් එකක් වනුයේ නාගරික ක්‍රියාකාරකම් විස්තෘත වීම නිසා සහ සැලසුම්කරණයේදී මතුවන ගැටළු සඳහා විසඳුමක් ලෙස නගර සීමාව පුළුල් කිරීමය. එබැවින් "මහා ගාල්ල" ප්‍රදේශය තුළට ගාල්ල මහ නගර සභා ප්‍රදේශය, බෝපේ - පොද්දල ප්‍රාදේශීය සභා ප්‍රදේශය, හබරාදුව සහ අක්මීමණ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ කොටසක් ඇතුලත් වේ. (සිතියම් අංක 2:1)
මහ ගාල්ලෙහි ආයතනික ප්‍රදේශය හෙක්ටෙයාර 7302 ආවරණය වන අතර එය තුළ හෙක්ටයාර 1852 ක ගාල්ල මහනගර සභා ප්‍රදේශය ඇතුළත්ව ග්‍රාම නිලධාරී වසම් 55ක් වේ. 2012 වසර සංගණන දත්ත අනුව මෙහි මුළු ජනගහනය 190,486 ක් පමණ වන අතර ජනගහන වර්ධන සාමාන්‍ය වේගය 0.7% ක් පමණවේ. ජාතික දත්ත අනුව දළ ජනගහන ඝනත්වය හෙක්ටයාරයකට පුද්ගලයින් 26.08 ඇතුලත් වේ.

භූ ගෝලීය වශයෙන් ගත් කල සම්පූර්ණ ප්‍රදේශයම තෙත් කලාපයට අයත්වේ.සම්පූර්ණ භූමි ප්‍රදේශය සැලකීමේදී 38% පමණ වන විශාල කොටසක් ගොඩනැගිලි ඉදිකිරීම සහිත භූමි ප්‍රදේශයක් වන අතර ඉතිරි භූමි ප්‍රදේශය වන රක්ෂිතයන්, කෘෂිකාර්මික වැවිලි, අභ්‍යන්තර ජල මූලාශ්‍ර පවතින අතර නීලහරිත විවිධත්-වයෙන් පොහොසත්වේ.

දකුණු පළාතෙහි පරිපාලනමය අගනගරය ගාල්ල වන අතර ජනගහන ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාවේ හතරවන විශාලතම මහ නගරය වන ගාල්ල නගරයට සෑම ප්‍රදේශයකින්ම සැලකිය යුතු ජනතාවක් පැමිණේ. ප්‍රාදේශීය පරිපාලනය හා බැඳුණු ක්‍රියකාරකම් ඉටුකරන ආයතන ලෙස කරාපිටිය ශික්ෂණ රෝහල, රුහුණු විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨය, නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය, දකුණු පළාත් අණදෙන නිළධාරී මුලස්ථානය, ගැමුණු බලකාය, ලංකා විදුලිබල මණ්ඩලය, අධ්‍යාපන දෙපාර්තුමේන්තුව, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, මගී ප්‍රවාහන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය වැනි ආයතන දැක්විය හැක.

සිතියම 2.1 මහ ගාල්ල සැලසුම් ප්‍රදේශය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය 2:1 මහ ගාල්ල ප්‍රදේශයෙහි නීල හරිත පද්ධතිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල-2020

නගරය අධ්‍යාපන කාර්ය සම්බන්ධ වැඩි කාර්යභාරයක් ඉෂ්ට කරයි. තාක්ෂණික විද්‍යාලයක්, ප්‍රධාන පෙළේ පාසල් 9 ක් සහ ජාත්‍යන්තර පාසල් 3ක් ගාල්ල නගර සීමාව තුළ පිහිටා ඇත. රුහුණු විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨය නගර සීමාවට යාබදව පිහිටුවා ඇත. රුහුණු විශ්ව විද්‍යාල ඉංජිනේරු පීඨය හපුගල ද විවෘත විශ්ව විද්‍යාලය ලබුදූව ද ජාතික තාක්ෂණික ඩිප්ලෝමා ආයතනය වැනි ආයතන පිහිටා ඇති අතර මේවායෙහි විශේෂ කාර්යන් ප්‍රාදේශීය මට්ටම මෙන්ම ජාතික මට්ටමට ක්‍රියාත්මක වේ.

ඒ අනුව සාමාන්‍ය අගයක් ලෙස 125,000 පමණ ජනයා නගරය වෙත මෙම සේවාවන් ලබා ගැනීමට පැමිණෙන අතර කොළඹ මාර්ග (A2) ප්‍රවේශය හරහා මෙන්ම ප්‍රදේශය තුළ විහිදී ඇති අනෙක් ප්‍රදේශ තුළට ගමන්කරන අනෙකුත් A සහ B කාණ්ඩයේ මාර්ග හරහා ප්‍රවේශ වේ. මීට අමතරව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතන මගින් නඩත්තු කරනු ලබන ද්විතීක සහ තෘතීය ශක්තිමත් මාර්ග ජාලයක් මහා ගාල්ල බල ප්‍රදේශය සතුවේ. කෙසේ නමුදු සංවර්ධනයේ මතුවෙන ප්‍රවනතා සහ ජනාවාස ව්‍යාප්තිය සහ ප්‍රාදේශීය නාගරික ක්‍රියාකාරකම් සඳහා සරිලන ලෙස මාර්ග යටිතල පහසුකම් දියණු විය යුතු අතර රථ වාහන ගාල් කිරීමට ඉඩකඩ සහ රථ වාහන ගමනා ගමනය වැනි දෑ විධිමත් විය යුතුය. මෙය අනාගත ඉල්ලුම සහ සංවර්ධන ප්‍රවණතා සඳහා මුහුණ දියහැකි අයුරින් සිදු විය .

රූපය 2:1:1 ගාල්ල හි අන්තර් හා අභ්‍යන්තර සම්බන්ධතා

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල-2020

නගරයෙහි ආර්ථිකය සැලකීමේදී සංචාරක ව්‍යාපාරය ප්‍රධාන භූමිකාවක් ගනු ලැබේ. සෑම වසරකම පාහේ දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් දහස් ගණනක් ගාල්ලට ආකර්ශනය වනුයේ ඉතා හොඳ මට්ටමක සංරක්ෂණය වී පවතින ඓතිහාසික ලක්ෂණ පවතින එමෙන්ම 18 සහ 19 වන සියවසට අයත් ඕලන්ද සහ බ්‍රිතාන්‍ය ගෘහ නිර්මාණ ශිල්ප වලින් ගහණ වූ ගාල්ල කොටුව නිරීක්ෂණය කිරීමටය. ඕලන්ද කොටුව පමණක් නොව රූමස්සල කඳු පන්තිය, උණවටුන වෙරළ තීරය වැනි තවත් සංචාරක ආකර්ෂණය දිනාගත් ස්ථාන බොහොමයක් ගාල්ල අවට පවතී. මීට අමතරව ශ්‍රජයඑ යාත්‍රා (සුඛෝපබෝගී බෝට්ටු) සඳහා සුඛෝපභෝගී පහසුකම් සහිත ලොව ප්‍රසිද්ධ ස්වභාවික වරාය ගාල්ල සතුවේ. නගරය තුළ පවතින මෙවන් අවස්ථාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා නගරය තුල හොඳ සහ ප්‍රමාණවත් විභවයන් පවතී. නමුත් මෙය තවමත් එකිනනෙක ඒකාබද්ධ වී නොමැත.

භූ ගෝලීය ලෙස ගත් කල ගාල්ල මුහුදු බඩ නගරයකි. ගාල්ල ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධියක් උසුලන අතර ජාතික මත්ස්‍ය නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. රටෙහි ධීවර කරමාන්තයේ යෙදෙන දිස්ත්‍රික් 15න් දෙවන ස්ථානයට මත්ස්‍ය සැපයුම ලබාදෙන ගාල්ල නගරය වසරකට මෙට්‍රික් ටොන් 50000 කට වැඩි මත්ස්‍ය සැපයුමක් ලබාදේ. තවද මෙම සම්පත් උපරිමයෙන් උපයෝගී කරගත හැකි අතර සංචාරක කර්මාන්තය සහ යටිතල පහසුකම් වැනි නව අංශ සමඟ නවෝත්පාදනය කළ හැකිය.

2.2. සැලසුම් සහ පසුබිම තත්ත්ව

2.2.1 ජාතික සහ ප්‍රාදේශීය සම්බන්ධතා

කොළඹ - හම්බන්තොට අධිවේගී මාර්ගය මෙන්ම කොළඹ - මාතර දුම්රිය මාර්ගය සමඟ ගාල්ල නගරය මනා ලෙස සම්බන්ධ වී ඇත. අධිවේගී මාර්ගය මගින් උතුරු දෙසින් ශ්‍රී ලංකාවේ අගනගරය සමඟ සම්බන්ධ වන අතරම නගරයේ නැගෙනහිරින් අධිවේගී මාර්ගය හරහා හම්බන්තොට හා සම්බන්ධ වේ. ගාල්ල නගරය ගාල්ල-දෙනියාය මාර්ගය හරහා මෙන්ම ද්විතික මාර්ග ජාල වන ගාල්ල-බද්දේගම සහ ගාල්ල - වදුරඹ මාර්ග හරහා ගම්බද ප්‍රදේශ හා සම්බන්ධ වන අතර මෙම සම්බන්ධතා නගරයේ සංවර්ධනය වේගවත් කිරීමට හේතුදායක වේ

රූපය: 2:2:1 ගාල්ලෙහි ජාතික සහ ප්‍රාදේශීය සම්බන්ධකම්

මූලාශ්‍රය :ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව -2016

ප්‍රාදේශීය මට්ටමේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ අධිවේගී මාර්ග සහ දුම්රිය මාර්ග වලට අමතරව සමුද්‍රීය ප්‍රවාහනය ගාල්ල වරායේ සිට ක්‍රියාකාරකම්හි යෙදෙන අතර ගාලුවරාය ජාත්‍යන්තර මුහුදු මාර්ග ආසන්නව පිහිටා ඇත.

පින්නදුවේ පිහිටා ඇති දක්ෂිණ අධිවේගී මාර්ග හුවමාරු මධ්‍යස්ථානය වරාය කේන්ද්‍ර කරමින් සංවර්ධන ප්‍රවණතාවය ගාලු කොටුව සංචාරක මධ්‍යස්ථානයක් මෙන්ම ලෝක උරුම සංචාරක මධ්‍යස්ථානයක් ලෙසද ගාල්ල නගරය පුළුල් වූ භූමිකාවක ක්‍රියා කරන අතර නගර මධ්‍යස්ථය ක්‍රියාකාරකම් වලින් සපිරි ක්‍රියාකාරී නගරයක් වේ. ගාල්ල නගරයේ සිට කිලෝ මීටර 8ක් එපිටින් කොග්ගලහි පිහිටි අභ්‍යන්තර ගුවන් සේවාව හරහා ගුවන් ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ වීමද සිදුවේ.

2. 2. 2. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය 2030

1997දී ජනාධිපති කාර්ය සාධක බලකාය නිර්දේශ කර ඇත්තේ නිවාස හා නාගරික සංවර්ධනය සඳහා ජාතික අවකාශ සැලැස්මක් ශ්‍රී ලංකාව සඳහා තිබිය යුතු බවය. ඉන්පසුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තුමේන්තුව, වසර 2000 දී පනත් අංක 49 නගර සහ ග්‍රාම සැලසුම් කිරීමේ (සංශෝධිත) පනත යටතේ ජාතික භෞතික සැලැස්මක් නිර්මාණයට සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් පිහිටුවා ඇත. ජාතික භෞතික සැලැස්ම සකසා ඇත්තේ විවිධ වූ විෂය ක්ෂේත්‍රයන්හි විශේෂඥයන් සහ රජයේ නිළධාරීන්ගේ එකතුවකිනි. මෙම උපායමාර්ගික ලේඛනය ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධන සඳහා වූ රාමුව ඉදිරිපත් කරයි. තවදුරටත්, 2030 වසරේදී ශ්‍රී ලංකාව සඳහා වන දැක්ම සහ දැක්ම සාක්ෂාත් කරගැනීමට සහාය වන අරමුණු මෙම ලේඛනය මගින් පිළිබිඹු වේ.

රූපය: 2.2-2 ජාතික භෞතික සැලසුම් කිරීමේ ප්‍රතිපත්තිය මගින් යෝජනා කළ අවකාශීය ව්‍යුහයන්



මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, 2016

වසර 2030 දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 25ක් පමණ වන බව ඇස්තමේන්තු කර ඇති අතර එවන් ජනගහනයකට සරිලන ලෙස නව නගර සංවර්ධනය විය යුතුය. මෙය සංවේදී ප්‍රදේශ හා සංරක්ෂණ ප්‍රදේශ සංරක්ෂණය කරමින් සැලසුම් කළ යුතුවේ. ඉහත ඇස්තමේන්තු ජනගහනය සඳහා පහසුකම් සැපයීමට හැකි පරිදි ජනවාස සැලැස්ම යෝජනා වී ඇත. දිස්ත්‍රික්කයේ අගනගරය ලෙස ගාල්ල නගරය 300,000 පමණ වන ජනගහනයකට සහ නගරයට ආසන්නව මුළු ජනගහන මිලියන 25න් 600,000ක් පමණ ජීවත් වනු ඇත. ගුවන් හරහා සහ මුහුද හරහා ගමනාගමන පහසුකම් සැපයීමට අන්තර්ජාතික වශයෙන් ද විභවතාවයක් ඇති බැවින්, ගාලු වරාය ද්විතීයික හෝ සේවා වරායක් ලෙස සංවර්ධනය කිරීමට අවස්ථාවක් තිබේ. ඊට අමතරව මෙම සැලැස්ම සංචාරක සංවර්ධනය සඳහා කොග්ගල, උණවටුන, වැලිගම සහ මිරිස්ස වැනි ගාල්ල හා යාබද නාගරික ප්‍රදේශයන්හි විභවතාවන් හඳුනා ගෙන ඇත.

1. සමුද්‍රය පදනම් කරගත් සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම, හික්කඩුව, ගාල්ල, උණවටුන සහ කොග්ගල
2. ගාල්ල වරාය සංචාරක කර්මාන්තය සඳහා ගැළපෙන අයුරින් කලාපීය සමුද්‍ර වරායක් ලෙස පුළුල් කිරීම.
3. ප්‍රජාවන්හි ජීවනෝපාය වැඩිවන අයුරින් සහ ආර්ථිකය දියුණුවන අයුරින් ගාල්ල,මිරිස්ස, දොඩන්දුව සහ හික්කඩුව ධීවර වරායන් ප්‍රතිසංවර්ධනය කිරීම.
4. සීනිගම සිට දොඩන්දුව දක්වා මුහුදු තීරයේ මුහුදුකෑම් නැවත්වීමට වෙරළ කළමනාකරණ සැලැස්ම අනුව හදුනාගත් ක්‍රියාකාරකම ක්‍රියාත්මක කිරීම.

2. 2. 3. පෙර සැලසුම්කරණ උත්සාහයන්

2.2.3.1. ගාලු නගර සීමාවේ උපායමාර්ගික සංවර්ධන සැලසුම 2030

රූපය 2.2.3-1 : ගාලු නගර කලාපීය උපායමාර්ගික සංවර්ධන සැලසුම 2030



මූලාශ්‍රය : ගාල්ල උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යපෘතිය,2016

මොරටුව විශවවිද්‍යාලයේ විශ්වවිද්‍යාල උපදේශක සේවා ආයතනය (Uni -Consultancy Service) විසින් නාගරික සංවර්ධන අධිකාරියේ ඉල්ලීම පරිදි මෙම සැලසුම සකස් කර ඇත.
මෙම සැලැස්ම හරහා හික්කඩුව සහ වැලිගම ඇතුළු ගාල්ල නගර සභා ප්‍රදේශය ආවරණය වේ. ඒ අනුව උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය මගින්(SCDP) ගාලු නගරයෙහි මාර්ග තදබදය අඩු කිරීම, නාගරික සේවා සහ ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීම හා නගරයේ ලෝක උරුමය තිරසාර කිරීම යන මූලික කරුණු සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කෙරේ.

1. ජීවන තත්වය ඉහළ නැංවීම සහ ලෝක උරුම නගරයහි තත්වය ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම සඳහා යටිතල පහසුකම් සහ අනෙකුත් නාගරික සේවා වැඩි දියුණු කිරීම
2. නාගරික කටයුතු වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
3. සංවේදී ස්වභාවික පරිසරයන් සංරක්ෂණය කර නගරය තුළ අවකාශීය ව්‍යුහයට ඒවා ඒකාබද්ධ කිරීම
4. රථවාහන තදබදය සහ ආපදා අවදානම අවම කිරීම, නගරයෙහි උරුමය සංරක්ෂණය කිරීම හා ජීවන හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා එහි අනාගත සංවර්ධන මඟ පෙන්වීම හා කළමනාකරණය කිරීම සඳහා නගරයේ අවකාශ ව්‍යුහය සංවිධානය කිරීම.

රූපය 2.2.3-1 : ගාලු නගර කලාපීය උපායමාර්ගික සංවර්ධන සැලසුම 2030



මූලාශ්‍රය - ***ADV*** උපදේශකයින් විසින් සකස් කරන ලද සැලසුම,2008

2.2.3.2 ADV උපදේශකයින් විසින් සකස් කරන ලද ගාල්ල සංවර්ධන සැලසුම

2004 සුනාමි ව්‍යසනයෙන් ඉක්බිතිව ගාලු නගරය සඳහා ADV උපදේශකයින් විසින් සැලසුමක් සකස් කරන ලදී. මෙම සැලැස්ම අවධානය යොමු කරන ලද්දේ පහත සඳහන් කරුණු දෙක මතය

1. කෘෂිකාර්මික සහ අපනයන අංශය හා බැඳී සේවා සංවර්ධනය
2. සංචාරක කර්මාන්ත සංවර්ධනය

තවදුරටත්, මෙම සැලැස්ම මඟින් අධ්‍යාපනය හා ගමනාගමනය හා සම්බන්ධ කොරිඩෝවක් ලෙස ආර්ථිකය සංවර්ධනය කිරීමට ඇති හැකියාව පිළිබඳව අවධාරණය කර ඇත

2.2.3.3.ගාල්ල සංවර්ධන සැලසුම (2008-2025)

2008 - 2025 ගාල්ල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා (ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශය) නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද සංවර්ධන සැලසුම 2009.06.05 දිනැති විශේෂ ගැසට් නිවේදනය 1604/29 මගින් ප්‍රකාශයට පත් කරන ලදී. ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ඕනෑම සංවර්ධන සැලසුම් කිරීමේ කාර්යයන් සඳහා නීත්‍යානුකූල පදනම මෙය වේ. කලාපීකරණ සැලැස්ම මඟින් විස්තරකර ඇති අවසර දිය හැකි භාවිතයන් අදාල කලාපවල සංවර්ධන කටයුතු සඳහා භාවිතා කළ හැක.
මෙම සැලසුමෙහි අරමුණ වූයේ ඉඩම් සහ අනෙකුත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම හා ඒ තුලින් නාගරික සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා ආර්ථිකය විවිධාංගීකරණය කිරීම තුළින් නගර ආර්ථිකය ශක්තිමත් කිරීමයි.

උරුමයන් සංරක්ෂණය කිරීම සංචාරක ක්ෂේත්‍රයෙහි ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම, ස්වාභාවික ආපදා අවම කිරීම සඳහා ස්වභාවික පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම සහ කලාපීකරණය කිරීම හා රෙගුලාසි තුළින් සැලසුම්ගත සංවර්ධනයක් ළඟා කරගැනීම බලාපොරොත්තුවේ.

කෙසේ වෙතත් මෙම සැලසුමට ඇතුළත් වූ රෙගුලාසි, ඓතිහාසික ක්‍රියාවලියෙන් පැන නගින ස්ථානගත විශේෂ ගැටලු විසඳීමට ප්‍රමාණවත් නොවන අතර ආවේණික ලක්ෂණ සහ ප්‍රදේශයේ පාරසරික තත්ත්වය ප්‍රමාණවත් ලෙස සාකච්ඡා නොවන අතර , ස්වභාවික විපත් සඳහා අවධානමක් පැවතුනද මෙම සැලස්ම හරහා මේ පිළිබඳව යම් ප්‍රමාණයක් පමණක් සලකා ඇත.

ඒ අනුව, දැනට පවතින සැලසුම්, යෝජිත සහ දැනට ක්‍රියාත්මක සැලසුම් සමාලෝචනය තුළින් තේරුම් ගත හැකි වන්නේ මෙම සියලු සැලසුම්හි පැනනගින ගැටළු සාකච්ඡා සඳහා ප්‍රමාණවත් පරාසයක් නොප-වතින බවය.

සංවර්ධනයේ වෙනස්වන ප්‍රවණතා සමඟ පුළුල් සැලැස්මක අවශ්‍යතාවය සඳහා විසඳුම ඒකාබද්ධ ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් කරණයට යොමුවීමය. බොහෝ සැලසුම් යල්පැන ගිය සැලසුම් ලෙස පෙනී යන අතර මෙම සැලසුම් මූල්‍ය හා අනෙකුත් සම්පත් පවතින අයුරින් සකස් විය යුතු මෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගය, නව දුම්රිය මාර්ග ජාලය වැනි ප්‍රදේශයේ සිදුවන වෙනස්වීම් ප්‍රවණතා සලකාද සැලසුම් සකස් වියයුතුය.

රූපය 2.2.3:3 නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද ගාල්ල සංවර්ධන සැලසුම (2008-2025)



මූලාශ්‍රය : ගාල්ල නාගරික සංවර්ධන අධිකාරිය -නගර සංවර්ධන සැලසුම (2008-2025)

රූපය ***2.2.4*** :නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද ගාල්ල සංවර්ධන සැලැස්ම



මූලාශ්‍රය : ගාල්ල නාගරික සංවර්ධන අධිකාරිය -නගර සංවර්ධන සැලැස්ම (2008-2025)

2.2.4. සීමා මායිම් සැලසුම් කිරීම

ප්‍රදේශයේ සීමා මායිම් සැලසුම් කිරීම පහත කරුණු මත පදනම් වේ :

2.2.4.1 ක්‍රියාකාරී ප්‍රදේශය

පසුගිය වසර විස්සක කාල සීමාව තුළ ගාල්ල ක්‍රියාකාරී ප්‍රදේශය ලෙස සලකා ඇත්තේ ගාලු□ නගරය නාගරික ක්‍රියාකාරකම් මධ්‍යස්ථානය එනම්, මධ්‍යම ප්‍රමාණයේ වෙළඳ, ප්‍රාථමික සොබ්‍ය සහ අධ්‍යාපන සේවාව පරිපාලන කටයුතු සහ ප්‍රවාහන සේවා වැනි නාගරික ක්‍රියාකාරකම් සඳහා ආකර්ශනය වන ප්‍රදේශය වේ. මෙම ක්‍රියාකාරි ප්‍රදේශයේ සීමාවන් මහජන උපදේශන සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ හරහා හඳුනාගෙන ඇත.

2.2.4.2 භූ ගෝලීය ප්‍රදේශය

භූ ගෝලීය ප්‍රදේශය ලෙස හඳුන්වනුයේ ඉදිකිරීම් කලාප (මිනිස් ජනාවාස) සමඟ සංකේන්ද්‍රණය වී ඇති භූ විද්‍යාත්මක ලක්ෂණ, වෘක්ෂලතා පද්ධති සහ ජල පද්ධති හා ජල පෝෂක ප්‍රදේශ වේ. දක්ෂිණ අධිවේගී මාර්ගය වැනි භෞතික සීමාවන් භූ ගෝලීය ප්‍රදේශය තීරණය කිරීමට යොදා ගෙන ඇත.

2.2.4.3 පරිපාලනමය ප්‍රදේශය

2005 වසර දෙසැම්බර් මස 01 වන දින නිකුත්කරන ලද අංක 1421/29 දරණ ගැසට් පත්‍රයෙන් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති පරිපාලනමය ප්‍රදේශය හැඳින්වීම සඳහා ක්‍රියාකාරි ප්‍රදේශය සහ භූගෝලීය පිහිටීම් සලකා ඇති අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සීමාවන් හඳුනාගෙන ඇත. එබැවින් ප්‍රකාශිත සම්පූර්ණ ප්‍රදේශය තුළ ග්‍රාම නිළධාරි වසම් 55 ක් ගාල්ල මහනගර සභාව, බෝපේ-පොද්දල, අක්මීමණ සහ හබරාදුව යන ප්‍රාදේශීය සභා ප්‍රදේශයන් ඇතුලත් වේ (යොමුව ඇමුණුම් අංක 01)

ක්‍රියාකාරී ප්‍රදේශය සහ භූ ගෝලීය ප්‍රදේශය පරිපාලනමය ප්‍රදේශය සමඟ අතිච්චාදන වේ. එබැවින් පහසුව තකා සමාජ ජනගහන, ආර්ථික තොරතුරු සහ ව්‍යාපෘති ප්‍රදේශ හැඳින්වීම සඳහා, පරිපාලනමය ප්‍රදේශය අධ්‍යයන සහ සැලසුම්කරණ සීමාව ලෙස හඳුනාගෙන ඇත.

තුන්වන
පරිච්ඡේදය

සංවර්ධන
සැලසුමක
අවශ්‍යතාවය

පරිච්ඡේදය 03

සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය

3.1 සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය

මහා ගාල්ල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මතුකිරීමට හේතුවූ කරුණු කිහිපයක් ඇති අතර ඒවා පහත පරිදි වේ.

(A) • පවතින සැලසුම ගාල්ල මහනගර සීමාවට පමණක් වීම

ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශය සඳහා පවත්නා සැලැස්ම සීමා වුවද නාගරික ක්‍රියාකාරකම් නගර මධ්‍ය සිට පර්යන්තය තුළට ගමන් කරන ප්‍රවනතාවයක් පවතී. මෙය ප්‍රධාන වශයෙන් නගරය අවධිමත් බවත් කරා ගෙන යන අතර, සංවේදී පරිසරයට තර්ජනයක් වේ. ආර්ථිකමය දෘෂ්ඨි කෝණයකින් නිරීක්ෂණයේදී, මෙම වාතාවරණය අඛණ්ඩව පැවතීමෙන් ගාල්ල තුළ ආයෝජන කිරීමට කැමැත්තෙන් සිටි ආයෝජකයන්ට තරමක පැකිලීමක් ඇති වී ඇත.(සිතියම 2.2.3-1 හා සිතියම 2.2.3-1 පරිශීලනය කරන්න)

(B) • සංවර්ධන ප්‍රවණතාවෙහි වෙනස් වීම

*ගාල්ල වරාය

මෙම වරාය ක්‍රිස්තු පූර්ව සිට භාවිතා වී ඇති අතර 12 වන සියවසේ සිට මෙහි වැදගත්කම ඉහළ ගොස් ඇත. 14 වන සියවසේදී ගාලු වරාය රට තුළ පිහිටි ඉතා වැදගත් වරායක් වූ අතර මෙම තත්ත්වය කෘතීම වරායක් ලෙස කොළඹ ගොඩනගන තෙක් එනම් 1873 තෙක් පැවතිනි.

රූපය 3:1: ගාල්ල වරාය 1800 කාල පරිච්ඡේදයේ සහ අද

මූලාශ්‍රය: *Lankapura.com,* වෙබ් අඩවිය,2016

ලංකාවට පැමිණෙන මුළු විදේශීය සංචාරකයන්ගෙන්, සංචාරකයන් 1.1.% - 1.4% ප්‍රමාණයක් ගාල්ල වරාය හරහා එන අතර කොළඹ වරාය හරහා පැමිණෙන්නේ 0.3% ප්‍රමාණයකි. (ඉතිරි සංචාරකයින් ගුවන්තොටුපොළ හරහා ලංකාවට පැමිණේ) තවද මෙම වරාය ජාත්‍යන්තරය හදුනාගෙන ඇත්තේ ඉන්දියානු සාගරයට සහ ආසියානු වෙළඳපොළට කෘෘස් නැව්ගත කිරීමේ වරායක් ලෙස ස්ථාපනයට සුදුසු වරායක් ලෙසය.

හම්බන්තොට වරාය ඉදිකිරීමෙන් පසු ගාල්ල වරාය "සමුද්‍ර වරායක්" ලෙස පරිවර්තනය වූ ගාලු වරාය සංචාරක යාත්‍රා (Yacht) සඳහා පහසුකම් සපයන ශ්‍රී ලංකාවේ පිහිටි එකම වරාය වේ. එසේම ජාත්‍ය-න්තර සංචාරක යාත්‍රා සංගමය (International Yacht Society) විසින් ගාල්ල වරාය හදුන්වනුයේ ලොව ආකර්ෂණීයම වරාය වලින් එකක් ලෙසය. මෙම යාත්‍රා වල පැමිණීම ඉහළ යෑම විශේෂයෙන් ගාල්ලට සහ සමස්ථයක් ලෙස රටට සංචාරක කර්මාන්තයේ පුනර්ජීවනයකට හේතු වේ.

(C) දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිහිටීම

දක්ෂිණ අධිවේගී මාර්ගය ශ්‍රී ලංකාව තුල සැලසුම් කරන ලද අධිවේගී මාර්ග ජාලයේ ප්‍රථම සම්බන්ධතාවයයි. කොට්ටාව සිට මාතර දක්වා එය ගමන් කරන අතර එය ප්‍රථමයෙන් 2011 නොවැම්බර් මස කොට්ටාව - පින්නදුව ප්‍රදේශය දක්වා මහජනයා සඳහා විවෘත කරන ලදී.

දකුණු පළාත් ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමට හා ආර්ථික අවස්ථා ප්‍රසාරණය කිරීම මෙම ව්‍යාපෘතිය දායක වූ අතර මෙය ගාලු නගරයට සැලකිය යුතු කැපීපෙනෙන බලපෑමක් ඇති කර ඇත. තවද දක්ෂිණ අධිවේගී මාර්ගය තුළ ඇති අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 9 කින් 2ක්ම එනම් බද්දේගම සහ පින්නදුව ගාලු නගරයේ උතුරු දිසාවට ඉතා ආසන්නව පවතී. මෙය ගාලු නගරයට ප්‍රවේශයන් වේ. වර්තමානයේ දක්ෂිණ අධිවේගී මාර්ගය ගාල්ල සංවර්ධනය සඳහා ඉහළ විභවයක් වී ඇති අතර මෙය ගාල්ල සහ තදාසන්න ප්‍රදේශවල භෞතික සැලසුම්වල කැපී පෙනෙන වෙනසක් ඇති කිරීමට දායකවී ඇත. අධිවේගී මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන, ආර්ථික මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය වී ඇති අතර එමගින් ග්‍රාමීය ප්‍රදේශ වලට පහසුකම් සැපයේ. පවතින ද්විතියික මාර්ග කිහිපයක් අධිවේගී මාර්ගයට ප්‍රවේශ මාර්ග ලෙස දියුණු වීමට ලක්ව ඇත. තවද දක්ෂිණ අධිවේගී මාර්ගය හේතුවෙන් ඒ අවට විශේෂයෙ-න් අන්තර් හුවමාරු ප්‍රදේශ ආසන්නව නේවාසික ඉල්ලුම වැඩිවී ඇති අතර ඊට සමගාමීව ඉඩම් සහ දේපල වටිනාකම ඉහළ ගොස් ඇත.

කලාපයේ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස ගාලු නගරය දැක්විය හැකි අතර දේශීය හා විදේශීය සංචාරකයින් දෙපිරිසගේම ආකර්ෂණයට ගාල්ල සහ අවට පෙදෙස් නතුවීම කැපී පෙනේ. දක්ෂිණ අධිවේගී මාර්ගය නිර්මාණය සමඟ සංචාරක ආකර්ෂණය කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර මෙයට ප්‍රධාන හේතුව ලෙස රටේ අගනගරයේ සිට ඉතා පහසුවෙන් ප්‍රවේශ වීමට, ආසන්න වශයෙන් පැයක් තුළ ගාල්ලට පැමිණීමට හැකිවීම දැක්විය හැක.

දක්ෂිණ අධිවේගී මාර්ගය, ගාල්ල ප්‍රදේශයේ සිදුවෙමින් පවතින සහ වර්ධනය සඳහා යොදාගත හැකි මෙන්ම වැඩි ආකර්ශනයක් නිර්මාණය කරමින් තවත් සංවර්ධන අවස්ථා මතුකරන ප්‍රබල සාධකයක් ලෙස සැලකිය හැක.

රූපය 3. 2 දක්ෂිණ අධිවේගී මාර්ගය

මූලාශ්‍රය : මා.සං.අධි - දක්ෂිණ අධිවේගී මාර්ග නඩත්තු ඒකකය,2016

(D) උස් ගොඩනැගිලි සඳහා පවතින ඉල්ලුම (මහල් ගොඩනැගිලි)

මෑත කාලයේ දී මහ ගාල්ල තුළ මහල් නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා විභවතාවයක් ඇති වෙමින් පවතී. ඒ අනුව නගරය තුළ නේවාසික අවකාශ සඳහා ඉල්ලුම සීඝ්‍රයෙන් වැඩි වී ඇත

රූපය 3.3: මහල් ගොඩනැගිලි සඳහා වන ඉල්ලුමෙහි ප්‍රවණතා

මූලාශ්‍රය : පුවත් පත් දැන්වීම් 2018

(E) ඓතිහාසික /පුරාවිද්‍යාත්මක ස්මාරක හායනයට ලක් වීම

* ගාලු කොටුව

ලෝක උරුමයන්ගෙන් එකක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති නගර මධ්‍යයේ පිහිටි ගාලු කොටුව පුරාවිද්‍යාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් නගරයට විශේෂත්වයක් හිමි වී ඇත. මෙහි මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 38ක් පමණ වේ. පුරා විද්‍යාත්මක වශයෙන් හා ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වලින් යුත් ගොඩනැගිලි පෘතුගීසී, ලන්දේසි සහ ඉංග්‍රීසීන්ගෙන් පැවැත ගෙන එන ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ පිළිබිඹු කරයි. අධි උස බිත්ති සහිත විශාල ආරුක්කු සහ ආලින්ද වලින් සමන්විත වන අතර, ප්‍රවේශය මෙන්ම පිටවීමේ ස්ථාන වල ඇති ගේට්ටු ද විශාල ආරුක්කු වලින් සමන්විතව ඇත. ග්‍රැනයිට් භාවිතයෙන් නිමවා ඇත. ගුරුත්වා ප්‍රවාහයට සැලසුම් කළ මලාපවාහන පද්ධති, උමං මාර්ග සහ සැලසුම් කල මාර්ග ජාලය දියුණු ගෘහ නිර්මාණ ශිල්පීය හැකියාව පිලිබිඹු කරන අතර ඒ කාලයේ නගර සැලසුම්කරණය පැවති බවද තහහුරුවේ. ගාල්ල කොටුව ලෝක උරුම ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම හා ලෝක උරුමයක් ලෙස (පැරණි ගාලු නගරය සහ එහි බලකොටුව) වශයෙන් නම් කිරීම 1988 ද UNESCO මඟින් සිදුකරන ලදි.

ඓතිහාසික උරුමයේ ලක්ෂණ සංරක්ෂණය කිරීම පිණිස නාගරික සංවර්ධන අධිකාරියේ 1978 අංක 41 දරණ 23 වගන්ති ප්‍රකාරව 1997 වසරේ අගෝස්තු 07 දින අතිවිශේෂ ගැසට් නිවේදන අංක 987/12 මගින් මෙම ප්‍රදේශය විශේෂ නියාමන කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

වර්තමානයේ අනවසර ඉදිකිරීම් සහ භාවිතයන්ගේ පරිවර්තනය නිසා මෙහි ගොඩනැගිලිවල ඓතිහ-ාසික ලක්ෂණ වලට තර්ජනයක් එල්ල වී ඇත. තවද නගරය කේන්ද්‍ර කර ගනිමින් පවත්වාගෙන යන සියලු ක්‍රියාකාරකම් සඳහා ස්ථාන සැපයීමට නගරය පුළුල් කිරීමට ඉඩ නොමැති නිසාද නගර මධ්‍ය තදබද වී ඇත.

එබැවින් තිරසාර සංවර්ධනයක් සඳහා නගරයේ ඓතිහාසික ලක්ෂණ සංරක්ෂණය කිරීමට විස්තරාත්මක කිරීමට උත්සාහ දැරිය යුතුවේ.

රූපය 3.4: ගාලු කොටුවෙහි දර්ශනය ඉහළ සිට

පින්තූර,2019

රූපය 3:5 ගාලු කොටුව අවට

ිමූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ - නාගරික සංවර්ධන අධිකාරිය ,ගාල්ල,2019

ගාලු කොටුවට අමතරව ගාල්ල නගරය අවට පිහිටි පුරාවිද්‍යාත්මක ස්මාරක සහ ස්ථාන කිහිපයක් හඳුනා ගත හැකි අතර ඒවා පහත ලැයිස්තු ගත කර ඇත.

- අතපත්තු වලව්ව
- රෝසරි මවගේ දේවස්ථානය
- කළුවැල්ල පිහිටි බන්ධනාගාර සංකීර්ණය
- ඕලන්ද සමයේ ඉදිවූ එළවලු සහ පලතුරු වෙළඳ සැල
- ගල්වඩුගොඩ පුරාණ විහාරය
- මහේස්ත්‍රාත් උසාවිය සහ කොටුව ලේන්බාන් වීදියේ ඇති කාර්යාල ගොඩනැගිලි
- මෙතෝදිස්ත පල්ලිය, රිච්මන්ඩ් කන්ද
- ශ්‍රී සුමනාරාම විහාරය
- කරාපිටිය සුනන්දාරාම පුරාණ විහාරය
- තුවක්කුගලවත්ත පුරාණ විහාරය

කෙසේ නමුත් මෙම ස්ථාන සහ ගොඩනැගිලි, පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වැදගත් කමින් යුක්ත වන අතර මෙම ස්ථාන වලට ලැබිය යුතු අදාළ බලධාරීන්ගේ නිසි අවධානය යොමු වී නැත. මෙම ස්ථාන දේශීය විදේශීය සංචාරකයන්ට විවෘත විය යුතු අතර මෙම ස්ථාන ඉදිරියටත් සංරක්ෂණය කලයුතුවේ.

රූපය 3.6: රෝසරි මවගේ දේවස්තානය

රූපය 3.8: ඕලන්ද රෙපරමාදු දේවස්ථානය

රූපය 3.10: ප්‍රදීපාගාරය සහ ගාලු කොටුව අවට

රූපය 3.8: උසාවි සංකීර්ණය - ගාලු කොටුව

රූපය 3.9: නාගරික පලතුරු වෙළඳ සැල

මූලාශ්‍රය:ක්ෂේත්‍ර සමීක්ෂණ,2019

(F) වර්තමාන නගර මධ්‍යය අවදානම් කලාපයක පිහිටා තිබීම

මෙතෙක් සිදුවී ඇති සියලු ස්වාභාවික විපත් වලට වඩා සුනාමියෙන් ගාල්ල නගරයට සිදු වූ විනාශය දරුණු වේ. ගාල්ල වෙරළබඩ නගරයක් බැවින් 2004 සිදුවූ සුනාමි අනතුරෙන් දැඩි හානියක් සිදුවිණි. එමගින් නගරයේ වෙරළබඩ තීරයේ යටිතල පහසුකම් එනම් ප්‍රවාහන පද්ධති, විදුලිය, ජලය සහ සන්නිවේදන ඇතුළු සියලු යටිතල පහසුකම් හානියට ලක් විය.

සුනාමියට අමතරව නගරයේ පවතින දුර්වල ජලාපවාහන පද්ධතිය සහ ප්‍රමාණවත් නොවන නඩත්තු හේතුවෙන් මෙන්ම වර්ෂාපතනයේ තීව්‍රතාවය ඉහළ යෑම වැනි සියලු කරුණු වල එකතුවෙන් වාර්ෂිකව ගංවතුර තත්වයක් උදාවේ. එබැවින් වෙරළබඩ තීරයේ සාපේක්ෂ වශයෙන් ඉහළ ජලවහනය ක්ෂණික ගංවතුර ඇතිවීමට හේතුවක් ලෙස හඳුනාගත හැකිය.

පහත සිතියම මගින් ආපදා අවදානම් විශාලත්වය පෙන්නුම්කරන අතර ආපදාවන්ට ලක් විය හැකි ප්‍රදේශ පෙන්නුම් කෙරේ.

රූපය 3.11: අවදානම් තක්සේරුව සහ ආපදා අනතුරු අධ්‍යනයෙන් අවදානම කළමනාකරණය



මූලාශ්‍රය : එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන 2011

මෙම සියලු තත්වයන් පෙන්නුම් කරන්නේ දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති ආවරණයවන පරිදි නව සංවර්ධන සැලැස්මක් අවශ්‍ය බවය. මෙය ප්‍රදේශයේ පවතින ලක්ෂණ ආරක්ෂා වන පරිදි සහ නගරයේ පවතින ඉඩම් සහ අනෙකුත් සම්පත් තිරසාර ලෙස භාවිතා වන පරිදි සිදුවිය යුතුවේ.

හතරවන
පරිච්ඡේදය

සැලසුම්කරණ
රාමුව

පරිච්ඡේදය 04
සැලසුම්කරණ රාමුව

4.1. දැක්ම

"මධ්‍යතන උරුමය සුරකින නූතන නගරය"

දැක්ම

4.2. දැක්ම ප්‍රකාශය

මධ්‍යකාලීන ගාල්ල සංවර්ධනයෙහි ආර්ථික අංශයෙහි කලාපීය පහසුකම් සැපයීම සහ තිරසාර සංවර්ධන ක්‍රියාවලිය පවත්වා ගෙන යාම සහ එය ආරක්ෂා කිරීම

(A) ස්වාභාවික විපත් හමුවේ නොසැලෙන සුරක්ෂිතතාවය

ගාල්ල සංවර්ධන කලාපයෙහි නගර මධ්‍ය අනෙකුත් සංවර්ධන ප්‍රදේශයන්ට සාපේක්ෂව අධි අවධානමක් සහිත ප්‍රදේශයක පිහිටා ඇති බැවින් ස්වාභාවික විපත් හමුවේ ඉහල ආපදා අවධානමක් පවතී (ක්ෂණික ගංවතුර සහ සුනාමි වැනි ආපදා) ආපදා හමුවේ නොසැලෙන සුරක්ෂිතාවය (Resillience) යන්නෙන් අදහස් වන්නේ මහජනතාවට හෝ සමාජයට ස්වාභාවික ආපදා සඳහා මුහුණ දීමට ඇති හැකියාව සහ එම උපද්‍රවවලින් ඇති වන බලපෑම් වලට කාලෝචිත හා කාර්යක්ෂම අන්දමින් ප්‍රතිරෝධී වීම දරා ගැනීම හා ඒකරාශී වීම වේ. මෙම සුරක්ෂිතතාවයට මූලික අත්‍යාවශ්‍ය ව්‍යුහයන් හා කාර්යයන් ද අයත් වේ. (ආපදා අවම කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර උපාය මාර්ගය 2009) මෙම නොසැලෙන සුරක්ෂිතතාවය නගරයක ආර්ථිකය, සෞඛ්‍ය හා ආයෝජනය මත බලපෑම් ඇතිවේ.

(B) ආර්ථික සහ තිරසාර සංවර්ධනය සඳහා ප්‍රාදේශීය පහසුකම් සැපයීම

දකුණු පළාතේ සෙසු ප්‍රධාන නගරවලට සාපේක්ෂව සැසඳීමේදී ගාල්ල නගරය පළමු ගනයේ නගරයක් වන අතර දිස්ත්‍රික්කයේ අගනගරය ද පළාත තුල වඩාත් සම්බන්ධිත නගරයක් වශයෙන්ද පුළුල් කර්තව්‍ය-යක නිරතවනු ලබයි. මෙම නිසා පළාතේ සෙසු නාගරික මධ්‍යස්ථාන අභිබවා ගාල්ල නගරය පාදක කොට ගෙන නාගරික සමුච්චය නිර්මාණය වී ඇත. මාර්ග පද්ධතීන් එකිනෙක සම්බන්ධවීමත්, දක්ෂිණ අධිවේගී මාර්ගය, වරාය මාර්ග, දුම්රිය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් එකිනෙක සම්බන්ධවීමත් හේතුවෙන් කලාපයේ පවත්නා ව්‍යාපාර කෙරෙහි ඇති ආකර්ෂණය සාපේක්ෂව වර්ධනය වෙමින් පවතී. මෙය ආර්ථික අංශය සීඝ්‍රයෙන් ඉහළයාමට පාදක වී ඇත. මෙම ආර්ථික අංශයේ ඉහල නැංවීම (සංචාරක, සහ කෘෂිකාර්මික) විවිධාංගීකරණ වූ ආර්ථික ක්‍රියාකාරකම්වලින් ජනිත වන ආදායම් උත්පාදන අවස්ථා-වන්ට අමතරව සිදුවන්නකි. එබැවින් පවතින ඉඩම් තිරසාර සංවර්ධනයක් සඳහා උපරිමව භාවිතා කල යුතුවේ.

(C) මධ්‍යකාලීන ගාල්ල

1505 දී පෘතුගීසින් විසින්ද 1640 දී ලන්දේසින් විසින් සහ 1976 දී ඉංග්‍රීසින් විසින් ඔවුන්ගේ බලය සහ අධිකාරිය පතුරුවා යටත් කරගත් නගරයක් ලෙස ගාල්ල නගරය සලකුණු වී ඇත. එහි ප්‍රතිපලයක් ලෙස, ගාල්ල විකාශනය බලකොටුවෙහි සංවර්ධනය සහ එහි ගෘහ නිර්මාණාත්මක ලක්ෂණ සමඟ දිගු කලක් ක්‍රමිකව සිදුවී ඇත. එබැවින් නගරය ජාත්‍යන්තරව ඉමහත් ප්‍රසිද්ධ වී ඇති අතර ඉතා හොඳින් සංරක්ෂිතව පවතින 18 වන සහ 19 වන සියවස්හි පැවති ඕලන්ද සහ ඉංග්‍රීසි ඓතිහාසික ලක්ෂණ සහ ගෘහ නිර්මාණ ශිල්පයද මෙයට හේතුවී ඇත. කෙසේ නමුත් වර්ථමානයේ ස්මාරකයන්හි පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික ලක්ෂණ විශේෂයෙන් ඕලන්ද කොටුව පුරාවිද්‍යා ලක්ෂණ විනාශ වෙමින් පවතී.

අරමුණු

4.3. අරමුණු

මහ ගාල්ල නගර සංවර්ධනයෙහි අනාගත අපේක්ෂිත ප්‍රතිරූපය නිර්මාණය වනු ඇත්තේ පහත සඳහන් හදුනාගත් ප්‍රධාන අරමුණු හය සාක්ෂාත් කරගැනීමෙනි.

අරමුණ	01	"මධ්‍යතන උරුමය සුරකීම" සහ ප්‍රතිස්ථාපනය කිරීම

අරමුණ	02	මහා ගාල්ල නගර ප්‍රදේශය තුළ හි පවතින විවධ වූ ආර්ථික ක්ෂේත්‍ර එකිනෙක සම්බන්ධ කිරීම තුලින් ඇතිවන සාපේක්ෂ වාසිදායක තත්ත්වය ඉහළ නැංවීම මඟින් "ඉසුරුමත් නගරයක්" නිර්මාණය කිරීම
අරමුණ	03	මහා ගාල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන් හට "සුවපහසු ජීවනය" සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම
අරමුණ	04	"හරිත, සුපිරිසිදු සහ ආරක්ෂිත පරිසරයක්" නිර්මාණය කිරීම
අරමුණ	05	විධිමත් ගමනා ගමන පද්ධතියක් ප්‍රවර්ධනය කරමින් මහා ගාල්ල ප්‍රදේශය වෙත පැමිණෙන මගීන් හට පහසුකම් සැපයීම.
අරමුණ	06	වඩා උචිත පරිසරයක් නිර්මාණය කිරීම තුලින් මහා ගාල්ල ප්‍රජාව "ප්‍රීතිමත් පුරවැසියන්" ලෙස ජීවත්වන බව තහවුරු කිරීම.

4. 4. පරමාර්ථ

පරමාර්ථ

අරමුණ 01 මධ්‍ය කාලීන උරුමය

1 ගාල්ල කොටුව සහ එහි අවට පිහිටි අනෙකුත් ස්ථානවල හඳුනාගත් ස්මාරකවල ඓතිහාසික සහ පුරවිද්‍යාත්මක ලක්ෂණයන්හි මහිමය වසර 2030 වන විට ප්‍රතිස්ථාපනය.

අරමුණ 02 ඉසුරුමත් නගරය

1 වසර 2031 වන විට සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය 13% සිට 25% දක්වා ඉහළ නැංවීමට සහ හඳුනාගත් කෘෂිකාර්මික කලාපවලට (හෙක්ටයාර 362 ක ප්‍රමාණය) වෙළඳපොල අවස්ථා නිර්මාණ කිරීමට පහසුකම් සැපයීම් හරහා ප්‍රදේශයේ ආර්ථික තිරසාරත්වය සාක්ෂාත් කරගැනීම

2 2031 වසර වනවිට සංචාරක ආදායම, නගරයේ ආර්ථිකයට 55% සිට 75% දක්වා වූ දායකත්-වයක් ලබාගැනීමට හැකි අයුරින් පහසුකම් සැපයීම

3 වසර 2031 වනවිට හපුගල ප්‍රදේශය දැනුමේ කේන්ද්‍රස්ථානය බවට පත්කිරීම.

අරමුණ 03 "සුවපහසු ජීවනය"

1 කරාපිටිය ප්‍රදේශය වසර 2031 වන විට සෞඛ්‍ය කේන්ද්‍රය ලෙස ප්‍රවර්ධනය කිරීම.

2 වසර 2031 වන විට පවතින සුදුසු ඉඩම් අනුව හපුගල, උළුවිටිකේ සහ ඇත්තිලිගොඩ ප්‍රදේශ සහ අනෙකුත් හඳුනාගත් ප්‍රදේශ නේවාසික කලාප ලෙස ප්‍රවර්ධනය කිරීම.

3 හඳුනාගත් ස්ථානයන්හි පරිපුරක සේවා සඳහා පහුකම් සැපයීම් මඟින් නාගරික ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

පරිච්ඡේදය 04

සැලසුම්කරණ රාමුව

අරමුණු

අරමුණු 04 හරිත සුපිරිසිදු ආරක්ෂිත පරිසරයක්

1 වසර 2031 පමණ වනවිට හෙක්ටෙයාර 1.3 පමණ වන ජල මූලාශ්‍ර සහ හෙක්ටෙයාර 3850.21 වන හරිත ආවරණ වලින් යුක්තවූ හදුනාගත් සංවේදී ස්වභාවික පරිසර පද්ධතිය කළමනාකරණ සහ සංරක්ෂණ කරන අතරතුර නගරයේ හටගන්නා ක්ෂණික ගංවතුර වැනි ව්‍යසනයන් හට ඔරොත්තු දියහැකි පරිදි නගරය නිර්මාණය.

2 වර්ථමානයේ 65% පමණ වන රූමස්සල ප්‍රදේශයේ පවත්නා හරිත ආවරණය සංරක්ෂණයත් එම අසමසම ස්වභාවික පරිසරයෙහි ආරක්ෂාවත් සඳහා සංරක්ෂිත කලාප-යක් ලෙසට වසර 2031 වනවිට ප්‍රකාශයට පත් කිරීම.

අරමුණු 05 "විධිමත් ගමනාගමන පද්ධතියක්"

1 ගිංතොට සිට වලහන්දුව දක්වා ඇති මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කොට සංවර්ධන කොරිඩෝව සඳහා සහ පර්යන්ත ප්‍රදේශයට අවශ්‍ය පහසුකම් 2031 වන විට වර්ධනය කිරීම

2 වඩාත් සම්බන්ධිත සහ දියුණුවූ මාර්ග ජාලයක් මහා ගාල්ල ප්‍රදේශය තුල ඇතිකිරීම තුළින් අන්තර් සහ අභ්‍යන්තර සම්බන්ධතා වසර 2031 වනවිට සංචලන මාර්ග තුනක් මගින් වර්ධනය කිරීම.

3 වසර 2031 වන විට මගී සේවා මධ්‍යස්ථාන ලෙස ගින්තොට සහ වලහන්දුව ස්ථාපනය කිරීම සහ ඒ අතරතුර මහමෝදර සහ දෙවට (INSEE) සිමෙන්ති භූමිය තාවකාලික පිළියමක් ලෙස වැඩිවන බස්රථ හා ධාවන බස් රථ ගාල් කිරීම.

4 වසර 2031 වන විට නාගරික වාහන තදබදය අවම කිරීම.

අරමුණු 06 "ප්‍රීතිමත් පුරවැසියන්"

1 2031 වසර වනවිට සමාජ හා විනෝදාස්වාදය සඳහා ඇති ස්ථාන ප්‍රවර්ධනය කිරීමෙන් සහ වැඩි දියණු කිරීමෙන් මහජනතාව සඳහා නාගරික අවකාශයන් නිර්මාණය කිරීම.

2 2031 වසර වනවිට නගරයේ හදුනාගත් ස්ථානවල සහ මාර්ග ඔස්සේ මිත්‍රශීලී හරිත පදික ගමන් මාර්ග සහ හරිත තීරු ඇතිකිරීම තුළින් පදිකයින්ගේ සුවපහසුව සහ ආරක්ෂාව තහවුරු කිරීම.

පස්වන
පරිච්ඡේදය

ශ.දු.අ.ත
විශ්ලේෂණය

5.1. ශ.දු.අ.ත විශ්ලේෂණය

මහා ගාල්ල නගර සභා බල ප්‍රදේශය සැලසුම්කරණය සඳහා ගැලපෙන අවස්තාව සමඟ ඉදිරියට යාමේ ඉලක්කයත් ඒ සමගින් සැලසුම්කරණ අරමුණු හා සම්බන්ධ මූලික අංග හඳුනාගැනීමත් අත්‍යවශ්‍යවේ. මතුවන ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන මත පදනම් වේ.

අරමුණු 01 "මධ්‍යතන උරුමය" සුරකීම සහ ප්‍රතිස්ථාපනය කිරීම

ශක්තීන්		දුර්වලතා	
ශ1	යුනෙස්කෝ මගින් ගාල්ල කොටුව ලෝක උරුම කලාපයක් බවට ප්‍රකාශයට පත්කිරීම	දු1	පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික ස්මාරක විනාශවීම සහ ක්ෂයවීම
ශ2	ගාල්ල කොටුව කළමනාකරණ සැලැස්ම යෝජනා වී තිබීම	දු2	අනවසර ඉදිකිරීම්
ශ3	පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික ස්මාරක ස්ථාන ප්‍රදේශයේ පැවතීම	දු3	නිසි සංරක්ෂණ සැලැස්මක් නොමැතිකම (රූමස්සල, කොටුව)
ශ4	ප්‍රධාන සංචාරක ගමනාන්තය		
අවස්ථා		**තර්ජන**	
අ1	ක්‍රියාත්මක සංවර්ධන සැලසුම්	ත1	දේශපාලනික බලපෑම්
අ2	ගාලු කොටුව මාර්ගෝපදේශ සැලසුම		
අ3	යෝජිත ගාලු කොටු බැම්ම සංවර්ධන ව්‍යාපෘතිය		
අ4	යෝජිත රූමස්සල විශේෂ ප්‍රදේශ සංරක්ෂණ නියාමන සැලසුම		

ශක්තීන් - අරමුණු *01*

ශ 1 - යුනෙස්කෝ මගින් ගාල්ල කොටුව ලෝක උරුම කලාපයක් බවට ප්‍රකාශයට පත්කිරීම

ගාල්ල කොටුව ලෝක උරුම ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සහ යුනෙස්කෝව හි ලෝක උරුම මධ්‍යස්ථානය මඟින් 1988දී ලෝක උරුම ලැයිස්තුව හි "පැරණි ගාලු නගරය සහ එහි බලකොටු " වශයෙන් නම් කරන ලදි.

ශ 3 - ගාලු කොටුවට අමතරව ගාල්ල නගර අවට පිහිටි ස්මාරක සහ ස්ථාන කිහිපයක් හඳුනා ගත හැකි අතර ඒවා පහත ලැයිස්තු ගත කර ඇත

- අතපත්තු වලව්ව
- රෝසරි මවගේ දේවස්ථානය
- කළුවැල්ල පිහිටි බන්ධනාගාර සංකීර්ණය
- ඕලන්ද සමයේ ඉදිවූ එළවලු සහ පලතුරු වෙළඳ සැල
- ගල්වඩුගොඩ පුරාණ විහාරය
- මහේස්ත්‍රාත් උසාවිය සහ කොටුව ලේන්බාන් වීදියේ ඇති කාර්යාල ගොඩනැගිලි
- මෙතෝදිස්ත පල්ලිය, රිච්මන්ඩ් කන්ද
- ශ්‍රී සුමනාරාම විහාරය
- කරාපිටිය සුනන්දාරාම පුරාණ විහාරය
- තුවක්කුගලවත්ත පුරාණ විහාරය

කෙසේ නමුත් මෙම ස්ථාන සහ ගොඩනැගිලි, පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වැදගත්කමින් යුක්ත වන අතර මෙම ස්ථාන වලට අදාළ නිළධාරීන්ගේ නිසි අවධානය යොමු කර නැත. මෙම ස්ථාන මහජනයා හට, දේශීය විදේශීය සංචාරකයින්ට විවෘත විය යුතු අතර මෙම ස්ථාන ඉදිරියටත් සංරක්ෂණ කල යුතුවේ.

දුර්වලතා - අරමුණු *01*

දු1 – පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික ස්මාරක විනාශවීම සහ ක්ෂයවීම

ලෝක උරුමයක් වන ගාලු නගරය, විශේෂයෙන් ඕලන්ද කොටුව, තුළ සිදුවන සංවර්ධන හේතුවෙන් එහි ස්මාරක තර්ජනයට ලක්වී ඇත. යුනෙස්කෝ වාර්තා අනුව පහත සඳහන් කරුණු විශේෂකොට දක්වා ඇති තර්ජන වේ.

1 මෙම දේපල කළමණාකරනය කරනු ලබන නිසි බළධාරී ආයතනය ලෙස ක්‍රියාකරන "ගාලු උරුම පදනම" ආයතනයේ ඇති දුර්වල කළමනාකාරිත්වය

2 යෝජිත වරාය ඉදිකිරීම් හේතුවෙන් ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක දේපළ වල පැවැත්මට ඇතිවිය හැකි බලපෑම

3 නගරය තුල සිදුවන අනිසි සහ නීති විරෝධී ඉදිකිරීම් හේතුවෙන් ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක දේපළ වල පැවැත්මට ඇතිවිය හැකි බලපෑම

රූපය 5.1-1 ගාල්ල කොටුව අවට සංවර්ධනය

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ, 2019

පරිච්ඡේදය 05 දු 2 - ගාලු කොටුව තුළ සිදුවන අනවසර ඉදිකිරීම්

ශ.දු.අ.ත විශ්ලේෂණය

අරමුණු 01

පැරණි නගර සීමාවේ පවතින බොහෝ ගොඩනැගිලි පැරණි ආරුක්කු සහ යටත් විජිත සමයේ පැවති ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වලින් යුතු කොරිඩෝවකින් සමන්විත වේ. වීදි දෙපස ඇති පැරණි ගොඩනැගිලි තට්ටු දෙකකින් සමන්විත අතර සරල වහලකින් නිර්මාණය කොට ඇත.

කෙසේ නමුත් , නාගරීකරණය සහ ගොඩනැගිලි අලුත්වැඩියා හේතුවෙන් යටත්විජිත ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ විනාශ වෙමින් පවතී. ගාලු කොටුවෙහි විශේෂ මාර්ගෝපදේශන උල්ලංඝනය කිරීම් මෙම සිද්ධියෙන් පැහැදිලිව පෙනේ.

රූපය 5.1-2 ගාල්ල කොටුව තුළ අනවසර ඉදිකිරීම්

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ,2019

අවස්ථා - අරමුණ *01*

අ1 - ක්‍රියාත්මක සංවර්ධන සැලසුම්

ගැසට්කර ඇති ගාල්ල මහනගර සභා සීමා සැලැස්ම සහ ගාල්ල සඳහා වූ අනෙකුත් සංවර්ධන සැලසුම් ප්‍රයත්නයන් මගින් ගාල්ලට ආවේණික ලක්ෂණ හඳුනාගෙන ඇති අතර එය අනාගත විභවයන්ට වටිනාකමක් එක් කරයි.

අ2 - ගාලු කොටුව මාර්ගෝපදේශ සැලසුම

ගාල්ල මහනගර සභා සංවර්ධන සැලැස්ම (2008- 2025) වර්ථමානයේ ක්‍රියාත්මක වන අතර ගාලු කොටුව සංරක්ෂිත පුරාවිද්‍යාත්මක කලාපයක් ලෙස වෙන්කර එහි පවතින ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ලක්ෂණ සංරක්ෂණය වන පරිදි විශේෂ වූ රෙගුලාසි මාලාවක් ඉදිරිපත් කර ඇත.

ඊට අමතරව,ඓතිහාසික උරුමයේ ලක්ෂණ සංරක්ෂණය කිරීම පිණිස නාගරික සංවර්ධන අධිකාරියේ 1978 අංක 41 දරණ පනතේ 23 වගන්තිය ප්‍රකාරව 1997 වසරේ අගෝස්තු 07 දින අතිවිශේෂ ගැසට් නිවේදන අංක 987/12 මගින් මෙම ප්‍රදේශය විශේෂ නියාමන කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත'

රූපය 5.1-3: ගාල්ල මහනගර සීමා සඳහා වූ සංවර්ධන සැලැස්ම 2008-2025



මූලාශ්‍රය : ගාල්ල සංවර්ධන සැලැස්ම (2008-2025)

අ4 - යෝජිත රූමස්සල විශේෂ ප්‍රදේශ සංරක්ෂණය සඳහා මාර්ගෝපදේශ සැලැස්ම

ගාල්ල යනු ශ්‍රී ලංකාවේ වඩාත් ආකර්ශණීය නගරය වන අතර ගාලු සංචාරක කලාපයේ රූමස්සල ප්‍රදේශය තවත් සංචාරය කල යුතු ස්ථානයක් වේ. රූමස්සල කන්දට ඓතිහාසික වටිනාකමක් එක්වනුයේ "රාමායනය" පුරාවෘත ග්‍රන්ථයේ සඳහන් පරිදි රූමස්සල " යනු ඉන්දියාවේ හිමාල කන්දෙන් කොටසක් බවයි. රූමස්සල කන්ද දකුණු වෙරළ තීරයේ අලංකාරත්වය මනා කොට ගෙනහැර දක්වයි. යටත් විජිත කාලයන්හි රූමස්සල ඔවුන්ගේ යාත්‍රා වලට නැවුම් ජලය සපයන ස්ථානය ලෙස යොදා ගෙන ඇත.

ප්‍රදේශයේ නාගරීකරණ ලක්ෂණ හේතුවෙන් මෙම වටිනා සුන්දර ස්ථානය තර්ජනයට ලක්වී ඇත. මෙබැවින් පරිසරහිතකාමී ලෙස මෙම ප්‍රදේශය සංවර්ධනය සඳහා මාර්ගෝපදේශ ලබා දිය යුතු වන අතර ජෛව විවිධත්වය සහ ඓතිහාසික වටිනාකම් අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කලයුතුවේ

රූපය 5.1-4: ජපන් සාම චෛත්‍යය

රූපය 5.1-5: රූමස්සල වෙරළ

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ 2019

අරමුණු 02 මහා ගාල්ල සීමාවහි පවතින විවිධ වූ ආර්ථික ක්ෂේත්‍ර සම්බන්ධ වීම්හි වාසිදායි තත්ත්වය ඉහළ නැංවීම සඳහා "ඉසුරුමත් නගරය" නිර්මාණය

ශක්තීන්		දුර්වලතා	
ශ1	ප්‍රධාන සංචාරක ගමනාන්තය	දු1	නගරයහි වැදගත් ස්ථාන වල ඌන උපයෝජිත ඉඩම් පැවතීම (වාණිජ කේන්ද්‍ර ස්ථානය)
ශ2	විවිධ වූ භාණ්ඩ හා සේවා පැවතීම	දු2	වෙරළ තීරයේ සැලසුම්ගත නොවූ භෞතික සංවර්ධනය
ශ3	ආර්ථික විවිධාංගීකරණයට අවශ්‍ය සම්පත් පැවතීම	දු3	වගා නොකරන කුඹුරු ඉඩම් පැවතීම
ශ4	ඓතිහාසික වැදගත් කම		
ශ5	විශිෂ්ඨ සම්බන්ධතාව		
අවස්ථා		**තර්ජන**	
අ1	නගර ඒකාබද්ධ කිරීමේ විභවය	ත1	සුනාමි සහ ක්ෂණික ගංවතුර වැනි තර්ජන වලට ඇති අවධානම
අ2	කොග්ගල අපනයන සැකසුම් කලාපයට ආසන්නව පිහිටීම	ත2	දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා වාහන ගමන් කිරීම තුලින් ව්‍යාපාර අවස්ථා මග හැරීම
අ3	දක්ෂිණ අධිවේගී මාර්ග අන්තර් හුවමාරු මධ්‍යස්ථානයට ආසන්නව පිහිටා තිබීම	ත3	හම්බන්තොට සහ මාතර නගරවල වේගවත් සංවර්ධනය හි බලපෑම

ශක්තීන් - අරමුණු *01*

ශ 1 - ප්‍රධාන සංචාරක ගමනාන්තය

ස්වභාවික සම්පත් හා සංස්කෘතික උරුමයන් සහිත ගාලු නගරය, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් බවට පත් වී ඇත.ලෝක උරුමයක් වන ලන්දේසි කොටුව සංචාරක ව්‍යාපාරය සඳහා දැවැන්ත අවස්ථාවක් වී ඇත. මුහුදු මාර්ගය, මහමෝදර වැව, රූමස්සල, උණවටුන ආශ්‍රිත ප්‍රදේශ සංචාරක කර්මාන්තය සඳහා විශාල විභවතාවයක් ඇත. කටුගොඩ වෙරළබඩ ප්‍රදේශය, බීක්කේ ජලාශය, මහමෝදර වැව ආශ්‍රිත ප්‍රදේශ සංචාරක කර්මාන්තය සඳහා විශේෂ විභවයක් ඇත. කෙසේ වෙතත් මෙම ප්‍රදේශ සංචාරක කර්මාන්තය ප්‍රශස්ත ලෙස තවමත් භාවිතා වී නොමැත.

රූපය 5.1-5 : ශ්‍රී ලංකාවේ සංචාරක කලාප



මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය

රූපය 5.1-6 : දේශීය හා විදේශීය සංචාරකයන් පැමිණීමේ ප්‍රතිශතය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය

ශ 3- ආර්ථික විවිධාංගීකරණයට අවශ්‍ය සම්පත් පැවතීම

දේශීය වශයෙන් ධීවර හා සංචාරක කර්මාන්තය නගරය තුළ ආදායම් උත්පාදන අවස්ථාවන් සපයන අනෙකුත් ප්‍රධාන අංශයන් වේ. රටේ දළ දේශීය නිෂ්පාදනයට 1.3% ක දායකත්වයක් මත්ස්‍ය කර්මාන්තය සපයයි. තංගල්ල හා ගාල්ල ධීවර දිස්ත්‍රික්ක 15 අතරින් සමස්ත ධීවර නිෂ්පාදනයෙන් 27% ක දායකත්වයක් ලබා දෙයි.

ඊට අමතරව නගරයේ ආර්ථිකයෙන් සැලකියයුතු කොටසක් වී ගොවිතැන හා විශේෂයෙන් සුළු අපනයන බෝග ඇතුළු කෘෂිකාර්මික අංශය දරයි.

රූපය 5.1-6: ධීවර දිස්ත්‍රික්ක අනුව වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදන - 2010



මූලාශ්‍ර: සම්පත් පැතිකඩ (ගාල්ල කඩවත් සතර , බෝපේ පොද්දල, අක්මීමන සහ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ) 2010

රූපය 5.1-7: වගාබිම් ප්‍රමාණය - 2010



මූලාශ්‍ර: සම්පත් පැතිකඩ (ගාල්ල කඩවත් සතර , බෝපේ පොද්දල, අක්මීමන සහ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ) 2010)

ශ 4 - ඓතිහාසික වැදගත්කම

ක්‍රි .ව. 125-150 වකවානුවේ ටොලමිගේ ලෝක සිතියමේ ගාලු ඉතිහාසය සදහන් පරිදි නගරයේ පරිණාමය බලකොටුවේ සංවර්ධනය සමඟ බෙහෙවින් සම්බන්ධ වී ඇත. 17 වන සියවස් ඕලන්ද යුගයේදී වීදී සහ මාර්ග ජාලය පැතිරී පැවතුනේ නගර කේන්ද්‍රීය හරහාය.

18 සහ 19 වන සියවසයන්ට අයත්වන ඉතා හොඳින් සංරක්ෂණය කෙරෙනු ඓතිහාසික ලක්ෂණ සහ පැවති ඕලන්ද සහ ඉංග්‍රීසි ගෘහනිර්මාණ මිශ්‍රණය ගාලු කොටුව තුළ තවමත් සාක්ෂි වශයෙන් ඉතිරිව ඇති අතර මෙය ලෝක උරුම පෙදෙසක් බවට 1988 දී යුනෙස්කෝව මගින් ප්‍රකාශයට පත් කර ඇත.

රූපය 5.1-8 1726 දී ගාල්ල කොටුව සිතියම



මූලාශ: : ලංකාපුර වෙබ් අඩවිය

රූපය 5.1-9 ගාලු කොටුව

මූලාශ: : ලංකාපුර වෙබ් අඩවිය

දුර්වලතා - අරමුණ *02*

දු 1- නගරයේ වැදගත් ස්ථානවල (වාණිජ කේන්ද්‍රස්ථාන වල) පවතින ඌන උපයෝජිත ඉඩම්

වාණිජ ප්‍රදේශයේ ඌන උපයෝජිත ඉඩම් එනම් ඔරොප්පුවත්ත, පෙට්ටිගලවත්ත සහ නිවාස සංවර්ධන අධිකාරියේ ඉඩම (විද්‍යාලෝක විද්‍යාලයට යාබදව ඇති) මහජන පොළ සහ චීන කොරොටුව වැනි ඵලදායී ලෙස භාවිතා නොකිරීමෙන් නගරයේ ආර්ථිකයට මෙන්ම ආකර්ෂණයට ගැටළුවක් වී ඇත.

රූපය 5.1-10 : නගර මධ්‍යයේ ඇති ඌන උපයෝජිත ඉඩම්



මූලාශ්‍රය : ගූගල් චන්ද්‍රිකා ජයාරූප - ක්ෂේත්‍ර සමීක්ෂණ, 2019

දු 2 - වෙරළ තීරයේ අවිධිමත් භෞතික සංවර්ධනය

නිසි ක්‍රමවත් නියාමන යාන්ත්‍රයක් නොමැති බැවින් විවධ වූ ගොඩනැගිලි සහ ව්‍යුහ විවධවූ සේවා ලබාදීමට අවහිරයක් වී ඇති අතර වෙරළ තීරයට සහ අනෙකුත් ස්ථාන වලට ආවේනික ලක්ෂණවලට බාධාවක් වී ඇත.

රූපය 5.1-11 වෙරළ තීරයේ තත්කාර්ය භෞතික සංවර්ධනය



මූලාශ්‍රය : ගූගල් චන්ද්‍රිකා ජයාරූප, *2019*

අවස්ථා - අරමුණ *02*

අ 1 - කොග්ගල අපනයන සැකසුම් කලාපයට ආසන්නව පිහිටීම

කොග්ගල අපනයන සැකසුම් කලාපය පිහිටා ඇත්තේ ගාල්ල නගරයේ සිට කිලෝමීටර 8ක් පමණ එපිටිනි. ඇගලුම් කම්හල්, රබර් නිෂ්පාදන, බෝට්ටු නිෂ්පාදන සහ අහස් යානා අලුත් වැඩියා වැනි විවිධාකාරයේ වූ ව්‍යාපාර මෙම කලාපය තුල පිහිටා ඇත. කොග්ගල අපනයන සැකසුම් කලාපය දකුණු පළාත තුල මෙන්ම රටෙහි ආර්ථිකය තුල ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස විශාල දායකත්වයක් සපයනු ලබයි. බොහෝ ආයෝජන කොග්ගල අපනයන සැකසුම් කලාපය වෙත ආකර්ෂණය වීමට කොග්ගල සිට කිලෝමීටර 115 පමණ දුරකින් පිහිටි හම්බන්තොට වරාය පිහිටීම හේතුවන අතර දක්ෂිණ අධිවේගී මාර්ග ප්‍රවේශය හේතුවෙන් ප්‍රතිලාභ ලබන කොග්ගල අපනයන සැකසුම් කලාපය මෙහෙයුම් කේන්ද්‍රස්ථාන සම්බන්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

රූපය 5.1-12 : කොග්ගල අපනයන සැකසුම් කලාපය

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ,2020

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2019

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත විශ්ලේෂණය

අරමුණු **03** මහා ගාල්ල සීමාවේ පදිංචිකරුවන් හට "සුවපහසු ජීවනය" සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම

අරමුණු 03

ශක්තීන්		දුර්වලතා	
ශ1	විවිධ භාණ්ඩ හා සේවා ලබාගතහැකි ස්ථාන පැවතීම	දු1	කාර්ය බහුල වේලාවන්හිදී නගරයේ ප්‍රධාන ස්ථානවල පවතින රථවාහන තද බදය
ශ2	100% ආවරණය වන නළ ජල පද්ධතියක් පැවතීම (මහනගර සහා බල ප්‍රදේශය)	දු2	නාගරික ස්ථාන වල නිතර ඇතිවන ක්ෂනික ගංවතුර
ශ3	100% විදුලි ආවරණය	දු3	පරිපාලන මධ්‍යස්ථාන විසිරී පැවතීම
අවස්ථා		**තර්ජන**	
අ1	නගර ඒකාබද්ධ විභවය	ත1	සුනාමි වැනි ආපදාවන් හට ඇති අවධානම
අ2	දක්ෂිණ අධිවේග මාර්ගයේ අන්තර් හුවමාරු මධ්‍යස්ථානවලට ආසන්න වීම (පින්නදූව)	ත2	මුහුදු ජලය ඉහළ යැමත් සමඟ ලවණ ජලය ඇතුල්වීම
අ3	සංවර්ධන නැඹුරුව වෙනස් වීම	ත3	පළාත තුළ දෙවන නියාමක නගරය ලෙස මාතර නගරයෙහි

ශක්තීන් - අරමුණු *03*

ශ 1 -විවිධ භාණ්ඩ හා සේවා ලබාගතහැකි ස්ථාන පැවතීම

සේවා සහ වාණිජ අංශවල ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන නගරයක් වන අතර, අධ්‍යාපන අංශයේ වැඩි කාර්යභාරයක් ඉටු කරනු ලබයි. තාක්ෂණික විද්‍යාලයක්, ප්‍රධාන පෙළේ පාසල් 9 ක් සහ ජාත්‍ය-න්තර පාසල් 3ක් ගාල්ල නගර සීමාව තුළ පිහිටා ඇත. රුහුණු විශ්ව විද්‍යාල වෛද්‍ය පීඨය නගර සීමාවට යාබදව පිහිටුවා ඇත. රුහුණු විශ්ව විද්‍යාල ඉංජිනේරු පීඨය හපුගලද විවෘත විශ්ව විද්‍යාලය ලබුදූව ද ජාතික තාක්ෂණික ඩිප්ලෝමා ආයතනය වැනි ආයතන පිහිටා ඇති අතර මේවායෙහි විශේෂ කාර්යන් ප්‍රාදේශීය මට්ටම මෙන්ම ජාතික මට්ටමට ක්‍රියාත්මක වේ. කරාපිටිය ශික්ෂණ රෝහල පළාතේ ජනයට පමණක් නොව ඉන් පිටත ජීවත්වෙන ජනතාවට පවා සෞඛ්‍ය සේවා සපයන ලැබේ. ඊට අමතරව මහමෝදර පිහිටි මාතෘ රෝහල, අනෙකුත් පෞද්ගලික රෝහල්, සහ දේශීය වෛද්‍ය මධ්‍යස්ථාන දිස්ත්‍රික්කයේ ජනයාට සේවාවන් සපයනු ලැබේ.

නගරයේ වාණිජ ක්ෂේත්‍රය මුළු ප්‍රදේශයටම විවිධාකාර සේවා සපයනු ලැබේ. සිල්ලර, තොග වෙළඳසැල් සහ බැංකු, රක්ෂණ ආයතන වැනි ආයතන ඒ අතර වේ. ගාල්ල නගරයේ පමණක් නොව ගිංතොට, කටුගොඩ, කරාපිටිය, සරෙන්තුකඩේ, තනිපොල්ගහ, හිරිඹුර වැනි නගරයට තදාසන්න ප්‍රදේශවලින්ද මේ හා සේවාවක් ලබාදේ.

ශ 2- 100% ආවරණය වන නළ ජල පද්ධතියක් පැවතීම (මහනගර සභා සීමාව)

නගරයට ජලය සපයන ප්‍රධාන මූලාශ්‍රය වන්නේ ගිංගඟ වන අතර මෙය හියාරේ ජල සැපයුමට අමතරව වේ. ජාතික ජලසම්පාදන සහ ජලපවාහන මණ්ඩලයහි පවතින තොරතුරු අනුව ගාල්ල මහනගර සභා සීමාවේ අවශ්‍ය ජල සැපයුම 100% ලබා දීමට වර්ථමානයේ ප්‍රමාණවත් ධාරිතාවයක් පවතින අතර අනෙකුත් ප්‍රදේශවලට මුළු දවස පුරා ජලය සැපයීමට වැඩි දියුණු කිරීම් අවශ්‍ය අතර මෙය ගිංගඟ ජල පොම්පාගාරයේ ධාරිතාව ප්‍රමාණවත් නොවීම ද හේතුවේ.

රූපය 5.1-13 මහ ගාල්ල ප්‍රදේශයේ ජල පරිභෝජනය ජල ප්‍රභවයන් ඇසුරෙන්



මූලාශ්‍රය :සම්පත් පැතිකඩ (ගාල්ල කඩවත් සතර, බෝපේ පොද්දල, අක්මීමණ, හබරාදුව ප්‍රාදේශීය සභා)2019

ශ 3 - 100% විදුලි ආවරණය

ගාල්ල මහා නගර සභා ප්‍රදේශයේ සම්පූර්ණ විදුලි අවශ්‍යතාව විදුලි බලාගාර 17 කින්, උප බලාගාර 97 කින් ලංකා විදුලි බල මණ්ඩලයෙන් නඩත්තුවන විදුලි උත්පාදක යන්ත්‍ර මගින් උපයා ගනී. ගාල්ල මහ නගර සීමාවට විදුලිය සැපයීම සහ නඩත්තුව ලංකා විදුලි පුද්ගලික සමාගම යටතේ සිදුවන අතර මහා ගාල්ල අනෙක් පෙදෙස් වලට ලංකා විදුලි බල මණ්ඩලයෙන් සේවාවන් සිදුවේ.

මහ ගාල්ල බල ප්‍රදේශයෙන් පළාත් පාලන ආයතන 03ක් හැර, මහනගර සභා බල ප්‍රදේශය 100% විදුලි ආවරණය ඇති අතර නේවාසික සංවර්ධනයට ඉහළ විභවයක් පවති.

රූපය 5.1-14 මහ ගාල්ල සීමාව තුළ විදුලි ආවරණය







මූලාශ්‍රය :සම්පත් පැතිකඩ (ගාල්ල කඩවත් සතර, බෝපේ පොද්දල, අක්මීමණ, හබරාදුව ප්‍රාදේශීය සභා)

වගු අංක 5.1 විදුලි ආවරණ ප්‍රදේශ - මහ ගාල්ල ප්‍රදේශය 2016

අක්මීමන ප්‍ර. සභා විදුලි සැපයුම			හබරාදූව ප්‍ර. සභා විදුලි සැපයුම		
මුළු ඒකක ගණන	විදුලිය සහිත එකක ගණන	විදුලිය නොමැති එකක ගණන	මුළු ඒකක ගණන	විදුලිය සහිත එකක ගණන	විදුලිය නොමැති එකක ගණන
12711	12069	642	1629	1624	5

මූලාශ්‍රය :සම්පත් පැතිකඩ (ගාල්ල කඩවත් සතර, බෝපේ පොද්දල, අක්මීමණ, හබරාදූව ප්‍රාදේශීය සභා)

එබැවින් මෙවැනි ඒකාබද්ධ වූ අත්‍යවශ්‍ය පහසුකම් හා සේවා පැවතීම තුලින් සුවපහසු ජීවන පරිසරයක් තහවුරු කල හැක.

අවස්ථා - අරමුණ *03*

අ 1 නාගරික ඒකරාශී වීමට ඇති විභවතාවය

ගාල්ල නගරය හිරිඹුර, කරාපිටිය අඛණ්ඩව සංවර්ධනය වීමේ විභවයක් පවතී. ගිංතොට නගර මධ්‍යද සාපේක්ෂව සංවර්ධනය වීමේ ඉහළ විභවයක් පවතී. මෙය පහත දැක්වෙන පරිදි නගර ඒකාබද්ධ කිරීමේ විභවය සහ නාගරීකරණ ප්‍රවණතා විශ්ලේෂණ අනුව පෙන්නුම් කල හැක.

රූපය 5.1-15 : මහා ගාල්ල සීමාවේ නාගරීකරණ ප්‍රවණතා



මූලාශ්‍රය :නාගරික සංවර්ධන අධිකාරිය - ගාල්ල 2020

රූපය 5.1-16 : මහා ගාල්ල සීමාව තුළ නාගරීකරණ ප්‍රවණතා මට්ටම්



මූලාශ්‍ර: පර්යේශණ හා සංවර්ධන අංශය - න.ස.අ. 2016

අ 3 - සංවර්ධන නැඹුරුව වෙනස් වීම

ඉහළ මහල් සහිත ගොඩනැගිලි (මහල් නිවාස) ප්‍රවණතා

දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමෙන් පසුව මහා ගාල්ල නගර ප්‍රදේශය තුළ මහල් නිවාස කිහිපයක්ම ඉදිකිරීම් කටයුතු සීඝ්‍රව ආරම්භ විය. මෙයින් පෙනී යන්නේ ප්‍රදේශයේ අවකාශයේ සිදුවූ ව්‍යුහාත්මක වෙනස්වීම හේතුවෙන් නගරය තුළ නේවාසික අවකාශ සඳහා සහ දේපල වෙළඳ පොළට හොඳ ඉල්ලුමක් මහා ගාල්ල ප්‍රදේශය තුළ ඇති වීමය.

රූපය 5.1-17 : මහල් නිවාස සඳහා ඇති ඉල්ලුම



මූලාශ්‍රය : පුවත් පත් දැන්වීම් ,2018

තර්ජන - අරමුණ *03*

ත 2 - මුහුදු ජලය ඉහළ යැමත් සමඟ ලවණ ජලය ඇතුල්වීම

ගාල්ල ප්‍රදේශයේ වෙරළබඩ භූමිය දේශගුණික විපර්යාස හේතුවෙන් සහ එහි බලපෑමෙන් මුහුදු ජල මට්ටම ඉහළ යැමෙන් මුහුදු ජලය භූමිය තුළට ගලා ඒමේ අවධානමට විශේෂයෙන් ගොදුරු වන නගරයකි. අධි ඝනත්ව නේවාසික සහ වෙරළබඩ පහත්බිම් තැනිතලා, දූපත් සහ ඩෙල්ටාවන් විශේෂයෙ-න් ම වෙරළ ඛාදනය වීමේ අවධානමට ලක් වන අතර, මුහුදු ජලය මිරිදිය ජල මූලාශ්‍ර හා මිශ්‍රවේ.

පහත වගුව මුහුදු ජලය ඉහළ යැමෙන් හානියට ලක්වූ ජල මූලාශ්‍ර ප්‍රමාණය පෙන්නුම් කරන අතර ගාල්ල ඉන් ඉහළ තැනක් ගනී.

රූපය 5.1-18 : මුහුදු මට්ටම ඉහල යාම නිසා ජල මූලාශ්‍ර වලට සිදුව ඇති බලපෑම

District	Total Area of Water Bodies affected due to sea level rise Ha
Colombo	758
Mullaitivu	824
Matara	893
Kalutara	1,539
Ampara	1,587
Trincomalee	2,063
Batticaloa	2,195
Gampaha	3,179
Hambantota	3,380
Galle	4,846
Mannar	7,776
Jaffna	9,457
Puttalam	10,221
Total	**48,718**

මූලාශ්‍රය :ශ්‍රී ලංකාවේ අවදානම් පැතිකඩ - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2012

පරිච්ඡේදය 05

ශ.දු.අ.ත විශ්ලේෂණය

අරමුණු 04

අරමුණු 04 "හරිත, සුපිරිසිදු සහ ආරක්ෂිත පරිසරයක්" නිර්මාණය කිරීම

ශක්තීන්		දුර්වලතා	
ශ1	කුඹුරු හෙක්ටෙයාර 1136.13 පවතින අතර වගුරුබිම් හෙක්ටෙයාර 135ක්ද හෙක්ටෙයාර 200ක පමණ පඳුරු, උද්‍යාන, වෙරළ ප්‍රදේශ සහ ආසන්න වශයෙන් හෙක්ටෙයාර 3631 ක පමණ පරිසර සංවේදී (උදා: මහමෝදර, ගිංගඟ, රූමස්සල) කලාප වේ.	දු1	නිසි ක්‍රමවත් කාණු සහ මලපවාහන පද්ධතියක් නොමැතිවීම
ශ2	හෙක්ටයාර 1.11 පමණ ප්‍රමාණයක විහිදුණු ස්වභාවික ජල මූලාශ්‍ර ද හෙක්ටෙයාර 0.2 පමණ මිනිසා විසින් නිර්මාණිත ජල මූලාශ්‍ර පවතී.	දු2	ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ විධිමත් ක්‍රමයක් නොමැතිවීම
ශ3	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයන් හඳුනාගෙන ඇති සුනාමි ආරක්ෂිත ස්ථාන 10.	දු3	අනවසර ලෙස පහත් ගොඩකිරීම
		දු4	වෙරළ තීරයේ සහ ජල මූලාශ්‍ර පරිහානිය
අවස්ථා		**තර්ජන**	
අ1	පාරසරික සංචාර සඳහා සංවර්ධනය කල හැකි ස්ථාන උදා : මහමෝදර කලපුව , කැපු ඇළ සහ මෝඩ ඇළ	ත1	ගං වතුර සහ සුනාමි වැනි අවදානම් සහිත ආපදා

ශක්තීන් - අරමුණ *04*

ශ 1 - කුඹුරු හෙක්ටෙයාර 1136.13 පවතින අතර වගුරුබිම් හෙක්ටෙයාර 135ක්ද, හෙක්ටෙයාර 200ක පමණ පඳුරු, උද්‍යාන, වෙරළ ප්‍රදේශ සහ ආසන්න වශයෙන් හෙක්ටෙයාර 3631 ක පමණ පරිසර සංවේදී (උදා: මහමෝදර,ගිංගඟ,රූමස්සල) කලාප වලින් සමන්විත වේ

ප්‍රදේශය ජෛව විවිධතත්වයෙන් සහ සමුද්‍රීය ශාඛ සහ ජීවින්ගෙන් ගහන වේ. රූමස්සල යනු ජෛව විවිධතත්වයෙන් ගහණ වූ එක් ප්‍රදේශයක් වන අතර මෙය ගාලු□ නගරයට යාබදව පිහිටා ඇත. ගාල්ලහි පවතින කැපී පෙනෙන භූ විෂමතා තුළට ශක්තිමත් ජල මූලාශ්‍ර ජාලයක් සහ වෙරළතීරය ශක්තිමත් හරිත දසුනක් මවා පායි.

ශ 2 - හෙක්ටයාර 1.11 පමණ ප්‍රදේශයක විහිදුණු ස්වභාවික ජල මූලාශ්‍රද හෙක්ටෙයාර 0. 2 පමණ ප්‍රදේශයක මිනිසා විසින් නිර්මාණිත ජල මූලාශ්‍ර පවතී.

ගාල්ල නගරයහි භූ විෂමතා ගත්කල මෘදු තෙත් තැනිතලා සහ සමතලා පහත් බිම්වලින් යුක්ත අතර එය ඉහළ ආර්ද්‍රතාවයකින් යුක්ත ජලාපවාහනවලින් සැදුම්ලත් ජලය සහ ගොඩබිම මිශ්‍රවූ භූ ගෝලීය පරිසරයකින් ස්මන්විත වන්නකි. නගරය ඇළ මාර්ග කිහිපයකින්ම යුක්ත අතර හෙක්ටෙයාර 12 (අක්කර 30) විශාලත්වයකින් ඇති මහමෝදර විල පිහිටුවා ඇත්තේ කැපු ඇළ පහළට වන්නටය.

ගාලු නගරයහි වයඹ දෙසින් පිහිටි ගිංගඟ රට තුළ පිහිටි ප්‍රධාන ගංගා වලින් එකක් වන අතර එය ගිංතොට ප්‍රදේශයෙන් මුහුද හා සම්බන්ධවේ. නගරයට ජලසම්පාදනය සිදුකරන ප්‍රධාන මූලාශ්‍රය මෙය වේ. නැගෙනහිරින් මොරොගොඩ ඇළ නගරය හරහා ගොස් මාගාල්ල පෙදෙසෙන් අවසන් වන ප්‍රධාන ධාරාව වේ.

රූපය 5.1-19 : මහා ගාල්ල සීමවහි හරිත සහ නීල ජාලය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය- ගාල්ල 2020

ශ 3 - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් හඳුනාගෙන ඇති සුනාමි ආරක්ෂිත ස්ථාන

පසුගිය දශකය තුළ ගාල්ල සුනාමි සහ ක්ෂණික ගංවතුර වැනි ස්වභාවික උවදුරු වල ගොදුරක් බවට පත්වී ඇත. මුල් අවදිය තුළ ආපදා කළමනාකරණ සඳහා සාකච්ඡාවන් විටින් විට පැවතිනි. මහින්ද විද්‍යාලය, සංඝමිත්ත විද්‍යාලය , ශ්‍රී විජයාරාම පංසල වැනි නගරයේ ඉහළ උන්නතාංශ වල පිහිටි ස්ථාන 10ක් සුනාමි ආරක්ෂිත ස්ථාන ලෙස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හඳුනාගෙන ඇත.

එබැවින් තිරසාර පරිසරයක් සාක්ෂාත් කරගැනීම සඳහා නිසි ආපදා කළමනාකරණ සැලැස්මක් සැකසීමට මෙය සාධකයක් විය.

රූපය 5.1-20: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් හඳුනාගත් ආපදා ආරක්ෂණ ස්ථාන

මූලාශ්‍ර : නාගරික සංවර්ධන අධිකාරිය - ගාල්ල 2020

දුර්වලතා - අරමුණ *04*

දු 1 සහ දු 2 - නිසි ක්‍රමවත් කාණු සහ මලපවාහන පද්ධතියක් නොමැතිවීම සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ විධිමත් ක්‍රමයක් නොමැතිවීම

සමහර නාගරීකරණය වී ඇති සහ වේගයෙන් නාගරිකරණය වෙමින් පවතින ප්‍රදේශ බොහොමයක් පහත් බිම් ලෙස ගාලු නගරය තුළ පිහිටා ඇත. නගරය තුළ පහළ ජල පෝෂක පෙදෙස් ගංවතුර අවධානම පවතින අතර වර්ශාවකදී පවා නිතරම ජල ගැලීම් ඇතිවේ.

අනවසර ඉදිකරීම් ස්වභාවික ජල ප්‍රවාහ අවහිර වන පරිදි ඉදිකිරීම සහ නීති විරෝධී ලෙස ඝන අපද්‍රව්‍ය සහ මලපවාහන ඇළමාර්ග සහ අනෙක ජල පවාහන පද්ධති තුළට බැහැර කිරීමත් ජලයේ ගුණාත්මක බව විනාශ කර ඇත. රොන්මඩ තැන්පත්වීම, ජල භාවිතය සහ ඇළ පවාහන ධාරිතාව, වෙනස්වීම හේතුවෙන් පසුකාලීනව කණ්ඩිය යටවීම සහ අවට පරිසරය ජල ගැලීම වලට හසුවීම.

"මොරගොඩ ඇළ, කැපු ඇළ සහ මහමෝදර විල යන ජල මූලාශ්‍රවල පවතින ජලයෙහි ගුණාත්මක බව ගෘහස්ත භාවිතයට, ස්නානයට හෝ විනෝද ක්‍රියා සඳහා භාවිතයට අවශ්‍ය ජල ගුණාත්මකභාවයට වඩා ඉතා අඩු මට්ටමකවේ."

විවිධ ජල විද්‍යාත්මක පද්ධති සංවේදී පරිසර පිහිටුවීමට බලපෑම් සිදුකරන අතර මෙය ගාල්ල නගර සීමාව සඳහා ශක්‍යතා විධිමත් සහ තිරසාර නාගරීකරණ සංවර්ධන උපායමාර්ගයක් සහතික කිරීම සඳහා අවශ්‍ය වේ.

රූපය 5.1-21: කැපු ඇළ සහ මහමෝදර ඇළ

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2019

දු3 - අනවසර ලෙස පහත් බිම් ගොඩකිරීම

පහල ප්‍රවාහයේ මෙන්ම මධ්‍යම ප්‍රවාහයේ ප්‍රදෙශ තුළ ඇති ජල ගැලීම් රදවා ගත හැකි ඉඩම් සිතුමතේ ගොඩකිරීම සහ ආරක්ෂිත භූමි ආවරණ ඉවත්කිරීමද ගංවතුර අවධානම ඉහළ යෑමට හේතු වී ඇත.

දු 4- වෙරළ තීරයේ සහ ජල මූලාශ්‍රවල පරිහානිය

පහළ උන්නතංශයේ පිහිටි සංවේදී ජල මූලාශ්‍ර සහ වගුරු බිම් අධිඝනත්ව නාගරික ක්‍රියාකාරකම් බවට පත්වීමේ නැඹුරුතාවයක් පවතින අතර ක්ෂණික ගංවතුර වැනි ගැටළු සහ පාරිසරික යටිතල පහසුකම් සැපයීම සඳහා ඉහළ වියදම දැරිය යුතුවේ.

රූපය 5.1-22 : උණවටුන වෙරළ

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය,2019

අවස්ථා - අරමුණ *04*

අ 01 -පාරසරික සංචාර සඳහා සංවර්ධනය කල හැකි ස්ථාන (උදා : මහමෝදර ඇළ, කැපු ඇළ සහ මෝඩ ඇළ)

වැඩි දියුණු කරන ලද පාරිසරික පද්ධතියක් සංචාරක කර්මාන්තයට වක්‍රාකාරව ප්‍රවර්ධනය කල හැකි අතර හරිත නාගරික අවකාශයක් ඇති පරිසර හිතකාමී ලක්ෂණ පිරිපුන් නගරයක් මෙන්ම ආර්ථික සංවර්ධනයක් කළ හැකි වේ. මෙය සිදුකිරීමේදී ප්‍රදේශය පුරා විහිදුණු විවිධාකාරයේ ජල මූලාශ්‍ර ජාල සැලකිලිමත් විය යුතු වේ.

එබැවින් මහමෝදර කලපුව, කැපු ඇළ සහ , මෝඩ ඇළ වැනි නගරය පුරා දිවෙන ජල මූලාශ්‍ර තවදුරටත් පාරසරික සංචාරක ස්ථාන ලෙස සංවර්ධනය කරන අතරතුර ස්වභාවික සහ නිර්මාණිත පරිසරය අතර සමතුලිතය පවත්වා ගනිමින් සංවේදී ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීම සිදුවේ.

රූපය 5.1-23 : ගිංගඟ

රූපය 5.1-24: මහමෝදර ඇළ

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2019

තර්ජන - අරමුණ *04*

ත 1 - ක්ෂණික ගංවතුර සහ සුනාමි වැනි ආපදා සඳහා අවධානම

මෙතෙක් සිදුවී ඇති සියළු ස්වාභාවික විපත් වලට වඩා සුනාමියෙන් සිදු වූ විනාශය දරුණු වේ. ගාල්ල වෙරළබඩ නගරයක් බැවින් 2004 සිදුවූ සුනාමි අනතුරෙන් දැඩි හානියක් සිදුවිණි. එමගින් අති විශාල හානියක් ප්‍රවාහන පද්ධති, විදුලිය,ජල සහ සන්නිවේදන ඇතුළු සියලු යටිතල ව්‍යුහයන්ට සිදුවිණි.

සුනාමියට අමතරව නගරයේ පවතින දුර්වල ජලාපවාහන ජාලය සහ ප්‍රමාණවත් නොවන නඩත්තු හේතුවෙන් මෙන්ම වර්ෂා ලැබීමේ තීව්‍රතාවය ඉහල යාම වැනි සියලු කරුණු වල එකතුවෙන් වාර්ෂිකව ගංවතුර තත්වයක් උදාවේ.

සිතියම 5.1 - 1 ගං වතුර අවදානම් ප්‍රදේශ



මූලාශ්‍රය : නගර සහ ග්‍රාම නිර්මාණ දෙපාර්තුමේන්තුව, මොරටුව විශ්වවිද්‍යාලය 2014

පරිච්ඡේදය 05

ශ.දු.අ.ත විශ්ලේෂණය

අරමුණු 05

අරමුණු **05** විධිමත් ගමනා ගමන පද්ධතියක් ප්‍රවර්ධනය කරමින් මහා ගාල්ල ප්‍රදේශය වෙත පැමිණෙන මගීන් හට පහසුකම් සැපයීම.

ශක්තීන්		දුර්වලතා	
ශ1	ප්‍රදේශය තුළ පවතින අනර්ඝ අන්තර් සම්බන්ධය (2 මාර්ගය කොළඹ - වැල්ලවාය, දක්ෂිණ අධිවේගී මාර්ග,දුම්රිය මාර්ග, ඉතා කාර්ය බහුල මුහුදු මාර්ගය ආසන්නවීම)	දු1	කාර්ය බහුල කාල වේලාවන්හිදී ප්‍රධාන ස්ථාන වල පවත්නා රථවාහන තද බදය.
		දු2	පොදු රථ වාහන ගාල් කිරීම සඳහා විධිමත්වූ ඉඩකඩ නොමැතිවීම
		දු3	නගර මධ්‍යයේ ඇවිදීමට ඇති හැකියාව අඩුවීම
ශ2	ගාල්ල මුහුදු වරායේ පිහිටීම	දු4	දුර්වල මං සන්ධි නිර්මාණය (උදා-නාවික සංකීර්ණය ප්‍රවේශය, සරෙන්තු කඩේ හන්දිය තනිපොල් ගහ හන්දිය)
		දු5	ප්‍රමාණවත් නොවන සහ පටු මාර්ග සහ වීදි
අවස්ථා		**තර්ජන**	
අ1	දක්ෂිණ අධිවේගී අන්තර් හුවමාරු ස්ථානයන්ට ඉතා සමීපයෙන් පිහිටීම.	ත1	දේශපාලන අස්ථාවරත්වය
අ2	කොග්ගල අභ්‍යන්තර ගුවන්තොටුපොළට සමීපයෙන් පිහිටීම		

ශක්තීන් - අරමුණ *05*

ශ 1 - ප්‍රදේශය තුළ පවතින අනර්ඝ අන්තර් සම්බන්ධය

ගාල්ල නගරය ගාල්ල-දෙනියාය ් 17 මාර්ගය හරහා මෙන්ම ද්විතික මාර්ග ජාල වන ගාල්ල-බද්දේගම සහ ගාල්ල - වදුරඹ මාර්ග හරහා ගම් බද ප්‍රදේශ හා සම්බන්ධ වන අතර මෙම සම්බන්ධවීම් නගරයේ සංවර්ධනය වේගවත් කිරීමට හේතුදායක වේ.

පින්නදුවේ පිහිටා ඇති දක්ෂිණ අධිවේග මාර්ග හුවමාරු මධ්‍යස්ථානය වරාය සංවර්ධන ප්‍රවණතා සහ ගාලු කොටුව සංචාරක මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය මෙන්ම ලෝක උරුම සංචාරක මධ්‍යස්ථා-නයක් ලෙසද ගාල්ල නගරය පුළුල් වූ භූමිකාවක ක්‍රියා කරන අතර නගර මධ්‍යස්ථයේ පවත්නා ක්‍රියාකාරකම් වලින් සපිරි ක්‍රියාකාරී නගරයක් වේ.

සම්බන්ධතා විශ්ලේෂණය අනුව ප්‍රදේශය තුල ඉහළම සම්බන්ධතාවය ඇත්තේ ගාල්ල නගරයට වේ. එබැවින් නාගරික ඒකරාශීවීමේ ක්‍රියාවලිය යටතේ ප්‍රදේශයේ අනෙක් නාගරික මධ්‍යස්ථාන අතරින් ප්‍රමුඛ වී ඇත. මෙය මාර්ග සංවර්ධනය හා අනෙකුත් ක්‍රියාකාරකම් (ඓතිහාසික ස්ථාන) පිහිටීම අතර අන්‍ය ගෙන්‍ය වශයෙන් ශක්තිමත් වන ක්‍රියාවලියක් ලෙස තේරුම් ගත හැකිය. මාර්ග පද්ධතීන් එකට ගොනු වීම ඉහළ සම්බන්ධතාවයක් ප්‍රවර්ධනය කරන අතර මෙය ව්‍යාපාර වලට ඇති ආකර්ෂණය ඉහළ යෑමට මෙන්ම ප්‍රතිලෝම ලෙස ද බලපාන කරුණක් ලෙස දැක්විය හැක.

සිතියම 5.1-2 : ගාල්ලෙහි ප්‍රාදේශීය සම්බන්ධතාවය

මූලාශ්‍ර : නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව,මොරටුව විශ්වවිද්‍යාලය 2014

ශ -2 ගාලු වරායේ පිහිටීම සහ එහි පැවැත්ම

මෙම වරාය ක්‍රිස්තු පූර්වේ සිට භාවිතා වී ඇති අතර 12වන සියවසේ සිට මෙහි වැදගත්කම ඉහළ ගොස් ඇත. 14 වන සියවසේදී ගාලු වරාය රට තුළ ඇති ඉතා වැදගත් වරායක් වූ අතර මෙම තත්ත්වය 1879 දී කෘතීම වරායක් ලෙස කොළඹ වරාය ගොඩනගන තෙක් නොවෙනස්ව පැවතුනි 17 වන සියවසේදී ගාලු කොටුව ගොඩනැගීමෙන් පසු ගාලු වරාය ඉන්දියානු සාගරයේ ඉතා වැදගත් වරායක් ලෙස වසර 200 කට අධික කාලයක් පැවතුනු අතර යුරෝපය සහ ආසියාව අතර ජාත්‍ය-න්තර සමුද්‍රීය මාවතේ පිහිටි නැව් සහ බෝට්ටු නැංගුරම්ලන වැදගත් ස්ථානයක් බවට පත්විය. බ්‍රිතාන්‍ය යටත්විජිත ආණ්ඩුව යටතේ 19 වන සියවසේදී කොළඹ වරායේ දියකඩනයක් ඉදිකිරීමෙන් පසු ජාත්‍යන්තර සමුද්‍රීය මාවත කොළඹ වරාය කේන්ද්‍රකොටගෙන ගාල්ල සිට කොළඹ වෙත මාරුවිනි. ඉන්පසු ගාලු වරාය රටෙහි පවතින දෙවන වරාය බවට පත්වුවත් වර්තමානයේදීත් ඇතැම් නැව් සහ බෝට්ටු මෙම වරායෙන් පාලනය කරනු ලබයි.

කෙසේ නමුත්, පුළුල් කිරීමට යෝජිත වරාය නව පුළුල් කිරීම යටතේ නැව් දෙකක් සඳහා එකවර පහසුකම් සැපයිය හැකි පරිදි පුළුල් කිරීමට යෝජිතය. වර්තමානයේ මෙම වරායෙන් ගොඩබානු ලබන භාණ්ඩ වලින් 99% ක් සිමෙන්ති අමුද්‍රව්‍ය (ක්ලින්කර්) සහ පිටි යන භාණ්ඩ වර්ගයන් වන අතර මැලේසියා, ඉන්දියාව සහ ඉන්දුනීසියාව යන රටවලින් ආනයනය කරනු ලබයි. තවද මීට සමාන්තරව නාවික සහ යුධ හමුදාවන්ට අයත් භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම මත්ස්‍ය නිෂ්පාදන අපනයන කිරීමද මෙම වරාය හරහා වර්තමානයේදී සිදුවේ.

එබැවින් නාවික යානා ගමනාගමන සේවා (සුඛෝපභෝගී නාවික සේවා) සඳහා වරාය පුළුල් කිරීම සහ එම සංවර්ධන බලපෑම තුලින් ප්‍රදේශයේ ආර්ථිකයට මෙන්ම නාවික සේවා වලටද බලපෑමක් ඇතිවිය හැක. ගාල්ල වරාය කලාපීය අවශ්‍යතාවයන්ට සහ ජාතික ආර්ථික කොරිඩෝවලට ගැලපෙන පරිදි ප්‍රතිසංවිධානය කිරීමට ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් හඳුනාගෙන ඇත

රූපය 5.1-25 : ගාලු වරාය

රූපය 5.1-26: ගාලු වරාය තුල නැංගුරම් ලා ඇති නැවක්

මූලාශ්‍රය: පිංතුර ක්ෂේත්‍ර සමීක්ෂණය 2019

දුර්වලතා - අරමුණු *05*

දු 1- කාර්යබහුල වේලාවන්හිදී ප්‍රධාන ස්ථානවල රථවාහන තදබදය ඇතිවීම

ගාල්ල නගරය තුළ දිනපතා අධික රථ වාහන ප්‍රවාහයක් නිරීක්ෂණය කල හැක. කෙසේ නමුත් මාගාල්ල සිට මහමෝදර දක්වා වූ කොළඹ මාර්ගයේ කොටස නගරයේ රථවාහන තදබදය පවතින ස්ථාන ලෙස හඳුනාගත හැකි අතර මෙය උච්ච කාල හෝරාවන්හිදී කැපී පෙනේ.

සිතියම 5.1-3 : ගාලු නගරය තුළ රථවාහන තදබදය

මූලාශ්‍රය : නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය 2014

දු 2 - පොදු රථ වාහන ගාල් කිරීමේ විධිමත්වූ ඉඩකඩ නොමැතිවීම

ගාල්ල නගරය සහ තදාසන්න ප්‍රදේශ තුළ රථවාහන ගාල් කිරීමේ ඉඩකඩ නොමැතිවීම වර්තමානයේදී ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත. රථවාහන ගාල් කිරීම සඳහා නියමකරන ලද ස්ථාන වෙන්කර තිබුනද පවතින ඉල්ලුමට සරිලන ප්‍රමාණවත් ඉඩකඩ එම රථගාල් තුලින් නොමැති වීමත් දිනෙන් දින එම ස්ථාන කරා ආකර්ෂණය වන වාහන සංඛ්‍යාව ඉහළ යාමත් මෙයට ප්‍රධාන හේතු වේ. මෝටර් කාර් වලට අමතරව වෑන් රථ සහ බස් රථ විශාල සංඛ්‍යාවක් ප්‍රධාන මාර්ග දිගේ විශේෂයෙන් වක්වැල්ල මාර්ගය සහ මහජනයාගේ ක්‍රියාකාරකම සඳහා ඇති විවෘත පෙදෙස්හි ගාල්කර ඇත. මෙවැනි සැලසුමකින් තොරව මාර්ග දෙපස වාහන නතර කිරීමෙන් පදිකයන්ට මෙන්ම රථ වාහනයන්හි වේගවත් ගමනාගමනයටද බාධාවක් වී පවතී.

රූපය 5.1-27 : මාර්ග දෙපස අවිධිමත් ලෙස වාහන ගාල් කිරීම (වක්වැල්ල පාර සහ ගාමිණී මාවත)

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2019

දු 3 - නගර මධ්‍යයේ ඇවිදීමට ඇති හැකියාව අඩුවීම

ගාල්ල මහනගර සභාව මගින් මහවීදියේ ගොඩනැගිලි ඉදිකිරීමේ සීමාවන්හි ලිහිල් බවක් ඇති කර ඇති බැවින් කිසිදු රථ ගාලක් නොමැතිව තට්ටු ගොඩනැගිලි ඉදිකිරීමෙන් මාර්ගය භාවිතා කරන්නන් හට බාධාවන් සහ රථ වාහන තද බදය උග්‍ර වී ඇත. මේ හේතුවෙන් පදිකයින්හට නගර මධ්‍යය හරහා ගමන් කිරීම අපහසු වී ඇත.

රූපය 5.1-28 :ගාල්ල නගරය තුළ දෛනික පදික ප්‍රවාහනය



මූලාශ්‍රය : නගර සහ ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, මොරටුව විශ්වවිද්‍යාලය,2014

රූපය ***5.1.34:*** අක්‍රමවත් රථ වාහන ගාල් කිරීම (වක්වැල්ල පාර හා ගාමිණී මාවත)

මූලාශ්‍රය : *Google* වීථි දසුන් පින්තූර 2019

දු 4 හා දු 5 - දුර්වල මං සන්ධි නිර්මාණය සහ ප්‍රමාණවත් නොවන සහ පටු මාර්ග සහ වීදි

නගරයේ බොහෝ ස්ථානවල මාර්ග පටුවීම හේතුවෙන් හා නගරය තුල විධිමත්ව ගමන් කිරීමට වේදිකා නොමැති බැවින් පදිකයන්ගේ ආරක්ෂාව නගරයේ තවත් ප්‍රශ්නයක් වී ඇත.

රූපය 5.1-29 : මහවීදිය

රූපය 5.1-30 :නාවික හමුදා සංකීර්ණ ප්‍රවේශ මංසන්ධිය

මූලාශ්‍රය: Google වීථි දසුන් පින්තූර 2019

අවස්ථා - අරමුණු *05*

අ *1*- දක්ෂිණ අධිවේගී අන්තර් හුවමාරු ස්ථානයන්ට ඉතා සමීපයෙන් පිහිටීම

දක්ෂිණ අධිවේගී මාර්ගය හඳුන්වාදීමත් සමඟ නගර හා සම්බන්ධවීමේ මට්ටම හා හැකියාව වැඩිවිය.

රූපය 5.1-31 : දක්ෂිණ අධිවේගී පින්නදූව අන්තර් හුවමාරුව

මූලාශ්‍රය: Google වීථි දසුන් පින්තූර 2019

අ 2 - කොග්ගල අභ්‍යන්තර ගුවන්තොටුපොළට සමීපයෙන් පිහිටීම

ශ්‍රී ලංකා ගුවන් හමුදා බලකා කඳවුරක් ලෙස වර්තමානයේ ක්‍රියාත්මක වන කොග්ගල අභ්‍යන්තර ගුවන් තොටුපොළ ගාලු නගරයේ සිට කිලෝමීටර 8 ක පමණ දුරින් පිහිටා ඇත. දැනට පවතින ගුවන් පථය අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා වන ගුවන් යානා වෙනුවෙන් භාවිතා වේ. මෙම ගුවන් තොටුපොළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට විකල්ප ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් ලෙස දියුණු කිරීමට බලාපොරොත්තුවේ. එබැවින් මෙය ප්‍රදේශයේ ඒකාබද්ධ සහ වඩාත් සම්බන්ධිත වූ ප්‍රවාහන ජාලයකට විභවයක් ඇති කරනු ඇත.

රූපය 5.1-32: කොග්ගල අභ්‍යනතර ගුවන් තොටුපොළ

මූලාශ්‍රය: Google පින්තූර 2019

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත විශ්ලේෂණය

අරමුණු 06 — වඩා උචිත පරිසරයක් නිර්මාණය කිරීම තුලින් මහා ගාල්ල ප්‍රජාව "ප්‍රීතිමත් පුරවැසියන්" ලෙස ජීවත්වන බව තහවුරු කිරීම

අරමුණු 06

ශක්තීන්		දුර්වලතා	
ශ1	ප්‍රදේශයේ ප්‍රධාන සංචාරක ගමනා-න්තය	දු1	පොදු සහ විවෘත අවකාශ හිඟකම (චතුරශ්‍ර වැනි)
ශ2	නගර මධ්‍යයේ පිහිටි මහජන උද්‍යානය	දු2	ගාල්ල නගර සීමාව තුළ පදික මාර්ග අවම ප්‍රමාණයක් පැවතීම
ශ3	පුළුල් වෙරළ තීරයක්/ජල සම්පත් ගාල්ල නගරය තුළ පැවතීම	දු3	වෙරළ තීරයේ සහ නගර සීමාව තුල පිහිටි අනාරක්ෂිත සහ අබලන් වූ ගොඩනැගිලි
		දු4	පරිහාණියට පත්වූ වෙරළ ප්‍රදේශ සහ ජල මූලාශ්‍ර
අවස්ථා		තර්ජන	
අ1	සංවර්ධන වෙනස් වීමේ නැඹුරුව	ත1	සුනාමි සහ ක්ෂණික ගංවතුර වැනි ආපදා සඳහා ඇති අවදානම

ශක්තීන් - අරමුණ *06*

ශ 2 -නගර මධ්‍යයේ පිහිටි මහජන උද්‍යානය

2004 සුනාමියෙන් විනාශයට පත්වී නැවත යථාතත්ත්වයට පත්වී ඇති ධර්මපාල උද්‍යානය කලබලකාරී ගාල්ල නගරයෙන් මිදී සාමකාමී සහ නිසංසල පරිසරයක් දායාද කරයි.

උද්‍යානය මගින් ප්‍රජාව වෙත විනෝදාශ්වාද පහසුකම් සපයන අතර මෙය විනෝදාස්වාද සහ විවේක සුවපහසුව සඳහා ඇති එකම විවෘත පොදු ස්ථානය වේ.

රූපය 5.1-33 : ධර්මපාල උද්‍යානය ගාල්ල

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ 2019

ශ 3 - ගාල්ල සතුව පුළුල් වූ වෙරළ තීරය/ජල සම්පත පැවතීම

වෙරළබඩ නගරයක් ලෙස ගාලු නගරය ඉතා ආකර්ෂණීය මුහුදු තීරයක් ඇති අතර නගර අලංකරණය, සංචාරක ව්‍යාපාරය සහ ආර්ථික සංවර්ධනය සඳහා ඵලදායී ලෙස යොදා ගත හැකිය.

රූපය 5.1-34 : ගාල්ල නගර ජල මුහුණත

මූලාශ්‍රය: Google පින්තූර 2017

දු 3 - වෙරළබඩ සහ නගර සීමාවේ අනාරක්ෂිත සහ අබලන් ගොඩනැගිලි පැවතීම

ආර්ථික වටිනාකම සඳහා භාවිතා කල හැකි නගරයේ වැදගත් ස්ථානවල අබලන්වූ ගොඩනැගිලි සහ ඌන භාවිත ඉඩම් කිහිපයක්ම නගර සීමාව තුළ පිහිටා ඇත

රූපය 5.1-35 : වෙරළබඩ සහ නාගර සීමාවේ අනාරක්ෂිත සහ අබලන් ගොඩනැගිලි

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ සහ ගූගල් භූමි දර්ශන,2019

පරිච්ඡේදය 05

5.2 විස්තරාත්මක විශ්ලේෂණය

විස්තරාත්මක විශ්ලේෂණය

5.2.1 නාගරික ව්‍යුහය

නගරයේ ආධිපත්‍ය ප්‍රදේශය තුල ඉදිකිරීම් මගින් පිළිඹිබු වන අතර මෙය ඉදිකිරීම්වල සාන්ද්‍රගත රටාව මත ඉතා හොඳින් කැපී පෙනේ. ඉදිකිරීම් ප්‍රදේශ කොළඹ - මාතර මහා මාර්ගය (ඒ 2) ඔස්සේ ව්‍යාප්තව ඇති අතර මෙහි ප්‍රතිපලයක් ලෙස මිශ්‍ර ඉඩම් භාවිතයේ කොරිඩෝවක් දැක්විය හැක. සංවර්ධනයේ මෙම රටාව කලාපයේ නාගරික ස්වරූපය සංකල්පනය කිරීමට ඉඩ සලසන අතර මෙය ඒක කේන්ද්‍රීය සහ රේඛීය සම්පීඩනයක මිශ්‍රයක් ලෙස දැක්විය හැක. ගාල්ල නගරයට යාබදව ඇති කරාපිටිය සහ අනෙකුත් කුඩා නගර මෑතකදී නගරයෙන් පරිබාහිර ප්‍රදේශවල මතුවීම මෙම ආකෘතිය යම් මට්ටමකට වෙනස් වීමට හේතුවී ඇත. ගාල්ල - කලේගාන, ගාල්ල- කහඳුවත්ත සහ ගාල්ල - ලබුදුව මාර්ග ඔස්සේ ඉදිකිරීම් ප්‍රදේශ ගාල්ල නගර මධ්‍යයේ සිට නගර අභ්‍යන්තරයට කේන්ද්‍රීය රටාවකට ව්‍යාප්තවේ

රූපය 5.2-1 : ගාල්ල නගර ව්‍යුහය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - ගාල්ල 2020

සත්‍ය වශයෙන්ම මෙවැනි නාගරික ආකෘති තුළ අනෙකුත් ආකෘතින්ට වඩා සියලු ප්‍රදේශ වලින් ප්‍රවේශ පහසුව, සාපේක්ෂව වඩා ආර්ථිකමය ප්‍රතිපාදන යටිතල පහසුකම් සඳහා ලබාදීම, ඉහළ සේවා පහසුකම්, සමාජ අන්තර්ක්‍රියා සඳහා වැඩි අවස්ථාවන් සහ අවට පරිසරය සංරක්ෂණය කිරීමේ ඉහල විභවයක් පැවතීම වැනි ඉතා ධනවත් ලක්ෂණ පවතී. කෙසේ නමුත් ගාල්ල නගරය තුල පවතින දුර්වලතා කිහිපය-ක්ද හඳුනාගත හැක.

පහත සිතියමෙන් පෙන්නුම් කරනු ලබන්නේ පසු ගිය කාල වකවානුව තුල සිදුවූ ඉදකිරීම් රටාවන්හි පරිණාමනය වන අතර වර්තමානයේදී සිදුවෙමින් පවතින අවකාශීය සංවර්ධන රටාවද පැහැදිලි වේ. මූලික විශ්ලේෂණ මගින් ඉදිකිරිම් ප්‍රදේශ නගර අභ්‍යන්තරයට සිදුවන ව්‍යාප්තිය දැකගත හැක

රූපය 5.2-2: ගාලු නගරයේ බොහෝ කාලයක් තුල සිදුවූ ඉදිකරීම් රටාව 1993



වසර 1993 දී, බොහෝ ඉදිකිරීම් කේන්ද්‍රගත වූයේ ගාලු නගරය සහ ආසන්-නතම අවට ප්‍රදේශයන්ට වන අතර ගාල්ල- මාතර මාර්ගය ඔස්සේ ව්‍යාප්තිය පැවතිනි.

මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

රූපය 5.2-3: ගාලු නගරයේ බොහෝ කාලයක් තුල සිදුවූ ඉදිකරීම් රටාව 2001



වසර 2001 න් පසුව මෙය වෙනස්වූ දිශාවක් ඔස්සේ වර්ධනය වූ අතර කොළඹ

- මාතර මාර්ගයට සාපේක්ෂව ක්‍රමයෙන් අභ්‍යන්තර ප්‍රදේශ කරා ව්‍යාප්ත වුනි.

මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

රූපය 5.2-4: ගාලු නගරයේ බොහෝ කාලයක් තුල සිදුවූ ඉදිකරීම් රටාව 2013



මෙය වසර 2013 වන විට දී වර්ධන රටාව සහ ගොඩනැගීම් ආකෘතිය ගාල්ල නගරයෙන් අභ්‍ය-න්තරයට විහිදී ඇති බව නිරීක්ෂණය වන අතර ප්‍රධාන නාගරික මධ්‍යට සමාන්තරව කරාපිටිය උපනගරය දෙසට වර්ධනය වීමක් පෙන්නුම් කරයි.

මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

5.2-4 : පසුගිය වසර කිහිපය තුළ දී ගාල්ල නගරයහි ජනගහන ව්‍යාප්තිය 2001



මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

5.2-5 : පසුගිය වසර කිහිපය තුළ දී ගාල්ල නගරයහි ජනගහන ව්‍යාප්තිය 2012

මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

ඉහත සාකච්ඡා කරනලද ජනාවාස වෙනස් වීම පෙන්නුම් කරන දර්ශකයක් ලෙස ජනගහන වර්ධන රටාව දැක්විය හැක. 2001 ට සාපේක්ෂව 2012 වසර ජනගහණ සංඛ්‍යා ලේඛන සංසන්දනයේදී නාගරික සීමාවේ පිහිටි ග්‍රාම නිලධාරි වසම් සිට මෑතකදී සංවර්ධනය වූ කහඳුවත්ත, කරාපිටිය, ලබුදුව,බෙලිගහ, තනිපොල්ගහ වැනි ,තදාසන්නාවූ ප්‍රදේශවෙත නේවාසික ජනගහනය සම්ප්‍රේෂණය වීමේ ප්‍රවනතාවයක් තහවුරු වේ.

1980 දී ගාලු නගර මධ්‍ය සීමාවේ අවකාශ සහ නගර ආසන්නයේ පිහිටි අවකාශ අතර ඉතා ඉහළ අන්තර් සම්බන්ධතාවයක් පැවති ඇත. මෙය නගර සීමාව සහ නගරය අවට ජනතා ක්‍රියාකාරිත්වය සාන්ද්‍රගත වීමට හේතුව විය හැක.

එහෙත් වසර 30 කට පසු එනම් 2010 දී නගර අතර ඒකාබද්ධතා මට්ටම් වෙනස් වී ඇති අතර පර්යන්ත ප්‍රදේශ ආශ්‍රිත ස්ථානවල ගාලු නගර මධ්‍යයේ සම්බන්ධතා අගය වැඩි අගයක් ගෙන ඇත . පසුකාලීනව නව ආයතනික කටයුතු පුළුල් වීම හා හා නව මාර්ග ජාල සංවර්ධනය නවීකරණය කිරීම බෙලිගහ හන්දිය, කහඳුවත්ත හන්දිය සහ කරාපිටිය හන්දිය වැනි ස්ථානවල අවකාශීය අන්තර්ග්‍රහණය වැඩිදියුණු විය හැකිය. මෙය එම ප්‍රදේශවලට ඇති ඉල්ලුම ඉහළ නැංවීමට හේතු වූ අතර එම ප්‍රදේශ ගාල්ල නගරයෙන් පිටත පිහිටියද එහි ප්‍රතිපලයක් ලෙස එම නගරයන්හි නාගරික ක්‍රියාකාරකම් කේන්ද්‍රගත වී ඇත. වර්තමානයේ යෝජනා වී ඇති මාර්ග සංවර්ධන ව්‍යාපෘති සමඟ කරාපිටිය සහ අවට ප්‍රදේශ තුළ අවකාශ සංයුක්තියක එකතුවක් සාපේක්ෂව ඉහළ මට්ටමකට පත්වීමේ ප්‍රතිපලයක් ලෙස ක්‍රියාකාරී නාගරික මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය වීම සඳහා ඉහළ විභවයක් වර්ධනය වනු ඇත

රූපය 5.2-4 : පසුගිය වසර කිහිපය තුළ දී ගාල්ල නගරයෙහි භූමි භාවිතය හා මාර්ග ජාල සම්බන්ධතාවය





මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

විස්තරාත්මක විශ්ලේෂණය

රූපය 5.2-7 : පසුගිය වසර කිහිපය තුළ දී ගාල්ල නගරයෙහි භූමි භාවිතය හා මාර්ග ජාල සම්බන්ධතාවය





මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

5.2.2 සලකා බලනු ලබන විකල්ප සිද්ධීන්

මෙම සැලැස්ම මගින් සකස් කරන ලද දැක්ම සමග ගැළපෙන පරිදි අනාගතයේ සංවර්ධනය සඳහා ගාල්ලේ හොඳම සුදුසු වාතාවරණය හඳුනාගත හැකි විකල්ප සිද්ධීන් තුනක් සැලකිල්ලට ගෙන තිබේ. මහා ගාල්ල හි අනාගත සංවර්ධන සැලැස්ම හරහා සැකසුණු දැක්ම හා ගැලපෙන වඩාත් උචිත සම්භව්‍යක් ඇති විකල්ප සිද්ධීන් තුනක් සැලකිල්ලට ගෙන තිබේ

.

වර්තමානයේ ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල අපේක්ෂිත බලපෑම් මෙන්ම ඉහත සාකච්ඡා කල අධ්‍යන සීමාව තුළ වර්තමාන නාගරික සංවර්ධන නැඹුරුව මත පදනම්ව සංවර්ධනයේ ඉහළම සම්භාවිතාව සැලකිල්ලට ගනිමින් මෙම අපේක්ෂාවන් සකස් කර ඇත.

සංවර්ධනය සාමාන්‍ය වශයෙන් සිදුවීමේ සංසිද්ධිය

රූපය 5.2-5 සංවර්ධනය සාමාන්‍ය වශයෙන් සිදු වන සංසිද්ධිය



මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

නාගරික යටිතල පහසුකම් වෙත සිදු කෙරෙන්නාවූ වර්තමාන ආයෝජන සමඟ නියාමන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වුවද කලාපයේ පවතින්නාවූ සංවර්ධන නැඹුරුව තවදුරටත් "නාගරික ප්‍රදේශයක්" ලෙස ක්‍රියාත්මක වේ. තත්ත්ව කේන්ද්‍රය සමඟ අඛන්ඩව පවත්වා ගෙන යාම මෙම කලාපය කලාපය මත මෙන්ම එහි වර්ධනය මත ධනාත්මක සහ ඍණාත්මක බලපෑම් ඇති කිරීමට හේතු විය හැක. ධනාත්මක බලපෑම් අතර සාමන්‍ය නාගරික මධ්‍යස්ථාන එපිටින් පිහිටි බොහෝ තදාසන්න ප්‍රදේශ තනිපොල්ගහ, කරාපිටිය වැනි ස්ථාන විවිධවූ ආර්ථික ක්‍රියාකාරකම් වලින් යුක්තව කැපීපෙනේ. සාමන්‍ය වෙළඳාම සහ වාණිජමය ව්‍යාපාර ගාල්ල නගරය තුළ අවම කිරීමෙන් නගරය තුළට රථ වාහන ප්‍රවාහය අඩු කළ හැකි අතර නගරය තුළ තදබදය අවම වී නගරය තුළ ඇති තෙරපුම ද අවම වේ. වෙරළට සහ ස්වභාවික ජල මූලාශ්‍ර යාබද ප්‍රදේශ සංචාරක සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කලයුතු අතර මෙය ක්ෂේත්‍රයේ සංවර්ධනය මතුවීමට ඇති ඉල්ලුම මත රඳා පවතී.

මෙම විකල්පයන්හි පවතින ඍනාත්මක බලපෑම වනුයේ සංවේදී පරිසරයරට ඇති විය හැකි හානිය වේ. මන්දයත් මෙම විකල්ප හේතුවෙන් අභ්‍යන්තර පෙදෙස් වල නේවාසික භාවිත රටාව විස්කෘතව ඉහළ යෑම සිදුවේ. එමෙන්ම ඒ තත්ත්වය ගංවතුර සහ නායයෑම් අවදානමක් ද ඇති වීමට ඉඩ ප්‍රස්ථාව ඇත. වෙරළාසන්න ප්‍රදේශ දේශීය සහ විදේශීය සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා ආකර්ෂණය වනු ඇත. නමුත් සංවර්ධන පීඩනය වර්ධනය වුවහොත් පවතින ධාරිතාව ඉක්මවා වර්ධනය වීමේ තර්ජනයක් ඇතිවිය හැකි අතර පරිසරයට බලපෑම් ඇතිවේ. මෙය දිගු කාලීන තිරසාරත්වයට බලපෑමක් ඇතිකළ හැක. ප්‍රවේශවීමට ඇති අඩු පහසුකම් සහ යටිතල පහසුකම් නොමැති වීම් හේතුවෙන් අභ්‍යන්තරයේ පිහිටි වටිනා සම්පත් ස්ථාන උපරිම අයුරින් භාවිත කර නොමැත. තවද සාම්ප්‍රදායික ලෙස සංවර්ධනය වන නගරයන්හි වර්ධනයෙහි ප්‍රමාදය හේතුවෙන් නාගරික පහසුකම් සහ ගොඩනැගිලි බොහොමයක් ප්‍රමාණවත් අවධානයක් නොමැතිව පවතී. මෙය නගරයේ පවතින ඉඩම් සහ අනෙකුත් සම්පත් උපයෝජිතව භාවිතා කරන තත්ත්වයට පත්වීමට හේතු වී ඇත.

පරිච්ඡේදය 05 උප නගරයක් ලෙස කරාපිටිය සංවර්ධනය

විස්තරාත්මක විශ්ලේෂණය
සලකා බලනු ලබන විකල්ප සිද්ධීන

කරාපිටිය නගරයෙහි සිදුවෙන්නා වූ වාණිජ සංවර්ධනයට සමගාමීව, බෙලිගහ, ජූල්ගහ, කහඳුවත්ත, කලේගාන, තනිපොල්ගහ වැනි මංසන්ධි නගර සංවර්ධනය සිදුවේ. ප්‍රධාන මාර්ග අතර පවතින අවකාශ මිශ්‍ර නේවාසික සංවර්ධනය ඉහළ නැංවීමට ඉඩප්‍රස්ථාව ලබා දෙයි. කරාපිටිය නගරයට ප්‍රමාණවත් යටිතල පහසුකම් ලබාදීම සහ ආයෝජන ප්‍රවර්ධනය කළහොත්, මෙම ක්‍රියාවලිය පරිබාහිර නගර සංවර්ධන ඉහළ නැංවීමට හේතුවන අතර ගාල්ල සහ ආසන්න පෙදෙස්වල පවතින සංවර්ධන තදබදයට යම්තාක් ප්‍රමාණයකට සහනයක් වනු ඇත. විසිරි පවතින සංවර්ධන ක්‍රියාවලි කරාපිටිය සහ අවට බොහෝ වශයෙන් රැඳී පවති. අපේක්ෂිත සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා මෙම ප්‍රදේශයන් තුළ උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති හඳුන්වාදිය යුතු අතර මෙයට යටිතල පහසුකම්ද ඇතුලත් විය යුතුය. මෙය මධ්‍යගතව පවතින නාගරික ක්‍රියාකාරකම් අවම කර දුරස් ප්‍රදේශ දක්වා විහිදී යන අතර මෙය ගාල්ල නගරයහි අවට පරිසරයට සිදුවන බලපෑම අඩු කිරීමට හේතුවේ. කෙසේ නමුත් ප්‍රදේශය, කඳුකර වගාවන්ගෙන් සහ පහත් කෘෂිකාර්මික භූමි වැනි සංවේදී පරිසරයකින් වටවී පවතින බැවින් මෙම නගරය ස්ථාපනය සහ පුළුල් කිරීමේදී සංවර්ධනයට සුදුසු සහ අවම පාරසරික සංවේදී ඉඩම් සොයාගැනීමේ අභියෝගයට මුහුණ දීමට සිදුවේ.

රූපය 5.2-6: නගරයක් ලෙස කරාපිටිය සංවර්ධනය වීමේ සංසිද්ධිය



මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

කොරිඩෝ පදනම් කරගත් සංවර්ධනය

නාගරික ක්‍රියාකාරකම්වල වර්ධනයේ වර්තමාන රටාව ගාලු නගරය කේන්ද්‍ර කොටගෙන පැතිරී යන ප්‍රධාන මාර්ග ඔස්සේ සිදු වන සංවර්ධනයක් වේ. එමඟින් සංවර්ධන කොරිඩෝවක් ඇති වෙමින් පවතී. මෙම තත්ත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, සැලසුම්කරණ රෙගුලාසි වලට අමතරව පර්යන්ත මාර්ග ජාලයේ හිදැස් සබැඳි කිහිපයක් සම්බන්ධ කිරීම අත්‍යවශ්‍යවේ. ප්‍රධාන මාර්ගවලට යාබද ප්‍රදේශවලට සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිමත් කිරීමද අත්‍යාවශ්‍ය කරුණකි. යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම ප්‍රධාන මාර්ග වලට හා යාබද ප්‍රදේශ වලට ගාල්ල නගර මධ්‍යස්ථාන වලට සීමා වේ නම් අනාගතයේ දී අපේක්ෂිත මධ්‍යස්ථ මට්ටමේ සංවර්ධනයට ඉඩ සැලසෙනු ඇත.

මෙම සංසිද්ධිය ප්‍රදේශයේ පරිසරයට සංවේදී ප්‍රදේශ සංරක්ෂණය කර ඇති අතර, ප්‍රවේශ මාර්ගවල වාසිය ලබා ගැනීමේ ප්‍රධාන මාර්ග ඔස්සේ පිහිටා ඇති හිස් ඉඩම් ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගනී. එහෙත්, පවත්නා සංවර්ධනය වැඩිකිරීම සඳහා සහ ප්‍රතිසංවර්ධනය සඳහා ශක්තිමත් හා නව්‍ය මැදිහත්වීම් තිබිය යුතුය.ජනතාවගේ සාම්ප්‍රදායික ආකල්ප සහ ජනතාවගේ ජීවන රටාව නාගරීකරණයට

රූපය 5.2-7 : කොරිඩෝ පදනම් කරගත් සංවර්ධනය සංසිද්ධිය



මූලාශ්‍රය : උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය 2016

පරිච්ඡේදය 05 5.2.3 සංසිද්ධීන් ඇගයීම

විස්තරාත්මක විශ්ලේෂණය

පහත සඳහන් ප්‍රධාන අරමුණු හය මත පදනම්ව විකල්ප සංසිද්ධීන් තුන ඇගයීම් කර ඇත.

සලකා බලනු ලබන විකල්ප සිද්ධීන

1) සැලකිය යුතු ප්‍රතිවිරෝධතාවක් නොමැතිව නගර මධ්‍යයේ පවතින ඓතිහාසික ලක්ෂණ සුරක්ෂිත කිරීම සඳහා මෙම විකල්පීය අවස්ථා තුනට ඇති ධාරිතාව (මධ්‍යකාලීන උරුමය)

2) ප්‍රදේශයේ ප්‍රධාන වාණිජ, සේවා සහ පරිපාලන කටයුතු සඳහා මෙම එක් එක් අවස්ථාවන් හට පවතින ප්‍රවේශ වීමේ මට්ටම් (සුවපහසු නගර)

3) නේවාසික සහ නාගරික ක්‍රියාකාරකම් සහ නාගරික සේවාවන්හි අපේක්ෂිත වර්ධනයන් සඳහා එම විකල්ප අවස්ථාවන්ට ඇති හැකියාව (සුව පහසු ජීවන)

4) එක් එක් විකල්ප සංසිද්ධීන් මගින් ඇතිවන ධනාත්මක හා ඍණාත්මක බලපෑම ජල පද්ධති වෘක්ෂලතා රටාව සහ ප්‍රදේශයේ කෘෂිකාර්මික ඉඩම් පරිභෝජනය සඳහා තිරසාර බව ඇතිකිරීම. (හරිත, සුපිරිසිදු, ආරක්ෂිත පරිසරය)

5) එම එක් එක් සිදුවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සහ පවත්නා සහ යෝජිත ප්‍රවාහන ජාල සහ පහසුකම් වැඩිදියුණු කිරීමදී ඇතිවන්නාවූ වාසි සහ අවාසි තත්ත්ව (විධිමත් ගමනාගමන පහසුකම්)

6) මෙම එක් එක් විකල්ප අවස්ථාවන් මගින් පොදු පහසුකම් සැපයීම සහ ඉදි කරන ලද පරිසරයේ අලුතින් තනන ලද ව්‍යුහයන් ගැලපීම් සම්භාවිතා මට්ටම (ප්‍රීතිමත් පුරවැසියන්)

සමස්තයක් වශයෙන් සමස්ත දැක්ම හා ප්‍රදේශය සඳහා සකස් කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙය වඩාත් වැදගත් පියවර ලෙස සලකනු ලැබීය. පහත දැක්වෙන අනුකෘතිය පෙන්නුම් කරන්නේ, අරමුණු හයට එදිරිව විකල්ප සලකා බැලීමේ යෝග්‍යතා මට්ටම් පදනම්ව පැවති බුද්ධි කලම්බන සැසියෙන් ලබා ගත් ඇගැයීම් ප්‍රතිචාරයන්ගේ සංයුතියයි.

වගු අංක 5.2.2 අවස්ථා සැසඳීමේ අනුකෘතිය

අවස්ථා සැසඳීමේ අනුකෘතිය						
සංවර්ධන අවස්ථා	මධ්‍යකාලීන උරුමය	ධනවත් නගර	සුව පහසු ජීවන	හරිත, පිරිසිදු, ආරක්ෂිත පරිසරය	විධිමත් ගමනාගමන පහසුකම්	ප්‍රීතිමත් පුරවැසියන්
සංවර්ධනය සාමාන්‍ය වශයෙන් සිදුවීමේ සංසිද්ධිය	-2	+3	+2	-2	+2	-1
උප නගරයක් ලෙස කරාපිටිය සංවර්ධනය	-1	+1	+1	-1	+1	+1
කොරිඩෝ පදනම් කරගත් සංවර්ධනය	+1	+2	+3	+1	+3	+2

මූලාශ්‍ර : නාගරික සංවර්ධන අධිකාරිය - ගාල්ල 2020

මෙම විකල්ප අවස්ථා ඇගයීම, බුද්ධි කලම්බන සැසියකින් සිදුකරනා ලද්දකි. විකල්ප අවස්ථා තුනක්, අරමුණු හයට එරෙහි ඇගයීමේදී, තුන්වන විකල්ප සංසිද්ධිය එනම් අභ්‍යන්තර සහ බාහිර කොරිඩෝ පදනම් කරගත් සංවර්ධන අවස්ථාවෙහි ක්‍රියාකාරිත්වය හා ජනගහනය සඳහා පහසුකම් සැලසීමේ වැඩි විභවයක් පවතී. තවද පාරිසරික සංවේදිතාව සහ කාර්යක්ෂමතාව වැඩි වීමද සිදුවේ.

හයවන
පරිච්ඡේදය

සැලසුම

පරිච්ඡේදය 06

6.1. සංකල්පිත සැලසුම

සැලසුම

සංකල්පිත සැලසුම

සංවර්ධන සැලැස්මේ සංකල්පය පදනම් වූයේ දැක්ම මත වන අතර 2031 දී මහා ගාල්ලෙහි අවකාශීය සැලැස්ම සහ සංවර්ධන රටාව එමගින් විදහා දැක්වේ.ගාල්ල නගරයෙහි කේන්ද්‍රීය ප්‍රදේශයන්හි පවතින සංවර්ධන පීඩනය හේතුවෙන් ඉදිකල ප්‍රදේශ සහ පවත්නා සංවර්ධන නැඹුරුව ගාල්ල නගර මධ්‍ය සිට ප්‍රධාන මාර්ග ඔස්සේ අභ්‍යන්තර තදාසන්න ප්‍රදේශයන් වෙත ව්‍යාප්තවේ.

1980 දී සිදුකරන ලද අවකාශීය ව්‍යුත්පන්න විශ්ලේෂණය (space syntax) අනුව ගාලු නගර මධ්‍යයේ අවකාශීය සම්බන්ධතාවය ඉතා ඉහළ සංයුක්තයක් පවතී. 1990 කාලවකවානුවේදී පර්යන්ත දෙසට සංයුති-යෙහි සුළු ව්‍යාප්තවීමක් දැකිය හැක. වසර 20 කට පසු එනම් 2010 දී නගර කේන්ද්‍රයේ සිට පර්යන්ත දෙසට සංවර්ධන රටාවහි සැලකිය යුතු වෙනසක් ඇත. වසර 2017 වනවිට, ප්‍රදේශයේ සංවර්ධන නැඹුරුව උතුරු දෙසට ව්‍යාප්ත වී ඇති අතර ගිංතොට, කලේගාන, කහදුවත්ත, කරාපිටිය, ලබුදුව සහ වලහන්දුව වැනි සංවර්ධන මධ්‍යස්ථාන ලෙස නිර්මාණ වී ඇත. එබැවින් සැලැස්ම මඟින් මෙම වර්ධන මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කරන අතර ප්‍රධාන නගරය සමඟ නගරයෙන් එපිට සංවර්ධන කොරිඩෝවක් නිර්මාණය කරයි. පාරිසරික පද්ධතියට ඇතිවන්නාවූ අනාගත සංවර්ධනයේ බලපෑම විශ්ලේෂණය කිරීම සංවේදීතා විශ්ලේෂණය මගින් විශ්ලේෂණය කර ඇති අතර මහා ගාල්ල ප්‍රදේශයේ විවිධ පාරිසරික පද්ධති අතර ඇති සම්බන්ධතාව ප්‍රතිස්ථාපිත කිරීම මගින් නීල හරිත ජාලයක් නිර්මාණය කිරීමට නියමිතය.

විශේෂයෙන් රූමස්සල වැනි දක්ෂිණ වෙරළ සමඟ ඇතිකරන දර්ශනීය වෙරළ දර්ශණ සහ ආවේනික ශාක හා සත්ව ගහනයකින් පොහොසත් පරිසර පද්ධතිය සුරකින අයුරින් සංචාරක ප්‍රවර්ධනය සහ සංවර්ධනය පාලනය කිරීමට හැකි අයුරින් ප්‍රදේශය සංරක්ෂණය කිරීමට වෙනම මාර්ගෝපදේශන සැලැස්මක් සකස් කිරීමට යෝජිතය.

ජනාවාස සංවර්ධන මාර්ගෝපදේශ සහ ප්‍රවර්ධනය සඳහා සුදුසු ස්ථාන සෙවීම සඳහා ඉඩම් සුදුසුකම පිළිබඳ විශ්ලේෂණය මෙවලමක් ලෙස භාවිතා කර ඇත. තවද සැලැස්ම හරහා වඩාත් ආරක්ෂිත, සුවපහසු සහ ප්‍රවේශ පහසු යන කරුණු සහතික කල වඩාත් සුදුසු ස්ථාන සැලැස්ම මගින් යෝජනා කර ඇත.
නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා මෙම සැලසුම හරහා ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කෘෂිකර්මාන්තය, ධීවර, වාණිජ හා සංචාරක වැනි ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් අන්තර් සම්බන්ධ කිරීම සිදුවී ඇත.

එබැවින්, වර්තමාන නාගරික අවශ්‍යතා සඳහා පහසුකම් දීම තුලින් නගරය තුළ ඓතිහාසික සුවිශේෂීත්වය අතර සමතුලිතතාවයක් ඇති කර ගත හැකි අයුරින් මෙම සංකල්පය ගොඩ නගා ඇත.
නගරය තුළ පවතින ජීවනිය උරුමය වන ඕලන්ද කොටුව විශේෂ මාර්ගෝපදේශ සැලැස්මක් මඟින් සංර-ක්ෂණය කිරීමට සැලැස්ම තුළ යෝජනා වී ඇත.
එබැවින් මහා ගාල්ල ප්‍රදේශයේ සංවර්ධන විභවතා පිළිබඳ පුළුල් පරාසයක් තුළ බැලීම මගින් සංවර්ධන සැලැස්මේ සංකල්පය සකස් වී ඇත.

රූපය 6.1-1: සංකල්පිත සැලසුම



මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය - ගාල්ල 2020

6.2. යෝජිත ඉඩම් පරිහරණ සැලසුම

අනාගත ඉඩම් පරිහරණ රටාව දැනට පවත්නා ඉඩම් පරිහරණ රටාව විශ්ලේෂණය කිරීම මත හා ප්‍රදේශය තුළ යෝජිත විවිධ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඉඩම් අවශ්‍යතාවයද පදනම් කරගෙන ඇත.

මහා ගාල්ල ප්‍රදේශයටම ආවේණික වූ පරිසර හිතකාමී පද්ධතියක් පවතී. මෙය කුඹුරු ඉඩම්, වගුරු බිම්, ජල මූලාශ්‍ර සහ අනෙකුත් ස්වභාවික සංරක්ෂණය කලයුතු පද්ධති වලින් සමන්විත අතර තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ඉහළ ජෛව විවිධත්වය මත එහි පවතින විභවය හඳුනා එය සංවර්ධනය කල යුතුවේ. එයට අමතරව වර්ධන මධ්‍යස්ථානයන්හි පවත්නා සංවර්ධන නැඹුරුව සහ යෝජිත ඉඩම් පරිහරණ සැලැස්මෙහි අනාගත සංවර්ධන විභවය ඉහළ නැංවීම සඳහා මාර්ග ජාලයේ යෝජිත සංවර්ධනයක් ද හඳුනාගෙන ඇත.

යුනෙස්කෝව මගින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති නගරයක් හේතුවෙන් පළාතේ අනෙකුත් නාගරික මධ්‍යස්ථාන වලට වඩා ගාල්ල නගර කේන්ද්‍රය ඉතා විශිෂ්ඨ වේ. එබැවින් ගාල්ල කොටුව විශේෂිත වූ කලාපයක් ලෙස සලකා ඇති අතර මෙම කලාපය සංරක්ෂිත කලාපයක් ලෙස යෝජිත සැලැස්මෙහි දක්වා ඇත. තවද, බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය විසින් කොළඹ වරාය ඉදිකිරීමට ප්‍රථම පෘතුගීසි සහ ලන්දේසි යුගයේදී ප්‍රධාන මුහුදු නැවතුම්පොළක් වූ ගාලු වරාය, වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා විශේෂ ප්‍රදේශයක් මෙම සැලැස්ම තුල හඳුනාගෙන ඇත.

නගර මධ්‍යයේ පිහිටි චීන කොරටුව ප්‍රදේශය නේවාසික ප්‍රදේශයක්ව පැවතුනද වර්තමානයේ දී එය වාණිජමය ක්‍රියාකාරකම් සඳහා භාවිත වන අතර ක්‍රම ක්‍රමයෙන් පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික ලක්ෂණ විනාශ වෙමින් පවතී. චීන කොරටුව සහ එය අවට තුළ පැවතී යටත් විජිත ඓතිහාසික ලක්ෂණ නැවත මතු කිරීම සඳහා මෙම සැලැස්ම මගින් අත්‍යාවශ්‍ය උපාය මාර්ගික ව්‍යාපෘති යෝජනා කර ඇත.මෙම ව්‍යාපෘතිය මගින් වැඩි දියුණු කරන ලද භෞතික තත්ත්වයන් සමඟ නේවාසික කටයුතු පුනර්ජීවන කිරීම අරමුණු කර ඇත.

මෙයට අමතරව මෙම සැලැස්ම හරහා කලාප 03ක් නේවාසික කලාප ලෙස ප්‍රවර්ධනය කිරීමට යෝජනා වී ඇති අතර මෙය නේවාසික සංවර්ධනයට සුදුසු ඉඩම් පදනම් කරගෙන ප්‍රවර්ධනය සිදුකිරීමට අපේක්ෂා කෙරේ. වසර 2031 වන විට සම්පූර්ණ ජනගහනයෙන් 38% ක් පමණ මෙම කලාපය වෙත ආකර්ෂණය වෙතැයි අපේක්ෂා කර ඇත. තවද මෙම කලාප ප්‍රධාන සංවර්ධන කොරිඩෝව සමඟ සම්බන්ධ කිරීමට ප්‍රවේශ සහ අසල්වැසි කුඩා මංසල් හා සම්බන්ධ කෙරෙනු ඇත.

කරාපිටිය සෞඛ්‍ය සේවා පදනම්වූ වාණිජ මංසලක් ලෙස සංවර්ධනයට යෝජනා වී ඇත. ප්‍රාදේශීය සහ පළාත් මට්ටම් පරිපාලනමය කටයුතු සහ ගොඩනැගිලි ලබුදූව ප්‍රදේශය තුළ ප්‍රවර්ධනය කිරීමෙන් ලබුදූව පරිපාලනමය කලාපයක් ලෙස යෝජනා වී ඇත. තවද කලේගාන සහ කහඳුවත්ත නාගරිකයන් හට නේවාසික පහසුකම් සපයන විශේෂ වාණිජ ස්ථානයක් (නේවාසික පහසුකම් සේවා ස්ථානය) ලෙස සැලැස්ම තුළ දක්වා ඇති අතර ගිංතොට සහ වලහන්දූව සංක්‍රාන්ති මංසල් ලෙස සංවර්ධනයට යෝජිතය.

ප්‍රදේශයේ ආර්ථික සුභ සාධනය සාක්ෂාත් කරගැනීම සඳහා, ගිංතොට මංසන්ධියේ සිට දෙවට මංසන්ධිය දක්වා ගාලු මාර්ගය සංචාරක කොරිඩෝවක් ලෙස ප්‍රතිසංවර්ධනයටත් ගිංගඟ, මහමෝදර කලපුව, මුහුදු

සිතියම 6.2-1: යෝජිත ඉඩම් පරිහරණ සැලසුම



මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය - ගාල්ල 2020

6.2.1 යෝජිත ඉඩම් පරිහරණ සැලසුමෙහි තෝරාගත් ස්ථාන වල හරස්කඩ 2031

1. සංවර්ධන කොරිඩෝවෙහි (*A- B* කොටස)- ගින්තොට සිට වලහන්දුව දක්වා

රූපය 6.2-1: සංවර්ධන කොරිඩෝවෙහි *(A- B* කොටස*)*



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

2. සංචාරක කොරිඩෝව (C-D කොටස) - ගාල්ල කොටුව සිට කලුවැල්ල දක්වා

රූපය 6.2-2: සංචාරක කොරිඩෝව (C-D කොටස)



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

3. දෙවට හන්දිය සිට පින්නදූව දක්වා (E-F කොටස)

රූපය 6.2-3: දෙවට හන්දිය සිට පින්නදූව දක්වා - (E-F කොටස)



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

6.3. සමාජ සහ භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග

6.3.1 සේවා සැලැස්ම - "සුව පහසු ජීවනය"

යෝජිත සේවා සැලැස්මට අනුව අනාගතයේදී ගාල්ල නාගරිකය සංචාරක සහ විනෝද කටයුතු සඳහා කේන්ද්‍රස්ථානය වනු ඇත . ගාලු නගරය තුළ සාමාන්‍යයෙන් පරිපාලන කටයුතු සිදු වන ස්ථානවල ඉතිරිව පවතින ඉඩම්, තරඟකාරී රටාවේ ඉහළ ආර්ථික ඉල්ලුමක් ඇත. සැලැස්ම මඟින් යෝජිත සංවර්ධන කොරිඩෝවේ ලබුදූව ප්‍රදේශයේ පරිපාලන සේවා හා ආයතනික කටයුතු ස්ථාපනය කිරීමට යෝජනා කර ඇත. එබැවින්, මෙම ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීම මඟින් සංවර්ධන කොරිඩෝවේ ආසන්නතම අවට ප්‍රදේශයන් නේවාසික මෙන්ම වාණිජමය සංවර්ධන සඳහා ඉල්ලුම ප්‍රවර්ධනය වනු ඇත. නේවාසික හා නාගරික ක්‍රියාකාරකම් වර්ධනය කිරීම පිණිස ප්‍රදේශයට පහසුකම් සැපයීම සඳහා යටිතල සහ ජනාවාස සංවර්ධනය සඳහා ප්‍රමාණාත්මක ආයෝජනයක් සිදුකල යුතුවේ. ඉහත සංසිද්ධිය පහත සඳහන් ප්‍රධාන තේමාත්මක සැලසුම් හරහා ලඟා කර ගැනිම අපේක්ෂා කෙරේ.

1) ජනාවාස සංවර්ධන සැලැස්ම
2) නාගරික සේවා ප්‍රවර්ධන සැලැස්ම

සිතියම 6.3-1: සුවපහසු ජීවනය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

6.3.1.1 ජනාවාස සංවර්ධන සැලැස්ම

ජනාවාස සංවර්ධන සැලැස්ම අනාගත වාසයට ගැළපෙන සුදුසු අවකාශය විස්තර කරයි. මෙය 2031 වසර වන විට අපේක්ෂිත නේවසික පහසුකම් සැලසුම්කරන අතර ජනගහනය පුරෝකථනය පහත පරිදි දක්වා ඇත

වගුව 6.3-1: මහා ගාල්ල සඳහා ජනගහන පුරෝකථන

මහා ගාල්ල ජනගහනය 2001 දී	**177,504**
මහා ගාල්ල ජනගහනය 2011 මහා ගාල්ල ජනගහනය 2017 (අනාවැකි)	190,486 199,034
ස්වභාවික ජනගන වර්ධන අනුපාත සාමාන්‍ය අගය	0.7%
මහා ගාල්ල සීමාවේ ස්වභාවික ජනගන වර්ධන උපරිම අගය	
ස්වභාවික ජනගන වර්ධන අනුපාත මධ්‍යස්ථ අගය 1% වැඩි ග්‍රාම නිළධාරි කොට්ඨාශ	2.55%
ජාතික ස්වභාවික ජනගන වර්ධන අනුපාත සාමාන්‍ය වේගය	0.75%

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ (ගාල්ල කඩවත් සතර,අක්මීමන, බෝපේ පොද්දල සහ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ) 2018

ඉහත දත්ත අනුව ජනගහන වර්ධන වේගය 1% ට වඩා වැඩි ග්‍රාම නිළධාරි කොට්ඨාශ ඇති අතර ඒ අතුරින් ඇතැම් ග්‍රාම නිළධාරි කොට්ඨාශ ඊටත් ඉහළ වර්ධන අගයක් පෙන්නුම් කරයි. අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉහලගොඩ දකුණ ග්‍රාම නිළධාරි කොට්ඨාශ වැනි ප්‍රදේශ 6.8% වැඩි ජනගහන වර්ධනයක් පෙන්නුම් කරයි.

එබැවින්, ජනගහන පුරෝකථනය මුලින්ම සංසිද්ධීන් දෙකක් මත පදනම්ව පහත පරිදි සිදු කර ඇත.

වගුව 6.3-2: සංසිද්ධීන් මත පදනම්ව ජනගහන පුරෝකථනයන්

සංසිද්ධිය	ස්වභාවික ජනගන වර්ධන අගය	2030 දී ජනගහනය	අතිරේක ජනගහනය
සංසිද්ධිය 01- ස්වභාවික ජනගන වර්ධන අනුපාත අගය මත පදනම්ව එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශ	සාමාන්‍ය - 0.7%	218, 830	-
සංසිද්ධිය 02 - ස්වභාවික ජනගන වර්ධන අනුපාත සාමාන්‍ය අගය 1% වැඩි මත පදනම්ව (මහා ගාල්ල ප්‍රදේශයේ මුළු ජනගහනයට, ජනගහනය වේගයෙන් වැඩිවන ප්‍රදේශ සඳහා ස්වභාවික ජනගන වර්ධන සාමාන්‍ය අගය යෙදීම)	2.55%	297,373	91,225

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

සංසිද්ධිය 03

ඉහත අවස්ථා දෙකට අමතරව, ජනගහන වර්ධන අනුපාතවල විවිධත්වය හේතුවෙන් ජනගහන අනාවැකි සඳහා වැඩි නිරවද්‍යතාවයක් ලබා ගැනීම සඳහා තුන්වන අවස්ථාව සකස් කර ඇත. ඒ අනුව සීඝ්‍ර ජනගහනයකින් යුත් වේගවත් ජනගහන වර්ධනයක් අත්පත් කර ගැනීමෙන් උපකල්පනය කරනු ලබන නේවාසික කලාප හා අනෙකුත් කලාප ස්වාභාවික වර්ධනය මත පදනම්ව ගනනය කරනු ලැබේ. එබැවින්, උපකල්පනය කරන ලද සාමාන්‍ය ජනගහන වර්ධනය අනුපාතය 2.55% ලෙස සැලකේ.

වගුව 6.3-3: ජනගහන පුරෝකථනය

විස්තරය	වර්ධන අනුපාතය	ජනගහනය
මුළු ජනගහනය 2011 දී	-	69,534
වසර 2031 ට ජනගහන පුරෝකථනය	0.7% (ස්වභාවික ජනගහන වර්ධන අනුපාතය අනුපාතය)	79,536
වසර 2031 ට ජනගහන පුරෝකථනය	2.55% (උපකල්පිත ජනගහන වර්ධන අනුපාතය)	112,879

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

ස්වාභාවික වර්ධනයට අමතර අපේක්ෂිත අතිරේක ජනගහනය - 33,343

එබැවින්, තවත් වසර 12 ක් ඇතුළත අපේක්ෂිත ජනගහනයට සාපේක්ෂව වඩා සාධාරණ අමතර ජනගහනයක් 03 වන සංසිද්ධිය මගින් නියෝජනය කෙරේ.

වසර 2031 වනවිට මහ ගාල්ල ප්‍රදේශයේ මුළු ජනගහනය - 251,253

↓

ස්වභාවික ජනගහන වර්ධනය (217,940) + ආකර්ශිත ජනගනය (33,343)

ජනගහන පුරෝකථන මත සිදුකරන ලද විශ්ලේෂණ පදනම් කරගෙන නේවාසික කලාප 03 ක් යෝජනා කර ඇත. ඒ අනුව අනාගත ජනගහනය සඳහා නේවාසික සංවර්ධනයට වඩාත් සුදුසු ප්‍රදේශ-යන් (කලාප) ප්‍රවේශ මාර්ග, ආරක්ෂාව සහ ස්වභාවික ආපදාවලින් තොර යන කරුණු සලකා ඇත. මෙම කලාප ඉඩම් යෝග්‍යතා විශ්ලේෂණය මගින් තහවුරු කර ගන්නා ලදී.

සිතියම 6.3-2: ජනාවාස සංවර්ධන සැලැස්ම



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

උපාය මාර්ගික ක්‍රියා (1) - නේවාසික සංවර්ධනය සඳහා යෝග්‍ය ඉඩම් මත පදනම්ව නේවාසික කලාප 03 ප්‍රවර්ධනය කිරීම

නේවාසික සංවර්ධනයට සුදුසු ඉඩම් යෝග්‍යතා විශ්ලේෂණයට අනුව, නේවාසික කලාප වර්ග 03ක් හඳුනාගෙන ඇති අතර ඒවා පහත පරිදි වේ.

1) නේවාසික ප්‍රවර්ධන කලාපය
2) සාමාන්‍ය නේවාසික කලාපය
3) අඩු ඝනත්ව නේවාසික කලාපය

රූපය 6.3-1: නේවාසික කලාප වර්ග තුන



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

වසර 2031 වන විට මුළු ජනගහනයෙන් 45% ක් ඉහත නේවාසික කලාපවල පදිංචි කිරීමට යෝජිතය. දැනට පවත්නා ජනගහනය හා යෝජිත නේවාසික කලාපවල ඉඩම් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් මෙම අගය නිර්ණය කර ඇත.

තවද එක් එක් කලාප සඳහා ඉඩම් වල යෝග්‍යතා, අපේක්ෂිත ලක්ෂණ සහ ජනගහන ව්‍යාප්තිය පහත පරිදි වේ.

වගුව 6.3-4: නේවාසික කලාපයන්හි ජනගහන පදිංචි කරවීම

නේවාසික කලාප වර්ගය	සංවර්ධන කල හැකි ප්‍රමාණය	සංවර්ධන කල හැකි ප්‍රමාණය (km2)	ජනගහන ව්‍යාප්තිය ප්‍රතිශතය	යෝජිත ජනගහන ව්‍යාප්තිය	යෝජිත ජනගහන ඝනත්වය ව. කි. මී. 1 ට පුද්ගලයින් (PPkm2)
නේවාසික ප්‍රවර්ධන කලාපය	ඉහළ (5)	4.27	38.5%	43,345	10,151
සාමාන්‍ය නේවාසික කලාපය	මධ්‍යස්ථ -(3)	7.68	35.5%	40,526	5,277
අඩුඝනත්ව නේවාසික කලාපය	අවම (1)	8.08	26%	29,006	3,590
2030 දී පදිංචි කිරීමට යෝජිත මුළු ජනගහනය				**112,877**	

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

පරිච්ඡේදය 06 සැලසුම

උපායමාර්ගික ක්‍රියා (2) - නේවාසික ප්‍රවර්ධන කලාප (RP') 03 ප්‍රවර්ධනය කිරීම සහ වසර 2030 වන විට සියලු නේවාසික කලාපවල පදිංචි මුළු ජනගහයෙන් 38% ක ජනගහනයක් ප්‍රවර්ධන කලාප 03 ට ආකර්ෂණය කිරීමට යෝජිතය.

ජනාවාස සංවර්ධන සැලැස්ම

ප්‍රදේශයේ ජනගහනයෙන් අනාගත අවකාශීය ව්‍යාප්තිය තුළ නේවාසික ප්‍රවර්ධන කලාප ලෙස වඩාත් යෝග්‍ය ප්‍රවර්ධනය සඳහා ප්‍රදේශ හඳුනාගෙන ඇත. ඒ අනුව, ජනාවාස ව්‍යාප්ති සැලැස්මේ නේවාසික සංවර්ධන සඳහා ප්‍රවර්ධන කලාප 03ක් හඳුනා ගෙන ඇත.

1) හපුගල නේවාසික ප්‍රවර්ධන කලාපය
2) උළුවිටිකේ නේවාසික ප්‍රවර්ධන කලාපය
3) ඇත්තිලිගොඩ නේවාසික ප්‍රවර්ධන කලාපය

එක් එක් නේවාසික ප්‍රවර්ධන කලාපයන් තුළ පදිංචි කිරීමට අපේක්ෂිත ජනගහනය සංවර්ධනයට යොදා ගත හැකි ඉඩම් ප්‍රමාණයේ අනුපාතයට අනුව පහත පරිදි වේ.

වගුව 6.3-5: නේවාසික ප්‍රවර්ධන කලාප තුළ ජනගහනය පදිංචිය

කලාප අංකය	කලාපයේ නම	සංවර්ධිත ප්‍රමාණය (km2)	යෝජිත ජනගහනය
RPZ 01	හපුගල නේවාසික ප්‍රවර්ධන කලාපය	0.83	8,085
RPZ 02	උළුවිටිකේ නේවාසික ප්‍රවර්ධන කලාපය	2.15	20,943
RPZ 03	ඇත්තිලිගොඩ නේවාසික ප්‍රවර්ධන කලාපය	1.30	12,663

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

සිතියම 6.3-4:නේවාසික ප්‍රවර්ධන කලාප



මූලාශ්‍රයः නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

පරිච්ඡේදය 06

සැලසුම

ජනාවාස සංවර්ධන සැලැස්ම

උපායමාර්ගික ක්‍රියා (3) - නේවාසික ප්‍රවර්ධන කලාප සහ සංවර්ධන කොරිඩෝව අතර සම්බන්ධවතාව ඇති කිරීම

උපායමාර්ගික ක්‍රියා (4) - නේවාසික කලාප අතර සම්බන්ධක නිර්මාණය කිරීම තුලින් අසල්-වැසි කුඩා මංසල් ඇතිවීම

එක් එක් නේවාසික ප්‍රවර්ධන කලාප අතර යෝජිත ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම් පහත පරිදි වේ.

1) හපුගල නේවාසික ප්‍රවර්ධන කලාපය සහ සංවර්ධන කොරිඩෝව අතර ඍජු සම්බන්ධතා දෙකක් ඇති කිරීම

2) උළුවිටිකේ නේවාසික ප්‍රවර්ධන කලාපය සහ සංවර්ධන කොරිඩෝව අතර ඍජු සම්බන්ධතා දෙකක් ඇති කිරිම

3) ඇත්තිලිගොඩ නේවාසික ප්‍රවර්ධන කලාපය සහ සංවර්ධන කොරිඩෝව අතර සම්බන්ධතාව ලබුදූව මාර්ගය හරහා ඇතිකිරීම

සිතියම 6.3-5 : නේවාසික කලාප අතර යෝජිත සම්බන්ධතා



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

6.3.1.2 නාගරික සේවා ප්‍රවර්ධන සැලැස්ම

ප්‍රවාහනය,ජල සැපයුම්,විදුලිබලය,අපද්‍රව්‍ය බැහැර කිරීම, අපවහන පද්ධතිය සහ කාණු පද්ධති විශේෂයෙන් යෝජිත සංවර්ධන කොරිඩෝව සහ නේවාසික කලාප නාගරික සේවා පහසුකම් කෙසේ සපයන්නේද යන්න මෙහිදී සළකා බලනු ඇත.

උපායමාර්ගික ක්‍රියා (1) - සේවා මාර්ගයක් ලෙස ප්‍රදේශය තුළ සැලසුම් කර ඇති වාණිජමය කටයුතු සඳහා දක්ෂිණ අධිවේගී මාර්ග ප්‍රවේශයේ වම්පස තීරුව මායිමේ මීටර 1300 දුරට ප්‍රවර්ධනය කිරීම.

අධි වාණිජ කටයුතු ප්‍රවර්ධනය සඳහා සාප්පු සංකීර්ණයක් ඉදිකිරීමට අක්කර 3ක ඉඩමක් වෙන්කිරීමට යෝජිතය.

රූපය 6.3-1 යෝජිත වාණිජමය තීරුව සහ සාප්පු සංකීර්ණය

මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

සිතියම 6.3-6: නාගරික සේවා ප්‍රවර්ධන සැලැස්ම



මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

පරිච්ඡේදය 06

සැලසුම

නාගරික සේවා ප්‍රවර්ධන සැලැස්ම

උපාය මාර්ගික ක්‍රියා 02 - වර්ධන මධ්‍යස්ථාන (උපනගර) සඳහා අවශ්‍ය සේවා පහසුකම් ප්‍රතිසංවර්ධනය කිරීම

යෝජිත සංවර්ධන කොරිඩෝව (තුන්වන තරංග මාර්ගය) ප්‍රධාන උප නගර 06 ක් හරහා විහිදේ. ගිංතොටින් ආරම්භ වී වලහන්දූව දක්වා විහිදී යන මෙම මාර්ගයේ උප නගර ඒවාට ආවේනික ක්‍රියාකාරී වැදගත්කම් අනුව සංවර්ධනයට යෝජිතය.

ප්‍රධාන වර්ධන මධ්‍යස්ථාන - උපනගර - 06 පහත පරිදි වේ.

1) ගිංතොට - අන්තර් හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත මෙම උපනගර මධ්‍යස්ථානය මහගාල්ල ප්‍රදේශයට සංවර්ධන කොරිඩෝව හරහා ප්‍රවේශ පහසුකම් ලබා දීමට සැලසුම් කරයි.

2) කලේගාන - වාණිජ සංවර්ධනය සඳහා අවශ්‍ය නාගරික සේවා පහසුකම් සැපයීම සඳහා ප්‍රවර්ධනය කිරීමට යෝජිත උපනගර මධ්‍යස්ථානයකි.

3) කහඳූවවත්ත - මිශ්‍ර සංවර්ධන උප නගර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය

4) කරාපිටිය - සෞඛ්‍ය මූලික වාණිජ උපනගර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනයට යෝජිතය.

5) ලබුදූව - පරිපාලන සේවා මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනයට යෝජිතය.

6) වලහන්දූව - දෙවන අන්තර් හුවමාරු මධ්‍යස්ථානය ලෙස සංවර්ධනයට යෝජිත මෙම උපනගරය මඟින් යෝජිත සංවර්ධන කොරිඩෝවට පහසුකම් සැපයීමට සැලසුම් කෙරේ.

සීඝ්‍ර සංවර්ධනයක් හා ඉහළ සංවර්ධන ඉල්ලුමක් පැවතීම හේතුවෙන් විශේෂ නියමතා සැලැස්මක් මඟින් පාලනය කිරීමට හා මඟීන්ට පහසුකම් සැපයිමට කරාපිටිය සැලසුම් කර ඇත.

රූපය 6.3-2 : යෝජිත කරාපිටිය උපනගර සංවර්ධනය



මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

තවදුරටත් මෙම මධ්‍යස්ථාන නියාමන සැලසුම් මඟින් සංවර්ධනය කිරීමේ විභවතාවයක් හඳුනා ගෙන ඇත. මෙම ප්‍රධාන උපනගර මධ්‍යස්ථාන 06 ට අමතරව මහගාල්ල සංවර්ධන සැලැස්ම මඟින් තවත් උප මධ්‍යස්ථාන 02 ක් සංවර්ධනයට යෝජනා කර ඇත.

1) වක්වැල්ල උප නගර සංවර්ධනය
2) පෝද්දල උප නගර සංවර්ධනය

වක්වැල්ල උප නගර සංවර්ධනය

නාගරික සේවා පහසුකම් සැපයීමට යෝජිතය. මාර්ග හා ප්‍රවාහන පහසුකම්, විවෘත අවකාශ සහ අනෙකුත් විනෝද කටයුතු පහසුකම් ඒ අතර වේ.

1) යෝජිත ගිං ගඟ ආශ්‍රිත උද්‍යාන ව්‍යාපෘතිය
2) යෝජිත බස් පර්යන්තය
3) යෝජිත වාණිජ සංවර්ධනය
4) යෝජිත රථගාල් හා ළමා උද්‍යානය
5) යෝජිත විකල්ප මාර්ග සංවර්ධනය
6) යෝජිත මාර්ග පුළුල් කිරීම්

රූපය 6.3-3 වක්වැල්ල උප නගර සංවර්ධනය



මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

රූපය 6.3-4 යෝජිත සංවර්ධනය හා වර්තමාන තත්වය

මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

පරිච්ඡේදය 06 පෝද්දල උප නගර සංවර්ධනය

සැලසුම

පෝද්දල උප නගර මධ්‍යස්ථාන වාණිජ උපනගරයක් ලෙස පහත සඳහන් ව්‍යාපෘති සංචරබ සමඟ සංවර්ධනයට යෝජනා කර ඇත.

නාගරික සේවා ප්‍රවර්ධන සැලැස්ම

1) යෝජිත ක්‍රීඩාංගණය වැඩි දියුණු කිරීම
2) යෝජිත සතිපොළ
3) යෝජිත රථගාල
4) යෝජිත ළමා උද්‍යානය
5) වාණිජ ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම
6) යෝජිත අතුරු මාර්ග සංවර්ධනය
7) දක්ෂිණ අධිවේගී මාර්ගය

රූපය 6.3- 5 පෝද්දල උප නගර සංවර්ධනය



මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

රූපය 6.3- 6 යෝජිත සංවර්ධනය හා වර්තමාන තත්වය

මූලාශ්‍රයඃ නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල - 2020

6.3.2 ප්‍රවාහනය - "විධිමත් ගමනාගමන පහසුකම්"

"විධිමත් ගමනාගමන පහසුකම් සැපයීම" අරමුණ යටතේ මහා ගාල්ල ප්‍රදේශය සඳහා මාර්ග සහ ප්‍රවාහන සංවර්ධන සැලැස්මක් නිර්මාණය කොට ඇත. ගාලු නගර සීමාව තුළ ප්‍රධාන මාර්ගවල නිතර පවතින තදබදය අවම කිරීමේ අරමුණින් සහ මෙම නගරයට පරිබාහිර ප්‍රදේශ අතර පවතින සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමට මාර්ග සංවර්ධන සැලැස්ම යෝජනා කර ඇත. මීට අමතරව, විවිධ ව්‍යාපෘති සංරචක සමග සංවර්ධනය කිරීමට යෝජිත ප්‍රදේශවලට පහසුකම් සැපයීම සඳහා නව මාර්ග සම්බන්ධතා නිර්මාණය කිරීම ද සැලකිල්ලට ගෙන ඇත.

ඒ අනුව මාර්ග සංවර්ධන සැලැස්ම මගින් ප්‍රධාන මාර්ග සම්බන්ධතා තුනක් (තරංගාකාර මාර්ග) මහා ගාල්ල ප්‍රදේශය ආශ්‍රිතව වැඩිදියුණු කිරීම සඳහා යෝජනා කර ඇත.

1) පළමු තරංග මාර්ගය - ගාලු පාර (2) මාර්ගයේ පවතින වාහන තදබදයට පිළියමක් ලෙස කළුවැල්ල මංසන්ධියේ සිට සම්බෝධිය මංසන්ධිය (මාගාල්ල) දක්වා මීටර් 18. 0 ක් පළලැති මංතීරු 02 ක් ලෙස මාර්ග සංවර්ධනය

2) දෙවන තරංග මාර්ගය - ගාලු පාර සහ අධිවේගී ප්‍රවේශ මාර්ගය සම්බන්ධ කරන මීටර් 18. 0 ක් පළලැති මංතීරු දෙකක මාර්ගයක් නිර්මාණය

3) තෙවන තරංග මාර්ගය - ගිංතොට සහ වලහන්දූව සම්බන්ධ කරන කලේගාන, කහදුවවත්ත, කරාපිටිය හා ලබුදූව හරහා දිවෙන මංතීරු හතරක මීටර් 30. 0 ක් පළලැති ලෙස පුළුල් කිරීම.

ඉහත තරංග මාර්ග හැරුණු විට ඇතැම් මාර්ග වැඩිදියුණු කිරීම් සහ නව මාර්ග කිහිපයක් පහත දැක්වෙන පරිදි යෝජනා කර ඇත.

පරිච්ඡේදය 06

සැලසුම

නාගරික සේවා ප්‍රවර්ධන සැලැස්ම

1) දහනායක මාවතෙහි මීටර 110ක් සහ කන්දෙවත්ත මාර්ගයේ මීටර 200ක් මීටර් 18. 0 ක් පළලැති මංතීරු 4 ක් ලෙස පුළුල් කිරීම.

2) ක්‍රිප්ස් මාර්ගය සහ කෝන්ගහ මංසන්ධිය මංතීරු 2 ක මීටර 18.0 ක් පළලැති දිග මාර්ගයකින් සම්බන්ධ කිරීම

3) කෝන්ගහ මාර්ගයේ මීටර 550ක් බණ්ඩාරනායක මාවත දක්වා සහ සර්කියුලර් මාර්ගයේ මීටර 1500ක් මංතීරු දෙකක මීටර් 18.0 ක් පළලැති මාර්ගයක් ලෙස පුළුල් කිරීම.

මීට අමතරව ගිංතොට සහ වලහන්දූව හි සංක්‍රමණ මංසල් දෙකක් ස්ථිර ලෙස ඉදිකිරීම මෙම සැලැස්ම හරහා යෝජනා වී ඇත. තවද වලහන්දූව තල්පේ දක්වා දීර්ඝ කිරීමට යෝජනා වී ඇත. ගිංතොට සිට වලහන්දූව දක්වා යෝජිත සංවර්ධන කොරිඩෝවට පහසුකම් සැපයීම් මෙම මංසල් වලින් සිදුවේ. එසේම මෙම සැලැස්ම යටතේ දැනට පවතින මහමෝදර මාතෘ රෝහල් භූමිය හා දක්ෂිණ අධිවේගී මාර්ගයට යාබද INSEE සිමෙන්ති කර්මාන්තශාලා භූමිය තුළ යෝජිත සංවර්ධන කොරිඩෝවට පහසුකම් සැපයීමට තාවකාලික සංක්‍රමණ ස්ථාන දෙකක් යෝජනා කර ඇත.

සිතියම 6.3-7: විධිමත් ගමනාගමනය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

පරිච්ඡේදය 06 සැලසුම ප්‍රවාහනය

උපායමාර්ගික ක්‍රියා (01) - ගිංතොට සිට වලහන්දුව දක්වා මීටර් 30.0 ක් පළලැති මංතීරු හතරක මාර්ගයක් ඉදිකිරීම (3 වන තරංග මාර්ගය)

ස්ථානය : ගිංතොට සහ වලහන්දූව කලේගාන,කහදුවත්ත, කරාපිටිය සහ ලබුදූව යෝජිත උප නගර මධ්‍යස්ථාන

ව්‍යාපෘති සංරචක:

1) පියදිගම සිට ලබුදූව දක්වා කලේගාන මාර්ගය මංතීරු හතරකට මීටර් 30. 0 ක් පළලැති මාර්ගයක් ලෙස පුළුල් කිරීම

2) ගිංතොට සිට පියදිගම දක්වා සහ ලබුදූව සිට වලහන්දූව දක්වා මංතීරු හතරක සම්බන්ධක මාර්ගයක් ඉදිකිරීම

සිතියම 6.3-8: මාර්ග සහ ප්‍රවාහන සංවර්ධන සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය 6.3-7: මංතීරු හතරක යෝජිත මාර්ගයේ පැතිකඩ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

උපායමාර්ගික ක්‍රියා (02) - මංතීරු හතරක අතුරුමාර්ගයක් නිර්මාණය (පළවන තරංග මාර්ගය)

ස්ථානය : කළුවැල්ල සිට සම්බෝධි මංසන්ධිය දක්වා (මාගාල්ල)

ව්‍යාපෘති සංරචක:

1) දහනායක මාවතහි මීටර 110ක් සහ කන්දෙවත්ත මාර්ගයේ මීටර 200ක් මීටර් 18. 0 ක් පළලැති මංතීරු 4ක් ලෙස පුළුල් කිරීම.

2) ක්‍රිප්ස් මාර්ගය සහ කෝන්ගහ මංසන්ධිය මංතීරු දෙකක මීටර් 18. 0ක් පළලැති මීටර 630ක් දිග මාර්ගයකින් සම්බන්ධ කිරීම

3) කෝන්ගහ මාර්ගයේ මීටර 550ක් බණ්ඩාරනායක මාවත දක්වා සහ සර්කියුලර් මාර්ගයේ මීටර 1500ක් මංතීරු දෙකක මීටර් 18. 0 ක මාර්ගයක් ලෙස පුළුල් කිරීම.

සිතියම 6.3-9:යෝජිත පළමු තරංග මාර්ගය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය 6.3-9: මංතීරු 2 යෝජිත මාර්ගයේ පැතිකඩ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

උපායමාර්ගික ක්‍රියා (03) - මිනුවන්ගොඩ මංසන්ධියේ සිට හපුගල දක්වා වක්වැල්ල මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කිරීම

මාර්ග දිග : කි.මී.4.4

උපායමාර්ගික ක්‍රියා (04) - කෝන්ගහ මංසන්ධියේ සිට කහදුවත්ත දක්වා (කි.මී. 2.5) සහ හිරිඹුර සිට උළුවිටිකේ දක්වා බද්දේගම මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කිරීම

උපායමාර්ගික ක්‍රියා (05) - ලබුදූව මාර්ගය පුළුල් කිරීම

මිලිද්දුව මංසන්ධියේ සිට ලබුදූව දක්වා එච්.කේ.එඩ්මන්ඩ් මාවත මංතීරු හතරක මාර්ගයක් ලෙස පුළුල් කිරීම

මාර්ග දිග : කි.මී.3

පළමු තරංග මාර්ගයහි පිහිටි බණ්ඩාරනායක මාවත මංසන්ධියේ සිට මිලිද්දුව මංසන්ධිය දක්වා සම්බන්ධ වන ලෙස මංතීරු හතරක මාර්ගයක් නිර්මාණය කිරීම

මාර්ග දිග : මී.600

සිතියම 6.3-10: යෝජිත මාර්ග පුළුල් කිරීම

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය 6.3-11: මංතීරු හතරක යෝජිත මාර්ගයේ පැතිකඩ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

උපායමාර්ගික ක්‍රියා (06)

1) නාගහවත්ත මංසන්ධියේ සිට අනන්ගොඩ මංසන්ධිය දක්වා මීටර් 18.0 ක් පළලැති මංතීරු දෙකක මාර්ගයක් ඉදිකිරීම (කි.මී.2.8)

2) හපුගල සහ තුන්වන තරංග මාර්ගය සම්බන්ධව වනසේ වටරැක මාර්ගය මංතීරු දෙකක මීටර් 18. 0 ක් පළලැති මාර්ගයක් ලෙස වැඩි දියුණු කිරීම සහ දීර්ඝ කිරීම

3) හපුගල මංසන්ධියේ සිට පිලාන කඩේ මංසන්ධිය දක්වා බටුවන්තුඩාව මාර්ගය (මී.700) සහ දැනට පවතින පිලාන කඩේ මංසන්ධියේ සිට තුන්හිරිපාන මංසන්ධිය දක්වා (කි.මී.1) මංතීරු දෙකක මීටර් 18. 0 ක මාර්ගයක් ලෙස වැඩි දියුණු කිරීම

4) තුන්හිරිපාන මංසන්ධියේ සිට බද්දේගම මාර්ගය දක්වා මංතීරු දෙකක මීටර් 18.0 ක් පළලැති මීටර 850 දිගැති නව මාර්ගයක් නිර්මාණය කිරීම

5) වේවැල්වල මාර්ගය වැඩි දියුණුකිරීම

රූපය 6.3-12: මංතීරු හතරක යෝජිත මාර්ග



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය 6.3-8: යෝජිත මංතීරු දෙක මාර්ගයේ පැතිකඩ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

පරිච්ඡේදය 06 සැලසුම ප්‍රවාහනය

උපායමාර්ගික ක්‍රියා (07) - ගාලු පාරේ සිට දක්ෂිණ අධිවේගී මාර්ග ප්‍රවේශය දක්වා මංතීරු දෙකක සම්බන්ධක මාර්ගයක් සැකසීම (දෙවන තරංග මාර්ගය)

මහමුදලි මාවත සහ ශ්‍රී හේමානන්ද මාවත සම්බන්ධවන පරිදි නව මාර්ගයක් ඉදිකිරීම
බෙලිගහ මංසන්ධියේ සිට නාගහවත්ත මංසන්ධිය දක්වා සම්බන්ධකයක් නිර්මාණය

උපායමාර්ගික ක්‍රියා (08) එස්.එච්.දහනායක මාවත සහ වුඩ්වඩ් මාවත දියුණුකිරීම

රූපය 6.3-12: යෝජිත නව මාර්ග සහ සම්බන්ධක

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

උපායමාර්ගික ක්‍රියා (09) - ගිංතොට හා වලහන්දුව ප්‍රවාහන මධ්‍යස්ථාන දෙකක් ලෙස ප්‍රවර්ධනය කිරීම

මහා ගාල්ල ප්‍රදේශයට සංවර්ධන කොරිඩෝව හරහා පැමිණෙන වාහන සහ සංචාරකයින් සඳහා පහසුකම් සැපයීමට සංක්‍රාන්ති මංසන්ධි දෙකක් ප්‍රවර්ධනය කිරීම. ඒවා පහත පරිදි වේ.

1) ගිංතොට සංක්‍රාන්ති මංසන්ධිය
2) වලහන්දුව සංක්‍රාන්ති මංසන්ධිය

සැලසුම

ප්‍රවාහනය

1) දැනට පවතින ලංගම ඩිපෝව පිහිටි ඉඩමෙහි වාණිජමය අවකාශ සහිතව කුඩා බස් පර්යන්තයක් ඉදිකිරීම

2) පියදිගම දුම්රිය ස්ථානය යෝජිත කුඩා බස් පර්යන්තය අසලට ගෙනයෑම

3) කුඩා බස් පර්යන්තය සහ දුම්රිය ස්ථානය අතර සම්බන්ධකයක් නිර්මාණය කිරීම

3) කුඩා බස් පර්යන්තය සහ ගාල්ල - කොළඹ මහා මාර්ගය අතර සම්බන්ධකයක් නිර්මාණය කිරීම

රූපය 6.3-15: යෝජිත ගිංතොට සංක්‍රමික මංසල

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය 6.3-16: ගිංතොට වර්ථමාන තත්වය සහ යෝජිත සංවර්ධනය

මූලාශ්‍රය : Google Earth,2019 සැකසීම : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

පරිච්ඡේදය 06 වලහන්දූව සංක්‍රාන්ති මංසන්ධිය

සැලසුම වාණිජ අවකාශ සහිත කුඩා බස් පර්යන්තයක් ඉදිකිරීම
තක්සේරු ඉඩම් ප්‍රමාණය : අක්කර 2.5

ප්‍රවාහනය ස්ථානය : උඩුගම මාර්ගය සහ දක්ෂිණ අධිවේගී මාර්ග ප්‍රවේශය අසල පිහිටි ඉඩමක්

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය 6.3-18: ගිංතොට වර්ථමාන තත්වය සහ යෝජිත සංවර්ධනය

මූලාශ්‍රය : Google Earth,2019 සැකසීම : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

6.3.3 ජල සැපයුම

ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩල ප්‍රමිතීන් අනුව සාමාන්‍ය ඒක පුද්ගල ජල පරිභෝජනය දිනකට ලීටර් 172 කි. ඒ අනුව, වැඩිවන ජනගහනය හා නේවාසික, වාණිජ, කාර්මික හා වෙනත් භාවිතය සඳහා මහ ගාල්ල ප්‍රදේශය සඳහා ජලය සඳහා වන සමස්ත දල ඉල්ලුම දිනකට ඝන ම. 164,000 පමණ වනු ඇත.

ගාලු නගරය ප්‍රදේශයට ජලය සපයන ප්‍රධාන ජල මූලාශ්‍රය ගිංගඟ වේ. ගිංගඟ ජලය වක්වැල්ල පිහිටි පිරිපහදුකාගාරයෙන් පිරිපහදු කොට බෙදා හරිනු ලැබේ .මහා ගාල්ල ප්‍රදේශය තුළ නල ජලය සපයා ඇත්තේ මෙම ගිංගඟ සැපයුමෙන් ජලය ලබා ගන්නා නගර සභා ප්‍රදේශයට පමණි.

වක්වැල්ල පොම්පාගාරය මඟින් බික්කේ ජල ටැංකියට ජලය ඝන මීටර 30000 ක් නිකුත් කරන අතර මෙයින් ගාල්ල මහනගර සභා ප්‍රදේශයහි වර්ථමාන දෛනික පරිභෝජනයට ගැළපෙන පරිදි ඝන මීටර 28000 ක් නිකුත් කරයි. එම නිසා ගාල්ල 100% නල ජල සැපයුමෙන් ආවරණය වේ.

මීට අමතරව හපුගල පොම්පාගාරයෙන් දිනකට ඝන මීටර 24000 ක් නිකුත් කරන අතර මෙය මහා ගාල්ල ප්‍රදේශය අයත් අක්මීමන, හබරාදුව සහ බෝපේ පොද්දල ප්‍රාදේශීය සභා ප්‍රදේශයට නිකුත් කෙරේ. මෙම ප්‍රමාණය එම පෙදෙස්වල ජල අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවේ. මහා ගාල්ල ප්‍රදේශයේ ඇති ප්‍රධාන ගැටලුව වන්නේ යල් පැනගිය සහ ප්‍රමාණවත් නොවන ධාරිතාවයක් සහිත නල පද්ධතිය සහ (ජල පීඩනයට ඔරොත්තු නොදෙන) පැය 24 ජල සැපයුමක් නොමැති වීමත් විශේෂයෙන් ගාල්ල මහනගර සභා ප්‍රදේශයෙන් පිටත ප්‍රදේශයට මෙම ජල හිඟය පවතින අතර ගිංගඟ පොම්පාගාරයහි ධාරිතාව ප්‍රමාණවත් නොවීම මෙයට හේතුවී ඇති අතර ඉහළ යන ජනගහන සහ යෝජිත සංවර්ධන ක්‍රියාවලි සඳහා අවශ්‍ය ඉල්ලුම වැඩිවීමද හේතුවකි. එබැවින් ජල සැපයුම ඝන අඩි 64000 දක්වා වැඩිකිරීමට යෝජිත වේ.
මීට අමතරව නගරයේ බොහෝ කොටස්වල භූ ගත ජලයෙහි අධිමාත්‍ර ද්‍රව්‍ය යකඩ සහ ෆ්ලෝරයිඩ් පවතී. එම නිසා ජලය අවශ්‍ය අවම ගුණාත්මක මට්ටමට සරිලන ලෙස නොපවතී. විශ්වසනීය ජල ප්‍රභවයන් නොමැතිවීම හේතුවෙන් පහසුකම් පුළුල් කිරීම් සහ ප්‍රධාන යෝජිත සංවර්ධන සීමා වීම්, මෙහි ප්‍රධාන අහිතකර බලපෑම් ලෙස දැක්විය හැක.

කෙසේ නමුත්, පසුගිය වසර 25 පුරාවට පුළුල් නොවූ හෝ ප්‍රකාශයට පත් නොවූ මෙම ව්‍යාපෘති ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩල ජල සැපයුම් ජාල දියුණු කිරීම සඳහා සංකල්පිත ව්‍යාපෘති ලෙස පැවති ඇත. මීට අමතරව ඇතැම් භූගත ජල නල බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ යෙදූ යකඩ නල වන අතර මෙය වසර 100කට වඩා පැරණි වීමේ සම්භාවිතාවක් ඇත. මෙලෙස, ජාතික ජලසම්පාදන සහ ජලාපව-ාහන මණ්ඩල සතුව ප්‍රදේශයේ අනාගත ජල සැපයුම සඳහා පහසුකම් සැපයීම අරමුණ ඇතිව භූගත නල යටිතල ව්‍යුහය දියුණු කිරීමේ ප්‍රධාන ව්‍යාපෘතියක් සිදුවෙමින් පවති.

වසර 2030 සඳහා මහා ගාල්ල ප්‍රදේශයහි ජල ඉල්ලුම ඝන මීටර 195890 පමණ වේ. එබැවින්, යෝජිත ව්‍යාපෘති සඳහා ජල අවශ්‍යතා ආවරණ වන අතර ව්‍යාපෘති යෝජනා සඳහා නිර්දේශ, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම අනාගත සැලසුම් ගත ඉලක්ක සමඟ සැසඳිය යුතුවේ.

6.3.4 විදුලි සහ දත්ත රැහැන්

පද්ධතියට කිසිදු බාධාවක් නොවී ගාල්ල මහනගර සභා ප්‍රදේශය සම්පූර්ණයෙන්ම විදුලි සැපයුමෙන් ආවරණය වී ඇත. එබැවින්, නගරයට විදුලිය සැපයීමේ කිසිදු හිඟයක් වර්තමානයේ නොපවතී. ප්‍රදේශයේ සියලු මාර්ග සඳහා විදුලි සැපයුම ලබා දී ඇත. ගාල්ල මහනගර සභා ප්‍රදේශය තුළ විදුලි සැපයුම් සහ නඩත්තු කටයුතු සිදුකිරීම ලංකා විදුලි (පෞද්ගලික) සමාගමෙන් සිදුකෙරෙන අතර මහා ගාල්ල අනෙකුත් ප්‍රදේශ ලංකා විදුලිබල මණ්ඩලයෙන් සිදු කෙරේ. පාර්ශවකරුවන්ගේ රැස්වීම් අනුව වර්තමානයේ පවතින ඉල්ලුම මෙන්ම යෝජිත ව්‍යාපෘති හරහා ඇතිවන අනාගත ඉල්ලුම කිසිදු ගැටළුවක් නොමැතිව විදුලිය සැපයීමට හැකි බව සඳහන් වී ඇත.එහෙයින්, වසර 2031 වන විට විදුලි ඉල්ලුම ගිගා වොට් පැය 609ක් බව ගණන් බලා ඇත. (මහගාල්ල ප්‍රදේශය) නගරය සහ තදාසන්නව විශේෂයෙන්ම ගාලු කොටුව තුළ පිහිටා ඇති විදුලි සහ සාම්ප්‍රදායික රැහැන් දුරකථන පද්ධති, ලිප්ත රැහැන් සහ කොන්ක්‍රීට් කණු නගරයෙහි පෙනුම ව්‍යාකූල මෙන්ම ආකර්ෂණයෙන් තොර පෙනුමක් නගරයට සහ වීථි වලට දායක කර තිබේ. මෙම රැහැන් කැණීම් හෝ ක්ෂුද්‍ර උමං සේවා නල තුළ භූගත කළ යුතු වේ.

පරිච්ඡේදය 06

සැලසුම

6.3.5 අපවහන සහ මළාපවහන කාණු

6.3.5.1 අපවහන ජාලය

අපවහන ජාලය

ගිංගඟ, මොරගොඩ ඇළ සහ මෝඩ ඇළ මහා ගාල්ල ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන ජල මාර්ග වන අතර වැසි ජලය අපවහන පද්ධතිය ප්‍රාථමික, ද්විතීක සහ ප්‍රධාන මාර්ගවල පැති ජලාපවහන පද්ධති කි.මී.68 දුරට විහිදී පවතී.

වැසි ජලය අපවහන පද්ධතිය නගරය හරහා දිව යනමුත් මතුපිට ජලාපවාහන පද්ධතියේ ගැටළු ගණනාවක් පවතී. නගරය පුරා දිවෙන මුළු මාර්ග දිගෙන් 75% ක පමණ පැති කාණු පවතින මුත් මෙම කාණු ස්වභාවික ජලාපවාහන පද්ධති හා නිසි අයුරින් සම්බන්ධ වී නොමැත. මෙය පද්ධතියට අයහපත් අන්දමින් බලපෑම් ඇති කර තිබේ.

නගරය තැනිතලා භූමියක පිහිටා ඇතත්, සම්පූර්ණ කාණු පද්ධතිය මධ්‍යන මුහුදු මට්ටමට පහතින් පිහිටා ඇති බැවින් ජල ධාරා ප්‍රවාහය අතිශයින්ම මන්දගාමී වේ. මෙම තත්වය විශේෂයෙන් වර්ෂා කාලයේදී ගංවතුර නිර්මාණය කරයි. තවද ඇළ මාර්ගයේ නීත්‍යානුකූල ජල ප්‍රවාහයට ඇතැම් ස්ථාන වල ඇති වී තිබෙන පටුකම බාධකයක් වී ඇති අතර පහත් බිම් පිරවීම, අපද්‍රව්‍ය සහ මල ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අවභාවිත කිරීම පරිසර දූෂණය හේතු වී ඇත.

මෙම සැලැස්ම රක්ෂිත පවත්වා ගැනීම තුළින් වඩාත් දියුණු ඇළ මාර්ග පරිසරයක් ඇති කිරීමට යෝජනා කරන අතර, ඒවා විනෝද ක්‍රියාකාරකම්, ව්‍යායාම සඳහා දිවීම් පථයක්, බෝට්ටු පැදීමේ පහසුකම් සහ පොදු උද්‍යාන වෙන් කර ගත හැක. මීට අමතරව ඇළ බැම්මෙහි ආරක්ෂාව සඳහා ආධාරක තාප්ප ඉහළ ධාරාවක් සහිත අවස්ථාවකදී පවා වේගවත් පිටප්‍රවාහයක් පවත්වා ගැනීමට පොම්පාගාර ස්ථාපනය විය යුතු බවට යෝජනාවන අතර පසුව ඉදිරිපත් කිරීමට නියමිත සංවර්ධන සැලැස්මට අදාළ පාරසරික තිරසාර උපායමාර්ග යටතේ මෙය විස්තරාත්මකව සඳහන් කර ඇත.

මළාපවාහන පද්ධතිය

6.3.5.2 මළාපවාහන පද්ධතිය

නගරයේ පොදු මළාපවාහන පද්ධතියක් නොමැත. නේවාසිකයින් වෙන් වෙන්ව පුතීක ටැංකි භාවිතා කරන අතර ප්‍රදේශය පහත් මෙන්ම ඉහළ ජල මට්ටම නිසාත් විශාල සෞඛ්‍ය ගැටළු නිර්මාණය වී ඇත. එබැවින් නගරය සඳහා මධ්‍යගත මළාපවාහන පද්ධතියක් ඇති කළ යුතු අතර ගොඩනැගිලි වල ඝණත්වය ,පහත් බිම් ප්‍රදේශ වල භෞමික පැවැත්ම හා අනාගත සංවර්ධන ක්‍රියාකාරකම් හා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ප්‍රමුඛතා පදනම මත ක්‍රියාත්මක කිරීම සුදුසු වේ.

මෙම ගැටලුව පිළිබඳව ශ්‍රී ලංකා රජය දැනුවත් වී ඇති අතර ගාල්ල නගරය පුරා සනීපාරක්ෂක මාර්ග පද්ධතියක් ඉදි කිරීමට සැලසුම් කර ඇත. ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය පළමු අදියර ලෙස ගාල්ල මහ නගර සභාව ආවරණය වන පරිදි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම අධ්‍යයනය කරන අතර අවට ප්‍රදේශ අඛණ්ඩ අදියරවල් මගින් ආවරණය වන පරිදි ක්‍රියාත්මකවනු ඇත. (SHIFT Project).

සිතියම ***6.3.19***: ගාල්ල සහ උණවටුන ප්‍රදේශවල අපජල එකතු කිරීම, පිරිපහදුව සහ බැහර කිරීම



මූලාශ්‍රය :*SHIFT* ව්‍යාපෘතිය,2016

මෙම ව්‍යාපෘතිය සම්ප්‍රදායික ගුරුත්වාකර්ෂණ සහ මළාපවහන පොම්ප පද්ධතියකින් යුක්ත වන අතර මෙයට ගුරුත්වාකර්ෂණ පොම්ප / පොම්ප ටැංකි ප්‍රධාන සහ පොම්පාගාර සහිතව ගාල්ල තුල පවතින සියලු පරිශ්‍ර සඳහා සේවා සපයන ගුරුත්ව පෝෂක නල පද්ධති මගින් අපජල පවිත්‍රාගාරයට පොම්පකරන අතර මෙම පවිත්‍රාගාරය මුහුදට පිටප්‍රවාහයක් සහිතව ගිංතොට පිහිටුවීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස ගාල්ල නගරයේ සියළුම වීථි නල එළීම සඳහා යොදා ගනු ලබන අතර, ප්‍රාදේශීය සම්බන්ධතා පරිශ්‍රයන් හට ලබාදීම සැපයුම නළ මගින් සිදුවේ. මෙය ගාල්ල වටා ඇති වීථීන්හි ඉදිකරනු ලබන ඕනෑම පොදු අවකාශයක් සඳහා සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. මෙවන් ආකාරයේ ඉදිකිරීම්වලට ඔරොත්තු දෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කලයුතු අතර එමගින් පෘෂ්ඨය ඉවත් කළ හැකි අතර එය ව්‍යපෘතියට හානියක් / බලපෑමක් ඇති නොවී නැතහොත් ව්‍යාපෘතිය අවශ්‍යතා බලපෑමක් ඇතිනොවී ප්‍රතිස්ථාපනය කළහැකි අතර පසුව පද්ධතියට සම්බන්ධතා ලබාදීම සඳහා මුලින්ම නල එළීම සිදුකලයුතු

6.3.6 අපද්‍රව්‍ය කළමනාකරණය

අපද්‍රව්‍ය කළමනාකරණය

ඝන අපද්‍රව්‍ය ගාල්ල නගරයේ සැලකිය යුතු ගැටළුවක්ව පවතී. වසර කිහිපයක් තුළ සිදුවූ ශීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් ඉවතලන අපද්‍රව්‍ය ප්‍රමාණය ඉහළ ගොස් ඇත. වසර කිහිපයක් පුරාවටම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දියුණු කිරීමේ ව්‍යාපෘති සහ යෝජනා පැවතුනද ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මෙහෙයුම අවශ්‍ය පාරසරික පිළිගත හැකි මට්ටමට නොපැමිණීම තවමත් ගැටළුවකි.

ඝන අපද්‍රව්‍ය ප්‍රධාන අංශ 2ක් හරහා සිදුවේ එනම් (i) නාගරික ඝන අපද්‍රව්‍ය (MSW) (නිවාස, වෙළඳපොළ-වල්, වෙළඳසල්, ආපනශාලා සහ හෝටල්, ආරෝග්‍යශාලා සහ වෛද්‍ය මධ්‍යස්ථාන හැර අනෙකුත් ආයතන වැනි වාණිජමය ආයතන) සහ (ii) කාර්මික සහ උපද්‍රව අපද්‍රව්‍ය (කර්මාන්ත ශාලා, රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන).

රූපය ***6.3.20***: මහා ගාල්ල ප්‍රදේශයේ දෛනික අපද්‍රව්‍ය ජනනය



මූලාශ්‍රය :ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය 2013

ක්ෂුද්‍ර ජීවීන් මඟින් දිරාපත් වන අපද්‍රව්‍ය කොම්පෝස්ට් කිරීම පළාත් පාලන ආයතන කිහිපයක් භාරගෙන ඇත. ඒවා අතුරින් සාර්ථක ක්‍රියාත්මක වීමක් ලෙස සැලකිය හැකි රත්ගම පිහිටි මොන්රෝවියාවත්ත කොම්පෝස්ට් කර්මාන්තය වෙත ගාල්ල මහනගර සභාව, බෝපේ පොද්දල ප්‍රාදේශීය සභාව, මහා ගාල්ල වටකරගත් ප්‍රදේශයේ කොම්පෝස්ට් කිරීමේ පහසුකම් යොමු කර ඇත. නමුත් අක්මීමන ප්‍රාදේශීය සභාව ඝන අපද්‍රවය කළමනාකරණය සඳහා නිසි ක්‍රමවේදයක් තවමත් භාවිතා නොකරයි.

6.3.6.1. රත්ගම (මොන්රෝවියාවත්ත) යෝජිත සනීපාරක්ෂක කසළ රඳවනය

ප්‍රදේශයේ ඉහළ යන අපද්‍රව්‍ය සඳහා දිගු කාලීන විසඳුමක් ලෙස මධ්‍යම පරිසර අධිකාරිය සනීපාරක්ෂක කසළ රඳවනය යෝජනා කර ඇත. යෝජිත කසළ රඳවනය සඳහා රජගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ මොන්රෝවියවත්ත හඳුනාගෙන ඇත. (2018 වසරේ සිට ක්‍රියාත්මක වී ඇත) වර්තමානයේ මෙම ඉඩමේ එක් කොටසක කොම්පෝස්ට් නිෂ්පාදනාගාරයක් පවතින අතර මෙයට මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබා දී ඇත්තේ පිලිසරු ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් වන අතර, මෙහෙය වීම රජ්ගම ප්‍රාදේශීය සභා විසින් කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන හතකට සේවා සැපයීමට අපේක්ෂා කෙරේ, ඒවා නම් ගාල්ල මහා නගර සභාව, අම්බලන්ගොඩ නගර සභාව, හික්කඩුව නගර සභාව, බෝපේ පොද්දල ප්‍රාදේශීය සභාව, බලපිටිය ප්‍රාදේශීය සභාව සහ රජ්ගම ප්‍රාදේශීය සභාව වේ. ව්‍යාපෘතිය සඳහා වන තාක්ෂණික නිර්මාණ අවසන් කර ඇත. ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය (1,042,281) මඟින් නිකුත් කරන අපද්‍රව්‍ය වලින් 40% පමණ මෙම ව්‍යාපෘතිය හරහා මෙහෙයවන අතර එකතුකරන ලද ප්‍රමාණයෙන් 74% ක් පමණ මෙහෙයවේ.(දිනකට ටොන් 114) අනෙකුත් ප්‍රදේශ හා සලකද්දී මෙම පළාත් පාලන ආයතන හත තුළ අධි ජන ඝනත්වයක් පවතී. දිස්ත්‍රික්කයේ වාර්ෂික ජනගහන ඉහළ යාමේ සාමාන්‍ය අගය 1% පමණ වේ.

ගාල්ල මහා නගර සභා සහ දිස්ත්‍රික්කයේ අනෙකුත් පළාත් පාලන ආයතන මුහුණ දී තිබුණු ප්‍රධානතම ගැටළුව වූයේ සනීපාරක්ෂක රඳවන භූමි නොමැතිකමය. වර්තමානයේදී ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු කරනු ලබන්නේ පෞද්ගලික ඉඩම් වලටය.

මෙම ඉඩම් බොහෝවිට පහත් බිම් වන අතර එම ඉඩම් හිමියන්ගේ අපේක්ෂාව වනුයේ ඉඩම් ගොඩ කර ගැනීම සහ ඉන් අනතුරුව විවිධ නාගරික ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමය. පාරිසරිකව එතරම් සුභදායි නොවුනත් පළාත් පාලන ආයතනවලට මෙවැනි පහත් බිම් වලට අපද්‍රව්‍ය බැහැර කිරීම හැර වෙනත් විකල්පයක් නොමැත. කෙසේ නමුත්, මෙලෙස පහත් බිම් ගොඩකිරීම සඳහා පහත්බිම් වලට අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් අනෙකුත් පාරසරික බලපෑම් වලට අමතරව භූගත ජලය දූෂණය වන අතර ප්‍රදේශයේ මුළු පාරිසරික පද්ධතියටම බාධා ඇතිවී ඇත.

ගාල්ල මහා නගර සභා ප්‍රදේශය තුල දිනකට ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 50ක් පමණ සාමාන්‍යයෙන් ජනනය කෙරේ. මහා නගර සභාව, පුද්ගලික අංශ, රාජ්‍ය නොවන සංවිධාන සහ ජන සමූහ යන අයගේ සහභාගිත්වයෙන් කසළ බැහැර කිරීම සිදුවේ. ගාල්ල මහා නගර සභාව මඟින් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම ගාල්ල නගර සීමාව තුල මහමෝදර, හීන්පැන්දල ප්‍රදේශයේ සිදුවේ. මෙවැනි කසළ බැහැර කිරීම් පාරිසරික සහ සමාජීය ගැටළු වලට මඟ පාදයි.

මහා ගාල්ල තුල පිහිටි මෙම පළාත් පළාත් පාලන ආයතනවලට අමතරව, හබරාදුව ප්‍රාදේශීය සභාව අපද්‍රව්‍ය විවෘත බැහැර කිරීම සඳහා සහ කොම්පෝස්ට් කර්මාන්තය සඳහා සුදුසු ඉඩමක් (ආසන්න ලෙස අක්කර 2ක්) කටුකුරුන්ද ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇත. වර්ථමානයේ භාවිතා වන අත්හැර දැමූ හුණුගල් පතල එතරම් පරිසර හිතකාමී නොවේ. මීට අමතරව ජීව වායු නිෂ්පාදනය සඳහා ස්ථාන ලෙස අහංගම, හබරාදුව පොළ සහ හබරාදුව ආදාහනාගාරය යෝජනා වී ඇත.
අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා හිස් ඉඩම් නොමැතිකමට අමතරව අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිකම සහ කසළ බැහැර කිරීමේ තාක්ෂණික දැනුම නොමැතිකම පළාත් පාලන ආයතන කසළ කළමනාකරණයේදී මුහුණ දෙන අනෙකුත් ගැටලු වේ. ඝන අපද්‍රව්‍ය මුදාහරින අය විසින් එම අපද්‍රව්‍ය වෙන් නොකිරීම හේතුවෙන් අපද්‍රව්‍ය බැහැර කිරීම පළාත් පාලන ආයතනවලට ගැටළුවක් වී ඇත. එබැවින් සංවර්ධන සැලැස්ම හරහා අක්‍රමවත් කසළ බැහැර කිරීම් හේතුවෙන් ඇතිවන පාරසරික, ආර්ථික , සමාජීය සහ සෞඛ්‍ය ගැටළු අවම කිරීමට මැදිහත් වේ.

අනාගත ජනගහන වර්ධනය මත අනාගත අපද්‍රව්‍ය ජනනය ඉහළ යනු අතර සමාජයේ ආර්ථික ව්‍යුහය වෙනස් වීම හේතුවෙන් කසළ සංයුතිය වෙනස් වේ. ඝන අපද්‍රව්‍ය වසරකට 2% කින් පමණ ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. වර්තමානයේ මහා නගර සභා ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ වාරයකදී, දිනකට මෙට්‍රික් ටොන් 30 ක අතිරික්තයක් විවෘත බැහැර කරනු ලැබේ. අනාගතයේදී එකතුවන කසළ ප්‍රමාණය සාමාන්‍ය ලෙස 20%කින් ආසන්න ලෙස ඉහළ යනු ඇති අතර අවසන් ලෙස කසළ බැහැර කිරීමට විකල්ප අවශ්‍ය වේ.

6.3.7. විශේෂ අවධානය

6.3.7. 1. වරාය

ජාත්‍යන්තර නාවික මාර්ගයෙහි ගාල්ල පිහිටීම වෙරළ තීරයට ඉතා ආසන්න සහ නැව් ගමන් වෙරළ තීරුවේ සිට ඉතා හොඳින් දර්ශනය වේ. මෙම උපායමාර්ගික ලක්ෂ්‍ය නැව් කටයුතු, සුඛෝපභෝගී නාවික සංචාර සහ සේවා සඳහා ඉන්දියානු සාගරයේ මධ්‍යස්ථානයක් ලෙස පත්කළ හැක. මෙලෙස ගාල්ල තුල සංචාරක සහ නාවික සේවා සංවර්ධන කිරීමේ ඉහළ විභවයක් පවතී. බොහෝ සංචාරක ආකර්ෂණ ගාල්ල වෙත ඇතිවීමේ සහායෙන් ඉන්දියානු සාගර සුඛෝපභෝගී නාවික කර්මාන්ත සඳහා සංකල්පීය ප්‍රධාන වරායක් ලෙස ගාල්ල වරාය හඳුනාගෙන ඇති අතර, මෙය ප්‍රධාන ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ සිට දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා පහසුවෙන් ප්‍රවේශය ද ලබා ගත හැකිය. මෙම වරාය ප්‍රධාන සුඛෝපභෝගී නාවික සේවා තොටුපොළක් බවට පරිණාම වන අයුරින් සංවර්ධනය කළ යුතු අතර එමගින් ඉන්දියානු සාගරයේ සුඛෝපභෝගී නාවික සේවා (ක්‍රූස්) ප්‍රමුඛ මධ්‍යස්ථානයක් බවට පත් වීමේ සම්භාවිතාව පවතී. එමෙන්ම ගාල්ල වරාය කලාපීය අවශ්‍යතාවයන් සහ ජාතික ආර්ථික කොරිඩෝවක පිහිටා ඇති බැවින් සේවා සපයන වරායක් ලෙස ප්‍රතිසංවිධානය කිරීමටත් සුඛෝපභෝගී නාවික යාත්‍රා සඳහා සේවා සැපයීම තුළින් ගාල්ල නගරයේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දීමේ විභවතාවයක් පවතී.

6.3.7.2.අධිවේගී මාර්ගය / අන්තර් හුවමාරු

පළාතේ ගමනාගමන පද්ධතියට මෑතකදී එක් වුණ එක් ප්‍රධාන විභවතාවයක් ලෙස මහ ගාල්ල සීමාවේ පිහිටි පින්නදුව අන්තර් හුවමාරුව හරහා දක්ෂිණ අධිවේගී මාර්ගය දැක්විය හැක. නව මාර්ග පද්ධතිය වෙනස්වූ ප්‍රවාහන ක්‍රම හරහා දේශීය සහ විදේශීය බොහෝ සංචාරකයන් ආකර්ෂණය කිරීම සහ ප්‍රධාන නගරය තුල සිදුවන සංවර්ධනය සමඟ අභ්‍යන්තර ජන සමූහ සමඟ විවිධ ඉඩම් සංවර්ධනයට බලපානු ලබයි. ප්‍රදේශයේ ප්‍රධාන භාවිතයන්ගේ සහ ප්‍රවේශකත්වය ඉහළ යනු ඇති අතර, වර්තමානයේ භාවිතා-වන ඉඩම් වඩාත් වාසිදායක භාවිතා සඳහා බලපායි. එබැවින් දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් ලබාදෙන සම්බන්ධතාවන්හි වාසිය භාවිතා කිරීම සඳහා උපායශීලී මඟ පෙන්වීම වාසිදායක වේ.

6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ග

6.4.1 ඉසුරුමත් නගරය

නගරයේ නිර්මිත පරිසරය සහ ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ ක්‍රියා කලාපය එම නගරයේ ඉසුරුමත් බව පෙන්නුම් කරයි. රාජ්‍ය අංශයේ ධාරිතාවය සීමාසහිත වූ විට, නාගරික සංවර්ධනය හා රැකියා උත්පාදනය සඳහා පෞද්ගලික ආයෝජකයින් ආකර්ෂණය කරගැනීමේ අවශ්‍යතාවයක් පවතී. මෙම ආකාරයේ ආයෝජනයන් ළඟා කර ගත හැක්කේ සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂා කළ යුතු විවිධ අංශවල ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීමෙන් පමණි.

ඒ අනුව වරාය, මහා මාර්ග හා වෙනත් භෞතික යටිතල පහසුකම් වැනි අතවශ්‍ය පහසුකම් සහිත ගාලු නගරය ප්‍රබල ස්ථානයක සිටී. ගෝලීය නැඹුරුව සැලකිල්ලට ගනිමින්, සාම්ප්‍රදායික කර්මාන්ත වලට වඩා වඩාත් තරඟකාරී නිර්මාණාත්මක ආර්ථික සහ ප්‍රදේශයට ආවේණික වූ සම්පත් පිළිබඳ විභවයන් ප්‍රශස්තකරණය කිරීම, නිර්මාණාත්මක සංචාරක කර්මාන්තය, දැනුම පදනම් කරගත් කර්මාන්ත සහ ප්‍රවාහන පදනම් කරගත් සේවා මෙම ආර්ථික සංවර්ධන සැලසුම තුල පවතී.

එබැවින්, අවකාශ සැලසුම්කරණ විෂය පථය තුල ආර්ථික සංවර්ධන සැලැස්ම "ඉසුරුමත් නගරය"යන අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා උප සැලසුම් පහක් යෝජනා වී ඇත.

1) සංචාරක කළමනාකරණ සැලැස්ම
2) ධීවර ක්‍රියාකාරකම වැඩි දියුණු කිරීම්
3) කෘෂිකාර්මික ක්‍රියාකාරකම වැඩි දියුණු කිරීම්
4) දැනුම පදනම් කරගත් කර්මාන්ත සංවර්ධන සැලැස්ම
5) රාජ්‍ය දේපල සංවර්ධන සැලැස්ම

සිතියම 6.4-1: ඉසුරුමත් නගරය- ආර්ථික සංවර්ධන සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල,2020

6.4.1. සංචාරක කළමනාකරණ සැලැස්ම

ගාල්ලෙහි ආර්ථිකය තුල සංචාරක කර්මාන්තය දැවැන්ත කාර්යක් ඉෂ්ඨ කරයි. ඕලන්ද කොටුව ලෝක උරුම ප්‍රදේශය සංචාරක ව්‍යාපාරය සඳහා අතිවිශාල අවස්ථාවක් වී පවතී. මුහුදුබඩ මාර්ගය හා බැඳුණු ප්‍රදේශ මහමෝදර සහ කටුගොඩ වෙරළ ප්‍රදේශ, බීක්කේ ජලාශය, මහමෝදර කලපුව වැනි ස්ථාන ද සංචාරක කර්මාන්ත සංවර්ධනය සඳහා වැඩි විභවතාවයක් පවතී. මෙතෙක් මෙම ප්‍රදේශ සංචාරක කර්මාන්තය සඳහා ප්‍රශස්ත අන්දමින් භාවිතා නොවූ බැවින් විස්තරාත්මක සැලසුම්කරණය තුළින් ආර්ථිකයෙහි ඉක්මන් පිබිදීමක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

6.4.1.1. උපායමාර්ගික ක්‍රියා (01) - සංචාරක තීරයක් නිර්මාණය

බොහෝ ආර්ථික අවස්ථා වැඩිකිරීමට සංචාරක ක්‍රියාකාරකම් පවතින මුහුදබඳ ප්‍රදේශයේ සහ ඊට ආසන්න ප්‍රදේශ සංචාරක තීරයක් (කොරිඩෝවක්) ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය. ගිංතොට සිට ආරම්භ වන්නාවූ වෙරළ තීරයේ සිට දෙවට දක්වා ප්‍රදේශය සංචාරක කොරිඩෝවක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. ස්ථානය : ගිංතොට සිට දෙවට මංසන්ධිය දක්වා ගාලු පාර

රූපය ***6.4.1.1***:යෝජිත සංචාරක පොකොට්ටු



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

6.4.1.1.1.පොකොට්ටුව 01 - ගිං ගඟ ආශ්‍රිතව ජලාශ්‍රිත ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම

යෝජිත ක්‍රියාකාරකම් / භාවිතයන්

1) කෘෘස් / බෝට්ටු චාරිකා
2) දිය පිහිරි - මුහුදු (ජල ජෙට්)
3) විවෘත අවන්හල්
4) කෘෘස් / බෝට්ටු සඳහා ජැටිය

රූපය ***6.4.1.2***: යෝජිත සංචාරක සංවර්ධනය - පොකොට්ටුව 01

ගිංතොට පාලමේ සිට මුහුද හා ගොඩබිම දෙස දර්ශනය

මූලාශ්‍රය : Google Earth,2019

6.4. 1.1.2.ව්‍යාපෘති 02 - මහමෝදර වැව ආශ්‍රිතව ජලජවිලා ඉදිකිරීම

යෝජිත ක්‍රියාකාරකම් / භාවිතයන්

1) ජලජ ක්‍රීඩා පිටිය
2) ජල ආශ්‍රිත විනෝද ක්‍රීඩා
3) අවන්හල්
4) කෘෘස්/ බෝට්ටු චාරිකා

රූපය ***6.4.1.3***: යෝජිත සංචාරක සංවර්ධන - පොකොට්ටුව 02

මහමොදර පාලමේ සිට මුහුද හා ගොඩබිම දෙස දර්ශනය



මූලාශ්‍රය : Google Earth,2019

6.4.1.1.3 ව්‍යාපෘති 03 - මහමෝදර රෝහල් භූමිය පුනර්ජනනය සහ පවතින ජාතික හෙද විදුහල් භූමිය ඉහළ පන්තයේ සංචාරක ක්‍රියාකාරකම් සඳහා භාවිතය

මහමෝදර මාතෘ රෝහල කරාපිටිය වෙත ප්‍රතිස්ථාපනය කර ඇත. එබැවින් එම හිස්වන භූමිය අවට සිදුවන සංවර්ධන නැඹුරුතා සලකා උපරිම ලෙස ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා හෝටල් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යෝජනා වී ඇත. මෙය මුහුදට මුහුණලා වෙරළට ඉතා ආසන්නව පිහිටි ඉඩමක් බැවින් එහි ආයෝජනය බොහෝ මූල්‍ය ප්‍රතිලාභ මෙන්ම නගරයට ආකර්ශනය ගෙනදෙනු ඇත.

මෙය මහජනයා සඳහා මුහුදට මුහුණලා පොදු විවෘත අවකාශ නිර්මාණ කරන සමුද්‍ර පියවර සංවර්ධන ව්‍යාපෘතිය හා බැඳී පවතී.

රූපය 6.4.1.4 : යෝජිත සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය - 03

මූලාශ්‍රය : Google Earth,2019

උපායමාර්ගික ක්‍රියා (02) - බෝට්ටු / සුඛෝපභෝගී නාවික සේවා (ක්‍රෘස් සේවා/Cruise Boat Service) පහසුකම් මහමෝදර කලපුව, කැපු ඇළ සහ ගිංගඟ ආශ්‍රිතව ප්‍රවර්ධනය සහ හඳුනාගත් ස්ථානවල ප්‍රවේශ ලක්ෂ්‍ය සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය හෙක්ටෙයාර 82 පමණ ප්‍රදේශයකින් යුක්ත වන අතර මෙය කැපු ඇළ දෙපස සංචාරක කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා හඳුනා ගෙන ඇත. (කබානා, අවන්හල්..) මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රදේශයට ආවේණික ස්වභාවික සම්පත් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගැනීමය. එබැවින් වෙරළ ආශ්‍රිත සංවර්ධනයට සමාන්තරව අභ්‍යන්තරික ජල මූලාශ්‍ර ආශ්‍රිත සංචාරක ක්‍රියාකාරකම් එකිනෙක සම්බන්ධ කිරීමට යෝජනා කර ඇත.

රූපය ***6.4.1.5***: මහමෝදර කලපුව, කැපු ඇළ සහ ගිංගඟ ආශ්‍රිත යෝජිත සංචාරක ක්‍රියාකාරකම්



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය ***6.4.1.6***: යෝජිත සංචාරක ක්‍රියාකාරකම්

මූලාශ්‍රය : Google Earth,2019

6.4.2.ධීවර කටයුතු ප්‍රවර්ධන සැලැස්ම

සැලසුම

ආර්ථික සංවර්ධන උපායමාර්ග

ධීවර කටයුතු ප්‍රවර්ධන සැලැස්ම

ගාල්ල වෙරළබඩ නගරයක් බැවින් ධීවර කර්මාන්තය නගරයේ එක් ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකමක් ලෙස සැලකේ. දළ ජාතික නිෂ්පාදනයට දිනකට කි.ග්‍රෑ. 5000 ත් 10000 ත් අතර මත්ස්‍ය නිෂ්පාදනයක් ගාල්ලෙන් දායක කරයි. මත්ස්‍ය නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා නිශ්චිත වෙළඳපොළ අවස්ථා සහ නිශ්චිත යාන්ත්‍රණයක් නොමැත. නිශ්චිත යාන්ත්‍රණයක් සැලසුම් කිරීම මඟින් වැඩි ආදායම් උත්පාදනය කිරීම සහ රැකියා අවස්ථා ඇතිවීමක් සිදු වේ.

උපායමාර්ගික ක්‍රියා (01) - හඳුනාගත් මත්ස්‍ය ගොඩබිම් 02 ක් සඳහා පහසුකම් සැපයීම සහ ඉහළ නැංවීම සහ එය වෙරළ හා සංචාරක ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ කිරීම.

1) භූමිය 01: දෙවට
2) භූමිය 02: රත්ගම වැල්ල

රූපය ***6.4.1.5*** යෝජිත මත්ස්‍ය ගොඩබිම්

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

6.4.2.1. භූමිය 01: දෙවට

අධිවේගී පිවිසුමට ඉදිරිපිට පිහිටා ඇති දෙවට ප්‍රදේශය මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට හඳුනාගෙන තිබේ

1) මුහුද දෙසට වූ විවෘත වේදිකාවක් සහ මුහුදු දෘෂ්ඨිපථය පුළුල් කිරීම
2) පවතින ගොඩනැගිලි මුහුදු දෘෂ්ඨි පථය දර්ශනය වන සේ ප්‍රතිසංවිධානය කිරීම

රූපය 6.4.4.2 : යෝජිත මත්ස්‍ය ගොඩබෑමේ ස්ථානය සංවර්ධනය කිරීම

මූලාශ්‍රය : Google Earth,2019

මෙම මත්ස්‍ය ගොඩබෑමේ භූමියට ගාල්ල කොටුව සහ ඓතිහාසික රූමස්සල කඳුවැටිය ඉතා හොඳින් නිරීක්ෂණය වේ. එබැවින් මෙම ස්ථානයේ පවතින අවේණික වූ අකාර්ශනීය දර්ශණයෙහි වාසිදායකත්වය ප්‍රයෝජනයට ගැනීම සඳහා විවෘත දැව වේදිකාවක් සංවර්ධනයට යෝජිතය.

රූපය 6.4.2.3 : මුහුද දෙසට වූ විවෘත වේදිකාවක් සහ මුහුදු දෘෂ්ඨිපථය පුළුල් කිරීම



මූලාශ්‍රය*: :Google Images and Open Street Maps,2019*

රූපය ***6.4.2.4**:* වෙරළ තීරයේ පවතින ගොඩනැගිලි ප්‍රතිසංවිධානය සඳහා යෝජිත ස්ථානය

මූලාශ්‍රය : Google Earth,2019

දෙවට මංසන්ධියේ සිට සම්බෝධිය මංසන්ධිය දක්වා වෙරළ තීරයේ ඉදිකර ඇති ගොඩනැගිලි දර්ශනීය මුහුදු දර්ශණය අවහිර කොට ඇත. එබැවින් ගාල්ලට ආවේණික අසමසම පුළුල් මුහුදු තීරයේ දෘෂ්ටි පථය ඉහළ නැංවීම සඳහා මුහුදු තීරය ප්‍රතිසංවිධානය විය යුතු ආකාරය මෙම සැලැස්ම මඟින් හඳුනාගෙන ඇත.

6.4.2.2. භූමිය 02 - රත්ගම් වැල්ල

රත්ගම වැල්ල වර්තමානයේ මත්ස්‍ය ගොඩබෑමේ ස්ථානයක් ලෙස හා වෙළඳපොළක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම ස්ථානය නගර මධ්‍යයට, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයට සහ ගාල්ල කොටුවට යාබදව පවතින බැවින් සංචාරක කටයුතු හා සම්බන්ධ කර සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී

රූපය ***6.4.2.5***: රත්ගම වැල්ල යෝජිත මත්ස්‍ය ගොඩබෑම් ස්ථානයේ සංවර්ධනය



මූලාශ්‍රය***: :Open Street Map Images,2019***

6.4.3. කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධන සැලැස්ම

කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධන සැලැස්ම

දිස්ත්‍රික්කයේ ප්‍රධාන කෘෂි ආර්ථික කටයුතු අතර තේ, රබර් සහ කුරුඳු වැනි ආර්ථික බෝග පැවතිය ද මෙහි නිමි භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රදේශයෙන් බැහැරව සිදුවේ. එබැවින් මෙම ක්‍රියාකාරකම් නගරයේ ආර්ථිකයට සෘජු දායකත්වයක් නොදක්වයි. එබැවින් කෘෂිකර්මාන්තය ප්‍රධාන අංශයක් ලෙස ඇතුලත් කිරීමට යෝජනා කරන අතර මෙහි පවතින විභවතාවය මහා ගාල්ල ආර්ථික සංවර්ධනයට දායක කර ගත යුතුය.

උපායමාර්ගික ක්‍රියා (01) - කෘෂි කාර්මික කලාපය තුළ වගාකළ හෙක්ටෙයාර 350 ඉඩම් කෘෂිකාර්මික වර්ධන ප්‍රදේශය ලෙස කෘෂිකාර්මික කලාපය තුල කළමනාකරණය

කෘෂිකාර්මික ක්‍රියා ප්‍රවර්ධන සැලස්ම යටතේ, හෙක්ටෙයාර 350 ක් වගාකළ බිම් ලෙස හඳුනාගෙන ඇති අතර එය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය මෙම සැලැස්ම තුලින් හඳුනා ගෙන ඇත. මෙය ධීවර සංස්ථා භූමියේ ධීවර කර්මාන්තය හා යෝජිත කුළුබඩු නිෂ්පාදන භාණ්ඩ සමඟ සම්බන්ධ කර එම නිෂ්පාදන සඳහා වෙළඳ පොළක් ලබා දීමට සැලසුම් කර ඇත.

රූපය ***6.4.3.1***: යෝජිත කෘෂිකාර්මික කලාපය සහ කුළුබඩු වෙළඳපොල



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය ***6.4.3.2***: යෝජිත කුළුබඩු හා මත්ස්‍ය අලෙවිසැල

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය , *Google Earth & Google Images, 2018*

6.4.4.දැනුම කේන්ද්‍රකරගත් කර්මාන්ත සංවර්ධන සැලැස්ම

හපුගල දැනුම කේන්ද්‍රකරගත් සංවර්ධන සැලැස්ම යටතේ හපුගල ප්‍රදේශයේ පවතින විභවතාවයන් හඳුනා ගෙන, පවතින රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය, විශ්ව විද්‍යාල ගම්මානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට යෝජනා කර ඇත.

රූපය ***6.4.4.1***: හපුගල යෝජිත විශ්ව විද්‍යාල ගම්මානය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

උපායමාර්ගික ක්‍රියා (01) - හපුගල විශ්වවිද්‍යාල ගම්මානය ප්‍රවර්ධනය කිරීම

පවතින රුහුණු විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය විශ්ව විද්‍යාල ගම්මානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට හඳුනාගෙන ඇති අතර ඉහළ සාක්ෂරතා අනුපාත විභවතාවය අනාගත ආයෝජනයක් ලෙස දැනුම භාවිතයෙන් ආර්ථික සංවර්ධන ඉලක්කය සාක්ෂාත් කර ගැනිම සඳහා ඵලදායී ලෙස යොදා ගැනිම අපේක්ෂා කර ඇත.

වගුව ***6.4.1:*** ප්‍රදේශයේ රැකියා මට්ටම් ප්‍රතිශතය

රැකියාව	ගා.ම.න.ස.	ම.ගා.ප
වෘත්තිය සහ ආශ්‍රිත	43.31	32.81
ලිපිකරු සහ ලිපිකාර සහායකයින්	5.51	5.22
සේවා සහ අලෙවිකරුවන්	10.82	8.88
පුහුණු කෘෂිකාර්මික / වනාන්තර සහ ධීවර කටයුතු ආශ්‍රිත සේවකයින්	2.66	2.89
කැටයම් සහ ඒ ආශ්‍රිත වෙළඳ සේවකයින්	14.33	19.02
යාන්ත්‍රික	7.10	8.67
මූලික රැකියා	9.64	14.55
සන්නද්ධ හමුදා සහ සේවකයින්	3.08	4.23
වර්ගීකරණය නොකළ රැකියා	3.53	3.73

මූලාශ්‍රය:සම්පත් පැතිකඩ දත්ත 2016 (ගාල්ල කඩවත් සතර, අක්මීමන, බෝපේ පොද්දල සහ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ)

වගුව ***6.4.2:***ප්‍රදේශයේ අධ්‍යාපනික සමාර්ථ ප්‍රතිශතය

දර්ශකය	ම.ගා. ප්‍රදේශ	ජාතික (%)
උපාධි හෝ ඉහළ සුදුසුකම්	4%	2.5%
ඉංග්‍රීසි කතාකිරීමේ හැකියාව	33%	20%
ඉංග්‍රීසි ලිවීමේ හැක්යාව	42%	26%
පරිගණක සාක්ෂරතාවය	28%	20%
සාක්ෂරතා අනුපාතය	96.2% (ගාල්ල දිස්තික්කය)	95.7%

මූලාශ්‍රය:සම්පත් පැතිකඩ දත්ත 2016 (ගාල්ල කඩවත් සතර, අක්මීමන, බෝපේ පොද්දල සහ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ)

6.4.5. ඌන උපයෝජිත රාජ්‍ය දේපළ සංවර්ධන සැලස්ම

නගරයේ පවතින බොහෝ රජයේ ඉඩම් ඌන උපයෝජිත සහ නගරයේ නොවටිනා ලක්ෂණයක් බවට පත්වෙමින් පවතී. මෙම තත්වය මඟ හැරීම සඳහා සැලස්ම තුළ මෙම ඌන උපයෝජිත ඉඩම් වඩාත් ඵලදායි අවකාශ බවට පත්කිරීමට හඳුනාගෙන ඇත. මෙම අවකාශ වාණිජමය කටයුතු සඳහා භාවිතයෙ-න් ජනතාවට ආදායම් උත්පාදනය කරනු ඇත.

උපාය මාර්ගික ක්‍රියා (1) - පොලිස් බැරක්ක භූමිය සහ මහවීදිය සමුද්‍ර මාවත අතර භූමිය පුනර්ජනනය කිරීම

රූපය ***6.4.5.1***:පොලිස් බැරැක්ක භූමිය පුනර්ජනනය කිරීම

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය , *Google Earth & Google Images, 2018*

රූපය ***6.4.5.2***:පොලිස් බැරැක්ක භූමිය පුනර්ජනනය කිරීම



මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය Open Street Maps ,2016

මහවීදිය හා සමුද්‍ර මාවත අතර පිහිටි ඉඩම

ව්‍යාපෘති සංරචක:

1) ගොඩනැගිලි සංවර්ධනය -වාණිජමය සහ විනෝදාත්මක කටයුතු සහිත ප්‍රමාණවත් ගෘහස්ත පහසුකම්

2) විවෘත අවකාශ - අවිධිමත් පදික වෙළඳුන්, විශේෂ කාල සමයේ ප්‍රවර්ධන සහ මහජන කටයුතු

3) සිල්ලර වෙළඳ සල්- වෙළඳසැල් 240 ට අවකාශ වෙන්කර ඇත

4) බස් නැවතුම් - දේශීය බස් සේවා

5) රථ ගාල් පහසුකම් - ත්‍රිරෝද රථ, කුලී රථ සහ බර වාහන

6) යෝජිත හෝටල් සංවර්ධනය

රූපය ***6.4.5.3:*** මහවීදිය සමුද්‍ර මාවත අතර භූමිය පුනර්ජනනය කිරීම



මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ,2016

උපායමාර්ගික ක්‍රියා (02) ඔරොප්පුවත්ත චතුරශ්‍ර සැලසුම් ව්‍යාපෘතිය

මෙම ප්‍රදේශයේ ඓතිහාසික එළවලු වෙළඳපොළ පිහිටා අතර මෙහි ඓතිහාසික ලක්ෂණ මතු වන ලෙස සංරක්ෂණය කිරීමට මෙන්ම ඓතිහාසික වටිනාකම් සහිත එළවලු වෙළඳපොළ සුදුසු ලෙස නැවත භාවිතය සඳහා අනුගත කිරීමට යෝජිතය. ව්‍යාපෘතිය තුල පහත දෑ සමන්විතවේ.

1) කෘෂි නිෂ්පාදන වෙළඳ කුටි
2) ආහාර අංගනයන්
3) ගෘහස්ථ ද්‍රව්‍ය විකුණුම් මධ්‍යස්ථානයන්

රූපය ***6.4.5.3***: ඔරොප්පුවත්ත චතුරශ්‍ර සැලසුම් ව්‍යාපෘතිය සඳහා යෝජිත ස්ථානය



මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ,2016

පරිච්ඡේදය 06 6.5. පාරිසරික තිරසාර උපායමාර්ග

සැලසුම හරිත සුපිරිසිදු සහ ආරක්ෂිත පරිසරය

පාරිසරික තිරසාර උපායමාර්ග

දැක්ම සකසන අවස්ථාව යටතේ හඳුනාගත් එක් ප්‍රධාන අරමුණක් වනුයේ හරිත පිරිසිදු සහ ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමයි. මෙය ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරන්නේ මහ ගාල්ල ප්‍රදේශයේ සිදුවිය හැකි සහ සිදුවන ස්වභාවික ආපදාවන්ට ඔරොත්තු දිය හැකි පරිදි සහ ස්වභාවික පරිසරය සංරක්ෂණය වන අයුරින් සංවර්ධනය සිදුකිරීමය. මෙය කළමනාකරණ සැලසුම් දෙකක් හඳුනාගෙන ඇති අතර ව්‍යාපෘති කිහිපයක් පහත පරිදි ඇතුලත් වේ.

1) ස්වභාවික පරිසර කළමනාකරණ සැලැස්ම
2) ආපදා කළමනාකරණ සැලැස්ම

6.5.1.ස්වභාවික පරිසර කළමනාකරණ සැලැස්ම

පසුගිය දශක කිහිපය පුරාවට සිදුවූ ස්වභාවික ආපදාවන්හි ගොදුරක් බවට ගාල්ල නගරය පත්ව ඇත. ප්‍රදේශය සඳහා ස්වභාවික සංරක්ෂණ සහ කළමනාකරණ සැලැස්මක් නොමැතිකම මෙම විනාශයන්ට ප්‍රධානතම හේතුව වී ඇත. එබැවින් ඉහත සංයුක්ත සිතියමේ දක්වා ඇති පරිදි හඳුනාගත් සංරක්ෂිත ප්‍රදේශ සහ ආරක්ෂිත ජනාවාස ප්‍රදේශයන් තවදුරටත් මඟ පෙන්වනු ලැබේ.

ගාල්ල නගරය තුල පවතින ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් මෙම නගරය සංචාරක ගමනාන්තයක් බවට පත්වීමට හේතුවී ඇත. එබැවින් පාරිසරික කළමනාකරණය සංවර්ධන සැලසුමක මූලික අංගයක් වන අතර ස්වභාවික සහ මිනිසා විසින් නිර්මාණිත ගැටළු මඟ හරවා ගැනීම සඳහා පාරිසරික කළමනාකරණ උපායමාර්ග සකසා ඇත. එම ක්‍රියාව සංචාරක කර්මාන්ත සංවර්ධනය දිරිගැන්වීමේ බලපෑමක් ඇති කරන අතර හරිත සහ නීල අවකාශය භූ දර්ශනය කිරීම තුළින් තවදුරටත් ප්‍රවර්ධනය කළ හැක. සංචාරක කර්මාන්තය එමෙන්ම, සංචාරක කාර්මාන්තයේදී සිදු විය හැකි පාරිසරික හානිය උපාය මාර්ගික කළමනාකරණයේදී සළකා බැලිය යුතුය.

එබැවින් පවතින හරිත සහ නීල අවකාශ සංරක්ෂණය, සහ සංරක්ෂණ කලාප ඇති කිරීම උපායමාර්ගික ප්‍රවේශයන් ලෙස හඳුනා ගෙන ඇත.

සිතියම 6.5-1: හරිත පිරිසිදු ආරක්ෂිත - ස්වභාවික පරිසර කළමනාකරණ සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

පරිච්ඡේදය 06 උපායමාර්ගික ක්‍රියා (01) - පාරසරික සංරක්ෂණ තීරය - පවතින හරිත අවකාශ සංරක්ෂණය කිරීම

සැලසුම

පාරිසරික තිරසාර උපායමාර්ග

ජලධාරක විශ්ලේෂණ අනුව සංරක්ෂණ තීරුවක් ලෙස නගර ව්‍යුහය තුල හෙක්ටෙයාර 3850.21 ඉඩම් ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. මෙය ප්‍රාථමික හරිත කොඳු නාරටිය ලෙස ක්‍රියා කරයි. එය ජල මූලාශ්‍ර සහ හරිත අවකාශ හා එකාබද්ධව පවතී.

ස්වභාවික පරිසර කළමනාකරණ සැලැස්ම

රූපය ***6.5.1.1:*** පාරසරික සංරක්ෂණ තිරුව

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

ව්‍යාපෘති සංරචක

- කුඹුරු හෙක්ටෙයාර 1136.13 ක් සංරක්ෂණය
- පුරං වූ කුඹුරු හෙක්ටෙයාර 0.01 ක් ප්‍රතිවගා කිරීම
- වගුරු බිම් හෙක්ටෙයාර 135, ලඳු බිම් හෙක්ටෙයාර 200 සංරක්ෂණය (මහමෝදර කලපුව, ගිංගඟ ආශ්‍රිතව සහ රූමස්සල ප්‍රදේශයන්හි පිහිටි)
- ද්විතීක හරිත අවකාශ සංරක්ෂණය- හෙක්ටෙයාර 3631 (පුරං වූ කුඹුරු, උද්‍යාන, වෙරළ ප්‍රදේශ, සංවේදී ස්ථාන. උදා: රූමස්සල)

ප්‍රාථමික හරිත අවකාශ සංරක්ෂණය - කුඹුරු ඉඩම්

නාගරික කෘෂිකාර්මික වැඩසටහන යටතේ මහා ගාල්ල ප්‍රදේශය තුල හඳුනාගත් කුඹුරු හෙක්ටෙයාර 1136.13 ක් සහ පුරන් වූ කුඹුරු හෙක්ටෙයාර 0.01 ක් සංරක්ෂණය

තෙත් කලාපයේ පිහිටි බොහෝ කුඹුරු මිනිස් ක්‍රියාකාරකම් සහ ස්වභාවික හේතුන් මත පුරන් කුඹුරු බවට පත්වී ඇත. පසුගිය දශකය තුළ ජනයාගේ නීතිවිරෝධී ක්‍රියාකාරකම් මෙන්ම රජයේ මැදිහත් බව අඩුවීම නිසාද මෙම ඉඩම් අවභාවිතා කිරීමට පටන් ගෙන ඇත. ජල රඳවන ප්‍රදේශ ලෙස කුඹුරු ඉඩම් පරිසරයට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. එබැවින් මෙම සංරක්ෂණ ක්‍රියාව හරිත සුපිරිසිදු සහ ආරක්ෂිත පරිසරයක් නිර්මාණයේ ප්‍රධාන තැනක් ගනී.

රූපය ***6.5.1.2:*** මහා ගාල්ල ප්‍රදේශය තුල කුඹුරු ඉඩම් ව්‍යාපෘතිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

මහමෝදර වැව, ගිංගඟ අවට ප්‍රදේශය සහ රූමස්සල ප්‍රදේශයන්හි පිහිටි වගුරු බිම් හෙක්ටෙයාර 135, ලඳු බිම් හෙක්ටෙයාර 200 සංරක්ෂණය කිරීම

නිසි ව්‍යුහයක් නොමැති ජනාවාස ව්‍යාප්තවීම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් වලින් පාරසරික සංවේදී ප්‍රදේශ සංරක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් සංරක්ෂණය කලයුතු ඉඩම් හඳුනාගැනීම අනාගත සැලසුම් ක්‍රියාවලියට ප්‍රයෝජන වනු ඇත. ඉහත සඳහන් සංවේදී ප්‍රදේශ නගර මධ්‍යට ආසන්නව පිහිටා ඇති අතර මෙය නාගරීකරණ ව්‍යාප්තියෙන් සහ අවිධිමත් සංචාරක කටයුතු වලින් රැක ගත යුතුවේ.

ද්විතීක හරිත අවකාශ සංරක්ෂණය

හෙක්ටෙයාර 3631 පුරං වූ කුඹුරු, උද්‍යාන, වෙරළ ප්‍රදේශ හා අනෙකුත් සංවේදී ස්ථාන ද්විතීක හරිත ප්‍රදේශ. උදා: රූමස්සල පාරිසරික ලෙස වැදගත් හරිත අවකාශ හඳුනාගැනීම සහ ඒවා සංරක්ෂණය, ප්‍රදේශයේ හරිත පරිසරය ඇති කිරීමට ඉවහල් වේ.

උපායමාර්ගික ක්‍රියා (02) - පවතින නීල අවකාශ සංරක්ෂණය

ස්ථාන : මහමෝදර වැව, ගිංගඟ, බීක්කේ ජලාශය, කැපු ඇළ, මොරගොඩ ඇළ සහ මෝඩ ඇළ

ව්‍යාපෘති සංරචක :

ස්වභාවික ජල මූලාශ්‍ර හෙක්ටෙයාර 136.16 සහ නිර්මාණිත ජල මූලාශ්‍ර හෙක්ටෙයාර 84.47 ක් සංරක්ෂණය

උපායමාර්ගික ක්‍රියා (03) - හරිත ප්‍රවර්ධන කලාප හඳුන්වාදීම (රක්ෂිතය)

ප්‍රදේශයේ ජලාශ සංරක්ෂණය සඳහා මහා ගාල්ල ප්‍රදේශය අවට පවතින හරිත ආවරණ සහ ජල මාර්ග සඳහා රක්ෂිතයක් (Buffer) හඳුනා ගෙන ඇත. පහත වගුවේ පරිදි ජල මාර්ග සහ ඇළ මාර්ග සඳහා රක්ෂිතයක් පැවතිය යුතු වේ.

වගුව 6.5-1: ප්‍රදේශයේ ජල මාර්ග සඳහා රක්ෂිත ප්‍රදේශ

ඇළ හි මතුපිට පළල (M)	ඇළ රක්ෂිත ප්‍රමාණය (ඇළ ඉවුරේ සිට)	
	විවෘත ඇළ (M)	මතුපිට ආවරණය වූ ඇළ සඳහා (M)
1.0 -1.2	1.0	0.3
1.3 -3.0	2.0	1.0
3.1 – 4.5	2.75	1.0
4.6 -6.0	3.5	1.5
6.1 -9.0	4.5	1.5
9.0 වැඩි	6.5	2.0

මූලාශ්‍රය : ගැසට් අංක 1662/17- 2010ජූලි 14

ගා.ම.න.ස. ප්‍රදේශයට ජල සැපයීම් මූලාශ්‍රය වනුයේ ගිංගඟ බැවින් ජල දූෂණය සහ ගංවතුර බලපෑම් වළක්වා ගැනීමට ජල ධාරාව සඳහා රක්ෂිත වෙන්කිරීම වැදගත් වේ. ගඟ ඉවුරු දිගේ ජනාවාස ඉදිකිරීම වැළක්වීම මගින් ජලාශ ආරක්ෂාව සහ සංවේදී ප්‍රදේශ ආරක්ෂාව වෙනු ඇත. මෙය ගංවතුර වැළක්වීමේ පියවරක් ලෙස දැක්විය හැක.

උපායමාර්ගික ක්‍රියා (04) - රූමස්සල සඳහා මාර්ගෝපදේශන සැලැස්මක් සැකසීම

රූමස්සල ඉතා වටිනා පරිසර පද්ධතියක් ලෙස හඳුනාගෙන ඇති අතර මෙය සංරක්ෂණය කළ යුතු සහ විනෝදාස්වාද ප්‍රදේශයක් ලෙස ප්‍රවර්ධනය කිරීම එක් ප්‍රධාන උපක්‍රමයකි. හබරාදුව වෙරළ තීරයේ පිහිටි රූමස්සල හෙක්ටෙයාර 225ක භූමි ප්‍රමාණයක විහිදී පවතී. මෙය ගාල්ල, හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යද්දෙහිමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාශය, බොනවිස්ටා ග්‍රාම නිලධාරි කොට්ඨාශය සහ උණවටුන ග්‍රාම නිලධාරි කොට්ඨාශයන්ගෙන් සමන්විත වේ. රූමස්සල වනාන්තර පෙදෙස් තුල ජෛව විවිධත්වයන් විශාල ප්‍රමාණයක් පවතින අතර ඉතා අලංකාර වූ කඳු පන්තියක් පවතී. මෙහි සාගර කලාපය කොරල්පර වලින් සශ්‍රීක පෙදෙසක් වන අතර මුහුදු ජෛව විවිධත්වයක් ද පවතී. සංචාරකයන්හට දිය නෑමට, කිමිදීමට සහ සාගරය තුල පවතින ජෛව විවිධත්වය ගවේෂණය කළ හැක.

රූමස්සල සංරක්ෂණ සැලැස්මේ පරමාර්ථ

1) ඓතිහාසික වටිනාකම් සහ ජෛව විවිධත්වය ආරක්ෂාවන ලෙස රූමස්සල පරිසරය සංරක්ෂණය කිරීම.

රූපය ***6.5.1.3:***මහා ගාල්ල ප්‍රදේශයේ ජලාශ ව්‍යාප්තය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

උපායමාර්ගික ක්‍රියා (05) - ප්‍රදේශයේ වන රක්ෂිත සංරක්ෂණය කිරීම

1) කුරුන්දකන්ද වන රක්ෂිතය (වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව)
2) පලගලා කන්ද වන රක්ෂිතය (වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව)

උපායමාර්ගික ක්‍රියා (06) - හදුනාගත් පාරිසරික සංරක්ෂණය කලයුතු භූමි සංරක්ෂණය කිරීම

1) බික්කේ ජලාශය - මහා ගාල්ල ප්‍රදේශයට අවශ්‍ය අනාගත ජල අවශ්‍යතා සඳහා ජල සැපයීමේ විභවයක් ලෙස හෝ ජල පෝෂකයක් ලෙස ක්‍රියාකිරීමේ විභවයක් මෙම ස්වභාවික ජලාශයට පවතී.
2) බෝපේ- පොද්දල ප්‍රාදේශීය සභාවට අයත් බටුවන්තුඩාව පිහිටි ජල උල්පත් සහ පීල්ල - සංරක්ෂණ ස්ථාන ලෙස හඳුනා ගෙන ඇත.
3) බෝපේ- පොද්දල ප්‍රා.ස පිහිටි හොලුවාගොඩ තෙත්බිම් - ජල රඳවන ප්‍රදේශයක් ලෙස හා සංචාරක කටයුතු සඳහා ප්‍රවර්ධනය කිරීමට යෝජිතය.

පාරසරික සංරක්ෂණ කලාපය තුල පාරිසරික සංචාරක විභවතාවයක් පවතින ස්ථාන ප්‍රවර්ධනය

සංරක්ෂිත පාරසරික ලක්ෂණ සමඟ, ගාල්ල ප්‍රදේශයේ හරිත ප්‍රදේශ පාරිසරික සංචාරක කටයුතු සඳහා සංවර්ධනය කළ යුතුය. මේ අනුව දෙවට INSEE සිමෙන්ති කර්මාන්ත ශාලාව අවට (පින්නදුව) පවතින තෙත්බිම් පාරිසරික සංචාරක කටයුතු සඳහා හදුනාගෙන ඇත.

රූපය 6.5.1.4 : පිහිටීම සිතියම පාරසරික උද්‍යානය, පින්නදුව

මූලාශ්‍රය : භූ දර්ශන අංශය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,2017

රූපය 6.5.1.5 : පාරසරික උද්‍යානය, පින්නදුව

මූලාශ්‍රය : භූ දර්ශන අංශය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,2017

රූපය 6.5.1.6 : යෝජිත භූමි පරිහරණ සැලසුම පාරසරික උද්‍යානය, පින්නදුව



මූලාශ්‍රය : භූ දර්ශන අංශය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,2017

ආපදා කළමනාකරණ සැලැස්ම

6.5.2.ආපදා කළමනාකරණ සැලැස්ම

2004 සිදුවූ සුනාමි ව්‍යසනයෙන් පසු ආපදා කළමනාකරණ සැලැස්මක අවශ්‍යතාවය දැඩිව අවධාරණයට ලක්විය. පසුගිය වසරවල සිදුවූ ජල ගැලීම සහ නායයෑම් ද ආපදා කළමනාකරණ සැලැස්මක වැදගත්කම අවධාරණය කරයි. ගාල්ල වෙරළ තීරයේ පිහිටි නගරයක් බැවින් සුනාමි අවම කිරීමේ ක්‍රියා සඳහා පෙර සූදානම් වීම ඉතා වැදගත් වේ.

සුනාමියට අමතරව ක්ෂණික ගංවතුර තත්ත්වයන්ගෙන් ගාල්ල මධ්‍ය සහ යාබද පෙදෙස් නිතර හානියට පත්වේ. ගංවතුර පාලන බැම් නඩත්තු අවම වීම සහ අනවසර පහත් බිම් ගොඩකිරීම මෙම තත්වයට ප්‍රධාන හේතු වී ඇත. එයට අමතරව කාණු පද්ධති මඩ සහ රොන් මඩ තැන්පත් වී තිබීමද ක්ෂණික ගංවතුර ඇතිවීමට මූලික හේතුවක් වී ඇත.

එබැවින්, සැලැස්ම මගින් ප්‍රධාන වශයෙන් ක්ෂණික ගංවතුර සහ සුනාමි ආපදා කළමනාකරණය සඳහා නියාමනයක් ලබාදෙන අතර ක්‍රියාකාරි ප්‍රජාවගේ සහභාගිත්වයෙන් සහ නිරන්තර අනතුරු ඇගවීම, ප්‍රදේශ-යෙන් ඉවත් කිරීම් වැනි අනෙකුත් සංරචක මගින් ආපදා කළමනාකරණය යෝජනා කර ඇත.

6.5.2.1.සුනාමි

උපායමාර්ගික ක්‍රියා (1) - සුනාමි ආපදාවන්ට අනුගත විය හැකි යටිතල පහසුකම් නිර්මාණය සඳහා මාර්ගෝපදේශ

a) පවතින ව්‍යුහ ශක්තිමත් කිරීම

b) නව ඉදිකිරීම්

සුනාමියට ලක්විය හැකි ප්‍රදේශවලට යෝජිත ඉදිකිරීම් ස්ථානය, පිරි සැලසුම,දිශානතිය,ව්‍යුහාත්මක වින්‍යාසය, භූවිද්‍යාත්මක දත්ත සහ කරුණු සමඟ සැලසුම් නිර්මාණ මාර්ගෝපදේශ විශ්ලේෂණය කළ යුතුවේ. සුනාමි ආපදාවක බලපෑම අවම කිරීමට පවතින ව්‍යුහයන්ගේ ශක්තිය ඉහළ නැංවීම ද කළ යුතුවේ.

උපාය මාර්ගික ක්‍රියා (2) - ප්‍රජාවගේ සහභාගිත්වය සහිතව සුනාමි ආපදා තත්ත්වයෙන් මිදීමට සැලසුම් සකස් කිරීම

1) සුනාමි තත්ත්වයෙන් බැහර වීම සඳහා සුදුසු මාර්ග හා ස්ථාන සිතියම් ගත කිරීම (ඉතා හොඳින් සංකේතවත් විය යුතුය)
2) මෙම ප්‍රදේශයන්හි ආරක්ෂිත ස්ථාන ලෙස හඳුනාගත් (සංඝමිත්ත විද්‍යාලය, මහින්ද විද්‍යාලය, ඕල් ශාන්තවරුන්ගේ විද්‍යාලය, විද්‍යාලෝක විද්‍යාලය, ශ්‍රී හෘදය කන්‍යාරාම විද්‍යාලය, ඕල්කොට් මහා විද්‍යාලය, 'තස්සිම් විද්‍යාලය, පරමානන්ද විද්‍යාලය සහ සියඹලාවත්ත ශ්‍රී විජිතාරාමය) සහ එම ප්‍රදේශ සඳහා මාර්ග ඉතා පැහැදිලිව ප්‍රදර්ශනය විය යුතුය.
3) ප්‍රජාවගේ සහභාගිත්වයෙන් සුනාමි තත්වයෙන් බැහැර වීම සඳහා සැලසුම් සකස් කිරීම
4) සැලසුම් සැකසීමේදී මහජන උපදේශ ඉතා වැදගත්වේ. මෙම උපායමාර්ගය යටතේ මහජන සහභාගිත්-වයෙන් සුනාමි තත්ත්වයෙන් බැහැරවීම් සැලැස්ම සැකසීම යෝජනා කර ඇත.

රූපය 6.5.2.1: ආපදාවලින් බැහැරවීම සඳහා හඳුනාගත් සුදුසු මාර්ග, ආරක්ෂිත ස්ථාන

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

පරිච්ඡේදය 06

6.5.2.2 නාගරික ගංවතුර ගැටළුව

සැලසුම

උපායමාර්ගික ක්‍රියා (1) - වැසි ජලය කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම

පාරිසරික තිරසාර උපායමාර්ග

ස්ථානය : මොරගොඩ ඇළ සහ මෝඩ් ඇළ ජල රඳවන ප්‍රදේශ

ආපදා කළමනාකරණ සැලැස්ම

ව්‍යාපෘති සංරචක :

1) ව්‍යුහ ,ඉවුරු සහ ගංවතුර බැමි නඩත්තුව සහ පරීක්ෂාව
2) ජලාපවහන පද්ධති/ ඇළ මාර්ග වැඩි දියුණු කිරීම
   මොරගොඩ ඇළ ජලාපවාහන වැඩි දියුණු කිරීම
3) ජලාපවහන පද්ධතිය පිරිසිදු කිරීම
   සියලු නිර්මාණ සහ ස්වභාවික ජලාශ
4) රැඳවුම් ප්‍රදේශ (ජල රඳවන) සංරක්ෂණය කිරීම
   මොරගොඩ ඇළ සහ මෝඩ ඇළ ජල රඳවන ප්‍රදේශ

රූපය ***6.5.2.2:*** වැසි ජල කළමනාකරණ පද්ධතියහි යෝජිත වැඩි දියුණු කිරීම

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

වගුව ***6.5.2.1:*** මහා ගාල්ල සීමාවේ ජලය රඳවා ගැනීමේ ප්‍රදේශ

රඳවා ගැනීම ප්‍රදේශ අංක	රඳවා ගැනීම් ජල මූලාශ්‍රයේ නම	ප්‍රදේශයේ නම	ප්‍රමාණය (හෙක්ටෙයාර)
1	මෝඩ් ඇළ	බෙලිගහ	1.0372
2		ඩොනල්ඩ් ජෑන්ස්	4.2458
3		හිරිඹුර	1.0413
4		බොම්බේ කාසල් 1	2.883
5		බොම්බේ කාසල් 2	7.5712
6		දංගෙදර 1	2.6975
7		දංගෙදර 2	4.8189
8		හීන් ඇළ	5.8426
A	කැපු ඇළ	ජූල් ගහ	0.1687
B		කැපු ඇළ ජූල් ගහ	0.6412
ජල රැඳවුම් ස්ථාන			30.9474
එකතුව			76.44 Acre

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

6.5.3. පොදු විවෘත අවකාශ -

6.5.3.1.ප්‍රීතිමත් පුරවැසියන් බවට පත් කිරීම

පොදු අවකාශය සහ සමාජීය වැදගත් අංගයක් ලෙස නගර සැලසුම්කරණ ක්‍රියාවලියේදී භාවිතා වේ. මෙය නාගරික අවකාශ තුල වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. පසුගිය දශක තුල, නගර මධ්‍ය තුල පියමං සහ පොදු අවකාශ වඩාත් ජනප්‍රිය වූ අතර ආර්ථිකමය සහ සමාජීය අවකාශ නිර්මාණ කිරීම නාගරික ලක්ෂණයක් විය.

ගාල්ල නගරය සතුව ජලතීර්යක් පවතින අතර සංචාරක කර්මාන්තය සමඟ බැඳී ඇති සුවිශේෂී ලක්ෂණ, පොදු අවකාශ සහ මංතීරු දියුණුකිරීම වැදගත් වේ. එබැවින්, මෙම කරුණු ආවරණය කිරීම සඳහා මහ ගාල්ල සංවර්ධන සැලස්මට ප්‍රධාන සැලසුම් 02 ක් හඳුනා ගත් අතර එමඟින් "ප්‍රීතිමත් පුරවැසියන්" ඇතිකිරීමේ පරමාර්ථය ළඟා කිරීමේ හැකියාවක් ඇතිවේ.

1) මංතීරු ප්‍රවර්ධන සැලැස්ම
2) මහජන එළිමහන් ප්‍රදේශ විනෝදාත්මක අවකාශ කළමනාකරණ සැලැස්ම

මංතීරු ප්‍රවර්ධන සැලස්ම තුල උපායමාර්ගික ක්‍රියා ව්‍යාපෘති ඇතුලත් වන අතර මෙය නගරය තුල පවතින ඉඩම් උපරිම ප්‍රයෝජනයට අවස්ථාව සලසා දෙමින් විවිධ ක්‍රියාකාරකම් වලින් යුත් ආකර්ශනීය නගරයක් නිර්මාණය කෙරේ. තවද වර්ථමානයේ පවතින කාබන් විමෝචනය සම්බන්ධ ගැටලුවෙන් මිදීම සඳහා වාහන ප්‍රවාහය සහ පදිකයන් සඳහා වෙන් වූ පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියෙන් සිදුවේ. ප්‍රදේශයේ පවත්නා අවිධිමත් සැකැස්ම සංවිධානාත්මක, පරිසරයක් බවට පත් කිරීම ඉලක්ක වී ඇත

සිතියම 6.5.2: ප්‍රීතිමත් පුරවැසියන් බවට පත් කිරීම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

උපායමාර්ගික ක්‍රියා (01): සමුද්‍ර පියවර නිර්මාණය කිරීම. ලයිට් හවුස් හෝටල් පරිශ්‍රය අසළ සිට දෙවට මංසන්ධිය දක්වා (ආසන්න ලෙස මීටර් 6. 0 පළල)

ස්ථානය : ලයිට් හවුස් හෝටල් පරිශ්‍රය අසළ සිට දෙවට මංසන්ධිය දක්වා
පළල : මීටර් 6. 0
සමුද්‍ර පියවර ලෙස ගාල්ල වෙරළ තීරයේ ලයිට් හවුස් හෝටල් පරිශ්‍රය අසළ සිට දෙවට මංසන්ධිය දක්වා සංවර්ධනය සඳහා හඳුනාගෙන ඇත. එයට පහත සංරචක ඇතුළත්වේ.

ව්‍යාපෘති සංරචක :

1) පදික සහ බයිසිකල් පථය
2) වෙරළ මත සැකසූ වේදිකාව
3) දියකඩනය අවසානයේ ආවරණ සහිත ගමනාන්ත විශේෂාංග (අවන්හල්)
4) සංකේතාත්මක ජල ප්‍රතිමාව
5) දියකඩනය නැවත ඇති කිරීම
6) රාත්‍රී උත්සව සහ ප්‍රසංග සඳහා විදුලි සහ ආලෝක කුටීර සහිත උද්‍යාන පහසුකම්
7) වෘක්ෂ රේඛා

වර්ග ප්‍රමාණය : ඇස්තමේන්තු ගත වර්ග ප්‍රමාණයන්

ව්‍යාපෘති සංරචක :

1) ආසන්න ලෙස වර්.අඩි. 5.130 හිස් අවකාශ .
2) ආසන්න ලෙස වර්.අඩි. 18,100 චතුරශ්‍ර පෘෂ්ඨය.
3) ආසන්න ලෙස වර්.අඩි. 18,940 පැති මං තීරු
4) ආසන්න ලෙස වර්.අඩි. 39,620 වෙරළ සංරක්ෂණ දෙපාර්තුමේන්තු ඉඩම් අත්පත් කරගැනීම.
5) ආසන්න ලෙස වර්.අඩි. 3,400 මංතීරු/පැති මං තීරු නාවික කඳවුර සිට ගාලු වරාය දක්වා දිර්ඝ කිරීම

වෙරළ සංරක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් වර්ග අඩි 39,620 ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගත යුතු අතර වර්.අඩි. 3,400 ඉඩම් ප්‍රමාණය නාවික කඳවුර වරාය පැති මංතීරුව දික් කිරීමට අත්පත් කර ගත යුතු වේ

රූපය 6.5.3.1 : යෝජිත සංවර්ධන විස්තර



මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය,2016

රූපය 6.5.3.2 : යෝජිත සංවර්ධන විස්තර



මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය,2016

උපායමාර්ගික ක්‍රියා (02) - පවතින සමුද්‍ර මාවත සහ මහවීදිය සම්බන්ධවන ප්‍රවේශ මාර්ග නිල තුඩු (Acupuncture Points) ලෙස වැඩි දියුණු කිරීම සහ නිර්මාණය කිරීම

සමුද්‍ර පියවර සිට සමුද්‍ර මාවත හරහා නගරය දක්වා භූ දර්ශන නිර්මාණය කරමින් සම්බන්ධතා ඇති කිරීම (ස්ථාන කිපයක්)

1) පවතින උසස් ගණයේ පරිණත ගස් රදවාගනීම, ආසන පහසුකම් සැපයීම්, මාර්ග සෙවුම්, තොරතුරු සඳහන් පුවරු සහ ආලෝකකරණය
2) මුහුදු බඩ මාර්ග සම්බන්ධක පුළුල් කිරීම සඳහා සමුද්‍ර පියවර සහ දැව සමුද්‍ර වේදිකාව නිර්මාණය
3) සමුද්‍ර පියවර ජල ඉවුර දක්වා හැරවීම
4) රෝපණ මායිම සමඟ පවතින බැම්මට පදික ප්‍රවේශයන් ලබා දීම සහ ගස් සිටුවීමෙන් පදිකයන් මාරුවීම පාලනය කරන අතර නියමිත පදික මාරු භාවිතය සිදුවේ.
5) සමුද්‍ර මාවතහි පදික මාරු හරහා සම්බන්ධක ඇතිකිරීම
6) නගරයේ පැති හරස් මාර්ග සහ සමුද්‍ර වේදිකාව වෛවර්ණ කුඩාරම් සැපයීම සෙවණ සහිත සහ ආරක්ෂිත පදික හිතකාමී වීථි නිර්මාණය වීම මෙම ව්‍යාපෘතියේ අතුරු ප්‍රතිඵල වේ

රූපය 6.5.3.3 : යෝජිත සංවර්ධන විස්තර



මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය,2016

පරිච්ඡේදය 06

සැලසුම

පාරිසරික තිරසාර උපායමාර්ග

මංතීරු ප්‍රවර්ධන සැලැස්ම

උපායමාර්ගික ක්‍රියා (03) කොරටුව තුල පිහිටි පටු මාර්ග කුඩා විවෘත ඉඩ කඩ සුදුසු පරිදි සැලසුම් කිරීම ප්‍රවර්ධනය කිරීම හා මුහුණත පෙනුම ආකර්ශනීය ලෙස වැඩි දියුණු කිරීම

පසුගිය දශක කිහිපය පුරා අවම ආකර්ෂණයක් පැවති චීන කොරටුව නගරයේ හෘදය බඳු වූ නගර මධ්‍යයේ පිහිටා ඇත. අවිධිමත් ගොඩනැගිලි ව්‍යුහයන් සහ අඩු ආකර්ෂණ පෙනුම හේතුවෙන් නගරයේ ජීවත්වීමට සුදුසු පරිසරයෙන් ඈත්වී පවතී. ඓතිහාසික වටිනාකම සහ ස්ථානීය පිහිටීමේ වැදගත්කම ගාල්ල ප්‍රදේශයට වටිනාකමක් ඇති කරයි. චීන කොරටුව තුල පවතින පටු මාර්ග / ඇවිදීමට සුදුසු මාර්ග ලෙස වැඩි දියුණු කිරීම තුළින් එහි පැවති ලක්ෂණ නගර මධ්‍යය විවෘත කළ හැක. කුඩා උද්‍යාන මඟින් ප්‍රදේශය තුල වඩාත් පරිපූර්ණ අවකාශයක් නිර්මාණ කළ හැකිවේ.

රූපය 6.5.3.4 : යෝජිත සංවර්ධන විස්තර

පවතින

යෝජිත

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය , *Google Earth & Google Images, 2019*

6.5.3.1.1.මුහුණත පෙනුම සංවර්ධනය කිරීම

රූපය 6.5.3.5 : නගරයේ යෝජිත ගොඩනැගිලි මුහුණත සංවර්ධනය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

ගොඩනැගිලි මුහුණත් සංවර්ධනය තුළින් චීන කොරටුව ප්‍රදේශයේ පෙනුමට ආකර්ෂණයක් නැවත ලබා ගත හැකිවේ. එමගින් ප්‍රදේශය තුල සංචාරක ප්‍රවර්ධනය සඳහා බලපෑමක් ඇතිවේ. පදික හිතකාමී වීථි නිර්මාණය මෙම ව්‍යාපෘතිය තුළින් මතුවන තවත් එක් ප්‍රථිපලයකි

සටහන .6.5.3.6 : යෝජිත ගොඩනැගිලි මුහුණත් සංවර්ධන විස්තර



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

පරිච්ඡේදය 06 සැලසුම

පාරිසරික තිරසාර උපායමාර්ග

මංතීරු ප්‍රවර්ධන සැලැස්ම

උපායමාර්ගික ක්‍රියා (04) - ප්‍රධාන මාර්ග දිගේ, යෝජිත තුන්වන තරංග මාර්ගයේ (යෝජිත සංවර්ධන කොරිඩෝව) සහ නගර සීමාවේ හඳුනාගත් මාර්ග දිගේ පැති මං තීරු දිගේ වෘක්ෂ තීරු නිර්මාණය

වගුව 6.5.3.1: ශාක සිටුවීම සඳහා යෝජිත මාර්ග ලැයිස්තුව

විස්තරය	වර්ගය
ගිංතොට - ලබුදූව මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / ඉහළ ඝනත්වය / මාර්ග මධ්‍ය සහ දෙපස
කළුවැල්ල-කන්දෙවත්ත-කෝන්ගහ මාර්ගය-සර්කියුලර් මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / මධ්‍යස්ථ ඝනත්වය / දෙපස
මිනුවන්ගොඩ - කලේගාන මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / මධ්‍යස්ථ ඝනත්වය / දෙපස
බද්දේගම මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / මධ්‍යස්ථ ඝනත්වය / දෙපස
අම්බලන්වත්ත මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / මධ්‍යස්ථ ඝනත්වය / දෙපස
ශ්‍රී හෙමානන්ද මාවත	අහඹු ලෙස ගස් සිටුවීම / මධ්‍යස්ථ ඝනත්වය / දෙපස
නව යෝජිත මාර්ගය (බෙලිගහ - අධිවේගී මාර්ග පිවිසුම)	අහඹු ලෙස ගස් සිටුවීම / අඩු ඝනත්වය / දෙපස
නව යෝජිත මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / මධ්‍යස්ථ ඝනත්වය / දෙපස
අම්බලන්වත්ත මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / මධ්‍යස්ථ ඝනත්වය / දෙපස
ලබුදූව - පින්නදූව මාර්ගය (නව යෝජිත)	අහඹු ලෙස ගස් සිටුවීම / ඉහළ ඝනත්වය / මාර්ග මධ්‍ය සහ දෙපස
ගිංතොට - ලබුදූව මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / ඉහළ ඝනත්වය / මාර්ග මධ්‍ය සහ දෙපස
ගිංතොට - කලේගාන මාර්ගය	අහඹු ලෙස ගස් සිටුවීම / ඉහළ ඝනත්වය / මාර්ග මධ්‍ය සහ දෙපස
ගාලු මාර්ගය (මහමෝදර රෝහල-උඩුගම මාර්ග මංසන්ධිය)	අහඹු ලෙස ගස් සිටුවීම / ඉහළ ඝනත්වය /දෙපස

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය ***6.5.3.7:*** ශාක සිටුවීම සඳහා යෝජිත මාර්ග

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

යෝජිත සංවර්ධන කොරිඩෝව ගිංතොට සිට වලහන්දූව දක්වා මාර්ගයේ කලේගාන, කහදුවත්ත, කරාපිටිය සහ ලබුදූව උප නගර හරහා ගිංතොට සිට වලහන්දූව දක්වා පදික හිතකාමී වන ලෙස වෘක්ෂ රේඛා ඇති කිරීමටද යෝජිතය.

2) මහජන එළිමහන් විනෝදාත්මක අවකාශ කළමනාකරණ සැලැස්ම

මහජනයා හට පහසුකම් සැපයීම පරමාර්ථ කරගත් මෙම සැලැස්ම වැඩි දියණු කරන ලද ප්‍රවේශ මාර්ග සැපයීම සහ ඌන භාවිත ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතයට ගැනීමට සැලසුම් කරන අතර ස්වභාවික සහ ඓතිහාසික උරුමයන් හා ගැළපෙන පරිදි නව ඉදිකිරීම් ගැලපීම අපේක්ෂා කරයි.

ඒ අනුව, මහා ගාල්ල ප්‍රදේශයේ විවෘත අවකාශ , ඉතා කුඩා උද්‍යාන (හෙක්ටෙයාර 0.2 ට අඩු) කුඩා උද්‍යාන (0.5 - 2.5 අක්කර) දේශීය උද්‍යාන (1.0-7.5 අක්කර) මහජන උද්‍යාන (3.0 සිට 6.0 දක්වා හෙක්ටෙයාර - අක්කර 15) සහ රේඛීය විවෘත අවකාශ ලෙස වෙන්කෙරේ. මෙය PORS (මහජන එළිමහන් විනෝදාත්මක අවකාශ සැලස්ම) ප්‍රමිති අනුව මහගාල්ල ප්‍රදේශයේ වසර 2030 සඳහා අනාගතයේදී ජනතාවගේ අවශ්‍ය විවෘත අවකාශ ප්‍රමාණයට ළඟා වීමක් වේ. (පුද්ගලයින් 1000 කට විවෘත අවකාශ 1.4 හෙක්ටෙයාර)

- වසර 2031 සඳහා ප්‍රක්ෂිප්ත ජනගහනය- 251,283
- ප්‍රක්ෂිප්ත විවෘත අවකාශ අවශ්‍යතාවය -351.4 හෙක්ටයාර්
- පවතින විවෘත අවකාශ -3.7108 හෙක්ටයාර් (මහා නගර සභා සීමාව)
- පවතින විවෘත අවකාශ - 280 හෙක්ටයාර් (මහා නගර සභා සීමාවෙන් පිටත)
- 2031 වසර සඳහා අවශ්‍යතාවය - 67.69 හෙක්ටයාර්

රූපය ***6.5.3.8:*** මහජන එළිමහන් විනෝදාත්මක අවකාශ කළමනාකරණ සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

උපායමාර්ගික ක්‍රියා (01) - ගාල්ල නගර මධ්‍යයේ විභවතාවයන් පවතින ස්ථානයන්හි මහජන චතුරශ්‍ර නිර්මාණය කිරීම

නගරයේ මහජන අවකාශ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා මහජන චතුරශ්‍ර ලෙස සංවර්ධනය කිරීමට නගරයේ පහත සඳහන් ස්ථාන හඳුනා ගෙන ඇත.

1. නගර ශාලා චතුරශ්‍ර නිර්මාණ ව්‍යාපෘතිය
2. දුම්රිය ස්ථාන පෙරසවි ශාලා නිර්මාණ ව්‍යාපෘතිය
3. "මහජන පොළ" පොදු චතුරශ්‍ර ව්‍යාපෘතිය
4. බන්ධනාගාර චතුරශ්‍ර නිර්මාණ ව්‍යාපෘතිය

රූපය 6.5.3.9 : විභවතා පවතින ස්ථානයන්හි යෝජිත මහජන චතුරශ්‍ර

මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය,2016

1) නගර ශාලා චතුරශ්‍ර නිර්මාණ ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය වර්ග මීටර 8920 ප්‍රමාණයක් වැඩි දියුණුකිරීම සඳහා යෝජනා කර ඇත. යෝජිත සංවර්ධන තුල පහත කරුණු ඇතුලත් වේ.

වර්ග මීටර 5350 - චතුරශ්‍ර
වර්ග මීටර 2000 -පැති මං තීරු
වර්ග මීටර 1490 - මාර්ග
වර්ග මීටර 80 -පොදු පහසුකම්

රූපය 6.5.3.10: නගර ශාලා චතුරශ්‍ර නිර්මාණ ව්‍යාපෘතිය සඳහා යෝජිත ස්ථානය

මූලාශ්‍රය : *Google Earth & Google Images, 2019*

2) දුම්රිය ස්ථාන පෙරසවි ශාලා නිර්මාණ ව්‍යාපෘතිය

යෝජිත සංවර්ධන ප්‍රදේශය - වර්ග මීටර් 3460. 0 යෝජිත සංවර්ධනය තුල පහත කරුණු ඇතුලත් වේ.

- වර්ග මීටර 970 , චතුරශ්‍ර
- වර්ග මීටර 1230 - පැති මං තීරු
- වර්ග මීටර 1140 -මාර්ග
- වර්ග මීටර 120 - මගී පාලමක්



රූපය 6.5.3.11: යෝජිත දුම්රිය ස්ථාන පෙරසවි ශාලා නිර්මාණ ව

මූලාශ්‍රය : *Google Earth Images,* නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

පරිච්ඡේදය 06 සැලසුම පාරිසරික තිරසාර උපායමාර්ග

3* මහජන පොළ පොදු චතුරශ්‍ර ව්‍යාපෘතිය

ඌන භාවිත තත්වයේ පවතින වර්තමාන මහජන පොළ භූමිය නව වාණිජ අවකාශයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. මෙය ඉදිරියේදී සමුද්‍ර පියවර හා A2 මාර්ගය සමඟ සම්බන්ධ වන අතර එමඟින් මෙම අවකාශයේ සාපේක්ෂ වටිනාකම් හා දෘශ්‍ය ගුණාත්මකබව ඉහළ නැංවේ.

රූපය 6.5.3.12 යෝජිත මහජන පොළ පොදු චතුරශ්‍ර ව්‍යාපෘතිය

මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය,2016

4* බන්ධනාගාර චතුරශ්‍ර නිර්මාණ ව්‍යාපෘතිය

වර්තමාන බන්ධනාගාරය නගර මධ්‍යයේ මධ්‍යස්ථ ලක්ෂයේ පිහිටා ඇති අතර නගරයේ පවතින සංවර්ධන ප්‍රවනතාවයෙන් ඈත්ව හුදෙකලා ලෙස ඌන භාවිත ස්ථානයක් ලෙස පවතී. මෙම ව්‍යාපෘතිය යටතේ බන්ධනාගාරය කැටයම් සහ කලා නිර්මාණ සහ නව නිර්මාණ මධ්‍යස්ථානයක් ලෙස

රූපය 6.5-.3.13 : යෝජිත බන්ධනාගාර චතුරශ්‍ර ව්‍යාපෘතිය

මූලාශ්‍රය : *Google Earth & Google Images, 2019*

උපායමාර්ගික ක්‍රියා (02) - ගාල්ල නගර මධ්‍යයේ පවතින ධර්මපාල උද්‍යානය ප්‍රති සංවර්ධනය කිරීම

සැලසුම

පාරිසරික තිරසාර උපායමාර්ග

මහජනයා සඳහා වඩා අවකාශ සහිත පරිසරයක් නගරය තුල නිර්මාණය සඳහා නගර උද්‍යාන ඇති කිරීම වර්ථමාන නැඹුරුව වී ඇත. එබැවින්, ඊට සමගාමීව ධර්මපාල උද්‍යානය සංවර්ධනය සඳහා හඳුනාගෙන ඇත.

වගුව ***6.5.3.2:*** ධර්මපාල උද්‍යානය ප්‍රති සංවර්ධනය සංරචක

සංරචකය	වර්ගඵලය
මංතීරු ප්‍රදේශය	වර්ග මීටර 2175
නව ගොඩනැගිලි	වර්ග මීටර 1200
ක්‍රීඩාංගන ප්‍රදේශය	වර්ග මීටර 600
පැති මංතීරු ප්‍රදේශය	වර්ග මීටර 1115
මගී පාලම්	වර්ග මීටර 200

මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය,2016

රූපය 6.5.3.14 : ධර්මපාල උද්‍යානයේ පිහිටීම



මූලාශ්‍රය : *Google Earth & Google Images, 2019*

රූපය 6.5.3.14 : ධර්මපාල උද්‍යානයේ පිහිටීම



මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය,2016

ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය ප්‍රති සංවර්ධනය කිරීම

ගාල්ල කොටුව හා ක්‍රිකට් ක්‍රීඩාංගනයේ දෘශ්‍ය පථය ක්‍රිකට් ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් මඟින් අවහිර කර ඇත. මෙ හේතුන් නිසා නගර මධ්‍යයේ පිහිටි ප්‍රධාන ලක්ෂණ 02 ක් අහිමි වී ඇත.

රූපය 6.5.3.15 : ගාල්ල කොටුවේ සහ ක්‍රිකට් ක්‍රීඩාංගණයේ දර්ශනය ප්‍රධාන මාර්ගවල විවිධ දෘශ්‍ය පථයන්



වක්වැල්ල මාර්ගයේ සිට දර්ශනය

මාතර මාර්ගයේ සිට දර්ශනය

කොළඹ මාර්ගයේ සිට දර්ශනය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය: 6.5.3.17 ගාල්ල කොටුව රැම්පාට් සඳහා දෘශ්‍යතා විශ්ලේෂණය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

2004 සුනාමියෙන්පසු ඉදිකර ඇති ක්‍රිකට් ක්‍රීඩාංගණ ගොඩනැගිලි සඳහා යුනෙස්කෝ සංවිධානය මඟින් පෙන්වා දී ඇති අවදානම් තත්ත්වයට විසඳුම් සෙවීම අවශ්‍ය වී ඇත. එබැවින් මෙම ප්‍රදේශය තුළ යෝජිත සංවර්ධන කාර්යයන් විවෘත සහ හරිත අවකාශ සහිතව ගාල්ල - කොටුව මැනවින් නගරයට දෘශ්‍යමාන වන අයුරු සැලසුම් කිරීම සුදුසු බවට යෝජනා කෙරේ.

පවත්නා සියළු ගොඩනැගිලි සහ ස්ථිර ව්‍යුහයන් ඉවත් කර ක්‍රීඩාපිටිය පාරම්පරික වැට ආවරණයකින් සහ තෘණ ආවරණය පඩි පේළි සහ පිටුපසට කොන්ක්‍රිට් ආස්තරණ ආසන ඉදිකිරීම යෝජනා කෙරේ. මෙම කොන්ක්‍රිට් ආස්තරණ වැට ආසන හා අනෙකුත් පියසි සහිත ව්‍යුහයන් ප්‍රධාන තරඟාවලි පැවැත්වෙන විට පමණක් එසවීමට හැකි වන පරිදි සැලසුම් කිරීම යෝජනා කෙරේ.

රූපය: 6.5.3.18 ක්‍රිකට් ක්‍රීඩාංගණය සඳහා යෝජිත සංවර්ධනයන්



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

6.5.4. කෘෂිකර්මාන්තය

මහා ගාල්ල ප්‍රදේශය අවට කුඹුරු බිම් වලට අමතරව ආසන්න වශයෙන් හෙක්ටෙයාර 350 ක පමණ වගා කළ ඉඩම් ප්‍රමාණයක් කෘෂිකාර්මික කලාපයක් ලෙස මහා ගාල්ල ප්‍රදේශය තුල හඳුනාගෙන ඇත. ආර්ථික සංවර්ධන සැලැස්ම තුල වගාකර ඇති තේ, රබර්, කුරුඳු බෝග සහ ඒවායේ අතුරු නිෂ්පාදන, වාණිජ බෝග ලෙස ඒකාබද්ධ කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව මත්ස්‍ය වෙළඳපොළ, කුළුබඩු වෙළඳපොළ සමඟ ඒකාබද්ධ කිරීම ආර්ථික සහ පරිසර යන උපායමාර්ගික දෙකෙහි එකතුවක් ලෙස වැඩි දියුණු කිරීමට යෝජිතය.
ඊට අමතරව, සැලැස්ම කුඹුරු ඉඩම් එක් කලාපයක් ලෙස හඳුනාගන්නා අතර මෙම ප්‍රදේශ සංවර්ධනය සඳහා භාවිතා නොකොට පුරන් වූ ගොවි ඉඩම් සංවර්ධනය සඳහා යෝජිතය.

6.6 සංස්කෘතික සහ උරුමය කළමනාකරණ උපායමාර්ගය

6.6.1. උරුම සහ පුරාවිද්‍යාත්මක සංරක්ෂණ ප්‍රදේශ

පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි සහ ස්මාරක සංරක්ෂණ සැලැස්ම

හේතුකොටගෙන අනෙක් නගර මධ්‍යස්ථාන වලට වඩා ගාල්ල නගර මධ්‍ය අතිවිශේෂ වී ඇත. ඓතිහාසික ලේඛන අනුව 1505 දී පෘතුගීසින් ලංකාවට පැමිණීම ගාල්ල හරහා සිදුවී ඇති බව හඳුනාගෙන ඇති අතර ඒ සමඟ ඉදිවූ බලකොටුව සහ වෙළඳ ප්‍රදේශ ඒ හා බද්ධ වී ඇත.

1640 දී දිවයිනට පැමිණි ලන්දේසින් විසින් ගාල්ල කොටුව සහ බලකොටුව අත්පත් කරගත් අතර එය මහජන පරිපාලන ගොඩනැගිලි, ගබඩා, ව්‍යාපාර ගොඩනැගිලි සහ නිල නිවාස පවතින ප්‍රදේශයක් ලෙස 18 වන සියවස මුල් භාගය තෙක් තවදුරටත් ව්‍යාප්ත විය. 1976 දී බ්‍රිතාන්‍යන් රට අත්පත් කරගැනීමත් සමඟ ගාලු කොටුව ඔවුන්ගේ ග්‍රහණයට නතු විය.

වර්තමානයේ ගාල්ල කොටුව විස්මය ජනක ලන්දේසි උරුමයක් ලෙස දැක්විය හැකි අතර ඉතා හොඳින් සංරක්ෂිත 18 සහ 19 වන සියවසට අයත් බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ සහ ලන්දේසී ලක්ෂණ මිශ්‍ර දේශීය සහ විදේශීය සංචාරකයන් දහස් ගණනක් ආකර්ෂණය වීමට හේතුවී ඇත.

මෙම පුරාවිද්‍යාත්මක කලාපය පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව, ගාලු උරුම පදනම, (ඨ්‍යත) ස්මාරක සහ ස්ථාන පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලය (ICOMS) සහ ගාලු කොටුව කළමනාකරණ කමිටුව යන ආයතන සහ සංවිධාන මඟින් කළමනාකරණය කෙරේ. මෙම ප්‍රදේශය තුල පවතින ගොඩනැගිලි ඉදිකිරීම් සහ සැලසුම්කරනය නියාමනය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් විශේෂ සැලසුම් කමිටුවක් ක්‍රියාත්මක වේ.

කෙසේ නමුත් මෙම ලෝක උරුමය සංවර්ධන ක්‍රියාවලිය සඳහා නතුවී ඇත. මෙම තත්වය සම්බන්ධව යුනෙස්කෝ මගින් අනතුරු ඇගවීම් නිකුත් කර ඇති අතර අවධානමට ලක්වූ ලෝක උරුම ලැයිස්තුවට මෙය ඇතුලත් කර ඇත.යුනෙස්කෝ වාර්ථා අනුව ඉහත තර්ජනය සම්බන්ධව පහත කරුණු විශේෂ කොට දක්වා ඇත.

1) මෙම දේපල කළමනාකරණ අධිකාරිය ලෙස ක්‍රියාකරන ගාලු උරුම පදනම ආයතනයෙහි දුර්වල කළමනාකාරීත්වය
2) යෝජිත වරාය ඉදිකිරීම් මෙම බලකොටුවහි ස්වභාවයට හානිදායක විය හැක.
3) ගාලු කොටුව තුල පවතින අනවසර සහ නීති විරෝධී ඉදිකිරීම් සහ ගාලු ක්‍රීඩාංගනයේ පවතින ඉදිකිරීම්ද බලකොටුවේ පෙනුමට හානිකර වීම.

එබැවින්, මහා ගාල්ල සංවර්ධන සැලැස්ම තුල උපායමාර්ගික ක්‍රියා දෙකක් යෝජනාවී ඇති අතර ඒවා පහත පරිදිවේ.

1) ගාලු කොටුව කළමනාකරණ සැලැස්ම
2) පුරාවිද්‍යාත්මක ගොඩනැගිලි සහ ස්මාරක සංරක්ෂණ සැලැස්ම

පරිච්ඡේදය 06

සැලසුම

සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

පළමු සැලැස්ම සම්පූර්ණයෙන්ම ගාලු කොටුව පමණක් අවධානය යොමුව ඇති අතර දෙවන සැලැස්ම හරහා ගාලු කොටුව තුළ සහ ගාල්ල අවට පවතින එනම් මහා ගාල්ල සැලසුම්කරණ ප්‍රදේශය තුල ඇති පුරාවිද්‍යාත්මක ස්මාරක සහ ගොඩනැගිලි සංරක්ෂණය කිරීම පිළිබඳව අවධානය යොමුව ඇත. මෙම සැලසුම් වෙන් වශයෙන් සකස් කරන ලද පුළුල් මාර්ගෝපදේශන සැලසුම් මගින් හඳුනා ගෙන ඇත

6.7 සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

6.7.1.උපාය මාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘති

සැලසුමෙහි ඇති සම්පූර්ණ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා පහත සඳහන් උපායමාර්ගික ක්‍රියාකාරී ව්‍යාපෘති හඳුනාගෙන ඇත. දැනටමත් ක්‍රියාත්මක වෙමින් තිබෙන ව්‍යාපෘතිවලට අමතරව මෙම ව්‍යාපෘති යෝජනා කරනු ලැබේ. උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ එවැනි අදාළ ආයතන විසින් පහත දැක්වෙන ව්‍යාපෘති කිහිපයක් යෝජනා කර ඇති අතර මෙම සැලැස්ම උපායමාර්ගිකව සැලසුම් කර ඇති සංවර්ධනය සඳහා උපාය මාර්ගික වැදගත්කමක් ලෙස එම ව්‍යාපෘති ඇතුළත් කර ඇත.

ඒ අනුව සංවර්ධන සැලැස්ම මගින් ක්‍රියාවට නංවන ව්‍යාපෘතිවල ප්‍රමුඛතාවය අනුව පහත සඳහන් ව්‍යාපෘති ලැයිස්තුව හඳුනාගෙන ඒවා ලැයිස්තුගත කර ඇත.

වගුව ***6.7.1.*** ව්‍යාපෘති ප්‍රමුඛතා

ව්‍යාපෘති අංක	ප්‍රමුඛතා අංක	ව්‍යාපෘතිය	අපේක්ෂිත ප්‍රතිඵල	අදහස් / තත්වය
01	01	ඉදිකිරීමට යෝජිත තුන්වන තරංග මාර්ගය	පදික මංතීරු සංවර්ධනය	මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව ඇත
02	01	පහත සඳහන් මාර්ග පුළුල් කිරීමට නියමිතය . 1. වක්වැල්ල මාර්ගය 2. බද්දේගම මාර්ගය 3. අම්බලන්වත්ත මාර්ගය	පදික මංතීරු සංවර්ධනය	මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව ඇත
03	01	රත්ගම මොන්රෝවියවත්ත කසල කළමනාකරණ ව්‍යාපෘතිය	සනීපාරක්ෂක කැලිකසල කළමනාකරණය	මධ්‍යම පරිසර අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත
04	02	ගිංතොට සහ වලහන්දුව සංක්‍රමණික නගර මධ්‍යස්ථාන දෙකක් වශයෙන් ප්‍රවර්ධනය කිරීම	සංවර්ධන කොරිඩෝවට පහසුකම් සැපයීම සඳහා පදික මංතීරු සංවර්ධනය	නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකිරීමට යෝජිතව ඇත
05	03	ගාලු පාර සිට අධිවේගී පිවිසුම් මාර්ගය දක්වා (දෙවන තරංග මාර්ගය) මංතීරු දෙකක සම්බන්ධක මාර්ගයක්	පදික මංතීරු සංවර්ධනය	ගාල්ල නගරසභාව මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව ඇත
06	03	වැසි ජල කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම	යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, පාරිසරික ගුණාත්මකභාවය සහ ගංවතුර අවම කිරීමේ පියවරක් ලෙස වැදගත් වීම	උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය මගින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී
07	04	හඳුනාගත් ස්ථානවල නේවාසික කලාප ප්‍රවර්ධනය කිරීම	ප්‍රදේශයේ වඩා සුදුසු ජනාවාස ඇති කිරීම	නාගරික සංවර්ධන අධිකාරිය විසින් යෝජනා කරන ලදී අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම
08	04	නේවාසික කලාප සහ සංවර්ධන කොරිඩෝව අතර මාර්ග සම්බන්ධතා නිර්මාණය කිරීම	ජංගම ගමනාගමනය සහ සම්බන්ධතාව වැඩි දියුණු කිරීම	පළාත් පාලන ආයතන මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිතය

		1. නේවාසික ප්‍රවර්ධන කලාපය හපුගල සහ සංවර්ධන කොරිඩෝව අතර සෘජු සම්බන්ධතා දෙකක් 2. උළුවිටිකේ නේවාසික ප්‍රවර්ධන කලාපය සංවර්ධන කොරිඩෝව අතර සෘජු සම්බන්ධකම් දෙකක් 3. ඇත්තිලිගොඩ නේවාසික ප්‍රවර්ධනය කලාපය සහ සංවර්ධන කොරිඩෝව අතර මිලිද්දුව මාර්ගය හා සම්බන්ධතාවය ඇති කිරීම		
09	05	ගිංතොට සිට දෙවට මංසන්ධිය සංචාරක කොරිඩෝවක් නිර්මාණය කිරීම 1. මහමෝදර රෝහල් භූමිය සහ දැනට පවත්නා හඹී භූමිය සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිනිර්මාණය කිරීම 2. වෙරළ උද්‍යානයක් ලයිට් හවුස් හෝටල් පරිශ්‍රයේ සිට දෙවට හන්දිය දක්වා නිර්මාණය කිරීම යෝජිත වෙරළ උද්‍යානය සමුද්‍ර වීදිය සහ ප්‍රධාන වීදිය අතර සම්බන්ධ වී පවතින මාර්ග ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම හා සැලසුම් කිරීම	සංචාරක සංවර්ධනය, නගර අලංකාර කිරීම	නාගරික සංවර්ධන අධිකාරිය, ගාල්ල නගර සභාව, ක්‍රමෝපායික නගර සංවර්ධන ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කිරීම
10	05	බෝට්ටු ගොඩබෑමේ පහසුකම් සහ ප්‍රවේශ ස්ථාන ලබා දීම මගින් මහමෝදර වැව, කැපූ ඇල සහ ගිංගඟ හරහා බෝට්ටු / නෞකා යාත්‍රා ප්‍රවර්ධනය කිරීම	සංචාරක සංවර්ධනය සහ නගර අලංකරණය	ගාල්ල මහ නගර සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.
11	06	දැනට පවතින නීල හරිත ප්‍රදේශ ආරක්ෂා කර ගැනිම යෝජිත පින්නදූව පාරිසරික උද්‍යානය	සංචාරක සංවර්ධනය නගර අලංකරණය පාරිසරික සංරක්ෂණය	නා. සං. අ. උද්භිද උද්‍යාන දෙපා. හා අක්මීමණ ප්‍රා. ස.
12	07	නගර මධ්‍යයේ සුදුසු ස්ථානවල මහජන චතුරස්‍ර සැලසුම් කිරිම	නාගරිකයන් සහ මගීන් සඳහා පොදු විවේකස්ථාන ඇති කිරිම	
13	07	මහවීදිය සහ මුහුදු මාර්ගය අතර ඉඩම් පොලිස් බැරැක්ක ප්‍රතිනිර්මාණය කිරීම	ඌන භාවිතා ඉඩම් සංචාරක කටයුතු සඳහා යොදා ගැනීම තුළින් ආදායම් උපදවා ගැනීම	නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිතය

14	08	ඔරොප්පුවත්ත චතුරස්‍රය නිර්මාණය කිරීම	ඌන භාවිතා දේපල සංවර්ධනය තුළින් ආදායම් උත්පාදනය	ගාල්ල මහ නගර සභාව ක්‍රියාත්මක කරයි
15	09	හඳුනා ගත් ප්‍රධාන මහාමාර්ග හා 3 වන මාර්ග දෙපස රුක් රෝපනය කිරීම	නගර අලංකරණය සහ ඇවිදීමේ පහසුකම් වැඩි දියුණු කිරීම	නා. සං.අ. මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිතය
16	10	චීන කොරටුව ප්‍රදේශය තුළ පිහිටා ඇති පටු මාවත් සංවර්ධනය සහ මුහුණත් අලංකරණය	සංචාරක සං. අධිකාරිය, නගර අලංකරණ හා ඇවිදිමේ පහසුකම් වැඩි දියුණු කිරීම	නා. සං. අ.උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ ගාල්ල මහ නගර සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිතය
17	11	දෙවට හන්දියෙන් ආරම්භ වි අධිවේගී මාර්ගය දෙපස මීටර් 1300 ක් දිග වාණිජ තීරුවක් ප්‍රවර්ධනය කිරීම	නාගරික සේවා වැඩි දියුණු කිරීම	නා. සං.අ. මඟින් ක්‍රියාත්ම කරනු ලැබේ
18	12	කළුවැල්ල හන්දිය සිට සම්බෝධි හන්දිය දක්වා විකල්ප රථවාහන මාර්ගයක් නිර්මාණය කිරීම	කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම	ගාල්ල මහ නගර සභාව ක්‍රියාත්මක කරයි
19	13	නාගහවත්ත හන්දියේ සිට ආනන්ද-ගාඩ හන්දිය දක්වා ද්විත්ව මංතීරු මාර්ගයක් නිර්මාණ කිරීම	කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම	පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිතය
20	14	උප නගර මධ්‍යස්ථාන සංවර්ධනය	නාගරික සේවා වැඩි දියුණු කිරීම	නා. සං. අ. විසින් සහ පළාත් පාලන ආයතන-වලින් ක්‍රියාත්මක කරනු ලැබේ
21	15	හපුගල විශ්ව විද්‍යාල ශ්‍රවනාගාරය ප්‍රවර්ධනය කිරීම	අධ්‍යාපනය පදනම් කරගත් ආර්ථික වාර්තාව	නා. සං. අ. සහ රේඛීය අමාත්‍යංශයෙන්
22	16	රූමස්සල ඕලන්ද ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය	සංචාරක සංවර්ධන අධිකාරිය, පාරිසරික වැඩි දියුණු කිරීම	වාරිමාර්ග දෙපා. නා. සං.අ . හා ඉඩම් ගොඩ කි. සං.සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරනු ලබයි
23	16	රූමස්සල රථවාහන නැවතුම් ස්ථාන දෙපස සංවර්ධනය කිරීම	සංචාරක සංවර්ධන කාර්යක්ෂමතාවය	වාරිමාර්ග දෙපා. නා. සං.අ . හා ඉඩම් ගොඩ කි. සං.සංස්ථාව මඟින් ක්‍රියාත්මක කරනු ලබයි
24	17	යෝග සහ කඳවුරු ස්ථාන සංවර්ධනය	සංචාරක සංවර්ධනය	නා. සං. අ. සහ හබරාදුව ප්‍රා. ස. මඟින් ක්‍රියාත්මක කරනු ලබයි

25	17	ආකාශ වස්තු නැරඹුම් මධ්‍යස්ථානය	සංචාරක සංවර්ධනය	නා. සං. අ. සහ හබරාදුව ප්‍රා. ස. මඟින් ක්‍රියාත්මක කරනු ලබයි
26	18	රූමස්සල පදිංක මංතීරු සංවර්ධනය සහ කඳු නැගීමේ ප්‍රදේශ සංවර්ධනය	සංචාරක සංවර්ධනය	නා. සං. අ. සහ හබරාදුව ප්‍රා. ස. මඟින් ක්‍රියාත්මක කරනු ලබයි
27	19	වටරැක මාර්ගය ද්විත්ව මංතීරු මාර්ගය ලෙස තුන්වන විකල්ප මාර්ගය දක්වා දීර්ඝ කිරීම	කාර්යක්ෂම සංවර්ධනය	බෝපේ - පෝද්දල ප්‍රා. ස. මඟින් ක්‍රියාත්මක කරනු ලබයි
28	19	හපුගල සිට පිලාන කඩේ සිට තුන්හිරිපාන හන්දිය දක්වා ද්විත්ව මං තීරු ලෙස සංවර්ධනය කිරීම	කාර්යක්ෂම සංවර්ධනය	පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබයි
29	21	එස්. එච්. දහනායක මාවත සහ වුඩ්වර්ඩ් මාවත වැඩි දියුණු කිරීම	කාර්යක්ෂම සංවර්ධනය	පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබයි
	22	වේවැල්ලවල මාර්ගය වැඩි දියුණු කිරීම	කාර්යක්ෂම සංවර්ධනය	පළාත් පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබයි

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

ඉහත සඳහන් සමහර ව්‍යාපෘති නාගරික සංවර්ධන අධිකාරිය විසින්ම ක්‍රියාවට නංවනු ලබන අතර සමහර කොටස් සැලසුම් / කලාපකරණ රෙගුලාසි මගින් ප්‍රවර්ධනය / නියාමනය කරනු ලබයි. පළාත් පාලන ආයතන, උපායමාර්ගික නගර සංවර්ධනය මෙන්ම මධ්‍යම පරිසර අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි රේඛීය ආයතන සමහර සංරචක ක්‍රියාත්මක කිරීමට නියමිතය.

පරිච්ඡේදය 06 මහා ගාල්ල සැලසුම් ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන ව්‍යාපෘති

සැලසුම

මහා ගාල්ල සැලසුම් ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන ව්‍යාපෘති

1 ගින්තොට සිට වලහන්දුව දක්වා වූ ප්‍රදේශය සංවර්ධන තීරුවක් ලෙස සංවර්ධනය කිරීම

ව්‍යාපෘතියේ යෝග්‍යතාවය

ගාල්ල නගරය දැඩි තදබදයක් සහිතව සහ දැඩි නාගරික පීඩනයක් යටතේ වැඩි දියුණු වන නගරයකි. නාගරික සංවර්ධනයේ ප්‍රවනතාවය නගරයේ සිට පර්යන්ත ප්‍රදේශ දක්වා විහිදී පවතී. එබැවින් ගිංතොට සිට වලහන්දුව දක්වා වූ ප්‍රදේශය සංවර්ධන තීරුවක් ලෙස සංවර්ධනය කිරීමටත්, එමගින් ගාල්ල නගර මධ්‍යයේ ඇතිවන තදබදය අවම කරලීමත් නගරයේ සිට නගර පර්යන්ත ප්‍රදේශ දක්වා වූ ප්‍රදේශයේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම යනාදී කරුණු සළකා ඇත. මීට අමතරව, මෙම සැලැස්ම මඟින් ගිංතොට සහ වලහන්දුව ස්ථිර ගමනාගමන මධ්‍යස්ථාන දෙකක් ලෙස යෝජනා කර ඇත.

මෙම නියාමන කේන්ද්‍රයන් සහ සංවර්ධන කොරිඩෝව මඟින් වාහන ගමනාගමනය සහ සංවර්ධන තීරුව භාවිතා කරන මගීන්ගේ කාර්යන් ඉතාමත් කාර්යක්ෂම වන අතර මහා ගාල්ල ප්‍රදේශය ද ප්‍රවේශය ලබයි. වේගවත් බස්රථ සංක්‍රමණ Bus Rapid Transit (BRT) ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කිරීම ඒතුලින් වර්ධන තීරයෙහි පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම ප්‍රවර්ධනය කිරීම මෙන්ම යෝජිත තුන්වන විකල්ප මාර්ගයෙහි දෙපසෙහි ඇති ප්‍රධාන ගමනාගමන නියාමන කේන්ද්‍රයන් දෙක ද ප්‍රවර්ධනය කෙරේ.

ව්‍යාපෘතියේ සංරචක

ගින්තොට ගමනාගමන හුවමාරු මධ්‍යස්ථානය

01. ගින්තොට පවත්නා බස් ඩිපෝ භූමිය තුල කුඩා වාණිජ අවකාශයන් සහ රථවාහන නැවතුම් සහිත කුඩා බස් රථ පර්යන්තයක් ඉදි කිරීම.
02. පියදීගම දුම්රිය ස්ථානය යෝජිත ගිංතොට කුඩා බස්නැවතුම්පල ආසන්නයට රැගෙනයාම
03. බස් රථ පර්යන්තය හා දුම්රිය ස්ථානය අතර සම්බන්ධතාවය ඇති කිරීම
04. කුඩා බස්රථ පර්යන්තය හා ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ගය අතර සම්බන්ධතාවය ඇති කිරීම

වලහන්දූව ගමනාගමන හුවමාරු මධ්‍යස්ථානය

1. වාණිජ අවකාශය සහ රථවාහන නැවතුම් සහිත බස් රථ පර්යන්තයක් ඉදි කිරීම.
(උඩුගම මාර්ගය හා දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිවිසුම් මාර්ගය අතර පිහිටි හඳුනා ගත් ඉඩම හෙක්ටයාර් 2.5)

ව්‍යාපෘතියේ අරමුණු

01. වාහන වලට හා මගීන්ට මහ ගාල්ල ප්‍රදේශයට කඩිනම්ව ගමන් කිරීම හා පිවිසීමට පහසු කිරීම.
02. සංවර්ධන කොරිඩෝව භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.
03. ගාලු පාරේ සහ නගරය තුළ රථවාහන තදබදය අවම කිරීම
04. නගර මධ්‍යයේ ගමනාගමන පද්ධතිය පුළුල් කිරීම
05. වාණිජ හා වාහන නැවැත්වීමේ ඉඩ ප්‍රස්තා වැඩි කිරීම

ව්‍යාපෘතියේ ප්‍රතිඵල

1. මහගාල්ල ප්‍රදේශය තුල කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතිය කාර්යක්ෂම කිරීම
2. කලාපයේ සම්බන්ධතාව වැඩි දියුණු කිරීම
3. වාණිජ අවකාශ හා රථගාල් පහසුකම් වැඩි කිරීම

මූල්‍ය සැලැස්ම

වගුව ***6.7.2.*** මූල්‍ය සැලැස්ම

ව්‍යාපෘති සංරචක / ක්‍රියාකාරකම	පිරිවැය (රු.මි.)
කුඩා බස් රථ පර්යන්තයක් ගිංතොට ප්‍රදේශයේ ඉදිකිරීම	100
පියදීගම ප්‍රදේශයේ දුම්රිය ස්ථානය වෙනත් ස්ථානයකට ගෙනයාම	100
කුඩා බස් රථ පර්යන්තය සහ දුම්රිය ස්ථානය අතර සම්බන්ධය ඇතිකිරීම	50
කුඩා බස්රථ පර්යන්තය සහ ගාල්ල - කොළඹ ප්‍රධාන මාර්ග අතර සම්බන්ධය ඇතිකිරීම	50
මුළු ඇස්තමේන්තුගත පිරිවැය	300

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය සහ ව්‍යාපෘති සැලසුම

රූපය ***6.7.1.*** යෝජිත ගිංතොට සංක්‍රමික මංසල ප්‍රවාහන හා මාර්ග සංවර්ධන සැලසුම

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය ***6.7.2.*** යෝජිත කුඩා බස් රථ පර්යන්තයක්

මූලාශ්‍රය : *Google Earth & Google Images, 2019*

පරිච්ඡේදය 06

2. ගිංතොට සිට දෙවට හන්දිය දක්වා සංචාරක කලාපයක් ඇතිකිරීම

සැලසුම

මහා ගාල්ල සැලසුම් ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ යෝග්‍යතාවය

ප්‍රධාන සංචාරක ආකර්ශනීය නගරයක් වන ගාල්ල නගරයෙහි දැනටමත් සංචාරක කටයුතු සඳහා යොදා නොගත් ප්‍රදේශ, විවෘත ප්‍රදේශ, විශේෂ කටයුතු සහ භූ දර්ශන ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට මහ ගාල්ල නගර සංවර්ධන සැලැස්මේ ආර්ථික උපාය මාර්ග ක්‍රමෝපාය වන "ඉසුරුමත් නගරය" යන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා යෝජනා කර ඇත. එබැවින් ගිංතොට සිට දෙවට හන්දිය දක්වා වෙරළ තීරය සහිත බිම් තීරුව ආර්ථික සංවර්ධන අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා සංචාරක කොරිඩෝවක් ලෙස සංවර්ධනය කිරීමට මෙමගින් යෝජනා කෙරේ.

මෙම ක්‍රියාකාරකම් යෝජිත ස්ථාන 04ක් තුළ සිදුකිරීමට හඳුනාගෙන ඇත
(ගිංගඟ , මහමෝදර වැව, මහමෝදර රෝහල හඳුනාගත් හිස් ඉඩම් ප්‍රදේශය සහ ගාල්ල කොටුව)

ව්‍යාපෘති සංරචක

1. ජලාශ්‍රිත කටයුතු පදනම් කොට ගත් හා ඒ ආශ්‍රිත ක්‍රීඩා ක්‍රියාකාරකම් කටයුතු
2. සංචාරක බෝට්ටු / සුඛෝපභෝගී බෝට්ටු
3. ජල ජෙට් අධිවේගී ජල බෝට්ටු
4. විවෘත අවන්හල සහ බෝට්ටු නැවතීම සඳහා ජැටි

මහමෝදර ජලාශයේ ජල මූලික ක්‍රියාකාරකම් කටයුතු

1. ජල මූලික විනෝදාත්මක ක්‍රියාකාරකම්
2. සුඛෝපභෝගී බෝට්ටු/ සංචාරක බෝට්ටු
3. ජල ක්‍රීඩා ප්‍රදේශයන්
4. අවන්හල

මහමෝදර රෝහල දැනටමත් කරාපිටිය වෙත ඉවත් කර තිබේ. ස්ථානීය වාසි හා අවට ඉඩම් පරිහරණ ප්‍රවණතාව සැලකිල්ලට ගනිමින් සංචාරක කටයුතු සහ ඉහල පන්තියේ හෝටල් ඇතිකිරීම සඳහා දැනට පවතින භූමිය යෝජනා කර ඇත. මෙය සමුද්‍ර පියවර ව්‍යාපෘතියට සම්බන්ධ වන අතර මෙමගින් මුහුදු වෙරළ තීරයේ වඩාත් විවෘත පොදු අවකාශයක් නිර්මාණය වනු ඇත.

• සැහැල්ලු සංචාරක යාත්‍රා සහිත වරාය ව්‍යාපෘතිය

ගාලු වරාය ලබාදෙන පහසුකම් පදනම් කර ලොව සුඛෝපභෝගී සංචාරක ආකර්ෂණයක් සහිත වරායක් ලෙස ජාත්‍යන්තර යාත්‍රා සංගමය විසින් හඳුනාගෙන ඇත. එබැවින් සංචාරක කර්මාන්තය සහ නගර ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා ඇති විභවතාවයන් මෙම සංවර්ධන සැලැස්ම මඟින් හඳුනාගෙන තිබේ.

ව්‍යාපෘති අරමුණු

1. සංචාරකයන්ගේ පැමිණීම හා සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම
2. නගර ආර්ථිකය ඉහළ නැංවීම
3. ප්‍රයෝජනයට නොගත් සංචාරක විභවතාවයන් ඇති ස්ථාන භාවිතයට ගැනිම
4. විනෝදාත්මක පහසුකම් සහ විවෘත අවකාශ වැඩි කිරීම.

ව්‍යාපෘති ප්‍රතිඵල

1. ආර්ථිකය ඉහළ නැංවීම
2. ප්‍රයෝජනයට නොගත් සංචාරක ආකර්ෂණ ප්‍රදේශ ස්ථාන භාවිතා කිරීම.
3. විනෝදාත්මක පහසුකම් සංවර්ධනය කිරීම.

මූල්‍ය සැලැස්ම

වගුව ***6.7.3.*** මූල්‍ය සැලැස්ම

ව්‍යාපෘති සංරචක / ක්‍රියාකාරකම	පිරිවැය (රු.මි.)
ගිංගඟ පදනම් කොටගත් ජල මූලික හා ඒ ආශ්‍රිත ක්‍රීඩා ක්‍රියාකාරකම් කටයුතු	100
මහමෝදර වැව ආශ්‍රිත ජල මූලික ක්‍රියාකාරකම් කටයුතු	100
මහමෝදර රෝහල් භූමිය ආශ්‍රිත ප්‍රදේශය පුනර්ජනනය කිරීම	80
සැහැල්ලු සංචාරක යාත්‍රා නැංගුරම් ව්‍යාපෘතිය	200
මුළු ඇස්තමේන්තුගත පිරිවැය	480

සටහන: ඉහත සඳහන් ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය වෙනස් විය හැකිය
මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

රූපය: 6.7.3 - සංචාරක ව්‍යාපාරය සංවර්ධනය- ව්‍යාපෘතිය 01



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල 2020

පරිච්ඡේදය 06 03.නගර සීමාව තුල ප්‍රධාන මාර්ග, හඳුනාගත් මාර්ග සහ තුන්වන විකල්ප මාර්ග දෙපස අවකාශයන් තුල පදික වේදිකා සහිත වෘක්ෂලතා තීරුවක් ඉදිකිරීම (සංවර්ධන කොරිඩෝව)

සැලසුම

මහා ගාල්ල සැලසුම් ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ යෝග්‍යතාවය

මහ ගාල්ල සංවර්ධන සැලැස්මෙහි ප්‍රධානතම ඉලක්කයක් වන්නේ "ප්‍රීතිමත් පුරවැසියන්" වන අතර පොදු එළිමහන් ප්‍රදේශ, ඇවිදීමේ මංතීරු සංවර්ධනය සහ නගර අලංකාර කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙය ඇවිදිම සඳහා අවකාශයන් ඇති කිරීම සහ පොදු විවෘත විනෝද අවකාශ කළමනාකරණ සැලැස්ම ලෙස හැඳින්වෙන සැලසුම් දෙකකින් ආවරණය වනු ලබයි.

යෝජිත ස්ථානය පින්නදූව දකුණ අධිවේගී මාර්ගය ආසන්නයේ සිමෙන්ති කර්මාන්ත ශාලාව තදාසන්නව පිහිටා ඇති කඩොලාන ප්‍රදේශය වන අතර, ස්වාභාවික සංරක්ෂණ හා විවේක කටයුතු සඳහා දියුණු කිරීමට අත්පත් කර ගැනීමට යෝජිතය. තවද ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීම සහ පක්ෂි නැරඹුම් මධ්‍යස්ථානයක් ඇති කිරීම ව්‍යාපෘතියේ බලාපොරොත්තුවයි.

වගුව***6.7.4.*** යෝජිත මාර්ග

විස්තර	වර්ගය
ගිංතොට - ලබුදුව මාර්ගය	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
කලුවැල්ල-කන්දෙවත්ත-කොන්ගොඩ මාර්ගය - වටරවුම් මාර්ගය	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
මිනුවන්ගොඩ- කලේගාන මාර්ගය	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
බද්දේගම පාර	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
අම්බලන්වත්ත පාර	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
ශ්‍රී හේමානන්ද මාවත	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
නව යෝජිත මාර්ගය (බෙලිගහ-අධිවේගී මාර්ග පිවිසුම්	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
නව යෝජිත මාර්ග	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
අම්බලන්වත්ත පාර	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
ලබුදූව පින්නදූව පාර (නව යෝජිත මාර්ගය)	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
ගින්තොට - කලේගාන මාර්ගය	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
ගාලු පාර (මහමෝදර රෝහල - උඩුගම පාර හංදිය)	අහඹු ශාක රෝපණය / ඉහළ ඝනත්වය / මාර්ගයේ මධ්‍ය රේඛාවේ සහ මාර්ගය දෙපස
දෙවට අධිවේගී පිවිසුම් මාර්ගයේ සිට පින්නදූව අන්තර් හුවමාරුව	කාබනික කෘෂිකාර්මික මංතිරුවක් ලෙස සංවර්ධනය කිරීම

මූලාශ්‍රය :නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල,2019

ව්‍යාපෘතියේ අරමුණු

1. ඇවිදින අවකාශයන් වැඩි දියුණු කිරීම
2. නගර අලංකරණය වැඩි දියුණු කිරීම
3. විනෝද ක්‍රීඩා පහසුකම් වැඩිදියුණු කිරීම

ව්‍යාපෘතියේ ප්‍රතිඵල

1. මාර්ග දෙපස නඩත්තුව අවම කිරීම
2. ඇවිදින අවකාශයන් වැඩි දියුණු කිරීම
3. නගර අලංකාරය වැඩි දියුණු කිරීම

මූල්‍ය සැලැස්ම

ඇස්තමේන්තුගත පිරිවැය - රු. මිලියන 100.00

සටහනඃ ඉහත සඳහන් ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය වෙනස් විය හැකිය

යෝජිත ව්‍යාපෘති භූමි සහ ව්‍යාපෘති නිර්මාණය

රූපය 6.7.4 - යෝජිත රුක් රෝපණ මාර්ග

මූලාශ්‍රය ඃනාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල,2019

රූපය ***6.7.5.*** යෝජිත රුක් රෝපණ මාර්ග

මූලාශ්‍රය : *Google Earth & Google Images, 2019*

පරිච්ඡේදය 06

4. දක්ෂිණ අධිවේගී මාර්ග පිවිසුමේ යෝජිත පාරිසරික උද්‍යාන ව්‍යාපෘතිය

සැලසුම

ව්‍යාපෘතියේ යෝග්‍යතාවය

මහා ගාල්ල සැලසුම් ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන ව්‍යාපෘති

ගාලු කොටුව, රූමස්සල කඳුවැටිය වැනි ස්වභාවික දර්ශනීය ස්ථානවලින් සමන්විත ඓතිහාසික වටිනාකමක් ඇති බැවින් ගාලු නගරය දකුණු පළාතේ ප්‍රධානතම සංචාරක අග නගරය වේ. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ දකුණු කලාපිය උපායමාර්ගික ක්‍රමෝපා සැලැස්මට අනුව ගාල්ල නගරය 2031 වසර වන විට ජනගහනය මිලියන 1 ක් වන මෙට්රෝ නගරය පොකුරක් ලෙස සංවර්ධනය වීමට නියමිතය

ගාල්ල සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා වැඩි විභවතාවයන් රැසක් සහිත නගරයකි. කෙසේ වෙතත්, එම විභවයන් තවමත් ප්‍රයෝජනයට නොගෙන ඇති අතර ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගත හැකි අවස්ථාවන් අහිමි විය. සංචාරක ආකර්ෂණ ස්ථාන බොහොමයක් ස්වාභාවික ස්ථාන වේ. සංචාරක ආකර්ශන ස්ථාන වැඩිදියුණු කිරීම රජයේ සහ පෞද්ගලික අංශයේ මැදිහත්වීම ප්‍රදේශයේ වර්තමාන ප්‍රවනතාවයක් බවට පත් වී ඇත.

එබැවින් භූ දර්ශන නිර්මාණය කිරීම හා අනෙකුත් විනෝදාත්මක පහසුකම් වැඩිදියුණු කිරීම මඟින් සංචාරක ස්ථාන ලෙස ප්‍රයෝජනයට නොගත් සංචාරක ස්ථාන සංවර්ධනය කිරීම සඳහා මහගාල්ල සංවර්ධන සැලැස්ම මඟින් හඳුනාගෙන තිබේ. ඒ අනුව යෝජිත ස්ථානය අධිවේගී පිවිසුම් මාර්ගයට දකුණු දෙසින් සංවර්ධනය ස්වභාවික උද්‍යානයක් ලෙස සංවර්ධනය කෙරෙන විනෝදාස්වාද ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම / ඉඩම් ලබා ගැනීම කළ යුතුව ඇත. මෙමඟින් ස්වභාවික වාසස්ථාන හා අවට පරිසරය විනෝදාස්වාද ක්‍රියාකාරකම් සහිතව ආරක්ෂා කිරීම අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘති සංරචක (ක්‍රියාකාරකම්)

- ඇවිදින මාර්ගය
- ජලාශ්‍රිත ක්‍රියාකාරකම් (සීමාසහිත)
- විවෘත කලාගාරය
- ස්වභාවික මංපෙත්
- ආපනශාලා / පහසුකම් මධ්‍යස්ථානය
- පාරිසරික හා භූ දර්ශන නිර්මානය කිරීම
- රථවාහන නැවතුම්
- විසිතුරු පැළ විකුණුම් මධ්‍යස්ථාන

ව්‍යාපෘති අරමුණු

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වනුයේ;

1. ප්‍රයෝජනයට නොගත් සංචාරක ආකර්ෂණ ස්ථානයට ගැනීම.
2. ස්වභාවික වාසස්ථාන සංරක්ෂණය කිරීම හා පාරිසරික හායනය වැළැක්වීම
3. නගරයේ ආදායම වැඩි කිරීම
4. දේශීය හා විදේශීය සංචාරකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා ගාලු නගරය ස්වභාවික මට්ටමේ සේවා මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කළ යුතුය.
5. අනවසර ඉදිකිරීම් සහ ඉඩම් පිරවීම පාලනය කිරීම.

ව්‍යාපෘති ප්‍රතිඵල

- විනෝදාත්මක පහසුකම් වැඩිදියුණු කිරීම සහ විවේක හා විවෘත ප්‍රදේශ ජනතාවට ලබා දීම (ස්වාභාවික උද්‍යානයක් ලෙස)
- දක්ෂිණ අධිවේගී මාර්ගයට සමාන්තර පදික මංතීරුවක් තැනීම
- නාගරික ආර්ථික වැඩිදියුණු කිරීම සඳහා ප්‍රයෝජනයට නොගත් සංචාරක විභව අඩවිය භාවිතා කරන්න
- ස්වභාවික වෘක්ෂලතා හා පරිසරය ආරක්ෂා කර ගනිමින් ස්වභාවික පරිසරය සමඟ විනෝදාත්මක කටයුතු ඒකාබද්ධ කිරීම. (කඩොලාන)

මූල්‍ය සැලැස්ම

වගුව ***6.7.5.*** මූල්‍ය සැලැස්ම

සංරචක/ක්‍රියාකාරකම්	පිරිවැය (රු. මි.)
ඉඩම් අත්පත් කර ගැනීම ව්‍යාපෘති ක්‍රියාකාරකම් ව්‍යාපෘති පර්යේෂණ හා නඩත්තු වියදම	127.16 -
මුළු එකතුව	**286.0**

සටහන : ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය

මූලාශ්‍රය :නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල,2019

යෝජිත ව්‍යාපෘති භූමිය හා ව්‍යුහගත සැලැස්ම

රූපය 6.7.6 - යෝජිත භූ දර්ශන සැලැස්ම - පින්නදූව පරිසර උද්‍යානය

මූලාශ්‍රය : භූ දර්ශන අංශය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,2017

පරිච්ඡේදය 06 5. ගාලු නගර මධ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ පොලිස් බැරැක්ක භූමිය ප්‍රතිනිර්මාණය කිරීම

සැලසුම

මහා ගාල්ල සැලසුම් ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ යෝග්‍යතාවය

වර්තමාන පොලිස් බැරක්ක භූමිය ගාල්ල නගරයේ පිහිටා ඇත. මහගාල්ල නගර සංවර්ධන සැලැස්ම යටතේ ආර්ථික වටිනාකමක් හා වාණිජ විභවයක් ඇති පොලිස් බැරක්ක භූමිය වර්තමානයේ ඌන උපයෝගී කර ගෙන ඇති බැවින් හා ගොඩනැගිලි දැඩි ලෙස අබලන්ව ඇති බැවින් නාගරික සංවර්ධන අධිකාරිය මෙම භූමිය වඩාත් කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනිමට පවත්නා ගොඩනැගිල්ල මහල් 02 කින් සමන්විත නිවාස ඒකක 08ක් හා එක් නිවාස ඒකකයක් 4 කින් සහ නිවාස 32 ක් පවතී. භූමි ප්‍රමාණය අක්කර 4.2 ක් පමණ වේ

ව්‍යාපෘති සංරචක

1. හෝටල් සංවර්ධනය
2. වාණිජ සංවර්ධන.

ව්‍යාපෘති අරමුණු

1. ඉහළ ආර්ථික වටිනාකමක් සහිත භූමිය ප්‍රශස්ථයට ගැනීම
2. නගර මධ්‍යයේ වාණිජ අවකාශය වැඩි කිරීම.
3. වාහන නැවැත්වීම් අවකාශ වැඩි කිරීම.
4. වාණිජ අවකාශ සහ සංචාරක කටයුතු ඒකාබද්ධ කිරීම
5. නගර අලංකරණය වැඩි දියුණු කිරීම

අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රතිපාදනය

1. නේවාසික දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා ඉඩකඩ වෙන් කිරීම මගින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම
2. වාණිජ අවකාශයන්, විවෘත අවකාශ සහ වාහන නැවැත්වීමේ පහසුකම් සැපයීම.
3. නගර ආකර්ෂණය වැඩි දියුණු කිරීම

මූල්‍ය සැලැස්ම

ඇස්තමේන්තුගත පිරිවැය - රු .284.00 කි

සටහන: ඉහත ඇස්තමේන්තුගත පිරිවැය වෙනස් විය හැකිය

රූපය: 6.7.7 - යෝජිත පොලිස් බැරක් භූමිය පුනරුත්තාපනය කිරීම

මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ,2016

6. යෝජිත ඔරොප්පුවත්ත චතුරස්‍ර නිර්මාණ ව්‍යාපෘතිය - ගාල්ල නගර මධ්‍යස්ථාන සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතියේ යෝග්‍යතාවය

ගාල්ල මහනගර සභා බල ප්‍රදේශය ඉහළ වෙළඳපල විභවයක් ඇති නගරය ඓතිහාසික එළවළු වෙළෙඳපොළ මෙම ප්‍රදේශයට තුළ පිහිටා ඇති අතර ඓතිහාසික එළවළු වෙළඳපොළේ සුදුසු ප්‍රතිස්ථාපනයට (ලන්දේසි පුරාවිද්‍යා ස්වරූපය) පත් කිරීම සඳහා සංරක්ෂණය කිරීමට හා නැවත භාවිතට ගැනීමට යෝජිතය. පවත්නා ඓතිහාසික එළවළු වෙළෙඳපොළ ගොඩනැගිල්ල අබලන්ව හා ඌන භාවිතයේ පවතී. මීට අමතරව, ගොඩනැගිලිවල යටත් විජිත උරුමයන් සහ පුරාවිද්‍යාත්මක ලක්ෂණ සංරක්ෂණය කළ යුතුය. මෙය ආර්ථික හා සංවර්ධන හා ඌන භාවිත රාජ්‍ය දේපල සංවර්ධන උපාය මාර්ගය යටතේ සංරක්ෂණය කිරීමට හා නැවත සංවර්ධනය කිරීමට මහගාල්ල නගර සංවර්ධන සැලැස්ම යටතේ හඳුනා ගෙන ඇත. එබැවින්, සංරක්ෂණය කිරීම හා එළවළු වෙළඳපල හා ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති යෝජනා කර ඇත. මෙම ඉඩම ගාල්ල නගර සභාව සතු වන අතර, ආසන්න වශයෙන් අක්කර 01 ක් පමණ වේ.

ව්‍යාපෘති සංරචක

1. එළවළු වෙළෙඳපොළ
2. පොදු විවෘත චතුරස්‍රය

ව්‍යාපෘති අරමුණු

1. ඌන භාවිත භූමි ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම
2. ගොඩනැගිල්ලේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ලක්ෂණ සංරක්ෂණය කිරීම.
3. වාණිජ අවකාශය හා ප්‍රජා ඉඩමට විවෘත ඉඩමක් ලබා දීම - මහජනතාවට වාණිජ ඉඩකඩ හා විවෘත අවකාශ ලබා දීම
4. නගරයට වාහන නැවැත්වීම ලබා දීම - වාහන නැවතුම් ස්ථාන ලබා දීම
5. නගර ආර්ථිකය වැඩි කිරීම
6. අනවසර ඉදිකිරීම් පාලනය කිරීම.

අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රතිලාභ

1. ඌන භාවිතා ඉඩම් ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම හා ඓතිහාසික පුරාවිද්‍යාත්මක ලක්ෂණ සංරක්ෂණය කිරීම.
2. වෙළඳාම සඳහා වාණිජ අවකාශය ලබා දීම. වෙළඳාම් කරන්නන් සඳහා විශේෂයෙන් සුනාමියෙන් අවතැන් වූ වෙළඳුන් සඳහා තාවකාලිකව ලබා දුන් කැකිරිබොක්කවත්ත ඉඩම්වල (කැකිරිබොක්කවත්ත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම)
3. නගරයට / ගාල්ල මහ නගර සභාවට ආදායම ලබා ගැනිම
4. නගරයට රථවාහන නැවතුම් ඉඩකඩ

මූල්‍ය සැලැස්ම (දළ වියදම් ඇස්තමේන්තුව)

වගුව ***6.7.6.*** මූල්‍ය සැලැස්ම

ක්‍රියාකාරකම	පිරිවැය (රු: මිලියන)
ගොඩනැගිලි සංරක්ෂණය කිරීම	285.0
ඉදිකිරීම් සඳහා	300.0
මුළු පිරිවැය	**585.0**

සටහන: ඉහත දළ ඇස්තමේන්තු පිරිවැය වෙනස් විය

මූලාශ්‍රය :නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල,2019

රූපය 6.7.8: යෝජිත ඔරොප්පුවත්ත චතුරස්‍ර නිර්මාණ ව්‍යාපෘතිය - පිහිටීම



මූලාශ්‍රය : උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ,2016

7. යෝග භාවනා මධ්‍යස්ථානය - කඳවුරු බිම සංවර්ධනය - රුමස්සල

ව්‍යාපෘතියේ යෝග්‍යතාවය

මහගාල්ල සංවර්ධන සැලැස්මෙන් ස්වභාවික සංරක්ෂණය හා විනෝදාත්මක ක්‍රියාකාරකම් ප්‍රදේශයක් ලෙස සැලකෙන රුමස්සල හඳුනාගෙන ඇත. දිනපතා 1000-1500 කට ආසන්න පිරිසක් රුමස්සලට ස්වභාවික පරිසරය හා එහි දර්ශනීය පරිසරය විඳීමට පැමිණේ. සංචාරකයින් සඳහා පොදු පහසුකම් නිසිලෙස නොමැතිකම සහ එවැනි ක්‍රියාකාරකම් සංචාරක කර්මාන්තයේ ප්‍රශස්ථ භාවිතයට ගෙන නොමැති වීම සංචාරක කර්මාන්තයට බලපෑම් ඇති කර ඇත. එබැවින් යෝජිත යෝග භාවනා මධ්‍යස්ථානය, පාසැල් ළමුන් සඳහා කඳවුරු බිම් සහ ගල් කඳු තරණය කිරීම වැනි ක්‍රියාකාරකම් රුමස්සල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

යෝග භාවනා මධ්‍යස්ථානය සහ කඳවුරු බිම් කුළුණු කන්ද පන්සල ආසන්නයේ පිහිටා ඇත. පරිසර හිතකාමී ව්‍යුහයන් ඉදිකිරීම, භූ දර්ශනය කිරිම, ඇවිදින මංතීරු වැනි පහසුකම් සැලසුම් කිරීමට යෝජිතය.

ව්‍යාපෘති සංරචක

1. පරිසර හිතකාමී යෝග භාවනා මධ්‍යස්ථානය
2. කඳවුරු බිම්
3. ඇවිදින මංතීරු

ව්‍යාපෘති අරමුණු

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ සමාජ සංවර්ධනය හා භූමි අලංකරණ සංවර්ධනය සමඟ ස්වභාවික පරිසරය සංරක්ෂණය කිරීමේ ප්‍රදේශයක් ලෙස පවත්වාගෙන යාමයි.

ව්‍යාපෘති ප්‍රතිඵල

1. පාසල් මට්ටමේ සිට පරිසර හිතකාමී ක්‍රියාකාරකම් වර්ධනය කිරීම
2. සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම
3. හබරාදුව ප්‍රාදේශීය සභාවේ ආදායම් වර්ධනය කිරීම
4. රක්ෂිත ඉඩම් ආරක්ෂා කිරීම

මූල්‍ය සැලැස්ම

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 20

සටහනඃ ඇස්තෙම්න්තුගත පිරිවැය වෙනස් විය හැකිය

යෝජිත ව්‍යාපෘති භූමිය හා ව්‍යාපෘති සැලැස්ම

රූපය 6.7.9ඃ යෝජිත යෝග මධ්‍යස්ථානය

මූලාශ්‍රය : *Google Images, 2019*

රූපය 6.7.10: රුමස්සල යෝජිත ව්‍යාපෘති



මූලාශ්‍රය :නාගරික සංවර්ධන අධිකාරිය ගාල්ල,2019

8. රූමස්සල ඕලන්ද ඇළ ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

උණවටුන යනු ගාලු නගරය ආසන්නයේ පිහිටි ලොව සුප්‍රසිද්ධ සංචාරක කලාපයකි. මේ ප්‍රදේශයේ ප්‍රධාන ගැටළුව වන්නේ දැනටමත් දූෂණය වූ ඕලන්ද ඇලයි. කසළ එකතු කිරීම, අප ජලය සහ කාණු පද්ධති එකතු වීම මෙයට ප්‍රධාන හේතුවයි. එබැවින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නාගරික සංවර්ධන අධිකාරිය සමග ඒකාබද්ධව පුනරුත්ථාපන ව්‍යාපෘතියක් යෝජනා කර ඇත. නාගරික සංවර්ධන අධිකාරිය මඟින් එහි භූ දර්ශනය කිරීම් හා ඇවිදින මංතීරු වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් සකස් කරනු ඇත.

ව්‍යාපෘති සංරචක

ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීම

ව්‍යාපෘති අරමුණු

1. මුහුදු දර්ශනය සඳහා විවෘත ප්‍රදේශය සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම
2. විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ විවෘත අවකාශයන් සඳහා භූමි සංවර්ධනය සමඟ ස්වභාවික පරිසරය ප්‍රතිසංවර්ධනය කිරීම.
3. සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම
4. විවේක කටයුතු වැඩි දියුණු කිරීම

ව්‍යාපෘති ප්‍රතිඵල

1. ව්‍යපෘතියේ සමාජ ප්‍රගමනය වැඩිදියුණු කිරීම
2. සංචාරක ආකර්ෂණය වැඩි කිරීම
3. හබරාදූව ප්‍රාදේශීය සභාවේ ආදායම ඉහළ නැංවීම

මූල්‍ය සැලැස්ම

ඇස්තමේන්තුගත පිරිවැය - මිලියන 265

සටහන: ඉහත ඇස්තමේන්තුගත පිරිවැය විස්තර වෙනස් විය හැකිය

යෝජිත ව්‍යාපෘති භූමිය සහ ව්‍යපෘති නිර්මාණය

රූපය 6.7.8: යෝජිත ඇළ මාර්ග ප්‍රතිසංවර්ධන ව්‍යපෘතිය

මූලාශ්‍රය : *Google Images, 2019*

09. මහජන රථ ගාල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘති සංරචක

උණවටුන ගාල්ල නගරයට ඉතා ආසන්නතම තදබදයක් සහිත සංචාරක මධ්‍යස්ථානයකි. දිනකට 1500 ක් පමණ උණවටුන සංචාරක කලාපයට පැමිණෙමින් සිටී. උණවටුන නෑමට සහ හිරුරැස් විඳීමට යන ස්ථානයක් ලෙස සංචාරකයන් භාවිතා කරති. කෙසේ වුවද, සංචාරකයන්ට විධිමත් කාණු පද්ධති නොමැති වීම, වාහන නැවැත්වීම සහ පොදු පහසුකම් ප්‍රමාණවත් නොවීම ගැටළුවක් වී ඇත. රථගාල් නැවතුම් භූ දර්ශනය සමඟ සැලසුම් කිරීම මඟින් සංචාරක ආකර්ශනය ප්‍රවර්ධනය කළ හැක.

ව්‍යාපෘති අරමුණු

- මාර්ග ආරක්ෂාව හා වීදි මත වාහන නැවැත්වීමේ බලපෑම අවම කිරීම සඳහා විනෝදාත්මක කටයුතු සහ භූ දර්ශන සංවර්ධනය සමග විවෘත ප්‍රදේශ සංවර්ධනය කිරීම.
- දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම.
- යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා විනෝද හා විවේක පහසුකම් ප්‍රවර්ධනය කිරීම
- හබරාදුව ප්‍රාදේශීය සභාවේ ආර්ථිකය නංවාලීම

ව්‍යාපෘති ප්‍රතිඵල

- මහජනතාව සඳහා රථගාල් පහසුකම් ඇති කිරීම
- පවතින විවෘත අවකාශ සංරක්ෂණය කිරීම
- සංචාරක ආකර්ෂණය වැඩි කිරීම
- හබරාදුව ප්‍රාදේශීය සභාවේ ආර්ථිකය ඉහළ නැංවීම

මූල්‍ය සැලැස්ම

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 0.55
සටහනඃ ඇස්තෙමින්තුගත පිරිවැය වෙනස් විය හැකිය

10. ඇවිදින මංතීරු වැඩි දියුණු කිරීම සහ කඳු නැගීම

ව්‍යාපෘති සංරචක

උණවටුන ප්‍රදේශය තුළ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා විනෝද කටයුතු ප්‍රමාණවත් නොවීම හඳුනා ගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- ඇවිදින මංතීරු
- පොදු පහසුකම් වැඩි දියුණු කිරීම

ව්‍යාපෘති ප්‍රතිඵල

- විනෝදාස්වාද සහ විවේක කටයුතු සංවර්ධනය කිරීම
- සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම
- සමාජ ප්‍රගමනය වැඩිදියුණු කිරීම
- පවත්නා ස්වභාවික පරිසරය ප්‍රවර්ධනය කිරීම
- විවේක කටයුතු සඳහා රජයේ රක්ෂිත ඉඩම් භාවිතා කිරීම
- සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම
- හබරාදුව ප්‍රාදේශීය සභාවේ ආර්ථිකය ඉහළ නැංවීම

මූල්‍ය සැලැස්ම

ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 30
සටහන: ඇස්තෙම්න්තුගත පිරිවැය වෙනස් විය හැකිය

රූපය 6.7.10 යෝජිත ඇවිදින මංතීරු වැඩි දියුණු කිරීම සහ කඳු නැගීම

මූලාශ්‍රය : *Google Earth & Google Images, 2019*

6.8 ආයතනික සැලැස්ම

සංවර්ධන සැලැස්මේ නම : මහ ගාල්ල නගර සංවර්ධන සැලැස්ම

වගුව ***6.7.7.*** සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයතනික සැලැස්ම

සැලැස්ම	උප සැලසුම් සහ ක්‍රියාකාරී ව්‍යාපෘති	අදාළ ආයතන (ඇමුණුම 01 බලන්න)	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ වගකීම
"සේවා සැලැස්ම" (සමාජ හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ගය යටතේ)	උප සැලැස්ම - ජනාවාස සංවර්ධන සැලැස්ම ක්‍රියාකාරී ව්‍යාපෘතිය 01 - නේවාසික සංවර්ධනය සඳහා නේවාසික කලාප 03 ක් ප්‍රවර්ධනය කිරීම	1. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2. නාගරික සංවර්ධන-අධිකාරිය	1. ශක්‍යතා විශ්ලේෂණය කිරීම 2. මූලික සැලසුම් නිරාකරණය
	ක්‍රියාකාරී ව්‍යාපෘතිය 02 - නේවාසික කලාප සහ සංවර්ධන කොරිඩෝව අතර සම්බන්ධතා ඇති කිරීම (DGC)	1. මාර්ග සංවර්ධන අධිකාරිය 2. බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව 3. අක්මීමන ප්‍රාදේශීය සභාව	1. ශක්‍යතා විශ්ලේෂණය කිරීම 2. -එම - 3. -එම -
ප්‍රවාහන සැලැස්ම	උප සැලැස්ම - ප්‍රවාහන සැලැස්ම ක්‍රියාකාරී ව්‍යාපෘතිය 01 - ගින්-තාට සහ වලහන්දූව සම්බන්ධ වන මංතීරු හතරක් වන ලෙස මාර්ගය පුළුල් කිරීම (3 වන තරංග මාර්ගය)	1. මාර්ග සංවර්ධන අධිකාරිය 2. ගාල්ල මහ නගර සභාව	ශක්‍යතා විශ්ලේෂණය කිරීම
	ක්‍රියාකාරී ව්‍යාපෘතිය 02 - මංතිරු අතුරු මාර්ගයක් නිර්මාණය කිරීම (1 වන තරංග මාර්ගය)	1. මාර්ග සංවර්ධන අධිකාරිය 2. ගාල්ල මහ නගර සභාව	ශක්‍යතා විශ්ලේෂණය කිරීම නඩත්තු කිරීම
	ක්‍රියාකාරී ව්‍යාපෘතිය 03 - ගාලු පාර සිට අධිවේගී පිවිසුම් මාර්ගය දක්වා (තරංග මාර්ගය) මාර්ගයක් නිර්මාණය කිරීම	1. මාර්ග සංවර්ධන අධිකාරිය 2. ගාල්ල මහ නගර සභාව	ශක්‍යතා විශ්ලේෂණය කිරීම නඩත්තු කිරීම
ජල සම්පාදන සැලැස්ම	උප සැලැස්ම - ක්‍රියාකාරී ව්‍යාපෘතිය 01 - භූගත ජලනල පද්ධතිය වැඩිදියුණු කිරීම	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWS & DB)	ශක්‍යතා විශ්ලේෂණය කිරීම
	උප සැලැස්ම - ක්‍රියාකාරී ව්‍යාපෘතිය 02 - ජල සම්පාදන පොම්ප ධාරිතාව පුළුල් කිරීම	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWS & DB)	ශක්‍යතා විශ්ලේෂණය කිරීම
ජලාපවහන හා අප ජලය සැලැස්ම	උප ව්‍යාපෘතිය - අප ජල කළමණාකරන ව්‍යාපෘතිය ක්‍රියාකාරී ව්‍යාපෘතිය 01 - (SHIFT ව්‍යාපෘතිය)	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWS & DB)	- ශක්‍යතා විශ්ලේෂණය කිරීම - සුදුසු ඉඩමක් හඳුනා ගැනීම

සැලැස්ම	උප සැලසුම් සහ ක්‍රියාකාරී ව්‍යාපෘති	අදාළ ආයතන (ඇමුණුම 01 බලන්න)	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ වගකීම
ආර්ථික සැලැස්ම	උප සැලැස්ම - සංචාරක කළමනාකරණය සැලැස්ම ක්‍රියාකාරී ව්‍යාපෘතිය 01 - මහමෝදර වැව ජල ගම්මානය	ගාල්ල මහ නගර සභාව	අධීක්ෂණය සහ නඩත්තු කිරීම
	ක්‍රියාකාරී ව්‍යාපෘතිය 02 - මහමෝදර රෝහල් භූමිය සහ අධි සංචාරක ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා හඹී ඉඩම පුනර්ජනනය කිරීම	වාරිමාර්ග දෙපාර්තමේන්තුව නාගරික සංවර්ධන අධිකාරිය - සංචාරක මණ්ඩලය	1. ශක්‍යතා විශ්ලේෂණය කිරීම 2. සැලසුම් කිරීම සහ අනුමත කිරීම 3. ශක්‍යතා විශ්ලේෂණය කිරීම
කලාපයට අදාල පොදු නියමතා	කුඹුරු බිම් ලෙස පවත්වා ගැනීම හා අනෙකුත් සංවර්ධනයන්ට අවසර නොදීය යුතුය. සෑම සංවර්ධන කටයුත්තක් සඳහාම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

8.11.2. අවසරලත් භාවිතයන්

වගුව 8.11.2 පාරිසරික කලාපය - කුඹුරු කලාපයේ අවසරලත් භාවිතයන්

පහත සඳහන් භාවිතයන් සඳහා පමණක් මෙම කලාපයේ අවසර දෙනු ලැබේ	
1	ස්වභාවික උද්‍යාන
2	ස්වභාවික මං තීරු
3	පරිසර හිතකාමී සංචාරක කටයුතු
4	ජල රැඳවුම් ප්‍රදේශ

සටහන :- මෙම කලාපය තුළ ඉහත සඳහන් භාවිතයන් සහ ඊට සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සලකා බලනු ලැබේ.

08 වන පරිච්ඡේදය

යෝජිත කලාපීකරණ සැලැස්ම

රූමස්සල සංරක්ෂණ කලාපය

අවසරලත් භාවිතයන්

8.12. රූමස්සල සංරක්ෂණ කලාපය

8.12.1.කලාපීකරණ නියමතා

ඔවගුව 8.12.1 : රූමස්සල සංරක්ෂණ කලාපය

සංවර්ධන කලාපය	රූමස්සල සංරක්ෂණ කලාපය
කලාප අර්ථකථනය	පාරිසරික සංරක්ෂණ කලාපයක් වන අතර පාරිසරික හිතකාමී ක්‍රියාකාරකම් සඳහා සහ රූමස්සල නියමතා සැලැස්මේ රෙගුලාසි වලට අනුකූල මිශ්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා උනන්දු කරවීම අපේක්ෂා කෙරේ
කලාප මායිම් (භූ ඛණ්ඩාංක)	ඇමුණුම 6 පරිශීලනය කරන්න
කලාප සංගුණකය	අදාළ නොවේ
අනුමත උස සීමාව	රූමස්සල නියමතා සැලැස්මට අනුකූල විය යුතුය. අනුමත බිම් කට්ටි ආවරණය රූමස්සල නියමතා සැලැස්මට අනුකූල විය
කලාපයට අදාල පොදු නියමතා	රූමස්සල නියමතා සැලැස්මේ මාර්ගෝපදේශන රෙගුලාසි බලාත්මක වේ

සටහන :- මෙම කලාපය තුළ ඉහත සඳහන් භාවිතයන් සහ ඊට සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සලකා බලනු ලැබේ.

8.13. හරිත ප්‍රවර්ධන කලාපය

8.13.1.කලාපීකරණ නියමතා

වගුව 8.13.1 : හරිත ප්‍රවර්ධන කලාපය

සංවර්ධන කලාපය	හරිත ප්‍රවර්ධන කලාපය
කලාප අර්ථකථනය	ජෛව විවිධත්වයෙන් අධික තෙත්බිම් සහිත පාරිසරික සංවේදී කලාප-යක්වේ.එබැවින් පාරිසරික සංවේදී සංචාරක කටයුතු (අඩු ඝනත්වයකින්) සංවර්ධනය කිරීමට හා හරිත ආවරණ හා ජලාශ සංරක්ෂණය කිරීමටත් අපේක්ෂා කෙරේ (නීල හරිත සංවේදී කලාපය)
කලාප මායිම් (භූ ඛණ්ඩාංක)	ඇමුණුම 6 පරිශීලනය කරන්න
කලාප සංගුණකය	0.96
අනුමත උස සීමාව	කලාප සංගුණකය හා නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි අනුව තීරණය කළ යුතුය
අනුමත බිම් කට්ටි ආවරණය	35%
කලාපයට අදාල පොදු නියමතා	i. නාගරික සංවර්ධන අධිකාරිය තීරණය කරනු ලබන සංවර්ධනයන් සඳහා පහත සඳහන් අදාල ආයතනවලින් මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබා ගත යුතුය.නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ අදාල අනෙකුත් ආයතන 2. දැනට පවත්නා කුඹුරු ඉඩම් ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යා යුතුය. 3. දක්ෂිණ අධිවේගී පිවිසුම් මාර්ගය ආරම්භයේ සිට ගාල්ල - මාතර ප්‍රධාන මාර්ගය දිගේ එරමුදුගහ හන්දිය දක්වා ආවරණය වන මීටර් 300.0 ක කලාපය සඳහා රූමස්සල සංවර්ධන ප්‍රවර්ධන කලාපයේ (උප කලාපය) නියමතාවයන් බල පැවැත්වේ 4. ඉහත (අංක 3) ට අදාල සියළුම යෝජිත සංවර්ධනයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබා ගත යුතුය. 5. ඉහත පොදු නියමතා මහ ගාල්ල බල ප්‍රදේශයේ බෝපේ - පෝද්දල බල ප්‍රදේශයට අයත් අංක 111 නරාවල,111 ඒ- මගදෙණිය,111 බී- පන්විල, 111-සී වලවත්ත, ,111-ඩී බාස්වත්ත, 111-ඊ අද්දරගොඩ,111 එෆ්- මුලන නැගෙනහි-ර,111ජී- මුලන බටහිර, 117 පෝද්දල, 117 ඒ- මීපාවල,117 බී පන්නමග යන ග්‍රාම නිලධාරි වසම් සඳහා ද බල පැවැත්වේ.

8.13.2. අවසරලත් භාවිතයන්

වගුව 8.13.2 හරිත ප්‍රවර්ධන කලාපයේ අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
නේවාසික	නිවාස ඒකක	150	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	ළමා නිවාස	500	
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	500	
පොදුබව	වෛද්‍ය මධ්‍යස්ථාන	250	
වාණිජ	සුපිරි වෙළඳසැල්	500	
	ඔසුසැල්	150	
	කඩ සාප්පු	150	
	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	150	
	මත්පැන් අලෙවිසැල්	150	
	අවන්හල්	150	

08 වන පරිච්ඡේදය

යෝජිත කලාපීකරණ සැලැස්ම

හරිත ප්‍රවර්ධන කලාපය

අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
අධ්‍යාපන	පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	500	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	සංස්කෘතික මධ්‍යස්ථාන	500	
ආයතන	බැංකු හා රක්ෂණ ආයතන	300	
	වෘත්තීය කාර්යාල	150	
නිෂ්පාදන කර්මාන්ත	ආහාර හා මධ්‍යසාර නොවන පානවර්ග කර්මාන්ත ශාලා	500	
	ගෘහාශ්‍රිත කර්මාන්ත	250	
	මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත (අවම පාරිසරික හානියක් සහිත)	500	
සේවා කර්මාන්ත	ලොන්ඩරි / රෙදි සේදුම් ස්ථාන	250	
	කුලි රථ සේවා මධ්‍යස්ථාන	150	
සමාජ සේවා හා පොදු කටයුතු	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	150	
	පුස්තකාල	150	
	සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	500	
විවේක හා විනෝද කටයුතු	කෞතුකාගාර	500	
	පොකට් උද්‍යාන	-	
	රේඛීය උද්‍යාන		
සංචාරක	ආගන්තුක නිවාස	150	
	ලැගුම්හල්	150	
	ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන (ස්පා)	250	
	සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	150	
	සංචාරක හෝටල්	500	

සටහන :- මෙම කලාපය තුළ ඉහත සඳහන් භාවිතයන් සහ ඊට සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සලකා බලනු ලැබේ.

8.14.කෘෂි ආර්ථික කටයුතු කලාපය

8.14.1.කලාපීකරණ නියමතා

8.14.1 : වගුව කෘෂි ආර්ථික කටයුතු කලාපය

සංවර්ධන කලාපය	කෘෂි ආර්ථික කටයුතු කලාපය
කලාප අර්ථකථනය	අඩු ඝනත්වයක් සහිත සංවර්ධනයක් අපේක්ෂා කරනු ලබන අතර කෘෂි කර්මය ආශ්‍රිත කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදීම අරමුණ වී ඇත.
කලාප මායිම් (භූ ඛණ්ඩාංක)	ඇමුණුම 6 පරිශීලනය කරන්න
කලාප සංගුණකය	0.5
අනුමත උස සීමාව	කලාප සංගුණකය හා නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි අනුව තීරණය කළ යුතුය
අනුමත බිම් කට්ටි ආවරණය	35 %
කලාපයට අදාල පොදු නියමතා	1. අවම බිම් කට්ටි ප්‍රමාණය පර්. 40. 0 ක් විය යුතුය. පර්. 40. 0 ට වඩා අඩු බිම් කට්ටි සඳහා අනු බෙදුම් වලට අවසර දෙනු නොලැබේ. 2. අනෙකුත් සියලු ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලට අනුකූල විය යුතුය

8.14.2.අවසරලත් භාවිතයන්

වගුව 8.14.2 කෘෂි ආර්ථික කටයුතු කලාපයේ අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
නේවාසික	නිවාස ඒකක	150	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	500	
සෞඛ්‍යය	වෛද්‍ය මධ්‍යස්ථාන	250	
	ආයුර්වේද මධ්‍යස්ථාන	250	
	රසායනාගාර හා සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථානය	150	
වාණිජ	ඔසුසැල්	500	
	කඩ සාප්පු	150	
	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	150	
	අවන්හල්	150	
	තොග වෙළඳම	500	
	ගබඩා (කෘෂි නිෂ්පාදන)	500	
	වාහන අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන	150	
අධ්‍යාපන	පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	500	
ආයතන	බැංකු හා රක්ෂණ ආයතන	300	
	වෘත්තීය කාර්යාල	150	

08 වන පරිච්ඡේදය

යෝජිත කලාපීකරණ සැලැස්ම

කෘෂි ආර්ථික කටයුතු කලාපය

අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
නිෂ්පාදන කර්මාන්ත	ආහාර හා මධ්‍යසාර නොවන පානවර්ග කර්මාන්ත ශාලා	500	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	ගෘහාශ්‍රිත කර්මාන්ත	150	
	කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත (අපනයන බෝග/සුළු අපනයන බෝග)	500	
සේවා කර්මාන්ත	ලොන්ඩරි / රෙදි සේදුම් ස්ථාන	250	
	කුලි රථ සේවා මධ්‍යස්ථාන	150	
සමාජ සේවා හා පොදු කටයුතු	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	150	
	පුස්තකාල	150	
	සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	500	
සංචාරක	ආගන්තුක නිවාස	150	
	ලැගුම්හල්	150	
	ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන (ස්පා)	250	
විවේක හා විනෝද කටයුතු	පොකට් උද්‍යාන	-	
	රේඛීය උද්‍යාන	-	
	නාගරික උද්‍යාන	-	

සටහන :- මෙම කලාපය තුළ ඉහත සඳහන් භාවිතයන් සහ ඊට සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සලකා බලනු ලැබේ.

8.15. ප්‍රවාහන කටයුතු කලාපය

8.15.1.කලාපීකරණ නියමතා

වගුව 8.15.1 : ප්‍රවාහන කටයුතු කලාපය

සංවර්ධන කලාපය	ප්‍රවාහන කටයුතු කලාපය
කලාප අර්ථකථනය	ප්‍රවාහන කටයුතු සමඟ මිශ්‍ර වාණිජ සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලද කලාපයයි
කලාප මායිම් (භූ ඛණ්ඩාංක)	ඇමුණුම 6 පරිශීලනය කරන්න
කලාප සංගුණකය	3.02
අනුමත උස සීමාව	කලාප සංගුණකය හා නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි අනුව තීරණය කළ යුතුය
අනුමත බිම් කට්ටි ආවරණය	80% - නේවාසික නොවන 65% - නේවාසික
කලාපයට අදාල පොදු නියමතා	අවශ්‍ය රථවාහන නැවතුම් ස්ථාන පහසුකම් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි වලට අනුකූල විය යුතුය

8.15.2. අවසරලත් භාවිතයන්

වගුව 8.15.2 ප්‍රවාහන කටයුතු කලාපයේ අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
නේවාසික	නිවාස ඒකක	150	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	නිවාස සංකීර්ණ	500	
	නේවාසිකාගාර	500	
	නිල නිවාස	150	
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	150	
සෞඛ්‍යය	වෛද්‍ය මධ්‍යස්ථාන	250	
	රසායනාගාර සහ සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථානය	150	
	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	250	
	සත්ත්ව සායන ප්‍රතිකාර මධ්‍යස්ථාන	250	
වාණිජ	සුපිරි වෙළඳසැල්	500	
	සාප්පු සංකීර්ණ	500	
	ඔසුසැල්	150	
	කඩ සාප්පු	150	
	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	150	
	මත්පැන් අලෙවිසැල්	150	
	අවන්හල්	150	
	බහු මහල් වාහන නැවතුම් ස්ථාන	1000	
	උත්සව ශාලා	1000	
	විවෘත වෙළඳසැල්	500	
	ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳසැල්	500	
	විවෘත වාහන නැවතුම්හල්	250	
	ගොඩනැගිලි මත දුරකථන සම්ප්‍රේෂණ කුළුණු	150	

08 වන පරිච්ඡේදය

යෝජිත කලාපීකරණ සැලැස්ම

ප්‍රවාහන කටයුතු කලාපය

අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
වාණිජ	ගෑස් පිරවුම් හල් සහ විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන	1000	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	ඉන්ධන පිරවුම්හල් සහිත වෙළඳ සංකීර්ණ	1500	
	ඉන්ධන පිරවුම්හල් සහ වාහන සේවා මධ්‍යස්ථාන	1500	
	ඉන්ධන පිරවුම්හල්	750	
	ප්‍රදර්ශනාගාර	300	
	ගබඩා		
අධ්‍යාපන	පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	500	
	සංස්කෘතික මධ්‍යස්ථාන	1000	
	වෘත්තීය පුහුණු ආයතන	500	
	පුද්ගලික උපකාරක පන්ති	1000	
	අධ්‍යාපනික ආයතන	250	
ආයතන	බැංකු හා රක්ෂණ ආයතන	300	
	වෘත්තීය කාර්යාල	150	
	කාර්යාල සංකීර්ණ	500	
	කාර්යාල	150	
නිෂ්පාදන කර්මාන්ත	ආහාර හා මධ්‍යසාර නොවන පානවර්ග කර්මාන්ත ශාලා	500	
	ගෘහාශ්‍රිත කර්මාන්ත	250	
	මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත (අවම පාරිසරික හානියක් සහිත)	500	
සේවා කර්මාන්ත	ලොන්ඩරි / රෙදි සේදුම් ස්ථාන	250	
	කුලි රථ සේවා මධ්‍යස්ථාන	1000	
	ඇඹරුම්හල්	250	
	වාහන අළුත්වැඩියා මධ්‍යස්ථාන / වාහන පින්තාරු කිරීම	500	
	වෑල්ඩින් වැඩපල /පෑස්සුම් වැඩපල	150	
	විදුලි උපකරණ අළුත්වැඩියා ස්ථාන	500	
සමාජ සේවා හා පොදු කටයුතු	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	150	
	පුනරුත්ථාපන මධ්‍යස්ථාන	150	
	පුස්තකාල	500	
සංචාරක	ආගන්තුක නිවාස	150	
	හෝටල්	500	
	සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	500	
	කබානා හෝටල්	150	
විවේක හා විනෝද කටයුතු	රංග ශාලා	500	
	ගෘහස්ථ ක්‍රීඩාංගණ	500	
	පොකට් උද්‍යාන	-	
	රේඛීය උද්‍යාන	-	
	නාගරික උද්‍යාන	-	
	ශරීර සුවතා මධ්‍යස්ථාන	300	

සටහන :- මෙම කලාපය තුළ ඉහත සඳහන් භාවිතයන් සහ ඊට සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සලකා බලනු ලැබේ.

8.16. පරිපාලන කටයුතු කලාපය

8.16.1.කලාපීකරණ නියමතා

වගුව 8.16.1 : පරිපාලන කටයුතු කලාපය

සංවර්ධන කලාපය	පරිපාලන කටයුතු කලාපය
කලාප අර්ථකථනය	පරිපාලන කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දීම හා මිශ්‍ර සංවර්ධනයක් අපේක්ෂා කෙරේ
කලාප මායිම් (භූ ඛණ්ඩාංක)	ඇමුණුම 6 පරිශීලනය කරන්න
කලාප සංගුණකය	3.37
අනුමත උස සීමාව	කලාප සංගුණකය හා නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි අනුව තීරණය කළ යුතුය
අනුමත බිම් කට්ටි ආවරණය	65% - නේවාසික 80% - නේවාසික නොවන
කලාපයට අදාල පොදු නියමතා	අවශ්‍ය රථවාහන නැවතුම් ස්ථාන පහසුකම් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි වලට අනුකූල විය යුතුය

8.16.2. අවසරලත් භාවිතයන්

වගුව 8.16.2 පරිපාලන කටයුතු කලාපයේ අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
නේවාසික	නිවාස ඒකක	150	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	නිවාස සංකීර්ණ	500	
	ළමා නිවාස	500	
	නිල නිවාස	150	
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	150	
පොදුවේ	වෛද්‍ය මධ්‍යස්ථාන	250	
	රසායනාගාර සහ සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථාන	150	
	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	250	
වාණිජ	සුපිරි වෙළඳසැල්	500	
	ඔසුසැල්	150	
	කඩ සාප්පු	150	
	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	150	
	මත්පැන් අලෙවිසැල්	150	
	අවන්හල්	150	
	බහු මහල් වාහන නැවතුම් ස්ථන	1000	
	විවෘත වාහන නැවතුම් ස්ථන	250	
	ගොඩනැගිලි මත දුරකථණ සම්ප්‍රේෂණ කුළුණු	150	
	ඉන්ධන පිරවුම්හල්	1000	
	ඉන්ධන පිරවුම්හල් සහිත වෙළඳ සංකීර්ණ	1500	
	ඉන්ධන පිරවුම්හල් සහ වාහන සේදුම් ස්ථාන	1500	
	ගෑස් පිරවුම් හල් සහ විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන	750	

යෝජිත කලාපීකරණ සැලැස්ම

පරිපාලන කටයුතු කලාපය

අවසරලත් භාවිතයන්

08 වන පරිච්ඡේදය

යෝජිත කලාපීකරණ සැලැස්ම

පරිපාලන කටයුතු කලාපය

අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
අධ්‍යාපන	පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	500	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	වෘත්තීය පුහුණු ආයතන	1000	
	පුද්ගලික උපකාරක පන්ති	500	
	වෙනත් අධ්‍යාපනික ආයතන	250	
ආයතන	බැංකු හා රක්ෂණ ආයතන	300	
	වෘත්තීය කාර්යාල	150	
	කාර්යාල සංකීර්ණ	500	
	කාර්යාල	150	
	රජයේ සහ රාජ්‍ය අනුබද්ධ කාර්යාල සහ පොදු ගොඩනැගිලි	1000	
නිෂ්පාදන කර්මාන්ත	ආහාර හා මධ්‍යසාර නොවන පානවර්ග කර්මාන්ත ශාලා	500	
	ගෘහාශ්‍රිත කර්මාන්ත	250	
	මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත (අවම පාරිසරික හානියක් සහිත)	500	
සේවා කර්මාන්ත	ලොන්ඩරි / රෙදි සේදුම් ස්ථාන	250	
	කුලි රථ සේවා මධ්‍යස්ථාන	150	
සමාජ සේවා හා පොදු කටයුතු	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	150	
	පුනරුත්ථාපන මධ්‍යස්ථාන	500	
	ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	1000	
සංචාරක	ආගන්තුක නිවාස	150	
	හෝටල්	500	
	සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	150	
	කබානා හෝටල්	500	
	ලැගුම්හල්	150	
විනෝද හා විනෝද කටයුතු	රංග ශාලා	500	
	ගෘහස්ථ ක්‍රීඩාංගණ	500	
	ශරීර සුවතා මධ්‍යස්ථාන	300	
	පොකට් උද්‍යාන	-	
	රේඛීය උද්‍යාන	-	

සටහන :- මෙම කලාපය තුළ ඉහත සඳහන් භාවිතයන් සහ ඊට සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සලකා බලනු ලැබේ.

8.17. නාවික කටයුතු කලාපය

8.17.1.කලාපීකරණ නියමතා

වගුව 8.17.1 : නාවික කටයුතු කලාපය

සංවර්ධන කලාපය	නාවික කටයුතු කලාපය
කලාප අර්ථකථනය	වරාය ආශ්‍රිත සංචාරක කටයුතු හා වාණිජ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට යෝජිතය
කලාප මායිම් (භූ ඛණ්ඩාංක)	ඇමුණුම 6 පරිශීලනය කරන්න
කලාප සංගුණකය	2.98
අනුමත උස සීමාව	මීටර් 15 - දෘශ්‍යතා විශ්ලේෂනය අනුව අහස් රේඛාව වේ
අනුමත බිම් කට්ටි ආවරණය	80% - නේවාසික නොවන 65% - නේවාසික
කලාපයට අදාල පොදු නියමතා	අවශ්‍ය රථවාහන නැවතුම් ස්ථාන පහසුකම් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි වලට අනුකූල විය යුතුය

8.17.2. අවසරලත් භාවිතයන්

වගුව 8.17.2 නාවික කටයුතු කලාපයේ අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
නේවාසික	නිවාස ඒකක	150	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	නිල නිවාස	150	
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	150	
සෞඛ්‍යය	වෛද්‍ය මධ්‍යස්ථාන	250	
	රසායනාගාර සහ සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථාන	150	
	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	250	
වාණිජ	සුපිරි වෙළඳසැල්	500	
	ඔසුසැල්	150	
	කඩ සාප්පු	150	
	අවන්හල්	150	
	ඉන්ධන පිරවුම්හල්	1000	
	ගෑස් පිරවුම් හල් සහ විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන	750	
	වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම්	-	
අධ්‍යාපන	බැංකු හා රක්ෂණ ආයතන	300	
	වෘත්තීය කාර්යාල	150	
ආයතන	ලොන්ඩරි / රෙදි සේදුම් මධ්‍යස්ථාන	250	
	කුලි රථ සේවා මධ්‍යස්ථාන	150	
	වාහන සේවා මධ්‍යස්ථාන	1000	
	වාහන අළුත්වැඩියා මධ්‍යස්ථාන	500	
	විදුලි උපකරණ අළුත්වැඩියා මධ්‍යස්ථාන	150	

08 වන පරිච්ඡේදය

යෝජිත කලාපීකරණ සැලැස්ම

නාවික කටයුතු කලාපය

අවසරලත් භාවිතයන්

අවසර දෙනු ලබන භාවිතයන්		අවම ඉඩම් ප්‍රමාණය (ව.මී)	අත්කර ගත හැකි උපරිම බිම් ප්‍රමාණය
සමාජ සේවා හා පොදු කටයුතු	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	150	වගුව අංක 7.3.1 අනුව විය යුතුය
	පුස්තකාල	150	
සංචාරක	ආගන්තුක නිවාස	150	
	හෝටල්	150	
	ලැගුම් හල්	500	
විවේක හා විනෝද කටයුතු	ගෘහස්ථ ක්‍රීඩාංගණ	500	
	ශරීර සුවතා මධ්‍යස්ථාන	300	
	පොකට් උද්‍යාන	-	
	රේඛීය උද්‍යාන	-	
		-	

සටහන :- මෙම කලාපය තුළ ඉහත සඳහන් භාවිතයන් සහ ඊට සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සලකා බලනු ලැබේ.

ගාලු කොටුව සංරක්ෂණ කලාපය

8.18. ගාලු කොටුව සංරක්ෂණ කලාපය

8.18.1.කලාපීකරණ නියමතා

වගුව 8.18.1 : ගාලු කොටුව සංරක්ෂණ කලාපය

සංවර්ධන කලාපය	ගාලු කොටුව සංරක්ෂණ කලාපය
කලාප අර්ථකථනය	ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ගාලු කොටුවේ ගෘහ නිර්මාණ ශිල්පිය ලක්ෂණ හා පුරා විද්‍යාත්මක හා ඉතිහාසගත ලක්ෂණ නැවත ස්ථාපිත කිරීම හා සංරක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ
කලාප මායිම් (භූ ඛණ්ඩාංක)	ඇමුණුම 6 පරිශීලනය කරන්න
කලාප සංගුණකය	අදාළ නොවේ
අනුමත උස සීමාව	ගාලු කොටුව සඳහා අති විශේෂ නියමතා සැලැස්මේ නියමතාවලට අනුකූල විය යුතුය
අනුමත බිම් කට්ටි ආවරණය	ගාලු කොටුව සඳහා අති විශේෂ නියමතා සැලැස්මේ නියමතාවලට අනුකූල විය යුතුය
කලාපයට අදාල පොදු නියමතා	ගාලු කොටුව විශේෂ නියමතා සැලැස්මේ නියමතා රෙගුලාසි වලට අනුකූලව ගාලු කොටුව තුළ සියළුම සංවර්ධනයන් සඳහා ගාලු උරුම සැලසුම් අනුකම්වුවේ මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබා ගත යුතුය ගාලු කොටුව විශේෂ නියමතා සැලැස්මේ නියමතා රෙගුලාසි හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නීති රෙගුලාසි වලට යටත්ව අවසර දීම සලකා බලනු ලැබේ.

නව වන
පරිච්ඡේදය

සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි

9.1.රුමස්සල පාරිසරික ආරක්ෂණ කලාපය

9.1.1.හැඳින්වීම

පාරිසරික සංවේදී කලාපයකින් දර්ශනීය කඳු පද්ධතියකින්, විවිධ ශාක වර්ගවලින් සමන්විත අලංකාරවත් නැරඹුම් පථයකින් සහ දර්ශනීය නැරඹීමේ ස්ථාන වලින් ද සමන්විත සොබා දහමේ අනගි දායාදයක් ලෙස රුමස්සල හැඳින්විය හැකිය. මෙකී සුවිශේෂී ලක්ෂණ හේතුවෙන් සංචාරක කලාපයක් ලෙස රුමස්සල වර්තමානයේ සීඝ්‍රයෙන් දියුණු වන අතර, ආයෝජකයින් ද මෙම කලාපය තුළ ආයෝජනය සඳහා පවතින නැඹුරුතාවය සීඝ්‍රයෙන් වර්ධනය වී ඇත. පුරා වෘත්තයන්හි කියවෙන පරිදි රුමස්සල ප්‍රදේශය හනුමා දෙවියන් විසින් හිමාලයේ සිට රැගෙන එන ලද ඖෂධීය ශාක අඩංගු ප්‍රදේශයෙන් කඩා වැටුණු කොටසක් වන අතර, රුමස්සල කඳු මුදුනෙහි පිහිටා ඇති හනුමන් කෝවිල දැනටමත් දක්නට ලැබෙන අතර, වාර්ෂිකව බැතිමතුන් සමූහයක් විවිධ උත්සව හා වන්දනාමාන මෙම ස්ථානයේ සිදු කරනු ලැබේ.

රූපය ***9.1.:*** රුමස්සල පිහිටීම

මූලාශ්‍රය***:*** *Google Earth,2020*

මෑත කාලයේදී රුමස්සල ප්‍රදේශය සංචාරක සංවර්ධන කටයුතු සඳහා විශාල ඉල්ලීමක් පැවතීම හේතුවෙන් ස්වාභාවික හරිත ලක්ෂණයන් හායනයට ලක් වී ඇත. ඒ නිසා මහ ගාල්ල සංවර්ධන සැලැස්ම මඟින් මෙම බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ප්‍රකාශයට පත් කරන ලද අතර, අනාගතය සඳහා ස්වාභාවික ඓතිහාසික හා ආවේනික වටිනාකම් ආරක්ෂා කර ගැනීම සඳහා මාර්ගෝප-දේශන සැලැස්මක අවශ්‍යතාවය හඳුනා ගෙන තිබේ. තවද නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස වෙරළේ සිට කි. මී. 01 ක ප්‍රදේශයක් දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති අතර, වෙරළේ ස්ථිර තුරුලතා මායිමේ සිට මීටර් 50. 0 ක් ගැඹුරට බොනවිස්ටා කොරල් පරය දක්වා වනජීවී ප්‍රදේශයක් ලෙස ද නම් කර ඇත.

9.1.2.අරමුණ

1.සාගරයෙන් ඉස්මතුව දර්ශනය වන හරිත කඳු පද්ධතියෙහි දර්ශනය සහ ඓතිහාසික ස්ථාන, ආවේනික ලක්ෂණයන් සහ ඒවායේ ගැටලු හඳුනා ගැනීම සහ ඒවා සංරක්ෂණය කිරීම සඳහා පියවර ගැනීම.

2.ඉහත අරමුණු 1 සාක්ෂාත් කර ගැනීම සඳහා සංවර්ධන කටයුතු සඳහා මාර්ග උපදේශන මාලාවක් සකස් කිරීම.

3.දේශීය හා විදේශීය සංචාරකයින්ට ආකර්ශනය වන ප්‍රධාන ස්ථාන සංරක්ෂණය කිරීම හා ඒවා සංවර්ධනය කිරීම සහ එම ස්ථාන අතර, ඇවිදීමේ පහසුකම් සංවර්ධනය කිරීම.

9.1.3. නියමතා සැලැස්මෙහි විෂය පථය

නාගරික සංවර්ධන අධිකාරි නීතියේ සම්පාදන කර ඇති විධිවිධාන යටතේ දර්ශන පථය සහ දර්ශනීය ස්ථාන රැක ගැනීම සඳහා විධිවිධාන සැලසීම ස්වභාවික හරිත තීරු ආරක්ෂා කර ගැනීම සඳහා විධිවිධාන සැලසීම ඓතිහාසික ස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා මූලිකවම රුමස්සල විශේෂ නියමතා කලාපයේ මඟ පෙන්වීම් සකස් කර ඇත.

රුමස්සල මාර්ගෝපදේශ සැලැස්මේ මූලිකව මහ ගාල්ල සංවර්ධන සැලැස්ම ප්‍රකාරව අතිවිශේෂ ගැසට් අංක 1421/29 සහ 2005.12.01 දිනැති ගැසට් පත්‍රයේ සහ වෙරළ තදාසන්නව කි. මී.01 ක් ප්‍රකාශයට පත් කළ 223/16 හා 1982. 12. 17 දිනැති ගැසට් පත්‍රයේ සඳහන් බල ප්‍රදේශ සඳහා මෙම මාර්ගෝපදේශන බලපානු ලැබේ. තවද මෙම බල ප්‍රදේශයෙන් කොටසක් වෙරළ සංරක්ෂණ පනත සහ වනජීවී සංරක්ෂණ පනත යටතේ නිර්වචනය වී ඇති බල ප්‍රදේශ වේ.මෙම මාර්ගෝපදේශන සැලැස්ම තුළ උප කලාප 04 කට අයත් මිණුම් දක්වා ඇති අතර, මාර්ගෝපදේශන සපයා ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ නිර්වචනය වී ඇති සංවර්ධන කටයුතු සඳහා අදාල වේ. මෙම මාර්ගෝපදේශන සකස් කර ඇත්තේ දර්ශන පථය සමෝච්ඡ රේඛා, බෑවුම්, ඉඩම් පරිහරණය, පාරිසරික සංවේදීතාවය, ගොඩනැගිලි ඝනත්වය පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනයන් මතය.

9.1.4. පොදු නියමතා රෙගුලාසි

1) රුමස්සල විශේෂ ආරක්ෂණ කලාපය තුළ පහත සඳහන් භාවිතයන් සඳහා අවසර දෙනු නොලැබේ.

i' කර්මාන්ත (සංචාරක කටයුතු සඳහා සිදු කරනු ලබන හස්ත කර්මාන්ත ශාලා සහ පාරිසරික හානියක් ගෙන දෙන]දුෂ්‍යකාරක යන්ත්‍ර භාවිතා කරනු ලබන කර්මාන්ත)

ii' කළුගල් කැඩීමේ කර්මාන්තය, ඛනිජ කැනීම හා පස් කැපීම

iii. දුරකථන කුළුන

iv' ගබඩා සහ ගුදම්

සියළුම දැන්වීම් පුවරු හා ප්‍රචාරක පුවරු සඳහා අවසර ලබා නොදෙන අතර ගොඩනැගිල්ලේ

2) බාහිර පෙනුමට අවහිර නොවන ආකාරයට සවි කර ඇති නාම පුවරු සඳහා පමණක් අවසර දෙනු ලැබේ.

3) පස් කැණීම, පස් කැපීම හා ඉඩම් ගොඩකිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

4) තද වර්ණ, අධික දීප්තිමත් වර්ණ සහ කැපී පෙනෙන වර්ණ සහ පරාවර්තන ද්‍රව්‍ය භාවිතය නොකළ යුතුය. පරිසර හිතකාමී වර්ණ සහ ඉදිකිරීම් ද්‍රව්‍ය භාවිතය කරනු ලැබිය හැකිය.

5) වහල සඳහා පැතලි කොන්ක්‍රීට් තට්ටු මත උද්‍යාන වගාව හා හරිත ආවරණය සඳහා ඉඩ දෙනු ලැබේ.

6) කොළ පැහැති දැල් ආවරණ හෝ දැවයෙන් සකස් කරන ලද විනිවිද පෙනෙන තීරු සහ වැටවල් හැර අනෙකුත් සියළුම මායිම් තාප්ප සඳහා අවසර ලබාදෙනු නොලැබේ.

7) සෑම ගොඩනැගිල්ලකම මාර්ගයට මුහුනත යෙදෙන පැත්ත සහ ගාල්ල - කොටුව ප්‍රදේශයට දර්ශනය වන ගොඩනැගිලි වල මුහුණත හරිත ආවරණයකින් වසා දැමිය යුතුය.

8) රුමස්සල විශේෂ නියමතා ප්‍රදේශයේ සියළුම සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයක් ලබා ගත යුතුය.

9) අදාල අවස්ථාවන්හිදී මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය,ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යන ආයතනවල නිර්දේශ ලබා ගත යුතුය.

10) මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය සඳහා සැලසුම් ඉදිරිපත් කරන විටදී වෘක්ෂ සංරක්ෂණය ඇතුළුව භූ දර්ශන සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

11) සියළුම සංවර්ධන කටයුතු වලදී ගොඩනැගිලි නිර්මාණයක් නම් වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු ද, ඉංජිනේරු කටයුත්තක් නම් වරලත් සිවිල් ඉංජිනේරුවරයෙකු ද, ඉඩම් සංවර්ධන කටයුත්තක් නම් බලයලත් මිනින්දෝරු වරයෙකු සහ වරලත් නගර නිර්මාණ ශිල්පියෙකු විසින් සැලසුම් සකස් කර අනුමැතිය හා මූලික සැලසුම් නිරාකරණය සඳහා ඉදිරිපත් කළ යුතුය.

12) ඇවිදින මංතීරු, නැරඹුම් කුටි, විවේක ප්‍රදේශ සහ සංචාරකයින් සඳහා පොදු පහසුකම් සඳහා අවසර දෙනු ලැබේ.

13) බොනවිස්ටාව, යද්දෙහිමුල්ල, වැල්ලේ දේවාලය වටරවුම් මාර්ගය හැර අනෙකුත් සියළුම නව මාර්ග හෝ මාර්ග පුළුල් කිරීම් සඳහා ඉඩ දෙනු නොලැබේ.

14) සෑම සංවර්ධන කටයුත්තකදීම යාබද දේපල මායිම් වලට අවම වශයෙන් එක් පසකින් මීටර් 2.25 කුත් අනෙක් පසින් මීටර් 1 කුත් තැබිය යුතුය

15) පෞරාණික ගොඩනැගිලි සහ ඓතිහාසික ස්ථාන සඳහා මීටර් 10 ක රක්ෂිත කලාපයක් පවත්වා ගත යුතුය.

සිතියම 9.1 රුමස්සල කලාපීයකරණ සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, ගාල්ල 2020

9.1.5 සංවර්ධන කලාප

රූමස්සල විශේෂ සංරක්ෂණ ප්‍රදේශය සඳහා මාර්ගෝපදේශන සැලැස්මේ පහත සඳහන් ප්‍රධාන කලාප 4 කින් සමන්විත වේ.

1) ස්වාභාවික සංරක්ෂණ කලාපය
2) පාලිත සංවර්ධන කලාපය
3) අන්තර් මධ්‍ය සංවර්ධන කලාපය
4) සංවර්ධන ප්‍රවර්ධන කලාපය

සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි

රූමස්සල පාරිසරික ආරක්ෂණ කලාපය

9.1.5.1 ස්වාභාවික සංරක්ෂණ කලාපය

9.1.5.1.1.කලාපීකරණ නියමතා

වගුව 9.1.5.1 : ස්වාභාවික සංරක්ෂණ කලාපය

ස්වාභාවික සංරක්ෂණ කලාපය

කලාප අංකය	RSCA I
සංවර්ධන කලාපය	රූමස්සල විශේෂ ආරක්ෂණ කලාපය
උප කලාපය	ස්වාභාවික සංරක්ෂණ කලාපය
කලාප නිර්වචනය	ඉහත කලාපය තුළ පිහිටා ඇති ඉඩම් වල වැඩි හරිත ඝනත්වයක් හා පාංශු ඛාදනයට සිදු වීමට ඉඩ ඇති අධික බෑවුම් සහිත ස්වභාවයක්, කඳු මුදුන්, තෘණ භූමි සහ ගාල්ල කොටුව සහ අධිවේගී පිවිසුම් මාර්ගයට මනස්කාන්ත දර්ශනයක් සහිත ලක්ෂණවලින් සමන්විත වේ. එබැවින් මෙම කලාපය තුළ ස්වාභාවික පරිසරය සහ භූගෝලීය පිහිටීම සහ හරිත ආවරණයට බලපෑමක් ඇති නොවීමට සංවර්ධන කටයුතු දැඩි ලෙස පාලනය කෙරේ.
කලාප මායිම්	ඇමුණුම් අංක 6
කලාප සංගුණකය	-
අවසර දෙනු ලබන උපරිම උස	-
අවසර දෙනු ලබන ගෙබිම් ආවරණ ප්‍රතිශතය	-
පොදු නියමතා	1. පවත්නා හරිත ලක්ෂණය ඒ ආකාරයෙන්ම පවත්වා ගත යුතුය. 2. පවත්නා ගොඩනැගිලි වල දීර්ඝ කිරීම් සඳහා ඉඩ දෙනු නොලැබේ. 3. මායිම් තාප්ප හා වැටවල් සඳහා අවසර දෙනු නොලැබේ. 4. පවත්නා පාසැල් තවදුරටත් පුළුල් කිරීමට ඉඩදෙනු නොලැබේ. 5. ඉඩම් එළිපෙහෙලි කිරීම දැඩි ලෙස තහනම් වේ. 6. සෑම සංවර්ධන කටයුත්තක් සඳහාම රූමස්සල සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්මෙහි 9.1.4හි පොදු නියමතා රෙගුලාසි පරිශීලනය කළ යුතුය

9.1.5.1.2 අවසර දෙන ලද භාවිතයන්

1. ස්වාභාවික උද්‍යාන සහ විවෘත ප්‍රදේශ

2. පරිසර කටයුතු පිළිබඳ අධ්‍යයනයන්

3. ස්වාභාවික මාර්ග, අඩි පාරවල් සහ තුරු අතර යකඩෙන් හා දැවමය වශයෙන් නිම කරන ලද පදික මංතීරු

4. විනෝද චාරික සහ පක්ෂි නැරඹුම් කුළුණු

5. ස්වාභාවික පරිසර හිතකාමී සංචාරක කටයුතු

6. තාවකාලික කඳවුරු ඉදිකිරීමේ ස්ථාන - උපරිම බිම් ආවරණ ප්‍රතිශතය 5% දැවමය නිමාවකින් යුත් තනිමහල් ගොඩනැගිලි (උපරිම උස මීටර් 4. 5 ක් දක්වා වහලය සහිතව)

7. භාවනා මධ්‍යස්ථාන - උපරිම බිම් ආවරණ ප්‍රතිශතය 5% දැවමය නිමාවකින් යුත් තනිමහල් ගොඩනැගිලි - උස මීටර් 5

8. අභ්‍යවකාශ සහ සාගර නැරඹුම් මධ්‍යස්ථාන

9.1.5.2 පාලිත සංවර්ධන කලාපය

9.1.5.2.1කලාපීකරණ නියමතා

වගුව 9.1.5.2 : පාලිත සංවර්ධන කලාපය

කලාප අංකය	**R S C A 11**
සංවර්ධන කලාපය	රූමස්සල විශේෂ ආරක්ෂණ කලාපය
උප කලාපය	පාලිත සංවර්ධන කලාපය
කලාප නිර්වචනය	ගාල්ල කොටුව සඳහා දර්ශනය වන රූමස්සල කඳු මුදුනෙහි මීටර් 60 ට වඩා උසින් පිහිටි ස්ථාන සහ අධික බෑවුම් සහිත හරිත තීරුව මෙම කලාපයට අයත්ය .මෙම කලාප දෙක අතර උසෙහි සැලකිය යුතු වෙනසක් නොමැති බැවින් සහ ගාලු කොටුව දෙසට දර්ශනය වන බැවින් හරිත ආවරණයට වඩා උස් වූ ගොඩනැගිලි සංවර්ධන කටයුතු දර්ශනය වීමට හැකියාවක් පවතී. ඒ නිසා කඳු මුදුන් හා හරිත තීරුව (Green Patch) අතර වෙනසක් නොමැති බැවින් හා වඩාත් උස් වූ ගොඩනැගිලි අයහපත් ආකාරයට දර්ශනය වීමට ඉඩ ඇත
කලාප මායිම්	ඇමුණුම් අංක 6
කලාප සංගුණකය	-
අවසර දෙනු ලබන උපරිම උස	පවතින ශාක ආවරණ මට්ටම (Canopy level) හෝ බිම් මට්ටමේ සිට උපරිම උස මීටර් 7.5 යන මට්ටම් වලින් අඩු උස සඳහා අවසර දෙනු ලැබේ.
අවසර දෙනු ලබන ගෙබිම් ආවරණ ප්‍රතිශතය	35%
පොදු නියමතා	1. මායිම් තාප්පය සඳහා අවසර දෙනු නොලැබේ. 2.ගොඩනැගිලි වර්ණ යොදා ගනු ලබන ද්‍රව්‍ය අවට ප්‍රදේශයේ පවත්නා හරිත ස්වභාවය සමඟ සැසඳිය යුතුය. 3. අවම බිම් ප්‍රමාණය පර්. 40 . 0 ක් විය යුතුය. 4. රජයේ ඉඩම් වල වාණිජ භාවිතයන් ඉදිකිරීම් සඳහා යොදා ගැනීමට ඉඩ දෙනු නොලැබේ. 5. අවම වශයෙන් දෙපස මායිම් සඳහා මීටර් 3. 0 ක ඉඩක් පවත්වා ගත යුතුය. 6. රජයේ කාර්යාල සඳහා අවසර දෙනු නොලැබේ 7.සෑම සංවර්ධන කටයුත්තක් සඳහාම රූමස්සල සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්මෙහි 9.1.4හි පොදු නියමතා රෙගුලාසි පරිශීලනය කළ යුතුය

9.1.5.2.2 අවසර දෙන ලද භාවිතයන්

1. නේවාසික ගොඩනැගිලි

2. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෙර පාසැල් - උපරිම ගෙබිම් ප්‍රමාණය වර්ග මීටර් 50 ට නොවැඩි විය යුතුය

3. කුඩා පරිමාණයේ සිල්ලර වෙළඳ සැල් හා දුරකථන පහසුකම් සැපයීම් මධ්‍යස්ථාන

4. ප්‍රජා මධ්‍යස්ථාන, විවෘත ප්‍රදේශ විවේක හා විනෝද කටයුතු

5. ආගමික ස්ථාන

6. පැළ තවාන් මධ්‍යස්ථාන

7. ගෘහාශ්‍රිත ආගන්තුක නිවාස

9.1.5.3 අන්තර් මධ්‍ය සංවර්ධන කලාපය

9.1.5.3.1.කලාපීකරණ නියමතා

වගුව 9.1.5.3 : අන්තර් මධ්‍ය සංවර්ධන කලාපය

කලාප අංකය	**R S C A 111**
සංවර්ධන කලාපය	රූමස්සල විශේෂ ආරක්ෂණ කලාපය
උප කලාපය	අන්තර් මධ්‍ය සංවර්ධන කලාපය
කලාපීයකරණ නිර්වචනය	මෙම කලාපය පිහිටා ඇත්තේ කඳු මුදුන් ප්‍රදේශය පාලිත සංවර්ධන ප්‍රදේශය, හරිත තීරුව සහ සංවර්ධන ප්‍රවර්ධන කලාපය අතර වන බැවින් සහ ගාලු කොටුව දෙසට දර්ශනය නොවන බැවින් දැඩි සංවර්ධන පාලනයක් හෝ උස පාලනය කිරීම සඳහා නිර්නායක යෙදීම අවශ්‍ය නොවේ. නමුත් මෙම කලාපය තුළ තරමක නායයෑමට හැකි සහ බෑවුම් ස්වභාවයේ ඉඩම් පිහිටා ඇති බැවින් අන්තර් මධ්‍යය සංවර්ධන පාලන උපක්‍රම යෙදිය යුතුවේ.
කලාප මායිම්	ඇමුණුම් අංක 6
කලාප සංගුණකය	-
අවසර දෙන ලද උස	G + 2 උපරිම උස පොළොව මට්ටමේ සිට වහලද සමඟ මීටර් 11. 5 ක්
අවසර දෙන ලද බිම් ආවරණ ප්‍රතිශතය	50%
පොදු නියමතා	අවම බිම් ප්‍රමාණය පර්. 20.0 ක් විය යුතුය. (තවදුරටත් අනුබෙදුම් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ) සෑම සංවර්ධන කටයුත්තක් සඳහාම රූමස්සල සංවර්ධන මාර්ගෝප-දේශන සැලැස්මෙහි 9.1.4හි පොදු නියමතා රෙගුලාසි පරිශීලනය කළ යුතුය

9.1.5.3.2 අවසර දෙන ලද භාවිතයන්

1.පාලිත සංවර්ධන කලාපය අවසර දෙනු ලබන භාවිතයන් සඳහා අවසර දෙනු ලැබේ

2.ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථාන

3.පාරිසරික සංචාරක කටයුතු

4.කුඩා පරිමාණයේ සිල්ලර වෙළඳ සැල් හා සන්නිවේදන මධ්‍යස්ථාන - උපරිම ගෙබිම් ප්‍රමාණය වර්ග මීටර් 50 නොඉක්මවිය යුතුය

5.විලා ආගන්තුක නිවාස - අවම බිම් ප්‍රමාණය පර්. 40 විය යුතුය

9.1.5.4 සංවර්ධන ප්‍රවර්ධන කලාපය

9.1.5.4.1.කලාපීකරණ නියමතා

ඔවගුව 9.1.5.4 සංවර්ධන ප්‍රවර්ධන කලාපය

කලාප අංකය	**R S C A 1V**
සංවර්ධන කලාපය	රුමස්සල විශේෂ ආරක්ෂණ කලාපය
උප කලාපය	සංවර්ධන ප්‍රවර්ධන කලාපය
කලාපීයකරණ නිර්වචනය	මෙම කලාපය තුළ මූලික වශයෙන් පවත්නා ඉඩම් උණවටුන වෙරළට හා ගාල්ල -මාතර ප්‍රධාන මාර්ගයට මුහුණ දී පිහිටා ඇත. එබැවින් සංචාරක කටයුතු සහ මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා ඉහළ විභවතාවයක් මෙම ඉඩම් වලට පවති.
කලාප මායිම්	ඇමුණුම් අංක 6
කලාප සංගුණකය	-
අවසර දෙනු ලබන උපරිම උස	උණවටුන මුහුදු තීරයට මුහුණලා මීටර් 15 ක උපරිම උසකුත් ගාල්ල - මාතර ප්‍රධාන මාර්ගයට මුහුණලා මීටර් 15 උපරිම උසකුත් සඳහා අවසර දෙනු ලැබේ.
අවසර දෙනු ලබන ගෙබිම් ආවරණ ප්‍රතිශතය	60%
පොදු නියමතා	මායිම් තාප්ප සඳහා අවසර දෙනු නොලැබේ. සෑම සංවර්ධන කටයුත්තක් සඳහාම රුමස්සල සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්මෙහි 9.1.4හි පොදු නියමතා රෙගුලාසි පරිශීලනය කළ යුතුය

9.1.5.4.2 අවසර දෙන ලද භාවිතයන්

1.ආගන්තුක නිවාස

2.ආපන ශාලා/උත්සව ශාලා/හොටෙල්

3.ස්වර්ණාභාරණ සාප්පු

4.වාණිජ කටයුතු

5.බැංකු/ රක්ෂණ ආයතන

6.මහජන රැස්වීම් ස්ථාන/ එළිමහන් රංග පීඨ

7.නේවාසික/ නිවාස සංකීර්ණ/පොදු ගොඩනැගිලි

8.ඔසු සැල්/ බෙහෙත් ශාලා

9.පාරිභෝගික සේවා මධ්‍යස්ථාන

10.වෘත්තිය කාර්යාල

11.නාගරික උද්‍යාන

12.කායවර්ධන මධ්‍යස්ථාන/ගෘහස්ථ ක්‍රීඩාංගණය

13.දිවා සුරැකුම් මධ්‍යස්ථාන/පෙර පාසැල්

14.නිවාඩු නිකේතන (මපපැර යමළ)

15.වාහන නැවතුම් ස්ථාන

16.භාවනා මධ්‍යස්ථාන හා කාය වර්ධන මධ්‍යස්ථාන

17.පිහිනුම් තටාක

9.2.ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශය

9.2.1.කලාපියකරණ සැලසුම

සිතියම 9.2. ගාල්ල කොටුව කලාපියකරණ සැලසුම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, ගාල්ල 2020

09 වන පරිච්ඡේදය

සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි

9.2.2. සැලසුම් නියෝග - ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශය

(අ) මෙම නියෝගය "ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම" ප්‍රදේශය සඳහා වන (ගොඩනැගිලි හා සැලසුම්) විශේෂ නියෝග වශයෙන් හඳුන්වනු ලැබේ.

ගාල්ල කොටුව කලාපියකරණ සැලසුම

(ආ) මෙම නියෝග 1997 අගෝස්තු මස 07 වන දින අංක 987/12 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් ප්‍රකාශිත "ගාලු විශේෂ නියාමන ප්‍රදේශයේ" සීමා ඇතුළත අදාල විය යුතුය.

මෙම නියෝගය මගින් "ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටුබැම්ම" ප්‍රදේශය ඇතුළත යම් සංවර්ධන කටයුත්තකට අදාල කළ යුතු නියෝග 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වන වගන්තිය යටතේ සැලසුම් හා ගොඩනැගිලි නියෝග පනවනු ලබන අතර එසේ වුවද එවැනි සංවර්ධන කටයුත්තක් සඳහා 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධන පනතේ 8 එ ෂ වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් එහිලා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ මහගාල්ල සංවර්ධන බල ප්‍රදේශය සඳහා සකසන ලද සැලසුම් හා ගොඩනැගිලි නියෝගවල ඇතුළත් නියම වලට අතිරේකව විය යුතුය.

ගාලු උරුම සැලසුම් අනුකමිටුවේ ව්‍යුහය හා පිහිටුවීම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා සතු බලතල අනුව පහත සඳහන් ආයතනවල සාමාජිකයින් ගෙන් හා විශේෂිත දැනුමැති (ලෝක උරුමයන් සුරැකීම සම්බන්ධ) පුද්ගලයින්ගෙන් සමන්විත ගාලු උරුම සැලසුම් කමිටුව පිහිටු විය හැක.

- නාගරික සංවර්ධන අධිකාරිය - සභාපතිත්වය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ගාලු උරුමය පදනම
- ගාල්ල මහ නගර සභාව
- මධ්‍යම සංස්කෘතික අරමුදල
- මධ්‍යම පරිසර අධිකාරිය
- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- සංරක්ෂණය සම්බන්ධ විශේෂඥයින්
- වාස්තු විද්‍යාව සම්බන්ධ විශේෂඥයින්
- ව්‍යුහ ඉංජිනේරු

9.2.2.1. සංරක්ෂණ කලාපය I

(අ) සියළුම ගොඩනැගිලි නිර්මාණය සහ ස්මරණ ආරක්ෂා කිරීම සංරක්ෂණය කිරීම හා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු අතර, කාර්යක්ෂම හා ආර්ථික වශයෙන් ශක්‍ය ආකාරයට දේපල නියමාකාරයෙන් පරිහරණය කරන බවට සහතික විය යුතුය.

(ආ) නව ඉදිකිරීම්, වැඩි දියුණු කිරීම්, ප්‍රතිනිර්මාණය , යම් ගොඩනැගිල්ලක අභ්‍යන්තර හෝ බාහිර පෙනුමේ වෙනස් කිරීම් හෝ යම් ගොඩනැගිලි ද්‍රව්‍යයක් ප්‍රතියෝජනය කිරීම් හෝ යම් ආකාරයෙන් කැනීම් වැඩක් සංරක්ෂණය සංවර්ධන සැලැස්මට අනුකූලව කළ යුතුය.

(ඇ) සියළු ඉදිකිරීම් අනුමත සැලැස්මට අනුකූල විය යුතුය. අනුමත සැලැස්මක් නොවේ නම් (අනවසර ඉදිකිරීම්) සංවර්ධනකරු/අයිතිකරු විසින් ගාලු උරුමය සැලසුම් කමිටුව වෙත දින 14 ක් තුළ සැලසුම් අනුමැතියට ඉදිරිපත් කළ යුතු අතර, අනුමැතිය ලැබෙන තෙක් ඉදිකිරීම් වහාම නතර කළ යුතුවේ.

(ඈ) රථවාහන ගාල් කිරීම් ඇතුළු කටයුතු ගාලු උරුමය සැලසුම් කමිටුව මගින් සකස් කර ඇති රථවාහන

02. මූලික සැලසුම් නිෂ්කාශනය

1) සියළුම වර්ගවල සංවර්ධන කටයුතු සඳහා වූ මූලික සැලසුම් නිශ්කාශන නාගරික සංවර්ධන අධිකාරිය මගින් පත් කරනු ලැබූ ගාලු උරුමය සැලසුම් කමිටුවෙන් ලබා ගත යුතුය.

2) සෑම සංවර්ධන කටයුත්තක් සඳහාම සංවර්ධකයා විසින් විධිමත්ව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පතක් සංවර්ධනයට අදාල සියළු තොරතුරු සහ ගොඩනැගිල්ල භාවිතා කිරීමට අදහස් කරන්නේ කුමක් සඳහා ද යන බවද සඳහන් කර ගොඩනැගිලි සැලසුම් පෙරසැරි ගාස්තු ද සහිතව නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කළ යුතුය.

3) සියළුම ගොඩනැගිලි සැලසුම් පහත සඳහන් සුදුසුකම් ලත් පුද්ගලයින් විසින් සකස් කර අත්සන් කළ යුතුය.

- ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ සංගමයේ සාමාජික වරලත් වාස්තු විද්‍යාඥයකු/ගෘහ නිර්මාණ ශිල්පියෙකු විසින් අත්සන් කළ යුතුය.
- ව්‍යුහ ඉංජිනේරු (අවශ්‍ය වේ නම්)

ගාල්ල කොටුව කලාපියකරණ සැලසුම

සංරක්ෂණ කලාපය I

4) සංවර්ධකයා විසින් විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමඟ පහත දැක්වෙන විස්තර ද ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(අ)පවත්නා ගොඩනැගිල්ලේ ඉදිරි පෙනුම දැක්වෙන ඡායාරූප සමඟ දෙපස දැක්වෙන ගොඩනැගිලි වල ඡායාරූප

(ආ)වැඩ බිම හිස්ව පවත්නේ නම් එහි එක් එක් පැත්තට යාබද ඉදිරි පෙනුමේ ඡායාරූප

(ඇ)පවත්නා ගොඩනැගිල්ලේ තිරස් සහ සිරස් කැපුම් සහිත මිනුම් සැලැස්මේ ටිෂු (ට්‍රේසින්) පිටපතක්

(ඉ)ඉදිරි සහ පැති ඉඩකඩ ඇතුළත් පවත්නා ගොඩනැගිල්ලේ ඡායාරූප

(ඊ)ව්‍යුහ සැලැස්ම (අවශ්‍ය වේ නම්)

(එ)ගොඩනැගිලි සැලැස්මේ බිත්ති සම්මත වර්ණ වලින් මුද්‍රිතව සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

පවත්නා බිත්ති	-	නිල් වර්ණය
කඩා ඉවත් කරනු ලබන බිත්ති	-	කොළ වර්ණය
යෝජිත බිත්ති	-	රතු වර්ණය

5) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලැබීමෙන් පසු සියළුම අවශ්‍යතා සම්පූර්ණ කර තිබේ නම් ගාලු උරුමය සැලසුම් කමිටුවේ නිර්දේශ මත එක් මාසයක කාලයක් ඇතුළත මූලික සැලසුම් නිශ්කාශනය නිකුත් කරනු ලැබිය යුතුය

සංවර්ධන අවසර පත්‍රය

(අ) ඉල්ලුම්කරු/අයිතිකරු විසින් විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය, ගොඩනැගිලි සැලසුම්වල පිටපත් 05 ක් මූලික සැලසුම් නිෂ්කාශනය සහිතව නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. සැලසුම් පිළියෙල කරනු ලැබ ඇත්තේ නිශ්චිත නියමයට අනුකූල බවට සෑහීමකට පත් වූ පසු නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව විසින් සංවර්ධන කටයුත්තේ නිරත වීම සඳහා ඉල්ලුම්කරුට/ අයිතිකරුට බලය ලබා දෙමින් අවුරුදු එකක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වූ අදාල සංවර්ධන බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතුය.

(ආ) මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලද සැලසුම් මුල් පිටපත හා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නිකුත් කරන ලද සංවර්ධන අවසර පත්‍රයේ පිටපතක් සංවර්ධන භූමියේ මාර්ගයට මුහුණ ලා ඇති දර්ශනය වන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය. මෙම අවසර පත්‍රය, ඉදිකිරීම් කාල පරිච්ඡේදය මුළුල්ලේම ප්‍රදර්ශනය කිරීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතුය. ගොඩනැගිලි අවසර පත්‍රයේ මුල් පිටපත නිරීක්ෂණය සඳහා සියළු අවස්ථාවන්හිදීම ඉදිකිරීම් ස්ථානයේ තිබිය යුතුය. ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කර ඇති එහෙත් ඉදිකිරීම් නිම කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් හේතු දක්වමින් සහ නියමිත ගාස්තුවක් ගෙවමින් ඉල්ලීමක් කරනු ලැබූ විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් අතිරේක කාල පරිච්ඡේදයක් සඳහා අවසර පත්‍රයේ වලංගු කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකි අතර, එම අතිරේක කාල සීමාව කිසිදු අවස්ථාවක වසර දෙකක් නොඉක්ම විය යුතුය.

04. පෞරාණික වටිනාකම් සහිත ස්ථාන සංරක්ෂණය

(අ) (188 වන අධිකාරිය වූ) පුරාවස්තු ආඥා පනතේ 6 වන වගන්තිය ප්‍රකාර සංවර්ධන කටයුත්තක් සඳහා වැඩ බිම සකස් කිරීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය. එම සුපරීක්ෂණයේදී යම් පුරා වස්තුවක් නිරීක්ෂණය වුවහොත් පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් වහාම ඒ බව නාගරික සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දිය යුතුය. අධිකාරිය විසින් ලබා දී ඇති බලපත්‍රය අවලංගු කරනු ලැබීම සහ ස්වයංක්‍රීය බල රහිත වේ. ඒ අනුව සංවර්ධකයා විසින් නැවත සංශෝධිත සැලැස්ම සළකා බැලීම සඳහා ගාලු උරුමය සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

09 වන පරිච්ඡේදය

සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි

(ආ) අයිතිකරු/සංවර්ධනකරු විසින් සුපරීක්ෂණය සඳහා අදාල ගාස්තු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුය.

(ඇ) ගාලු උරුමය සැලසුම් අනුකමිටුව විසින් උරුම වටිනාකම් සහිත යැයි හඳුනා ගන්නා ලද කිසිඳු ගොඩනැගිල්ලක් බිඳ හෙළීම සඳහා අවසර ලබා දෙනු නොලැබේ.

ගාල්ල කොටුව කලාපියකරණ සැලසුම

04. භාවිතය වෙනස් කිරීම

(අ) ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටුබැම්ම ඇතුළත ප්‍රදේශයේ සියළුම ඉඩම් හිමියන් ඔවුන්ගේ ඉඩම් ගාලු ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම සඳහා සකස් කරන ලද කලාපීකරණ සැලැස්මට අනුකූල විය යුතුය.

සංරක්ෂණ කලාපය I

(ආ) ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශය කලාපීකරණ සැලැස්මට නොගැළපෙන මෙහි සඳහන් භාවිත සඳහා අවසර ලබා දෙනු නොලැබේ. එනම් රාජ්‍ය ආයතන, නිෂ්පාදන කර්මාන්ත සහ ගබඩා.

(ඇ) කඩා ඉවත් කිරීමට යෝජිත සියළුම ගොඩනැගිලි සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය සහ අනුමැතිය ලබා ගත යුතුය.

05. අවසර ලත් භාවිතයන්

1. නේවාසික භාවිතයන්
2. සංචාරකයින් ආශ්‍රිත කර්මාන්ත (හස්ත කර්මාන්ත සහ ප්‍රදර්ශනාගාර)
3. කෞතුකාගාර
4. පිහිනුම් තටාක හෝ ජල පොකුණු රහිත කුඩා ප්‍රමාණයේ හෝටල් (කාමර 20 ට අඩු)
5. සංචාරක සමරු සහ ත්‍යාග මධ්‍යස්ථාන
6. ප්‍රවේශ පත්‍ර අලෙවි ස්ථාන
7. ආගන්තුක නිවාස (කාමර 10 ට අඩු)
8. කුඩා ප්‍රමාණයේ අවන්හල් (උපරිම ව. මී. 50)
9. ලෝක උරුම ගාලු කොටුව සඳහා ගැළපෙන විනෝදාත්මක කටයුතු
10. පොත් සාප්පු (උපරිම ව. මී. 10)
11. කුඩා පරිමාණයේ වෘත්තිමය ව්‍යාපාරික ආයතන (ව. මී. 10 ට වඩා අඩු)
12. කලාගාර
13. කුඩා සාප්පු (ව. මී. 20 ට අඩු)
14. මැණික් හා ස්වර්ණාභරණ සාප්පු හා ඒ ආශ්‍රිත ගෘහස්ථ කර්මාන්ත (ව. මී. 15 ට අඩු)
15. යටත් විජිත යුගයේ ඉදිකරන ලද සහ ආරම්භ කරන ලද භාවිතයන්

06. වාණිජ කටයුතු සඳහා භාවිතය වෙනස් කරනු ලබන නේවාසික ගොඩනැගිලිවල 35% ගෙබිම් ප්‍රමාණයක් නේවාසික කටයුතු සඳහා පවත්වා ගැනීම

07. අවසර නොලත් භාවිතයන්

1. ගරාජ (වාහන නැවතුම්)
2. වාහන අලුත් වැඩියා කිරීමේ ගරාජ
3. වාහන සේවා ස්ථාන
4. ඉන්ධන පිරවුම්හල්
5. ගබඩා
6. කර්මාන්ත, ගොඩනැගිලි හා කාර්මාන්ත
7. සියළුම රජයේ ආයතන (උරුම සංරක්ෂණය දායක ආයතන හැර)
8. නිල නිවාස
9. කාමර 20 ඉක්මවන හෝටල්
10. නව පාසැල් හෝ පවත්නා පාසැල් ගොඩනැගිලි වල එකතු කිරීම් හෝ ව්‍යාප්ත කිරීම්
11. සුපිරි වෙළඳ සැල්
12. ගුදම් හෝ වෙනත් ඒ සමාන ගොඩනැගිලි
13. ගාලු උරුම සැලසුම් කමිටුව මඟින් අවස්ථානුකූලව තීරණය කරනු ලබන වෙනත් භාවිත

08. පවත්නා ගොඩනැගිලි සංවර්ධනය කිරීම

ගොඩනැගිලිවල සියළුම උරුමයන් සහ වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන් සංරක්ෂණය කළ යුතුය. නාගරික සංවර්ධන අධිකාරියේ අවසරයක් නොලබා කරන ලද වෙනස් කිරීම් සහ නවීකරණය කිරීම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනුම් දුන් දින සිට වසරක කාලයක් තුළ මුල් සැලැස-මාකාරව ප්‍රතිනිර්මාණය කළ යුතුය.

සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි

09. සියළුම ගොඩනැගිලි ඉදිරිපස මාර්ගවල රථවාහන ගාල් නොකළ යුතුය.

ගාල්ල කොටුව කලාපියකරණ සැලසුම

10. (අ) ගොඩනැගිලි වල බාහිර පෙනුමට තුඩුදෙන ඉදිරිපස ආලින්දය ආවරණය කිරීමට හෝ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් වීදියකට විශේෂිත ලක්ෂණයක් ගෙන දෙන්නා වූ ගොඩනැගිල්ලේ ඉදිරි ආලින්ද, කුළුණු පේළිය එලෙසම සහ ඉදිරියටත් පවත්වා ගත යුතුය.

සංරක්ෂණ කලාපය I

(ආ) සියළුම පැරණි අත්වැටවල්, කැටයම් ලී කුළුණු, දොරවල් කැටයම් ජනේල, කුඩා ජනේල හෝ වෙනත් විශේෂිත උපාංග වෙනුවට සවි කරනු ලබන නව සවි කිරීම්, මුල් සැලැස්මට අනුකූලව සහ නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය.

11. පවත්නා ගොඩනැගිලි සඳහා කරනු ලබන ඕනෑම ප්‍රතිසංස්කරණයක් එම ගොඩනැගිල්ලට අදාල ඓතිහාසික හෝ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතුය.

12. ගාලු ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම ප්‍රදේශය තුළ පිහිටි සියළුම ඉඩම් ඓතිහාසික ව්‍යුහයන්ට සහ ලක්ෂණවලට ගැළපෙන ආකාරයෙන් සුදුසු ලෙස භාවිතා කළ යුතුය.

13. ගොඩනැගිලි වල උස සහ මුදුන් වහල

(අ) ගාලු ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම ප්‍රදේශය තුළ සංවර්ධනය කිරීමට ඉඩ දෙනු නොලබන ඕනෑම ගොඩනැගිල්ලක උපරිම උස මීටර් 10 නොඉක්ම
විය යුතුය අතර සහ සීමා විය යුතු අතර මහල් දෙකකට (බිම් මහල සහ පළමු මහල) පමණක් සීමා විය යුතුය.
වහල ආවරණය සඳහා සිංහල උළු, රට උළු පමණක් අවසර දෙනු ලැබේ. මහල් උයන් වතු සඳහා අවසර දෙනු නොලැබේ.

(ආ) ගාලු උරුමය සැලසුම් කමිටුවේ සැලසුම් නිරාකරණයකින් තොරව
ගොඩනැගිල්ලේ භෞතික වෙනස් කිරීම් කිසිවක් කරගෙන නොයා යුතුය.

(ඇ) වහල මට්ටමේ සවි කිරීමට යෝජිත සියළුම වතුර ටැංකි, දුරකථන හා රූපවාහිනී සංඥා ඇන්ටෙනා වහලයේ ආවේනික ලක්ෂණ වලට
අවහිරතාවයක් සිදු නොවන පරිදි හා මාර්ගයට දර්ශනය නොවන පරිදි සවි කළ යුතුය.

14. ගොඩනැගිලිවල වර්ණාලේප

ගාලු ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශය සඳහා නියමිත වර්ණ වලට අනුරූපි විය යුතුය.ග

(අ) මේ සඳහා සුදු වර්ණය සමර වර්ණය හැර වෙනත් වර්ණ සඳහා අවසර දෙනු නොලැබේ.

(ආ) දෙමහල් ගොඩනැගිලි තනි වර්ණයකින් පින්තාරු කරනු ලැබිය යුතුය.

(ඇ) මූලික වර්ණය වශයෙන් කැපී පෙනෙන තනි වර්ණයක් ඉදිරිපස තිබිය යුතුය.

(ඈ) විථියක දෙපසට දර්ශනය වන ගොඩනැගිලි වල ඉදිරිපස වර්ණ එකිනෙකට සමගාමී විය යුතුය.

15. ගොඩනැගිලි නිමාව

ගොඩනැගිලි වල සියළු අභ්‍යන්තර හා බාහිර පෙනුම කොටුව ප්‍රදේශය ඇතුළත දැනට පවත්නා පෞරාණික ගොඩනැගිලි නිමාවට අනුකූලව නිම කළ යුතුය.

(අ) ගොඩනැගිල්ලේ ඉදිරි පෙනුම සඳහා පරාවර්තන හා ප්‍රතිබිම්බික වීදුරු යොදා නොගත යුතුය.

(ආ) කම්බි දමා නිම කෙරෙණු ගඩොල් පාවිච්චිය, පිඟන් ගඩොල්, විචිත්‍ර ගඩොල් සහ පාට පැල්ලම් හෝ කැපී පෙනෙන ආකෘති හා නුසුදුසු කපලාරු ආකෘති වලින් යුත් ගඩොල් වලින් වැසීමට අවසර දෙනු නොලැබේ.

(ඇ) යම් වීථියක පිහිටි ගොඩනැගිල්ලක වහලයේ ආනතිය යාබද ගොඩනැගිලිවල වහලයේ ආනතියට අනුරූපී විය යුතුය.

16. ගෙබිම් නිමවුම් පවත්නා ගොඩනැගිලි වල ඓතිහාසික ලක්ෂණ වලට සමගාමී විය යුතුය. ගෙබිම් නිමවුම් සිමෙන්ති, ටෙරාකොටා, ටයිල්, රළු හෝ දීප්තියක් නැති කළුගල් සහ සිමෙන්ති ටයිල් යොදා ගැනීම සඳහා අවසර ලබා දිය හැකිය. කෙසේ වුවද පොළොව මත වර්ණ ආලේප කිරීම අවසර දෙනු නොලැබේ.

ගෙබිම් ප්‍රමාණයේ අනුපාතය = 1. 1.5 අනුපාතය නොඉක්ම විය යුතුය

$$\frac{\text{එක් එක් මහලේ මුළු මහල් වර්ග ප්‍රමාණය}}{\text{ඉඩමේ වර්ග ප්‍රමාණය}}$$

ඉඩම් කැබලි ආවරණ ප්‍රතිශතය = 75%

$$\frac{\text{බිම් මහලේ වර්ග ප්‍රමාණය}}{\text{ඉඩමේ වර්ග ප්‍රමාණය}} \circ 100$$

18. පිහිනුම් තටාක හා පොකුණු

ගාලු ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම ඇතුළත ප්‍රදේශය තුළ ජල පොකුණු සහ පිහිනුම් තටාක සඳහා අවසර දෙනු නොලැබේ.

19. නාමපුවරු සහ දැන්වීම් පුවරු

(අ) සියළු ආකාරයේ දැන්වීම්, සංඥා පුවරු, විශේෂයෙන් කැපී පෙනෙන වඩාත් ප්‍රභාත්මක, නොකඩවා වෙනස්වන නියොන් බල්බ වැනි උපාංග සඳහා අවසර දෙනු ලැබේ.

(ආ) එක් ගොඩනැගිල්ලකට එක් නාම පුවරුවක් සඳහා අවසර දෙනු ලැබේ. හරස් දැන්වීම් පුවරු ගාලු උරුම සැලසුම් කමිටුවේ අවසරය මත සවි කළ යුතුය.

(ඇ) නාම පුවරු මත සහ වෙනත් දැන්වීම් වල ඇති අතුරු වර්ණ සහ ප්‍රමාණය ගාලු උරුමය සැලසුම් අනුකමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතුය.

(ඉ) දැන්වීම් පුවරුවෙන් ආවරණය වන මුළු ප්‍රමාණය ගොඩනැගිල්ලේ මුහුණත ප්‍රමාණයෙන් 1/3 නොඉක්ම විය යුතුය.ගාලු ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම ඇතුලත යම් දැන්වීමක් සවිකිරීම සඳහා ගාලු උරුමය සැලසුම් අනුකමිටුවෙන් පූර්ව අවසරය ලබා ගත යුතු අතර, මහ නගර සභාව විසින් දැන්වීම් පුවරු සවි කිරීම සඳහා සුදුසු ස්ථාන කිහිපයක් ගාලු කොටුව ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශය තුළ සැපයිය යුතුය.

(ඊ) කිසියම් නාම පුවරුවක් හෝ දැන්වීම් පුවරුවක් සහ දැන්වීමක් විදුලි කණු, කොටු බැම්ම, මායිම් තාප්ප, විවෘත ප්‍රදේශ, ගස් මත, මාර්ගයන්හි, වහලය, පුරාවස්තුවක් ආවරණය වන පරිදි හෝ එවන් පුරාවස්තුවක කැටයමක් ආවරණය වන පරිදි සවි කිරීම හෝ ඇලවීම නොකළ යුතුය.

(උ) පොදු සහ පෞද්ගලික දේපල තුළ සියළු ආකාරයේ ප්‍රචාරක පුවරු සහ දැන්වීම් පුවරු සවි කිරීම තහනම් වේ.

(ඌ) දොර, ජනේල සහ ගොඩනැගිල්ලේ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ ආවරණය වන පරිදි නාම පුවරු වලින් ආවරණය නොකළ යුතුය.

20. භූමි දර්ශනය

ගාලු ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම ප්‍රදේශය තුළ හඳුනා ගත් ස්ථාන සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් භූ දර්ශන සැලසුම් සැපයිය යුතුය.

(අ) මතු පිට ජලය බැස යන සියළු කාණු කොන්ක්‍රීට් තහඩු වලින් ආවරණය කර ප්‍රධාන කාණු වෙත යොමු කළ යුතුය. ප්‍රධාන කාණු නගර සභාව මඟින් නඩත්තු කළ යුතුය.

(ආ) ඕලන්ද යුගයේ ඉදිකරන ලද මළාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කළ යුතු අතර, භූගත මලාපවහන නාලිකා පිරිසිදු කර නඩත්තු කළ යුතුය.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් රථවාහන නැවතුම්, පොදු විවෘත ප්‍රදේශ, වැසිකිළි පහසුකම් සහ වෙනත් පොදු සේවා සඳහා විස්තරාත්මක සැලසුම් සැපයිය යුතුය

21. වීථි දර්ශනය

ගාලු උරුම සැලසුම් අනුකමිටුව විසින් වීථි ලාම්පු පද්ධතිය අනුමත කළ යුතුය. ලාම්පු මෝස්තරය කමිටුව විසින් දෙන ලද අනුමැතියට අනුකූල විය යුතුය. රාත්‍රී කාලයේදී කොටු බැම්මෙහි ප්‍රධාන පාර දෙපස ආලෝකකරණය කළ යුතුය.

ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ආශ්‍රිත ප්‍රදේශය සඳහා වීථි නාම හා නාම පුවරු සඳහා පොදු සැලැස්මක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දිය යුතුය.

22. ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ආශ්‍රිත ප්‍රදේශය සඳහා වීථි නාම හා නාම පුවරු සඳහා පොදු සැලැස්මක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දිය යුතුය.

23 ගාල්ල ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම ආශ්‍රිත ප්‍රදේශයේ වත්මන් වීථි රේඛාව එලෙසම පවත්වා ගත යුතුය.

24. වාහන ගමනාගමනය හා රථගාල් කළමනාකරණය කිරීම

භාණ්ඩ ප්‍රවාහනය කරන සියළුම වර්ගයේ වාහන කොටුව ප්‍රදේශයට ඇතුළු වීම හා පිටවීම පිළිවෙලින් පෙ. ව. 9. 00 සිට පෙ. ව. 11. 00 සහ ප. ව.7.00 සිට ප. ව. 9. 00 දක්වා සීමා කළ යුතුය.

25 ගාල්ල ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම ප්‍රදේශය සඳහා වාහන ඇතුළුවීම වැළැක්වීම සඳහා සුදුසු උපාය මාර්ගික විසඳුම් ගාලු උරුමය සැලසුම් කමිටුව මඟින් හඳුන්වා දිය යුතුය.

(අ) ගාල්ල ඉපැරණි නගරය සහ එහි කොටු බැම්ම ආශ්‍රිත ප්‍රදේශය සියළු වාහන වල වේගය පැයට කි. මී. 25 නොඉක්ම විය යුතුය.

(ආ) සියළු වාහන රථගාල් සඳහා වෙන් කළ ස්ථානවල පමණක් වාහන නතර කරනු ලැබිය යුතු අතර එම වාහන නැවතීම නිශ්චිත කාලයකට සීමා විය යුතුය.

26. යටිතල පහසුකම්

සියළුම යෝජිත සහ පවත්නා ගොඩනැගිල වල විදුලි රැහැන් විදුලිය, ජල ටැංකි සහ ජල සැපයුම් නල, සන්නිවේදන කුළුණු, වායු සමීකරණ යන්ත්‍ර, කාණු පද්ධතීන් ගොනැගිල්ලේ ලක්ෂණයන්ට ගැළපෙන පරිදි ආවරණය කළ යුතුය.

27. ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශය තුළ සහ එහි දෙවන කලාපය ඇතුළත සියළුම සේවා රැහැන් සහ නල ලෝක උරුම නගරයේ දර්ශන පථය රැක ගැනීම සඳහා භූගත කළ යුතුය.

09 වන පරිච්ඡේදය

II වන කලාපයේ සංවර්ධන කටයුතු

සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි

28. ගාල්ල ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ආශ්‍රිත ප්‍රදේශයේ දෙවන කලාපය තුළ සියළුම සංවර්ධන කටයුතු සහ අර්ධ සහ තාවකාලික ඉදිකිරීම් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසරය නොලබා ඉදි නොකළ යුතුය.

ගාල්ල කොටුව කලාපියකරණ සැලසුම

29. පැරණි වරාය ප්‍රදේශය ඇතුළත ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ලක්ෂණ ආරක්ෂා කළ යුතු අතර ගාලු උරුම සැලසුම් අනුකමිටුව අනුමත භාවිතයන් සඳහා පමණක් භාවිතා කළ යුතුය.

සංරක්ෂණ කලාපය I

30. ගාල්ල පවත්නා ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ප්‍රදේශය විවෘත ප්‍රදේශයක්/ විවෘත ක්‍රීඩාංගණයක් ලෙස පවත්වා ගත යුතුය. එසේම ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය සම්බන්ධයෙන් යුනෙස්කෝ සංවිධානය විසින් 2008 වර්ෂයේ සිට මේ දක්වා ගලු ලැබූ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

31. ගාලු කොටුව ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ප්‍රදේශයේ ලක්ෂණයට අනුරූපි නොවන ගොඩනැගිලි ඉදිකිරීම් කඩා ඉවත් කළ යුතු අතර අවශ්‍ය විටක වඩා සුදුසු ස්ථානයක ප්‍රතිස්ථාපනය කරනු ලැබිය යුතුය.

32. සියළු ඉදිකිරීම් මහගාල්ල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්මට අනුකූල විය යුතුය.

ගාලු ඉපැරණි නගරය හා එහි කොටු බැම්ම ආශ්‍රිත ප්‍රදේශය සඳහා පෙරසැරි ගාස්තු

		නේවාසික	වාණිජ	සංචාරක
01.	මූලික සැලසුම් නිරාකරණය	5000. 00	20,000. 00	50,000. 00
02.	සංවර්ධන බලපත්‍ර	5000. 00	20,000. 00	50,000. 00
03.	වලංගු කාලය දීර්ඝ කිරීම	300. 00	2500 00	5000. 00
04.	අනුකූලතා සහතිකය නිකුත් කිරීම	10,000. 00	10, 000. 00	10, 000. 00

9.3.කරාපිටිය උප නගර මාර්ගෝපදේශන සැලසුම

9.3.1. පසුබිම

කරාපිටිය නගරය රජයේ සෞඛ්‍ය ආශ්‍රිත රෝහල් රැසක ක්‍රියාකාරකම් ස්ථානගත වීම නිසා මෑතකාලීනව ඉතා සීඝ්‍ර වර්ධනයකට ලක් වූ උප නගරයකි. විශේෂයෙන් රජයේ මහ රෝහල, ශික්ෂණ රෝහල, මාතෘ රෝහල, පිළිකා රෝහල සහ විශේෂඥ වෛද්‍ය සේවා සපයන ආයතන පෞද්ගලික රෝහල හා රුහුණ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ආදී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් නිසා මෑතකාලීනව දැඩි ආකර්ශනයකට ලක් වී ඇත. වර්තමානයේ කරාපිටිය නගරයේ පවතින නේවාසික, වාණිජ,සෞඛ්‍ය සේවා ආශ්‍රිත කටයුතු සඳහා පවතින විශාල ඉල්ලුම සහ තදබදය මෙන්ම 2030 වර්ෂය වන විට කරාපිටිය නගරය භාවිතා කරන්නේ යැයි උපකල්පිත 75,000 ක් පමණ ජනගහනය සළකා බැලීමේදී කරාපිටිය නගරය සඳහා විශේෂ නියාමන සැලසුමක් නිර්මාණය කර තිබේ. තවද මෙම නියාමන සැලසුම තුළින් අනාගත සංවර්ධන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා පෞද්ගලික අංශයට මඟ පෙන්වීමක් සිදු කරන අතරම, දැනට පවතින ගැටළු අවම කර ගැනිම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට අවශ්‍ය ස්ථාන වෙන් කිරීමට මෙන්ම විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීමද මෙම නියමතා සැලසුම තුළින් සිදු කිරීමට නියමිතය.

9.3.2. අරමුණු

i) අනාගත අවශ්‍යතා සඳහා අවශ්‍ය වන ඉඩකඩ හඳුනා ගැනිම සැලැස්ම තුළින් වෙන් කර දීම.

1 රජයේ රෝහල් ආශ්‍රිත ක්‍රියාකාරකම්
2 පොදු පහසුකම්
  2-1 බස් නැවතුම් පොළ, අතිරේක බස් නැවතුම්
  2-2 විවේක ප්‍රදේශ සහ නැවතුම් ස්ථාන
  2-3 පොදු පහසුකම් සහ විවෘත ප්‍රදේශ
3 ජල රැඳවුම් ප්‍රදේශ
4 මාර්ග සහ ප්‍රවාහන පහසුකම්
5 නේවාසික පහසුකම්
6 වාණිජ

ii) පවත්නා ගැටළු අවම කර ගැනිම සඳහා අත්‍යාවශ්‍ය පොදු පහසුකම් සහ ප්‍රමාණයන් හඳුනා ගැනිම සහ එම අවශ්‍යතා සම්පූර්ණ කර ගැනිම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

iii දැනට තීව්‍ර වී ඇති රථවාහන ගැටළුව සඳහා දිගුකාලීන විසඳුමක් ලබා දිම සහ විවිධ රජයේ රෝහල් සහ වෙනත් පහසුකම් ලබා දීම හා ඒවා අතර සම්බන්ධතාවය වර්ධනය කිරීම

9.3.3. කරාපිටිය උපනගරයේ සීමා

කරාපිටිය විශේෂ නියමතා කලාපයේ නගර මධ්‍යය ප්‍රදේශය සිමාව සහ කරාපිටිය නගරයේ පරිබාහිර ප්‍රදේශය දැක්වෙන සීමාව ඇමුණුම 2 මඟින් ඉදිරිපත් කර ඇත.

9.3.4. නියමතා සැලැස්මේ විෂයපථය

ඉලක්කගත වර්ෂයේදී විශේෂ නියමතා කලාපයේ ඇති වේ යැයි අපේක්ෂිත සෞඛ්‍ය අංශයේ සංවර්ධන කටයුතු සහ අනෙකුත් පොදු සහ වාණිජ සේවා මෙන්ම නේවාසික කලාප අතර මනා සම්බන්ධතාවයක් ඇති කිරීම මෙන්ම ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා මඟ පෙන්වීම මෙමඟින් සකස් කර ඇත. මෙම මාර්ග උපදේශන කරාපිටිය නගර මධ්‍යය සහ ඉන් පරිබාහිර ප්‍රදේශය ලෙස නියමතා සැලැස්මෙන් හඳුනා ගෙන ඇති ප්‍රදේශය සඳහා බල පැවැත්වේ. මෙම විශේෂ නියමතා කලාපයේ නගර මධ්‍ය සහ නගර පරිබාහිර ලෙස කලාප දෙකක් සඳහා නියමතා සකස් කොට ඇති අතර ඒ සඳහා ඉලක්ක ගත වර්ෂයේ සංවර්ධන අවශ්‍යතා සහ කරාපිටිය මධ්‍යස්ථානයේ සෞඛ්‍ය අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීම ඉලක්ක කොට ඇත.

9.3.5. කරාපිටිය උප නගර සැලැස්මේ පොදු නියමතා

ඉදිකරනු ලබන සෑම නව ගොඩනැගිල්ලකම අවම වශයෙන් (බිම් මහල, පළමු මහල හා දෙවන මහල) වාණිජ සහ සෞඛ්‍ය කටයුතු සඳහා වෙන් කළ යුතුය. කරාපිටිය උප නගර සංවර්ධන සැලසුම මඟින් හඳුනා ගත් ඉඩම් ඒ ඒ භාවිතය සඳහා පමණක් යොදා ගත යුතුය. විශේෂයෙන් නගර මධ්‍ය මධ්‍යයේ ප්‍රවාහන කටයුතු, වාණිජ සංවර්ධන, මිශ්‍ර සංවර්ධන, රජයේ රෝහල් කටයුතු කලාපය, විවෘත අවකාශ කලාපය සහ ජල රැඳවුම් ප්‍රදේශ, ආගමික කටයුතු ප්‍රදේශ. කරාපිටිය උප නගර මධ්‍ය කලාපය තුළ මාර්ගවල පවත්වා ගත යුතු අවම පළල පහත සඳහන් පරිදි වේ.

09 වන පරිච්ඡේදය

සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි

ගාල්ල කොටුව කලාපියකරණ සැලසුම

කරාපිටිය උප නගර මාර්ගෝපදේශන සැලසුම

වගුව ***9.3.1:*** අවම මාර්ග පළල

අනු අංකය	මාර්ගය	පවත්වා ගත යුතු අවම පළල එක් පසක සිට (මීටර්)
1	ගිංතොට වලහන්දූව මාර්ගය	15 m
2	හිරිඹුර හරස් පාර	12 m
3	පිටර් කිරින්ගොඩ මාවත	12 m
4	අනගාරික ධර්මපාල මාවත	12 m
5	ගොඩකන්ද පාර	12 m
6	මාඉටිපේ I පටුමග	09 m
7	මාඉටිපේ II පටුමග	09 m
8	මාඉටිපේ III පටුමග	09 m
9	ජාතික නිවාස පාර	09 m
10	පාසැල් මාවත	09 m
11	දෙද්දුගොඩ මාවත	09 m
12	කුරුඳුවත්ත ටෙරස් පාර	09 m
13	ඉන්ලන්කන්ද පාර	09 m
14	සනිසයිඩ් පාර I	09 m
15	සනිසයිඩ් පාර II	09 m
16	කපුවරන්දර වත්ත මාවත	09 m
17	අතුලාන්දාරාම පන්සල පාර	09 m
18	අනෙකුත් සියළුම පොදු මාර්ග	06 m

1. සියළුම සංවර්ධන කටයුතු වලදී යෝජිත මාර්ග පළල මාර්ග මධ්‍යයේ සිට ඉඩ හැරීම අත්‍යාවශ්‍ය වේ.
2. ඉහත අංක 01 හි සඳහන් නොවූ නේවාසික, වාණිජ, මිශ්‍ර සංවර්ධන යන කලාපවල හතරවන මහලේ සිට ඉහළට නිවාස ඒකක සඳහා අවසර ලබා දෙනු ලැබේ.
3. යෝජිත සියළුම සංවර්ධන කටයුතු වල උපරිම උස නගර අභ්‍යන්තර කලාපය තුළ මීටර් 75 ක් වන අතර පරිබාහිර කලාපයේ මීටර් 50 ක් වේ.
4. සියළුම සංවර්ධන කටයුතු වලදී ගෙබිම් ආවරණ අනුමැතිය පහත සඳහන් පරිදි වේ.

වගුව***9.3.2:*** කරාපිටිය උප නගර ගොඩනැඟිලි නියමතා

උස මීටර්	වාණිජ (%)		මිශ්‍ර නේවාසික (%)		ගෙබිම් අනුපාතය		ප්‍රතිශතය	
	ඇතුළත	පිටත	ඇතුළත	පිටත	ඇතුළත	පිටත	ඇතුළත	පිටත
10 M	80	70	66	60	-	3.0 m	2.25	2.25
20 M	70	60	60	55	3.0 m	4.5 m	3.0	3.0
30 M	60	55	55	50	4.5 m	5.5 m	4.5	5.5
40 සහ 40ට වැඩි	50	50	50	50	5.5 m	6.0 m	6.0	7.5

5. නගර මධ්‍යය ඇතුළත ප්‍රදේශයේදී සිදු කරනු ලබන සියළු වාණිජ සංවර්ධන කටයුතු වලදී අවම වශයෙන් ගොඩනැගිලි ඉඩ ප්‍රමාණයෙන් ඊ (25.26%) රෝහල් කටයුතු සඳහා වෙන් කළ යුතුය.
6. නගර මධ්‍ය ප්‍රදේශයේ සිදු කරනු ලබන සියළුම සංවර්ධන කටයුතු වලදී අදාල භූමිය තුළින් සියළුම රථවාහන සැපයීම් ස්ථාන වෙන් කළ යුතුය.
7. උප නගරයේ සිදු කරන සියළුම සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් මූලික සැලසුම් නිරාකරණය ලබා ගත යුතුය.
8. මාඉටිපේ I පටුමග රෝහල් කටයුතු සඳහා ප්‍රමුඛතාවයක් ලබා දීමේ මාර්ගයක් බවට පත් කෙරේ.

9.3.6. කලාපය තුළ අවසර දෙනු ලබන භාවිතයන්

01. රෝහල්
02. රෝහල් ආශ්‍රිත ක්‍රියාකාරකම්
03. වෛද්‍ය මධ්‍යස්ථාන
04. රසායනාගාර
05. ඔසුහල්
06. නේවාසික ගොඩනැගිලි
07. නේවාසිකාගාර/මහල් නිවාස
08. බැංකු/ රක්ෂණ ආයතන
09. ආපනශාලා/බොජුන්හල්
10. වාණිජ ක්‍රියාකාරකම්/බේකරි
11. සුපිරි වෙළඳසැල්
12. දිවා සුරැකුම් මධ්‍යස්ථාන/ පෙර පාසැල්
13. ක්‍රීඩාගාර
14. අවමංගල්‍ය ශාලා/මල්ශාලා

9.3.7. අවසර ලබා නොදෙනු ලබන භාවිතයන්

01. කර්මාන්ත
02. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නොවන අනෙකුත් ගබඩා
03. ගරාජ, වාහන ඇළුත්වැඩියා ස්ථාන
04. වීමෝල්
05. ලී මෝල්
06. වාහන සේවා ස්ථාන

මෙහි සඳහන් නොවන භාවිතයන් සඳහා අනුමැතිය සලකා බැලීම නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුවේ තීරණය අනුව වේ.

9.3.8. සංවර්ධන ව්‍යාපෘති

1.කරාපිටිය රෝහල් සංකීර්ණය වැඩිදියුණු කිරීම

1.1 යෝජිත පිළිකා ඒකකය ඉදිකිරීම

1. 2 යෝජිත දන්ත ශල්‍යාගාර ඒකකය ඉදිකිරීම
1. 3 වාහන නැවතුම් අංගනය ඉදිකිරීම
1. 4 වෛද්‍ය නිල නිවාස ඉදිකිරීම
1. 5 විවෘත ප්‍රදේශ (Open Space) සංවර්ධනය
1. 6 යෝජිත ළමා රෝහල ඉදිකිරීම
1. 7 යෝජිත ස්නායු රෝග, වකුගඩු බද්ධ කරන සහ රුධිර කාන්දු ඒකක රෝහල ඉදිකිරීම
1. 8 යෝජිත රෝග නිශ්චය කිරීමේ ඒකකය
1. 9 යෝජිත වාට්ටු සංකීර්ණය

02. මාතෘ රෝහල් සංකීර්ණය සංවර්ධනය කිරීම

2.1 හෙඳ නිල නිවාස ඒකකය ඉදිකිරීම

03. නගර මධ්‍ය මිශ්‍ර ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය

04. මාර්ග සංවර්ධනය

4. 1 පවතින මාර්ග පුළුල් කිරීම

1. ගිංතොට වලහන්දූව මාර්ගය මංතීරු 4 ක් ලෙස සංවර්ධනය කිරීම
2. හිරිඹුර හරස් මාර්ගය මංතීරු හතරක් ලෙස සංවර්ධනය කිරීම
3. මාඉටිපේ II පටුමග මංතීරු 02 ක් සහිතව සංවර්ධනය කිරීම (කරාපිටිය නගර මධ්‍යය සඳහා පමණක් බලපැවැත්වේ)
4. කරාපිටිය - ගොඩකන්ද මාර්ග මංතීරු 2 ක් සහිතව සංවර්ධනය කිරීම
5. පීටර් කිරිංගොඩ මාර්ගය මංතීරු 02 ක් සහිතව සංවර්ධනය කිරීම

09 වන පරිච්ඡේදය

සංවර්ධන මාර්ගෝපදේශන සැලැස්ම සහ රෙගුලාසි

4. 2 විකල්ප මාර්ග සංවර්ධනය (3.1 හා 3. 2 මාර්ගය)

4. 3 උමං මාර්ග සංවර්ධනය

1. මාතෘ රෝහල ඉදිරිපිට සිට නාගරික සංවර්ධන අධිකාරිය භූමි ප්‍රදේශය දක්වා

2. වෛද්‍ය විද්‍යාලය ඉදිරිපිට සිට කරාපිටිය ශික්ෂණ රෝහල දක්වා

ගාල්ල කොටුව කලාපියකරණ සැලසුම

05. බොම්බේ කාසල් ඇළ ප්‍රතිසංවර්ධනය කිරීම

06. විවේක හා විනෝද කටයුතු පහසුකම් සංවර්ධනය

6. 1 ආපනශාලා ඉදිකිරීම (Open Space)

6. 2 භූ දර්ශනය සකස් කිරීම

6. 3 ජල රඳවන ස්ථාන සංවර්ධනය

කරාපිටිය උප නගර මාර්ගෝපදේශන සැලසුම

07. යෝජිත පොදු නේවාසිකාගාර ඒකකයක් ඉදිකිරීම

08. යෝජිත ඔසු සැල් ගොඩනැගිල්ල

09. මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

10. අවට ප්‍රදේශ භූ දර්ශනය කිරීම

11. වෛද්‍ය පීඨ පරිශ්‍රය වැඩි දියුණු කිරීම

රූපය ***9.3.1:*** යෝජිත මාර්ග සංවර්ධන ව්‍යාපෘති



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, ගාල්ල 2020

